කැලණිය විශ්වවිද්‍යාලය
මානවශාස්ත්‍ර පීඨය

## සංස්කෘතික අනන්‍යතාව සහ
## සිංහල භාෂා සාහිත්‍ය අධ්‍යයන
# ශාස්ත්‍රීය ප්‍රභාෂණය 2023
## සිංහල අධ්‍යයන අංශය

# පර්යේෂණ සාරසංක්ෂේප සංග්‍රහය
# ABSTRACT VOLUME

2023 ඔක්තෝබර් 24
මානවශාස්ත්‍ර පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය

# ශාස්ත්‍රීය ප්‍රභාෂණය 2023

සිංහල අධ්‍යයන අංශය

සිංහල අධ්‍යයන අංශය

කැලණිය විශ්වවිද්‍යාලය

2023

# Research Symposium 2023

Department of Sinhala

Department of Sinhala

University of Kelaniya

2023

# පටුන


- අධ්‍යයනාංශ පණිවුඩය
- Message from the Department
- ශාස්ත්‍රීය පරිසංවාද කමිටුව
- සංස්කාරක මණ්ඩලය
- සාරසංක්ෂේප

| අංකය | සාරසංක්ෂේපය |
|---|---|
| NCSS-001-01 | භර්තෘහරීගේ ශෘංගාර ශතකයෙන් විද්‍යාමාන වන ස්ත්‍රී ප්‍රයෝග පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක් |
| NCSS-001-02 | සද්ධර්මරත්නාවලියෙන් පිළිබිඹු වන දේශීය වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (තෝරාගත් කතාවස්තු කිහිපයක් ඇසුරෙන්) |
| NCSS-001-04 | සද්ධර්මාලංකාරය කෘතියෙහි ලංකාද්වීපෝත්පන්න කථාවලින් පිළිබිඹු වන තත්කාලීන සමාජයේ ආර්ථීක තත්ත්වය (තෝරාගත් කථා පහක් ඇසුරෙන්) |
| NCSS-001-07 | කෝකිල සන්දේශයෙන් හෙළි වන උපුල්වන් දේවසංකල්පය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් |
| NCSS-001-11 | කේ. කේ. සමන් කුමාරගේ කෙටිකතා නිර්මාණ මඟින් පිළිබිඹු වන අධියථාර්ථවාදී හා පශ්චාත්නූතනවාදී අංග ලක්ෂණ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (සර්පයෙකු හා සටන්වැද, එක්ටැමකින් මහපොළොවට, එසඳ මම බලා සිටියෙමි යන කෙටිකතා ඇසුරින්) |
| NCSS-001-12 | නන්දන වීරසිංහගේ කාව්‍ය නිර්මාණවලින් ප්‍රතිබිම්බිත සාංදෘෂ්ටිකවාදී දර්ශනය පිළිබඳ විමර්ශනයක් |
| NCSS-001-13 | පැරකුම්බා සිරිතෙන් හෙළි වන ලාංකේය ඓතිහාසික තොරතුරු පිළිබඳ අධ්‍යයනයක්. |
| NCSS-001-15 | යටත්විජිත අවධියේ ස්වදේශිකයා මුහුණ දුන් අධිකරණයේ භාෂා ගැටලුව පිළිබඳ අධ්‍යයනයක් (බැද්දේගම නවකතාව ඇසුරින්) |
| NCSS-001-18 | කේ. ජයතිලකගේ නිර්මාණ කෘතිවල හමුවන ක්ෂුද්‍ර ප්‍රබන්ධමය ආකෘතීන් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්. |

| | |
|---|---|
| NCSS-001-19 | මායා යථාර්ථවාදී සිංහල ක්ෂුද්‍ර ප්‍රබන්ධමය කෙටිකතාවල අන්තර්ගතයේ සහ ආකෘතියේ විශේෂතා පිළිබඳ අධ්‍යයනයක්<br>(තෝරාගත් කෙටිකතා සංග්‍රහ ඇසුරිනි) |
| NCSS-001-21 | සද්ධර්මාලංකාරයෙහි විද්‍යමාන මායා යථාර්ථවාදී සාහිත්‍ය ලක්ෂණ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (තෝරාගත් කතා කිහිපයක් ඇසුරින්) |
| NCSS-001-23 | ස්ත්‍රිය පිළිබඳ දෘෂ්ටිවාද ප්‍රතිනිර්මාණය වැළැක්වීම සඳහා නූතන පද්‍ය කාව්‍යයේ දායකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්ඃ තෝරාගත් නූතන පද්‍යකාව්‍ය කිහිපයක් ඇසුරින් |
| NCSS-001-26 | සංයුක්ත කවිය පාඨකයාට කොතෙක් දුරට විචාරාත්මකව කියවිය හැකිද යන්න පිළිබඳ විමර්ශනයක්ඃ තෝරාගත් සංයුක්ත කවි කිහිපයක් ඇසුරින් |
| NCSS-001-28 | ඓතිහාසික කතාපුවත් නූතනවාදී ලෙස ප්‍රතිනිර්මාණය කිරීමට රුවන් බන්දුජීව දැක්වූ සාමර්ථ්‍යය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්<br>(මීළඟ මීවිත පද්‍ය කෘතිය ඇසුරිනි) |
| NCSS-001-29 | නූතන සිංහල පද්‍ය සාහිත්‍යයේ ප්‍රස්තුත විවරණය සඳහා ස්ත්‍රී වාදයෙහි උපයෝගීතාව පිළිබඳ අධ්‍යයනයක් |
| NCSS-001-33 | සාහිත්‍ය; මහා සම්ප්‍රදාය හා චූල සම්ප්‍රදාය ලෙස වර්ගීකරණය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් |
| NCSS-001-34 | පරමාර්ථ ධර්මයන්හි අර්ථ විශ්ලේෂණය කරගැනීමෙහි ලා විශුද්ධිමාර්ග මහා සන්‍යයෙහි උපයෝගිතාව පිළිබඳ විමසීමක්<br>(ලක්ඛණ-රස-පච්චුපට්ඨාන-පදට්ඨාන විග්‍රහය ඇසුරෙනි) |
| NCSS-001-35 | සක්‍රීයපඨනය, ලක්ෂ්‍යාර්ථය හා රූපකය<br>(අනුරාධා නිල්මිණි, නදුන් යසිත දසනායක හා ලක්ශාන්ත අතුකෝරලගේ කාව්‍ය නිර්මාණ ආශ්‍රිත අධ්‍යයනයක්) |
| NCSS-001-36 | කෝට්ටේ යුගයේ සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ දියුණුවට බලපෑ හේතු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් |
| NCSS-001-37 | 1990 - 2020 කාල සීමාවෙහි සිංහල නවකතා රචකයන් විසින් උපයුක්ත ආඛ්‍යාන රීතිවල විසදෘශතා<br>(ලියනගේ අමරකීර්ති, එරික් ඉලයප්ආරච්චි, කීර්ති වැලිසරගේ හා සමන් වික්‍රමාරච්චිගේ නවකතා ආශ්‍රිත අධ්‍යයනයක්) |
| NCSS-001-38 | සාංදෘෂ්ටිකවාදී විචාර න්‍යාය සහ නවකතා විචාරය; විචාරාත්මක අධ්‍යයනයක් |
| NCSS-002-03 | ශ්‍රී ලංකාවේ මාර්ගගත පොදු ප්‍රවේශ සූචිවල (OPACs) සිංහල පුද්ගල නාම සාධිකාරී පාලනය |

| | |
|---|---|
| NCSS-002-04 | පොළොන්නරු යුගයේ සෙල්ලිපිවලින් හෙළිවන සමාජ කුල ක්‍රමය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (තෝරාගත් සෙල්ලිපි ඇසුරෙන්) |
| NCSS-002-05 | දහවන සියවසේ සෙල්ලිපිවල ඇතුළත් බදුක්‍රම පිළිබඳ විග්‍රහාත්මක අධ්‍යයනයක් (තෝරාගත් සෙල්ලිපි ඇසුරින්) |
| NCSS-002-06 | භාෂණ සිංහලයේ භාවිත වන රූඪී හා ඉඟිවැකි පිළිබඳ විමසුමක් |
| NCSS-002-09 | ප්‍රාකෘත යුගයේ බ්‍රාහ්මී ශිලාලේඛනවලින් හඳුනාගත හැකි මත්ස්‍ය සංකේතයේ සන්නිවේදනාර්ථ පිළිබඳ අධ්‍යයනයක් |
| NCSS-002-10 | සිංහල භාෂාවේ සම්භවය පිළිබඳ දක්වා ඇති මත පිළිබඳ අධ්‍යයනයක් |
| NCSS-002-11 | සිංහල පරිමිත ව්‍යවහාරවල ස්වාධීනතා පිළිබඳ අධ්‍යයනයක් |
| NCSS-002-12 | අනුරාධපුර යුගයේ කාන්තා භූමිකාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (අනුරාධපුර යුගයේ ශිලාලේඛන ඇසුරෙන්) |
| NCSS-002-13 | හා-තොල සහ තල්ලේ සිදුර සහිත පුද්ගලයන්ගේ සහ ප්‍රතිකාර ක්‍රම මඟින් එය යථා තත්වයට පත්කරගත් පුද්ගලයන්ගේ භාෂණ සිංහල ස්පර්ශ සහ ඝර්ෂ ශබ්ද උච්චාරණය පිළිබඳ වාග්විද්‍යාත්මක අධ්‍යයනයක් |
| NCSS-002-14 | වේවැල්කැටිය ශිලාලේඛනයෙන් හෙළි වන ගම්බද උසාවි ක්‍රමය හා බලතල බෙදීම පිළිබඳ අධ්‍යයනයක් |
| NCSS-002-16 | සිදත් සඟරා අක්ෂර නාමකරණයෙහි ලා වීරසෝළියම් ද්‍රවිඩ ව්‍යාකරණ ග්‍රන්ථයෙහි ආභාසය පිළිබඳ අධ්‍යයනයක් |
| NCSS-002-17 | පොළොන්නරු යුගයේ සන්නස් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් |
| NCSS-002-18 | මුල්කාලීන රූපවාහිනී කාටූන් වැඩසටහන්වලට සාපේක්ෂ ව සමකාලීන කාටූන් වැඩසටහන්වල සිංහල භාෂාවේ ගුණාත්මකභාවය සහ වත්මන් ළමා පරපුරේ භාෂා භාවිතය කෙරෙහි ඒවායේ බලපෑම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් |
| NCCS-002-19 | සිංහල අවධි විභක්ත්‍යර්ථය හා ආධාර විභක්ත්‍යර්ථය ලේඛන දෙමළ භාෂාවේ දී භාවිත ආකාරය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් |
| NCSS-002-21 | මහනුවර යුගයේ සන්නස්වලින් හෙළි වන දීමනා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (තෝරාගත් සන්නස් හා තුඩපත් ආශ්‍රයෙන්) |
| NCSS-002-22 | සිංහල භාෂාවේ ණ-න-ල-ළ භේදයː භාවිතය හා පරිණාමීය ලක්‍ෂණ පිළිබඳ පදිම විචාරාත්මක අධ්‍යයනයක් |
| NCSS-002-23 | ශ්‍රී ලාංකික ජන සමාජයේ ආගමික පසුබිම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (ක්‍රි. ව. 9-10 සියවස්වල රචිත අත්තාණි ශිලාලේඛන ඇසුරෙන්) |
| NCSS-002-24 | කල්‍යාණවතී රැජිණගේ රුවන්වැලිසෑ පුවරු ලිපියෙන් හෙළිවන පූජාවිධි පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් |

| | |
|---|---|
| NCSS-002-26 | කුංචුට්ටු කෝරළයේ ධීවර කර්මාන්තය හා හේන් ගොවිතැන ආශ්‍රිත බස්වහර පිළිබඳ සාහිත්‍ය විමර්ශනයක් |
| NCSS-003-02 | සංස්කෘතික ස්වාධීනත්වය ගොඩනැගීම සඳහා සංස්කෘතික පරිසරවිද්‍යාවේ දායකත්වය පිළිබඳ අධ්‍යයනයක් |
| NCSS-003-03 | ආදිවාසී ජනතාවගේ ආහාර පරිභෝජන රටාවේ වෙනස්වීම කෙරෙහි පුද්ගලබද්ධ සංවර්ධන ව්‍යාපෘතිවලින් සිදුවන බලපෑම: දඹාන ආදිවාසී ගම්මානය ආශ්‍රයෙන් |
| NCSS-003-05 | මහනුවර යුගයේ සිතුවම්වල සාම්ප්‍රදායික උද්භිද සැරසිලි පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් |
| NCSS-003-06 | රාජකීය පුරාවෘත්ත පිළිබඳ ජනශ්‍රැති අධ්‍යයනයක් (මාතර ග්‍රාම නාම ඇසුරෙනි) |
| NCSS-003-08 | සිසුන්ගේ මෘදු කුසලතා සංවර්ධනය සඳහා සාහිත්‍යයෙන් ලැබෙන පිටුබලය: වර්තමානයේ පාසල්වල ක්‍රියාත්මක වන ප්‍රාථමික විෂයමාලාවේ අන්තර්ගත ළමා කතන්දර ඇසුරෙන් |
| NCSS-003-09 | ශ්‍රී ලංකාවේ දකුණු පළාතට ආවේණික ව සිදුකරනු ලබන " කිරිපෝය" චාරිත්‍රය පිළිබඳ සමාජ - සංස්කෘතික අධ්‍යයනයක්. |
| NCSS-003-10 | නිලගම සිත්තර පරම්පරාවේ අනන්‍යතා ලක්ෂණ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (නීලගිරි රජමහා විහාරයේ බුදුසිරිත නිරූපිත සිතුවම් ඇසුරෙන්) |
| NCSS-003-11 | මහනුවර යුගයේ චිත්‍ර කලාවෙන් නිරූපිත හස්ති රූපයේ කලාත්මක විකාසනය පිළිබඳ විමර්ශනයක් (තෝරාගත් විහාර ඇසුරින්) |
| NCSS-003-12 | සමාජගත "නාග"සංකල්පය ලාංකේය කලාව තුළ ප්‍රතිබිම්බිත ස්වභාවය පිළිබඳ අධ්‍යයනයක් (කැටයම් සහ මූර්ති කලාව ඇසුරෙන්) |
| NCSS-003-13 | පන්සියපනස් ජාතක පොතෙන් විද්‍යමාන ආහාර සංස්කෘතියෙහි ආයුර්වේදීය වටිනාකම් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (ජාතකකතා 10ක් ඇසුරෙන්) |
| NCSS-003-15 | අනුරාධපුර ශ්‍රී මහබෝධිය පිළිබඳ ජනශ්‍රැති අධ්‍යයනයක්; දරමිටි පොහොය ආශ්‍රයෙන් |
| NCSS-003-24 | කළුතර දිස්ත්‍රික්කයේ පවතින අප්‍රකට ඇදහිලි විශ්වාස පිළිබඳ අධ්‍යයනයක් (තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 05ක් ඇසුරිනි) |
| NCSS-003-30 | හෙළ කුල ධුරාවලිය මගින් පැරණි ආර්ථික ක්‍රමය පිරිහීමකට ලක්වීමෙන් වත්මන් සමාජය, සංස්කෘතිය සහ ආර්ථිකය අපගමනයට ලක් වූ ආකාරය පිළිබඳ අධ්‍යනයක් |
| NCSS-003-31 | කඩවත් කෝරළයේ කටුකැලියාව ග්‍රාමයේ බලි ශාන්තිකර්මය පිළිබඳ ජනශ්‍රැති අධ්‍යයනයක් |

| | |
|---|---|
| NCSS-003-33 | මාතර ප්‍රදේශයේ වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම් තුළින් පිළිබිඹු වන ලන්දේසි ගෘහ නිර්මාණ ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයක් |
| NCSS-003-35 | සිංහල සංස්කෘතිය සම්ප්‍රේෂණයෙහි ලා නූතන ළමා ප්‍රකාශනවල බලපෑම (තෝරාගත් කෘති දහයකට විශේෂිතව) |
| NCSS-003-37 | මොනරාගල දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික ජීවන රටාව පදනම් කරගත් සාම්ප්‍රදායික ආහාර සංස්කෘතිය |
| NCSS-003-38 | ආහාර සැකසීමේ දී හා ආහාර පරිභෝජනයේ දී සිංහල ගැමි සමාජය විසින් උපයෝගි කොටගත් පැරණි උපකරණ හා මෙවලම් (ගල්ගමුව කොට්ඨාසයේ සාම්ප්‍රදායික ගම්මාන ඇසුරින්) |
| NCSS-003-39 | ශ්‍රී ලංකාවේ කින්නර ජනයාගේ අස්පර්ශිත උරුමය පිළිබඳව අධ්‍යයනයක් |
| NCSS-003-40 | දඩයම්ක්‍රම හා බැඳුණු ජනශ්‍රැති පිළිබඳ අධ්‍යයනයක් |
| NCSS-003-44 | Portrayal of Sinhalese Culture through Translation: A Comparative Study of the Socio-cultural Terms Used in the Sinhalese First Translation and the Retranslation of Great Expectations by Charles Dickens |
| NCSS-003-45 | ශිව - පාර්වතී දේව සංකල්පය පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක් |
| NCSS-003-46 | පාරම්පරික හෙළවෙදකම හා ජනවිඥානය සතු රෝග නිවාරණීය විධික්‍රම පිළිබඳ සමාජ-මානව විද්‍යාත්මක අධ්‍යයනයක් (ලග්ගල ප්‍රදේශයේ පාරම්පරික දේශීය වෙදකම ඇසුරින්) |
| NCSS-004-01 | "Avatar" - The Way of Water චිත්‍රපටයෙන් මිනිසා කෙරෙහි සොබාදහම් නීතියේ බලපෑම රූපාත්මකව ප්‍රකට කිරීම සම්බන්ධ සිනමාත්මක අධ්‍යයනයක් |
| NCSS-004-02 | ඡායාරූප තැපැල්පත් (Picture Postcards) භාවිතය පිළිබඳ අධ්‍යයනයක් |
| NCSS-004-03 | උඩරට නර්තන සම්ප්‍රදායේ හිසවෙස් තැබීමේ මංගල්‍යයේ චාරිත්‍ර විධි පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් |
| NCSS-004-04 | වාර්තා චිත්‍රපටකරණය වෘත්තාන්ත සිනමාවට ප්‍රවේශයක් ද යන්න ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ සිනමා සම්ප්‍රාප්තිය ඇසුරෙන් විමසා බැලීමක් |
| NCSS-004-05 | සෝමලතා සුබසිංහ ළමානාට්‍ය නිර්මාණයේ දී වස්තු විෂය තෝරා ගැනීම සහ එය නිර්මාණශීලීව ඉදිරිපත් කිරීම සම්බන්ධව දක්වා තිබෙන ශක්‍යතා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (පුංචි අපට දැන් තේරෙයි ළමා නාට්‍යය ඇසුරෙන්) |
| NCSS-004-06 | මැඩියා වන්නම ඇසුරින් රජරට වන්නම් සම්ප්‍රදායේ අප්‍රකට ගායන ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයක් |
| NCSS-004-07 | ලාංකේය අංගම්පොර සටන් කලාවේ වර්තමාන මුහුණුවර පිළිබඳ අධ්‍යයනයක්. (අතුරුගිරියේ පිහිටි ශ්‍රී ලංකා පාරම්පරික දේශීය සටන්කලා සංගමය ආශ්‍රයෙනි) |

| | |
|---|---|
| NCSS-004-08 | ජයලත් මනෝරත්නගේ නාට්‍යයන්හි නිරූපිත පරිපීඩිත සමාජ පරිස්ථිතිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්<br>(මහගිරිදඹ, කණේරුමල්, බූරුවා මහත්තයා, සෙල්ලම් නිරිඳු නාට්‍ය ඇසුරින්) |
| NCSS-004-09 | ප්‍රසන්න ජයකොඩිගේ '28' සිනමා කෘතියෙහි ස්ත්‍රීත්වය හා ලිංගිකත්වය නිරූපණයෙහි ලා උපයුක්ත සිනමාරූප භාවිතය පිළිබඳ අධ්‍යයනයක් |
| NCSS-004-12 | විදේශීය චිත්‍රපට හා මාලා නාටක (TV series) සඳහා උපසිරැසි භාවිත කිරීම හා හඬකැවීම මුල් නිර්මාණය සඳහා කෙබඳු ආකාරයේ බලපෑමක් සිදුකරනු ලබයි ද යන්න පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් |
| NCSS-004-14 | දේශීය නර්තන රංගවස්ත්‍රාභරණ නිර්මාණය වීමෙහි ලා බලපෑ ඉන්දීය ආභාසය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් |
| NCSS-004-17 | සිංහල සංස්කෘතික අභිචාරයන්හි සමාජ ඥානනය ; සොකරි ගැමිනාටකය පදනම් කරගත් විමර්ශනාත්මක අධ්‍යයනයක් |
| NCSS-004-21 | යුරිපිඩීස්ගේ බැකී නාට්‍යයෙහි විද්‍යමාන මනෝවිද්‍යාත්මක ප්‍රවේශය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් |
| NCSS-004-23 | ජනප්‍රිය සංස්කෘතිය ප්‍රවර්ධනය සඳහා රූපවාහිනී මාධ්‍යයේ බලපෑම |

## සංස්කෘතික අනන්‍යතාව හා සිංහල භාෂා සාහිත්‍ය අධ්‍යයන

භාෂාව යනු සංස්කෘතියක පිළිබිඹුවයි. ලෝකය පුරා පැහැදිලි ව පෙනෙන සංස්කෘතික විවිධතාව භාෂාවලට අනන්‍යතාවක් ලබාදෙයි. සංස්කෘතිය යනු සතතයෙන් වර්ධනය වන ප්‍රපංචයක් වන හෙයින් භාෂාව ද එයට අනුරූප ව පරිණාමයට ලක්වෙයි. නූතන විද්‍යාත්මක පැහැදිලි කිරීම්වලට අනුව භාෂාවේ ආකෘතික ලක්ෂණ එම භාෂාව භාවිත කරන සංස්කෘතික කණ්ඩායම් ජීවත්වන පරිසරය සහ එමගින් හැඩගැන්වෙන චර්යාත්මක විවිධතාවලට සමාන්තර වෙයි. එහෙයින් භාෂාවක අනන්‍යතාව යනු සංස්කෘතික අනන්‍යතාවේ දර්ශකයයි. ඒ අරුතින් ගත් කල සිංහල භාෂාව හා එහි නිර්මාණාත්මක භාවිතය වන සාහිත්‍ය මෙන් ම අවශේෂ කලාංග හා අස්පර්ශනීය උරුම ද සංස්කෘතික ප්‍රකාශන කාර්යයක නියැළෙයි. ශීඝ්‍රයෙන් වෙනස්වීම්වලට ලක්වන නොඉඳුල් පරිසර පද්ධතිය හා නූතන තාක්ෂණය නිසා පරිවර්තනය වන චර්යා රටා, භාෂාවක අනන්‍යතා ලක්ෂණ නිර්මාණය කරන අයුරු අධ්‍යයනය කිරීම පර්යේෂණාත්මක නිමිත්තකි. ඒ සඳහා මංපෙත් විවර කෙරෙන විෂයානුබද්ධ ශාස්ත්‍රීය සංකථනයක නියැළීම මෙම ශාස්ත්‍රීය ප්‍රභාෂණයේ අධ්‍යාශයයි.

## Cultural Identity and Sinhala Literary Studies

Language is the reflection of a culture. Cultural diversity evident throughout the world gives languages their identity. As culture is a constantly growing phenomenon, language also evolves accordingly. According to modern scientific explanations, the formative characteristics of language are parallel to the environment in which the cultural groups using that language live and the behavioural diversity shaped by it. Therefore, the identity of a language is the indicator of cultural identity. In that sense, the Sinhala language and its creative use of literature, as well as residual arts and intangible heritage, are engaged in a cultural expression. It is an experimental purpose to study how the changing behaviour patterns due to the rapidly changing ecosystem and modern technology create the characteristics of identity in a language. This academic conference aims to engage in a subject-oriented academic conversation that paves the path for that.

## ශාස්ත්‍රීය පරිසංවාද කමිටුව

**අනුශාසකවරු**

මහාචාර්ය පූජ්‍ය මල්වානේ චන්දරතන හිමි

විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිමල් මල්ලව ආරච්චි

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය හර්සන් ඩයස්

**මුලසුන**

මහාචාර්ය ස්වර්ණා ඉහළගම

**සංවිධායක කමිටුව**

ආචාර්ය අංජලී වික්‍රමසිංහ

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය බුද්ධික ජයසුන්දර

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මදාරා කරුණාරත්න

කථිකාචාර්ය කිත්මි පෙරේරා

කථිකාචාර්ය නිපුණ හේමින්ද බස්නායක

කථිකාචාර්ය සුදේශ් කවීශ්වර

**මෙහෙයුම් කමිටුව**

මහාචාර්ය අනුරින් ඉන්දිකා දිවාකර

මහාචාර්ය කුසුම් හේරත්

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චින්තක රණසිංහ

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නීල් පුෂ්පකුමාර

සහකාර කථිකාචාර්ය යූ. ඩබ්. එන්. සුභාෂිනී

සහකාර කථිකාචාර්ය එච්. එම්. එස්. අයි. කුමාරි

සහකාර කථිකාචාර්ය ඒ. එන්. එස්. තරුක්ෂි

සහකාර කථිකාචාර්ය ආර්. එම්. ආර්. චන්ද්‍රමාලි

සහකාර කථිකාචාර්ය ඒ. ඒ. ඒ. එස්. අධිකාරි

**සැසි සභාපතිත්වය**

**සැසි අංක 01 A- පුරාතන ගද්‍ය හා පද්‍ය සාහිත්‍යය**

මහාචාර්ය බිහේෂ් ඉන්දික සම්පත්

මහාචාර්ය කුසුම් හේරත්

**සැසි අංක 01 B - නූතන පද්‍ය සාහිත්‍යය**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චින්තක රණසිංහ

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මදාරා කරුණාරත්න

**සැසි අංක 02 - සිංහල භාෂාව හා ව්‍යාකරණය**

විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිමල් මල්ලව ආරච්චි

ආචාර්ය කවිතා රාජරත්නම්

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නීල් පුෂ්පකුමාර

**සැසි අංක 03 - ආහාර සංස්කෘතිය**

මහාචාර්ය ස්වර්ණා ඉහළගම

මහාචාර්ය ලක්ෂ්මන් සෙනෙවිරත්න

**සැසි අංක 04 - වාර්තික කලා**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිවංක රන්දූල

කථිකාචාර්ය නිපුණ හේමින්ද බස්නායක

**සැසි අංක 05 - නූතන ගද්‍ය සාහිත්‍යය**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අනුරුද්ධිකා කුලරත්න

කථිකාචාර්ය සුදේශ් කවීශ්වර

**සැසි අංක 06- ශිලා ලේඛන**

මහාචාර්ය අනුරින් ඉන්දිකා

කථිකාචාර්ය කිත්මි පෙරේරා

**සැසි අංක 07- දෘශ්‍ය කලා**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය බුද්ධික ජයසුන්දර

කථිකාචාර්ය අසිත අමරකෝන්

**සැසි අංක** 08 A - **ප්‍රාසංගික කලා**

ආචාර්ය අංජලී වික්‍රමසිංහ

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දුලංගා ගුණරත්න

**සැසි අංක** 08 B - **සිංහල සංස්කෘතිය**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය බුද්ධික ජයසුන්දර

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නීතා සුභාෂිණී

## සාරසංක්ෂේප සංග්‍රහය - සංස්කාරක මණ්ඩලය

**ප්‍රධාන සංස්කාරක**

ආචාර්ය අංජලී වික්‍රමසිංහ

**සංස්කාරක මණ්ඩලය**

මහාචාර්ය බිහේෂ් ඉන්දික සම්පත්

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අනුරුද්ධිකා කුලරත්න

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය බුද්ධික ජයසුන්දර

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නීල් පුෂ්පකුමාර

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චින්තක රණසිංහ

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මදාරා කරුණාරත්න

කථිකාචාර්ය කිත්මි පෙරේරා

කථිකාචාර්ය නිපුණ හේමින්ද බස්නායක

කථිකාචාර්ය සුදේශ් කවීශ්වර

බාහිර කථිකාචාර්ය අමායා නානායක්කාර

බාහිර කථිකාචාර්ය ඉරුමා රත්නායක

**පරිගණක නිර්මාණ සහ පිටු සැකසුම්**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිවංක රන්දූල

කථිකාචාර්ය අසිත අමරකෝන්

# සාරසංක්ෂේප

# හර්තෘහරීගේ ශෘංගාරශතකයෙන් විද්‍යමාන වන ස්ත්‍රී ප්‍රයෝග පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්

යූ. ඩබ්ලිව්. එන්. සුභාෂනී
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
nadeeshasuba1996@gmail.com

**සාරසංක්ෂේපය**

"ස්ත්‍රීන් කෙරෙන් පිළිබිඹු වන අත්‍යන්තයෙන් විනීත බව පෙන්වීම, ලැජ්ජාශීලී බව, ලලනෝපචාරී හැසිරීම් හා ආචාරශීලීභාවය ආදි ඉංගිතයෝ" ස්ත්‍රී ප්‍රයෝග ගණයෙහි ලා හැඳින්වෙති. පෙර'පර දෙදිග කවීහු ස්වකීය නිර්මාණයන්හි ස්ත්‍රී ස්වභාව පිළිබඳ නොයෙකුත් අර්ථකථන ලබාදීමෙහි උත්සාහගත් අයුරු ප්‍රකට වන්නේ ය. විශේෂයෙන් සංස්කෘත පද්‍ය සම්ප්‍රදායට අයත් නිර්මාණ කෙරෙහි අවධානය යොමු කිරීමේ දී ඒ බව පැහැදිලි වේ. පර්යේෂණයේ ගැටලුව වශයෙන් හර්තෘහරීගේ ශෘංගාර ශතකය ඔස්සේ කවරාකාර ස්ත්‍රී ප්‍රයෝග ප්‍රකට වන්නේ ද යන්න විමසා බැලේ. ඒ අනුව හර්තෘහරීගේ *ශෘංගාර ශතකය* කෙරෙහි අවධානය යොමු කරමින් ස්ත්‍රී ප්‍රයෝගයන්හි ස්වභාව පිළිබඳ විචාරයට ලක්කිරීම මේ පර්යේෂණයේ මූලික අරමුණ යි. ස්ත්‍රීත්වය වරෙක ගර්හාවට ලක් කිරීමත් වරෙක උත්කර්ෂයෙන් යුතු ව ලෝකයේ පැවැත්මට රුකුල් වන අයුරු කියා පෑමත් එකවර සිදුකිරීම ශෘංගාර ශතකයෙහි දක්නට ලැබේ. ශෘංගාර ශතකයෙහි නිරූපිත ස්ත්‍රී ප්‍රයෝග ආශ්‍රයෙන් ස්ත්‍රී ස්වභාව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ දී අපේක්ෂිත ය. ඒ අනුව ස්ත්‍රිය අනුකම්පා සහගතව මෙන් ම රාගික හැඟීම් උත්තේජනය කරවන්නියක ලෙස ද, තවත් විටෙක උත්කෘෂ්ට මනුෂ්‍ය ප්‍රාණියෙකු වශයෙන් සේ ම පිළිකුලෙන් යුතු ව බැහැර කළ යුතු සත්ත්වයෙකු වශයෙන් ද ශෘංගාර ශතකයෙහි විග්‍රහ කොට තිබෙනු නිරීක්ෂණය කළ හැකි ය. අධ්‍යයනයේ සීමා වශයෙන් මූලික ව ශෘංගාර ශතකයෙහි විද්‍යමාන වන ස්ත්‍රී ප්‍රයෝග කෙරෙහි පමණක් අවධානය යොමු කෙරේ. ගුණාත්මක පර්යේෂණ විධික්‍රමයට අනුව ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ග. ආරියපාල ගුණසේනගේ ශෘංගාර ශතකය සිංහල සංස්කරණය කෙරෙහි මූලික අවධානය යොමු කෙරේ. ද්විතීයික මූලාශ්‍රය වශයෙන් භාරතීය ආචාර්යවරුන්ගේ උපාධි නිබන්ධ හා උක්ත විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විරචිත ලේඛන පරිශීලනය කෙරේ. මේ දක්වා සිදුකොට ඇති පර්යේෂණ කෘති කෙරෙහි අවධානය යොමු කිරීමේ දී ඒවායින් ප්‍රමුඛ ව සාකච්ඡාවට ලක් ව ඇත්තේ හර්තෘහරීගේ ශතකත්‍රය හා කාව්‍ය රීති යනාදිය පිළිබඳ ව පමණි. එහෙත් මෙම පර්යේෂණයේ දී ස්ත්‍රී ප්‍රයෝගයන්හි සූක්ෂ්ම භාවිතයන් හා ඒවායෙහි ශෘංගාරාත්මක ප්‍රකාශන පිළිබඳ ව ද සාකච්ඡා කෙරෙන අතර, හර්තෘහරීන්ගේ ශෘංගාර ශතකයෙහි අධ්‍යයනයට ලක් නොවුණු ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමුකෙරෙන බව ද අවධාරණය කළ යුතු ය.

**ප්‍රමුඛ පදඃ** හර්තෘහරී, ශෘංගාර ශතකය, ස්ත්‍රී ප්‍රයෝග, ස්ත්‍රී ස්වභාව

# A Critical Study on Gimmicks (of Women) in Femininity on Sringara Sataka of Bharthrihari

U.W.N. Subashani
Department of Sinhala, University of Kelaniya.
nadeeshasuba1996@gmail.com

**Abstract**

Showing extreme modesty, shyness, pampering behaviour, and politeness are referred to as gimmicks of femininity. It is known that the poets of both Western and Eastern traditions tried to give various interpretations of female nature in their works. This is especially evident when focusing on works belonging to the Sanskrit poetic tradition. As a research problem, the kinds of female Gimmicks that are evident through *Sringara sataka* of Bharthrihari will be examined. The purpose of this research is to criticise the nature of Gimmicks of femininity by focusing on Sringara Sataka of Bharthrihari. Femininity is sometimes despised and sometimes glorified as supporting the existence of the world. It is expected here to study the nature of women based on the Gimmicks mentioned in the Sringara Sataka. The woman who is prominent in the Sringara Sataka is sometimes seen as pitiable, a stimulant of lustful feelings, a sublime human being, and sometimes as a creature to be dismissed with contempt. As the limitations, only the feminine effects that are evident in the Sringara sataka of Bharthrihari will be focused on. According to the qualitative research methods, the Sinhala edition of Ariyapala Gunasena's Sringara sataka will be focused as the primary source. Under the secondary sources, the theses of Indian professors and selected documents related to the field are used. In the examination of postgraduate studies that have been conducted so far, only the research on *Sringara sataka* of Bharthrihari and poetical methods has been discussed. But it must be said this research discusses the subtle uses of feminine effects and their aesthetic manifestations. It can be indicated that this research will give opportunities for researchers to study the unseen fields **of** *Sringara sataka* of Bharthrihari**.**

**Keywords:** Bhathrihari, Femininity, Gimmicks, Sringara Sataka

# සද්ධර්මරත්නාවලියෙන් පිළිබිඹු වන දේශීය වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්: තෝරාගත් කතාවස්තු කිහිපයක් ඇසුරෙන්

ඩබ්. එම්. කල්‍යාණි විජේසුන්දර
සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය
kalyani@sinh.cmb.ac.lk
ඒ. කේ. එච්. ධර්මප්‍රිය
භාෂා අධ්‍යයන අංශය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය
harsha@gwu.ac.lk

**සාරසංක්ෂේපය**

අතීත ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ශාස්ත්‍රය සම්බන්ධයෙන් තොරතුරු විමර්ශනය කිරීමේ දී සෙල්ලිපි, වංශකතා සහ ජනප්‍රවාද පමණක් නොව සාහිත්‍ය මූලාශ්‍රය ද උපයෝගී කරගත හැකි ය. අප සතු ව ඇති අනුරාධපුර යුගයේ පටන් අඛණ්ඩව ගලා ආ සාහිත්‍ය ප්‍රවාහයෙන් තත්කාලීන සමාජ තොරතුරු විද්‍යමාන වේ. මෙම පර්යේෂණයෙහි අරමුණ වනුයේ දඹදෙණි යුගයේ රචිත *සද්ධර්මරත්නාවලියෙහි* සාකච්ඡා කෙරෙන දේශීය වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ තොරතුරු හඳුනාගැනීම යි. පැරණි ලංකාවේ වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ වක්‍ර ව තොරතුරු ලබාගත හැකි සාහිත්‍ය මූලාශ්‍රයක් වශයෙන් සද්ධර්මරත්නාවලිය වැදගත් වන්නේ ද යන්න පර්යේෂණ ගැටලුව වශයෙන් යොදාගෙන මෙම පර්යේෂණය සිදු කෙරිණ. දඹදෙණි සමයේ ධර්මසේන ස්ථවිරයන් විසින් රචිත මෙම කෘතිය ධර්මෝපදේශ ලබාදෙන සාහිත්‍ය ග්‍රන්ථයක් වශයෙන් හැඳින්වුව ද මෙමගින් බොහෝ සමාජීය තොරතුරු සාකච්ඡා කිරීම මෙම පර්යේෂණය සඳහා අවධානය යොමු කිරීමට ප්‍රධාන හේතුව විය. එකල ගැමි සමාජයේ විවිධ පැතිකඩ හෙළිකරන වැදගත් තොරතුරු අතර දේශීය වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ සාකච්ඡා කර ඇති තොරතුරු කෙරෙහි අවධානය යොමු කෙරිණ. ගුණාත්මක පර්යේෂණ විධික්‍රමයට අනුව ග්‍රන්ථ පරිශීලනය යටතේ *සද්ධර්මරත්නාවලිය* ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ද දේශීය වෛද්‍ය ශාස්ත්‍රය සම්බන්ධයෙන් රචිත ප්‍රාමාණික කෘති ද්විතීයික මූලාශ්‍රය වශයෙන් ද යොදාගනිමින් අධ්‍යයනය සිදු විය. චක්ඛුපාල තෙරුන් වහන්සේගේ කතාවෙහි නස්‍ය කිරීම, ඇඟ තෙල් ගැල්වීම ආදි ප්‍රතිකාර ක්‍රම ගැන සඳහන් වේ. විෂ බෙහෙත් භාවිත කළ බවට මට්ටකුණ්ඩලී, කාලි යකින්න සහ චක්ඛුපාල තෙරුන් වහන්සේගේ කතාවස්තුව ආදි කතාවස්තුවල සඳහන් වේ. මන්ත්‍රවලින් විෂ නැති කරන ආකාරය ද කසාය, කල්ක සහ තෙල් පානය කරවීම ආදි ප්‍රතිකර්ම පිළිබඳ තොරතුරු ද හමු වේ. කෘතියෙහි අන්තර්ගත උපමා, රූඪී සහ ප්‍රස්තාව පිරුළු අතර ද වෛද්‍ය ශාස්ත්‍රය හා බැඳුණු 'සෙමට උක් සකුරු කන්න කියන්නා සේ', 'වඳට බෙහෙත් දෙන්නා සේ', 'හුණට තියඹරා යහපතැයි කියන්නවුන් මෙන්' වැනි යෙදුම් හමු වේ. පිරිත් ශ්‍රවණය කර පිරිත් පැන් පානයෙන් පසු දරු ප්‍රසූතිය පහසු වූ බවට ද රෝග සඳහා පත්‍යාපත්‍ය ආහාර වර්ග භාවිත කළ බව ද කියැවේ. මේ අනුව දේශීය වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ පැරණි සාහිත්‍ය ග්‍රන්ථවල තොරතුරු සඳහන් බව විශ්ලේෂණය කළ හැකි ය. මෙම පර්යේෂණය දේශීය වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ පර්යේෂණයන්ට වෛද්‍ය ග්‍රන්ථවලින් පමණක් නොව සම්භාව්‍ය සිංහල සාහිත්‍ය ග්‍රන්ථවලින් ද බොහෝ තොරතුරු ලබාගත හැකි බව නිගමනය කිරීමට සාක්ෂ්‍ය වන බව පැහැදිලි ය.

**ප්‍රමුඛ පදඃ** දඹදෙණි යුගය, දේශීය වෛද්‍ය ශාස්ත්‍රය, ධර්මසේන හිමි, සද්ධර්මරත්නාවලිය, සමාජීය තොරතුරු

# An Analytical Study of Indigenous Medicine as Reflected in Saddharmaratnavaliya: with Selected Stories

Kalyani Wijesundara
University of Colombo
kalyani@sinh.cmb.ac.lk
A.K.H. Dharmapriya
harsha@gwu.ac.lk

**Abstract**

Not only inscriptions, chronicles and legends, but also literary sources can be used when investigating information regarding local medicine in Sri Lanka in the past. Contemporary social information is evident from the continuous flow of literature since the Anuradhapura period. The aim of this research is to identify the information about the local medical science discussed in the *Saddharmaratnavaliya* written in the Dambadeni period. This research was conducted focusing on the research problem of whether *Saddharmaratnavaliya* is important as a literary source from which information can be obtained indirectly about the 'medical practice of ancient Sri Lanka'. Although this book written by Dharmasena Thero in the Dambadeni period is known as a literary book that gives Dharmopadesa, it discusses many social information, which was the main reason for focusing on this research. Among the important information that reveals the various aspects of the village society at that time, attention was paid to the information discussed about local medicine. According to the qualitative research method, the study was conducted by using the *Saddharmaratnavaliya* as the primary source and authentic works written on local medicine as the secondary source under the bibliography.In the story of '*Chakkhupala Therunge Kathawa'*, there are mentions of treatments such as nasya, body oiling etc. The use of poisonous medicine is mentioned in stories like *Mattakundali, Kali Yakkhinni* and *Chakkupala Therunge Katha*. There is also information on how to eliminate poisons with mantras and remedies like *decoction, kalka and oil*. Among the parables, rudhis and prastavas contained in the work, there are also expressions associated such as *'Semata uk sakuru kanna kanna se'*, *'Vandata beheth denna se'*, *'Hunata thiembara yahapathei'*. It is said that after listening to *Pirith* and drinking *Pirith wathura,* childbirth became easier and that leafy foods were used for diseases. Thus it can be analysed that information is mentioned in the old literary books about local medicine. It is clear that this research gives evidence to conclude that the researches on indigenous medicine can get a lot of information not only from medical books but also from classic Sinhala literary books.

**Keywords:** Dambadeni Yugaya, Dharmasena Thero, Indigenous Medicine, Saddharmaratnavaliya, Social Information

# සද්ධර්මාලංකාරයෙහි ලංකාද්වීපෝත්පන්න කථාවලින් පිළිබිඹු වන තත්කාලීන සමාජයේ ආර්ථික තත්ත්වය: තෝරාගත් කථා පහක් ඇසුරෙන්

එච්. පී. සුසිල් සිරිසේන

හාපිටිගම් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය

susilsirisena@gmail.com

**සාරසංක්ෂේපය**

ශ්‍රී ජයබාහු ධර්මකීර්ති මාහිමියන් විසින් ලියන ලදැයි සැලකෙන **සද්ධර්මාලංකාරය** අයත් වන්නේ ගම්පොළ සාහිත්‍ය අවදියට ය. ඒ සඳහා ඇසුරු කරගෙන ඇත්තේ පාලි **රසවාහිනිය** යි. පාලි භාෂාවෙන් පැවති ශ්‍රී සද්ධර්මය එම බසින් හදාරන්නට නොහැකි, එම බස නොහදාළ ජනතාවට ද කියවන්නට සලස්වා ඔවුන් තුළ ශ්‍රද්ධාව හා බුද්ධිය වර්ධනය කිරීම *සද්ධර්මාලංකාරය* ලිවීමේ අරමුණ බව කතුවරයා සඳහන් කරයි. *සද්ධර්මාලංකාර*යේ අන්තර්ගතය වර්ග වශයෙන් සූවිස්සකින් ද කථා වශයෙන් 150කින් ද සමන්විත වේ. මෙහි ඇතුළත් කථා වස්තු ජම්බුද්වීපෝත්පන්න කථා සහ ලංකාද්වීපෝත්පන්න කථා වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට වෙන් කළ හැකි ය. ජම්බුද්වීපෝත්පන්න කථා වස්තුවල දඹදිව උපන් කථා අන්තර්ගත වන අතර, ලංකාවේ විවිධ පරිසර හා ප්‍රදේශ ආශ්‍රය කොටගත් කථා ලංකාද්වීපෝත්පන්න කථා වස්තුවල අන්තර්ගත වේ. මෙම පර්යේෂණ ලිපියේ ප්‍රධාන අරමුණ වන්නේ, *සද්ධර්මාලංකාර*යේ ලංකාද්වීපෝත්පන්න කථාවලින් හෙළි වන තත්කාලීන සමාජයේ ආර්ථික තත්ත්වය පිළිබඳ විශ්ලේෂණාත්මක විවරණයක් සැපයීම යි. පැරණි සම්භාව්‍ය කෘති බොහෝමයක් ජම්බුද්වීපයෙහි දී සිදු වුණු සිද්ධි හා චරිත ආශ්‍රයෙන් නිර්මිත කෘති වේ. ලංකාවේ අද්දැකීම් හා පරිසරය ආශ්‍රයෙන් ලියවුණු කෘති ඇත්තේ අල්ප සංඛ්‍යාවකි. ඒ අතර *සද්ධර්මාලංකාර*යට සුවිශේෂ තැනක් හිමි වේ. එහි ලංකාද්වීපෝත්පන්න කථාවලින් සමකාලීන සමාජයේ මිනිසුන්ගේ චර්යා රටා, ජීවන අද්දැකීම්, ආර්ථික තත්ත්වය, දේශපාලන තත්ත්වය ආදි තොරතුරු දැන ගැනීමට පිටුබලයක් සැපයෙයි. *සද්ධාර්මාලාංකාර*යේ කථා වස්තු මඟින් පිළිබිඹු වන සමකාලීන සමාජයේ ආර්ථික තොරතුරු අධ්‍යයනයන්හි රික්තකයක් ව පවතී. මේ සඳහා පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් සන්ධාර විශ්ලේෂණය තෝරා ගැනිණි. ඒ අනුව *සද්ධර්මාලංකාරය* කෘතියත් ඒ පිළිබඳ විවිධ විද්වතුන් විසින් සම්පාදිත කෘති හා ලිපි ලේඛන පරිශීලනය කිරීම මඟින් ලබා ගන්නා, සමකාලීන සමාජයේ ආර්ථික තොරතුරු ආශ්‍රිත දත්ත විශ්ලේෂණයට භාජනය කෙරේ. *සද්ධර්මාලංකාර*යේ ලංකාද්වීපෝත්පන්න කථා හැටකට අධික සංඛ්‍යාවක් ඇතුළත් ව ඇත. එයින් බෝධිරාජ වර්ගයේ ශ්‍රද්ධා සුමනා වස්තුවත් ආරඤ්ඤක වර්ගයේ උත්තරෝලිය වස්තුවත්, සාලිරාජ වර්ගයේ නකුල වස්තුවත්, තම්බසුමන වර්ගයේ තම්බසුමන වස්තුවත්, සංඝදත්ත වර්ගයේ නන්දිවාණිජ වස්තුවත් පර්යේෂණය සඳහා පදනම් කර ගැනිණි. එම කථා වස්තු අධ්‍යයනය කොට සමකාලීන සමාජයේ මිනිසුන්ගේ ආර්ථික තත්ත්වය, රටේ ආර්ථික තත්ත්වය, වෙළෙඳාමෙහි ස්වභාවය, ප්‍රවහනය, මහාමාර්ග ඇතුළු යටිතල පහසුකම්වල තත්ත්වය පිළිබඳ ඉදිරිපත් කෙරෙන විශ්ලේෂණාත්මක තොරතුරු මෙම පර්යේෂණයෙන් අපේක්ෂිත ප්‍රතිඵල වේ.

**ප්‍රමුඛ පද**: ආර්ථික තත්ත්වය, ජම්බුද්වීපොත්පන්න කථා, ලංකාද්වීපෝත්පන්න කථා, සම්භාව්‍ය කෘති

# Economic Situation of Contemporary Society as Reflected in Sri Lankan Stories of Saddharmalankaraya (Based on Five Selected Stories)

H.P.Susil Sirisena

Hapitigam National College of Education

susilsirisena@gmail.com

## Abstract

Saddharmalankara, believed to have been written by Rev. Sri Jayabahu Dharmakirti, belongs to the Gampola period of literature, which has associated the Pali Rasavahini. The author mentions that the purpose of writing Saddharmalankara is to make people who do not know that language to read Sri Saddharma which was in Pali and to develop their faith and intelligence. The content of Saddharmalankara consists of 28 categories and 150 stories. The stories included here can be divided into two main parts: Jambudvipotpanna stories and Lankadvipotpanna stories. Jambudvipotpanna stories contain stories originated in Dambadiva, and Lankadvipotpanna stories contain stories related to different environments and regions of Sri Lanka. The objective of this research paper is to provide an analytical commentary on the economic situation of contemporary society as revealed in the Sri Lankan stories of Saddharmalankara. Many of the old classics were based on events and characters that happened in Jambudvipa. There are only a few books written about experiences and environment related to Sri Lanka. Among them, Saddharmalankara holds a special place. Its Sri Lankan stories provide great support to know the behaviour patterns, life experiences, economic situation, political situation etc. of people who lived in contemporary society. The research problem here is the lack of studies on the economic information of contemporary society, as reflected by the stories of Saddharmalankara. For this purpose, correlation analysis was chosen as the research methodology. Accordingly, the data related to the economic information of contemporary society obtained by referring to the book Saddharmalankaraya and the books and documents written by various scholars about it will be subjected to analysis. Saddharmalankara includes more than sixty stories of Lankan origin. From that, Shraddha Sumana story of Bodhiraja category, Uttaroliya story of Arannaka category, Nakula story of Saliraja category, Thambasumana story of Thambasumana category and Nandivanija story of Sanghadatta category were based for research. The expected results of this research are the analytical information presented about the economic situation of the people in contemporary society, the economic situation of the country, the nature of trade, the condition of transportation, highways, and other infrastructure.

**Keywords** : Categories, Classic Economic situation, Jambudvipotpanna stories, Lankadvipotpanna stories,

# කෝකිල සන්දේශයෙන් හෙළිවන උපුල්වන් දේව සංකල්පය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ආර්. එම්. රශ්මිකා චන්ද්‍රමාලි
සිංහල අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
rashmichandamali@gmail.com

**සාරසංක්ෂේපය**

සිංහල පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය වන කෝට්ටේ යුගයේ රචිත කෝකිල සන්දේශය සන්දේශාවලියේ දීර්ඝතම කාව්‍යය යි. සිංහල සන්දේශ රචනා කර ඇත්තේ කිසියම් දෙවි කෙනෙකුට යැවෙන පණිවුඩයක ස්වරූපයෙනි. සන්දේශයන්හි අරමුණ යමෙකු අරභයා දේවාශිර්වාදය ලබා ගැනීම වන බැවින් පිහිට පතන සෑම දෙවි කෙනෙකු ම අතිශයෝක්තියෙන් වර්ණනා කිරීමට සන්දේශ කවීහු උත්සුක වූහ. කෝකිල සන්දේශයේ ද උපුල්වන් දෙවි වර්ණනා කර ඇත. කෝකිල සන්දේශයේ පරමාර්ථය වූයේ සපුමල් කුමරුට යාපා පටුනේ පාලන බලය ස්ථාවර කර දෙන ලෙස උපුල්වන් දෙවිඳු වෙත කෝකිලයෙකු අත පණිවුඩයක් යැවීමයි. සපුමල් කුමරු ඇතුළු ඇමති මඬුල්ල හා ජනතාවට උපුල්වන් සුරිඳුගේ දේවාශීර්වාදය ලබාගැනීම මඟින් උපුල්වන් දේව සංකල්පය එකල ප්‍රකට ව පැවති බව හඳුනාගත හැකි ය. මේ අනුව උපුල්වන් දෙවිඳු පිළිබඳ ඓතිහාසික තොරතුරු ගවේෂණය කරමින්, කෝකිල සඳැස්කරුවා උපුල්වන් දේව සංකල්පය සමාජගත කිරීම සඳහා දේව වර්ණනාව නිර්මාණාත්මක ව ඉදිරිපත් කර ඇත්තේ කෙසේ ද යන්න විමර්ශනාත්මක ව කරුණු අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ යි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ කෝකිල සන්දේශය ප්‍රාථමික මූලාශ්‍රය ලෙසත් ඒ හා සම්බන්ධ ග්‍රන්ථ, සඟරා, පුවත්පත් ආදිය ද්විතීයික මූලාශ්‍රය ලෙසත් භාවිත කෙරේ. ලෝක ශාසනය රැකීමේ කර්තව්‍යය උසුලන්නා වූ උපුල්වන් දෙවියන් වර්ණනා කිරීමට කෝකිල සන්දේශ කවියා උත්සුක වී ඇත. දෙවිනුවරින් සිය ගමන අරඹන කෝකිලයා ප්‍රථමයෙන් උපුල්වන් දේවාලයට පිවිස දේවාශීර්වාදය ලබා ගනියි. පුර වැනුම යටතේ පද්‍ය කිහිපයක් උපයුක්ත කොට ගනිමින් දේව වර්ණනාව සිදුකරන කවියා ප්‍රයත්න දරා ඇත්තේ දෙවිඳුගේ කීර්තිය, තේජෝ බල පරාක්‍රමය, ශ්‍රේෂ්ඨත්වය ආදි ලක්ෂණ උත්කර්ෂයෙන් වර්ණනා කිරීමට යි. එමඟින් පැහැදිලි වන්නේ එකල සමාජයේ උපුල්වන් දේව සංකල්පය ප්‍රකට ව පැවති බව යි. මෙම දේව සංකල්පය සමාජයේ ස්ථාපිත කිරීම පිණිස සහ සමාජීය අවශ්‍යතාව සාහිත්‍යයෙන් ඉදිරිපත් කිරීම සඳහා සුදුසු පරිදි කෝකිල සන්දේශය කාව්‍යය නිර්මාණය කොට ඇති බව මෙම පර්යේෂණයෙන් තහවුරු වෙයි.

**ප්‍රමුඛ පද :** උපුල්වන් දෙවි, කෝකිල සන්දේශය, කෝට්ටේ යුගය, දේව වර්ණනාව, දේව සංකල්පය

# A Study of the Concept of God Upulvan Revealed in the Kokila Sandeshaya

R. M. Rashmika Chandamali
Department of Sinhala
University of Kelaniya
rashmichandamali@gmail.com

**Abstract**

*Kokila Sandeshaya* written in the Kotte era, which is considered by many to be the golden age of Sinhala verse literature, is the longest poem of *Sandeshavali*. Sinhala Sandeshas are written in the form of a message for deities seeking for their help. As the purpose of sandesha is to obtain the blessings of god, the poets tend to exaggerate the dieties. In the *Kokila Sandeshaya* God Upulvan has also been praised. The purpose of the *Kokila Sandeshaya* was to send a message in the hand of a *Kokilaya* to God Upulvan to stabilise the ruling power of *Yapa Patuna* to prince Sapumal. It can be recognised that the concept of God Upulvan was popular at that time as the blessings of God Upulvan were sought for Prince Sapumal and the council of ministers and the people. The purpose of the research is to explore the historical information about God Upulvan and how the *Kokila Sandeshaya* poet has creatively presented the praise of god in order to socialise the concept of God Upulvan. Under the qualitative research methodology, *Kokila Sandesha* is used as the primary source and as the secondary sources, books, magazines, and newspapers were referred. *Kokila Sandesha* poet has been concerned with portraying God Upulvan, who is responsible for preserving the world. Kokilaya, who starts his journey from Devinuwara, first entered the temple of Upulvan and got the god's blessing. The Poet who sings the praises of god by using several verses praising the city has tried to glorify god's fame, power, and greatness. It is clear that the concept of God Upulvan was well-known in society at that time. This research confirms that this god concept has been created appropriately for the establishment of society and for presenting social needs through literature.

**Keywords** : Concept of God, God Upulvan, Kokila Sandeshaya, Kotte area, Praise god

# කේ. කේ. සමන්කුමාරගේ කෙටිකතා නිර්මාණ මඟින් පිළිඹිබු වන අධියථාර්ථවාදී හා පශ්චාත් නූතනවාදී අංග ලක්ෂණ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්: තෝරාගත් කෙටිකතා ඇසුරින්

අබ්දීන් රිෂ්නි
පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය
rishniabdeen1989@gmail.com

**සාරසංක්ෂේපය**

ඉංග්‍රිසි භාෂාවේ Surrealism හා Postmodernism යන සංකල්ප සිංහල භාෂාව හා සාහිත්‍යයේ දී අධියථාර්ථවාදය හා පශ්චාත් නූතනවාදය ලෙස භාවිත වේ. අධියථාර්ථවාදය යනු යථාර්ථවාදී රීතිය සමතික්‍රමණය කරමින් එයට නූතනවාදී ලක්ෂණ එක්වීම යි. පශ්චාත් නූතනවාදයේ දී නූතනත්වය සවිඥානක ව බිඳී යයි. 'ප්‍රතිසංස්කරණය' යන්න මෙයට සමීපතම වචනයකි. මෙම සංකල්ප ආරම්භ වීමත් සමඟ නවකතා, කෙටිකතා, කවි, ගීත යනාදි සෑම ක්ෂේත්‍රයකට ම පාහේ මෙකී ලක්ෂණ පැමිණියේ ය. අපරදිග සාහිත්‍යයෙන් ඇරඹුණු මෙම අංග පෙරදිග සාහිත්‍යයට ද පැමිණියේ ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලාංකේය සාහිත්‍ය කලා ක්ෂේත්‍රය නව මඟකට යොමු විය. මෙම අංග ලක්ෂණ තම නිර්මාණ සඳහා යොදාගත් නිර්මාණකරුවෙකු වශයෙන් 1980 දශකයේ කෙටිකතාකරණයට පිවිසි කේ. කේ සමන්කුමාර හැඳින්විය හැකි ය. සාම්ප්‍රදායික සිංහල කෙටිකතාවට අභියෝග කරමින් සම්මත කෙටිකතාවෙන් පරිබාහිර වූ අත්දැකීම් තම නිර්මාණ සඳහා යොදා ගැනීම මෙන් ම නවීනත්වය විසින් සංකීර්ණ කරනු ලැබ ඇති අද්‍යතන සමාජයේ ක්ෂණ භංගුර පැවැත්මකින් යුත් අත්දැකීම් මනෝවිශ්ලේෂණයට තුඩුදෙන අයුරින් විවරණය කිරීමට ඔහු නැඹුරු වී ඇත. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ එකී ලක්ෂණ කේ. කේ සමන්කුමාර තම කෙටිකතා විෂයෙහි යොදාගත් ආකාරය අධ්‍යයනය කිරීම යි. යථාර්ථවාදී සීමාවන් ඉක්මවා යමින් ඔහු විසින් පශ්චාත් නූතනවාදී ලක්ෂණ ස්වකීය කෙටිකතා විෂයෙහි උපයෝගී කරගෙන ඇත්තේ කෙසේ ද යන්න සොයා බැලීම මෙහි පර්යේෂණ ගැටලුව යි. පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ සර්පයෙකු හා සටන්වැද, එක්ටැමකින් මහපොළොවට හා එසඳ මම බලාසිටියෙමි යන කෙටිකතා ප්‍රාථමික මූලාශ්‍රය ලෙස යොදා ගන්නා අතර ද්විතීයික මූලාශ්‍රයාගත තොරතුරු රැසක් යොදාගැනීමට බලාපොරොත්තු වෙමි. ඒ අනුව කේ. කේ. සමන්කුමාර අධියථාර්ථවාදී හා පශ්චාත් නූතනවාදී ලක්ෂණ සිය නිර්මාණ සඳහා යොදාගනිමින් සාම්ප්‍රදායික කතා කලාවෙන් බැහැර ව කෙටිකතා කලාව උඩුයටිකුරු කළ ස්වාධීන ලේඛකයකු බව අධ්‍යයනය අවසානයේ එළඹිය හැකි නිගමනය යි.

**ප්‍රමුඛ පද** : අධියථාර්ථවාදය, කෙටිකතා, කේ. කේ. සමන්කුමාර, පශ්චාත් නූතනවාදය,

# An Investigative Study of the Characteristics of Surrealism and Postmodernism as Reflected in K. K Samankamara's Short Stories: With Reference to Selected Short Stories

Abdeen A.Rishni
University of Kelaniya

**Abstract**

The concepts of surrealism and postmodernism in the English language were prominent themes in the Sinhala language and literature. Surrealism balances the rule of realism and adds modernist features to it, showing the emergence of unconscious thought and conscious thought. Accordingly, in the Sinhala language, these concepts can be seen in all literary genres, such as novels, poems, and short stories. Due to the introduction of these elements from Western literature to Eastern literature, the Sri Lankan literary field also took a new direction. Many writers in Sri Lanka used surrealism and postmodernism in their literary works. Among them, K. K Samankumara is a genius writer who uses surrealism and postmodernism features in his works. He worked to challenge traditional Sinhala short stories and tried to use experiences outside the standard short story in his works, as well as psychoanalytically analyse the existence and experiences of the modern society complicated by modernity. The aim of this research is to study how K. K Samankumara used the features of surrealism and postmodernism in his short stories. The research problem here is to find out how Samankumara has used postmodernist features in his short stories such as *Sarpayeku ha satan wedha, ektemakin mahapolowata, esanda mama bala sitiyemi*. Various primary and secondary sources have been used in the qualitative research method. The conclusion that can be reached in this study is that Samankumara is an independent writer who turned the art of short stories upside down by using elements of surrealism and postmodernism in his works.

**Keywords**: Postmodernism, Saman Kumara, Short stories, Surrealism

# නන්දන වීරසිංහගේ කාව්‍ය නිර්මාණවලින් ප්‍රතිබිම්බිත සාංදෘෂ්ටිකවාදී දර්ශනය පිළිබඳ විමර්ශනයක්

ආර්. ඒ. ධම්මිකා මැණිකේ රණසිංහ
කැලණිය විශ්වවිද්‍යාලය
dhammikaranasinghe923@gmail.com

**සාරසංක්ෂේපය**

දර්ශන සම්ප්‍රදායන් අතර සාංදෘෂ්ටිකවාදයට වැදගත් තැනක් හිමි වේ. ඉන් ප්‍රධාන වශයෙන් කියැවෙන්නේ යමක සාරයට වඩා එහි පැවැත්ම වැදගත් වන බව යි. මනුෂ්‍යයාගේ පැවැත්ම තුළින් ඔහු කවරෙක් ද යන්න නිර්වචනය කළ හැකි බව පවසන සාංදෘෂ්ටිකවාදීන් මිනිස් ජීවිතයට දෙන වැදගත්කමේ අර්ථය කුමක් ද යන්න ප්‍රශ්න කරයි. පුද්ගල නිශ්‍රිතත්වය, සන්තාපය, නෂ්ටාපේක්ෂාව වැනි සංකල්ප සාංදෘෂ්ටිකවාදය හා බැඳී පවතී. නූතන සාහිත්‍ය නිර්මාණ කෙරේ ආවේශයන් සපයන සාංදෘෂ්ටිකවාදය නන්දන වීරසිංහගේ කවියෙන් ප්‍රතිබිම්බිත ආකාරය සාකච්ඡා කිරීම මෙම පර්යේෂණයේ අරමුණ යි. ඒ සඳහා ඔහුගේ *චන්ද්‍ර බිම්බ* හා *ක්ෂණ නියාම* නම් කාව්‍ය ග්‍රන්ථ උපයෝගී කරගැනේ. ඔහු අද්‍යතන සිංහල කාව්‍ය පරිෂදයට දායාද කොට දී ඇති කාව්‍ය කෘති ගණන 12කි. පෙර'පර දෙදිග කාව්‍ය සම්ප්‍රදායන්හි ආවේශය ලබමින් විවිධ අත්හදාබැලීම් සිදුකරමින්, කෘතියෙන් කෘතියට ස්වීය අනන්‍යතාවක් ප්‍රකට කරමින් ස්වකීය කාව්‍ය මාර්ගය පෝෂණය කරගත් හෙතෙම කලින් කලට සිදුවන ප්‍රබල සමාජ විචල්‍යතා දෙස මනා විචාරාක්ෂියක් යොමු කොට ඇත. එහි දී සාංදෘෂ්ටිකවාදී දර්ශනවාදය වෙත වඩාත් නැඹුරු වෙයි. කාව්‍යානුභූතිය, ව්‍යුහාත්මක සංරචනය මෙන් ම භාෂා යෝජනය සම්බන්ධයෙන් සිදුකරන අත්හදාබැලීම් ඔහුගේ කෙටි කවි, ආඛ්‍යාන කවි, නිසඳැස් රචනා මෙන් ම විරිතකට අනුගත ව පබැඳි කාව්‍ය රචනාවලින් හා පරිවර්තනවලින් පැහැදිලි වේ. කාව්‍ය භාෂාවෙහි වචනයක් වචනයක් පාසා ගොනු කරන අරුත් පදාසයත්, නිර්මාණය හා සබැඳි අන්තර්පයීතත්වීය ලක්ෂණත්, පෙර'පර දෙදිග දාර්ශනිකයන්ගේ චින්තන විධි ඇසුරෙන් ස්වීය කොටගත් සිය චින්තන විධියත් වීරසිංහගේ මෑත කාලීන කාව්‍ය නිර්මාණවලින් මනාව ප්‍රතිබිම්බිත ය. ලාංකේය විචාර පරිෂදය තුළ වීරසිංහගේ කවි පිළිබඳ කථිකා සිදු කළ ද ඔහුගේ මෑත කාලීන නිර්මාණවලින් ප්‍රකාශිත සාංදෘෂ්ටිකවාදී දර්ශනය පිළිබඳ සාකච්ඡා වීමේ හා සමාජගත වීමේ රික්තකයක් පවතී. මෙහි දී තත් දාර්ශනික අදහස් අද්‍යතන සිංහල කවීන්ගේ නිර්මාණ කෙරෙහි ආවේශයක් සපයා ඇත් ද යන්න ද සැලකිල්ලට ගැනේ. ප්‍රාථමික, ද්විතීයික මූලාශ්‍රයවලින් දත්ත ලබා ගැනීමට බලාපොරොත්තු වේ. එම මූලාශ්‍රය ඇසුරෙන් ලබා ගන්නා ගුණාත්මක දත්ත සැලකිල්ලට ගන්නා අතර විශේෂයෙන් ම ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් නන්දන වීරසිංහගේ උක්ත කාව්‍ය සංග්‍රහත්, ඔහු සහ තෝරා ගන්නා ලද ඔහුගේ සමකාලීන කවීන් කිහිපදෙනෙකු සමග පවත්වන්නට අපේක්ෂිත සම්මුඛ සාකච්ඡාත් සැලකිල්ලට ගැනේ. ලබා ගන්නා ලද දත්ත පදනම් කරගනිමින් ගැටලුව හා සම්බන්ධ අර්ථකථන රාමුව ගොඩනගා ගනිමින් පර්යේෂණ ගැටලුව සම්බන්ධ ව විචාරාත්මක විමර්ශනයක් කිරීමට අපේක්ෂිත ය.

**ප්‍රමුඛ පදඃ** නන්දන වීරසිංහ, නෂ්ටාපේක්ෂාව, නිශ්‍රිතත්වය, සන්තාපය, සාංදෘෂ්ටිකවාදය

# An Analysis of the Existential Philosophy Reflected in Nandana Weerasinghe's Poetry

R. A. Dhammika Manike Ranasinghe
University of Kelaniya

**Abstract**

In the wider philosophical arena, Existentialism occupies a prominent figure. It quintessentially stands for the significance of the existence of an entity than its essence. While existentialists tend to question the meaning of treating human life with importance, they elucidate the ability to define a human through its existence as well. Abstract concepts like subjectivity, forlornness, anguish, and despair are closely bound with this philosophy. The research expects to explore and discuss the expression of such existentialist ideas that evolved through the literary works of Nandana Weerasinghe. He has been able to publish 12 books of poetry during his career. His two publications, "*Chandra Bimba*" and "*Kshana Niyama*", will be studied and incorporated to explore the influence of existentialist philosophical approaches on the current Sri Lankan poets. He is renowned for his experimenting with both Eastern and Western poetic traditions while displaying his identity to critically address various interactive social issues. His conventional poetry, short poems, narrative poems, essays, and several other translations demonstrate his experiments on conventional poetic elements, structural development, and language utilisation. The meaning added to every word in his poetic language, the intertextual characteristics involved with the work, and the incorporation of the philosophical viewpoints and ideas of Eastern and Western philosophers are evident throughout his recent literary works. Despite his works being widely discussed in the current Sri Lankan literary community, there is a lack of discussion on his most recent works that express his existentialist ideas. Information is expected to be taken from primary and secondary sources. While the key information will be taken into consideration, Nandana Weerasinghe's poetry and an interview to be held with five contemporary writers will be chosen as the primary sources. The interpretive framework will be developed according to the collected information. Certain modern concepts of literary criticism are expected to be utilised. The research will present an analytical, literary exploration related to the issue while maintaining the awareness of the Eastern and Western philosophical concepts that he supported in his poetry.

**Keywords:** Anguish, Despair, Existentialism, Nandana Weerasinghe, Subjectivity

# පැරකුම්බා සිරිතෙන් හෙළිවන ලාංකේය ඓතිහාසික තොරතුරු පිළිබඳ අධ්‍යයනයක්

දිසානායක මුදියන්සේලාගේ සෙනරත් බණ්ඩාර දිසානායක
arch89senarathbandara@gmail.com

**සාරසංක්ෂේපය**

*පැරකුම්බා සිරිත* යනු කෝට්ටේ යුගයේ රචිත ප්‍රශස්ති කාව්‍යයකි. මෙම ප්‍රශස්ති කාව්‍ය හුදෙක් රචනා කරනු ලැබ ඇත්තේ කෝට්ටේ සවැනි පැරකුම්බා රජුගේ ගුණ වර්ණනා කිරීමට හෙවත් ප්‍රශස්තීන් ගායනා කිරීමට ය. මෙම කෘතියෙන් හෙළිවන ඓතිහාසික තොරතුරු *මහාවංශය, දීපවංශය, වංසත්තප්පකාසිනිය, රාජාවලිය*, ආදි වූ ප්‍රාථමික මූලාශ්‍රය හා වර්තමාන ගත් කතුවරුන් විසින් රචනා කරන ලද පර්යේෂණ ලිපි, ග්‍රන්ථ ආශ්‍රය කරගනිමින් ලාංකේය ඓතිහාසික පරිසරය කෙබඳු දැයි පරීක්ෂා කිරිම මෙම පර්යේෂණයේ අරමුණ ය. මෙරට ඓතිහාසික පසුබිම අනුරාධපුර යුගයේ විජය රජුගේ පටන් දෙවනපැතිස් රජු දක්වාත් එතැන් සිට වළගම්බා, ධාතුසේන ආදි අනුරපුර රජුන් ද පොළොන්නරු යුගයේ බලයට පත් වූ මහා පැරකුම්බා රජු වැනි රජවරුන්ගේ ප්‍රාතිහාර්යය හා දන්දීමේ ගුණ කදම්භය දක්වමින් කෝට්ටේ යුගය තෙක් පැවති ඓතිහාසික ක්‍රියාවලිය කෙබඳු ද? මෙම කාලයට අයත් කළ හැකි වෙනත් වංසකතාවලින් තහවුරු නොවන එහෙත් පැරකුම්බා සිරිතෙන් පමණක් හෙළිවන තොරතුරු මොනවා ද? ඒ බව පැරකුම්බා සිරිතෙහි ඓතිහාසික ක්‍රියාවලිය සිත්ගන්නා අයුරින් විග්‍රහයට භාජනය කර ඇත. *පැරකුම්බා සිරිත* කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රජු කෙරෙහි ගොඩනංවා තිබූ ප්‍රශස්තිමය ස්වභාවය මඟහරවා ඓතිහාසික කෘතියක් ලෙස වැදගත් වන ආකාරය විමර්ශනය කෙරේ.

**ප්‍රමුඛ පද :** පැරකුම්බා සිරිත, ප්‍රශස්ති සාහිත්‍යය, ශ්‍රී ලංකාවේ ඉතිහාසය, හයවන පරාක්‍රමබාහු

# A Study of Sri Lanka Historical Information Revealed by Parakumba Siritha

Dissanayake Mudiyanselage Senarath Bandara dissanayake
arch89senarthbandara@gmail.com

**Abstract**

The *Parakumba Siritha* is a Prashasthi Kavya Written in the Kotte Period. The Prashasti Kavyas were simply composed to praise the virtues of King Parakumba, the 6th King of Kotte kingdom. The purpose of this research is to examine what the Sri Lankan historical purse is like by referring to primary sources of *Mahavamsa, Deepawamsa Wamsathapprakshini* and the research articles and books written by current authors. Examining the historical background of the country, from the reign of King Vijaya to Devanam Piyathissa and from King Valagamba and Dhatusena in the Anuradhapura era and to Maha Parakumba of the Polonnaru era until the emergence of Kotte Era, and identifying such the information that is not confirmed by the genealogies but is only revealed by the *Parakumba Siritha* is the purpose of this study. These have been discussed in an interesting manner in the *Parakumba Siritha*. The present study examines how the *Parakumba Sirita*, Kotte, is significant as a historical work, overcoming the idealistic nature built on King Parakramabahu VI.

**Keywords:** King Parakumba XI, Literature, Parakumba Siritha, Prashasthi literature, Sri Lankan history,

# යටත්විජිත සමයේ ස්වදේශිකයා මුහුණ දුන් අධිකරණයේ භාෂා ගැටලුව පිළිබඳ අධ්‍යයනයක් (බැද්දේගම නවකතාව ඇසුරින්)

වයි. ඩී. ප්‍රියංකර
priyankarayd@gmail.com

**සාරසංක්ෂේපය**

රටක යුක්තිය පසිඳලීමේ ආයතනය වන්නේ අධිකරණය යි. බටහිර ජාතීන් විසින් මෙරටට හඳුන්වා දෙනු ලැබූ නූතන අධිකරණ ක්‍රියාදාමය යටත්විජිත සමයේ ක්‍රියාත්මක වූයේ ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙනි. අධිකරණය විසින් ලබා දෙන දඬුවමක් යුක්තිසහගත ක්‍රියාවලියක් යටතේ ක්‍රියාත්මක බවට විශ්වාසයක් ඇති වීම සඳහා අධිකරණ ක්‍රියාවලියට සම්බන්ධ පිරිස්වලට වැටහෙන භාෂාවකින් එම තීරණ ගැනීම අත්‍යවශ්‍ය වේ. යටත්විජිත පාලන අවධියේ අධිකරණ ක්‍රියාදාමය ක්‍රියාත්මක වූයේ කෙසේ දැයි බැද්දේගම කෘතියට විෂය වී තිබේ. නවකතාවක ලක්ෂණ ප්‍රබන්ධමය වුව ද, මෙහි කතුවරයා කෘතිය රචනයේ දී එකල සමාජ පසුබිම තුළ ක්‍රියාත්මක වූ සැබෑ තත්ත්වය සිය නවකතාවට පාදක කරගෙන ඇති බව ඔහුගේ පෞද්ගලික දින සටහන් පරීක්ෂා කිරීමෙන් ද වටහාගත හැකි ය. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ *බැද්දේගම* නවකතාව ඇසුරින් ස්වදේශික ජනයා යටත්විජිත සමයේ අධිකරණ ක්‍රියාවලියේ දී මුහුණ දුන් ගැටලු සමූහය හඳුනා ගැනීම යි. අධිකරණ ක්‍රියාදාමයේ දී යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය උදෙසා එම කටයුත්තට සහභාගි වන පිරිස්වලට වැටහෙන භාෂා මාධ්‍යයක් භාවිත වුව ද යටත් විජිත ස්වාමිවරුන් ස්වදේශික භාෂාවක් අධිකරණ ක්‍රියාදාමයට යොදාගැනීමට උනන්දු නොවූයේ මන්ද? යන පර්යේෂණ ගැටලුව කේන්ද්‍ර කරගනිමින් මෙම අධ්‍යයනය සිදුකෙරෙයි. *බැද්දේගම* නවකතාවේ යටත්විජිත අධිකරණ ක්‍රියාදාමය පිළිබඳ ව දැක්වෙන කරුණු, වුල්ෆ්ගේ දින සටහන් පොතේ අධිකරණ ක්‍රියාදාමය පිළිබඳ දැක්වෙන කරුණු හා මෙකල සමාජ පසුබිම තුළ අධිකරණය ආශ්‍රිත ඇති වූ ගැටලු හඳුනා ගැනීමට ලේඛනාරක්ෂක දෙපාර්තුමේන්තු ලිපි ලේඛන ආදිය කියවීම පර්යේෂණ ක්‍රමවේදය යි. මෙම පර්යේෂණය යටතේ යටත් විජිත යුගයේ ස්වදේශික ජනයා, අධිකරණ ක්‍රියාදාමයේ භාවිත කළ භාෂා ප්‍රතිපත්තිය නිසා පීඩාවට පත් වූ බව නිගමනය කෙරෙයි. මෙරට සමාජයට නව අත්දැකීමක් වූ යටත්විජිත අධිකරණ ක්‍රියාවලිය සඳහා ආදේශ කළ හැකි භාෂා ප්‍රස්තරයක් නොතිබීමත්, රජයේ ආයතනවල ඉංග්‍රීසියෙන් කටයුතු කිරීම භාෂා ප්‍රතිපත්තිය වීමත්, අධිකරණ ක්‍රියාදාමය පොදු භාෂා ප්‍රතිපත්තියට වඩා ස්වදේශිකයාගේ ජන ජීවිත කෙරෙහි ඍජු ව බලපාන ක්ෂේත්‍රයක් බව හඳුනා නොගැනීමත් යන ගැටලු මෙම පසුබිමේ තිබේ. දේශපාලන අයිතිවාසිකම්වලින් සමාජ ක්‍රමයෙන් බලගැන්වෙන පසුබිම දී පොදුජන අයිතිවාසිකම් කේන්ද්‍ර කරගත් දේශපාලන ක්‍රියාකාරකම් සමාජයේ උත්සන්න වීමත් හේතු කොටගෙන අධිකරණ ක්ෂේත්‍රයේ මෙම ගැටලුව සමාජ කතිකාවක් බවට පත් වී ඇති බව ද පර්යේෂණයේ සොයාගැනීම් වේ.

**ප්‍රමුඛ පදඃ** අධිකරණය, බැද්දේගම , යටත් විජිත සමාජය, ස්වදේශිකයා

# Language Barrier Faced by Natives in Colonial Courts: A Study Based on 'The Village in the Jungle'

Y. D. Priyankara
priyankarayd@gmail.com

**Abstract**

The judiciary plays a pivotal role in upholding law and justice within any nation. During the British colonial period, the judicial system introduced to Sri Lanka operated exclusively in English. To foster trust and confidence in the judgments delivered, it is imperative to conduct judicial proceedings in a language understood by the citizens. *'The Village in the Jungle'*, is a novel that provides a glimpse into how the judicial process unfolded during colonial times. While a novel is a work of fiction, the author's journal records suggest that he drew inspiration from the actual circumstances of contemporary society. This research endeavors to identify and analyse the challenges confronted by native communities due to language barriers within the court system. While the importance of employing a language comprehensible to citizens in the judicial process is acknowledged, this study delves deeper into the question of why colonial authorities were hesitant to adopt native languages for judicial purposes. Drawing data from a content analysis of *'The Village in the Jungle*', Leonard Wolf's journal entries, and archived documents, this study sheds light on the difficulties faced by native communities in the judicial processes due to language barriers during colonial times. The findings of this study reveal that native communities encountered significant difficulties during the colonial era due to language policies in the judicial process. Several underlying causes of this, such as the absence of an adaptable native language stratum for colonial judicial proceedings, English serving as the working language in all government institutions, and a failure to recognise the judicial process as a matter impacting the lives of ordinary citizens, rather than just a component of general language policy, are recognised by this study. Additionally, this study reveals that political movements advocating for the rights of ordinary citizens and community empowerment contributed to the emergence of a discourse regarding this issue within the contemporary society.

**Keywords:** Colonial society, Courts, Justice, Native communities, The Village in the Jungle,

# කේ. ජයතිලකගේ නිර්මාණ කෘතිවල හමුවන ක්ෂුද්‍ර ප්‍රබන්ධමය ආකෘතීන් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

හොරගල විමලතිස්ස හිමි
සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය
horagalavimalathissa@gmail.com

**සාරසංක්ෂේපය**

මෙම පර්යේෂණය සිංහල කෙටිකතාවේ නව උපශානරයක් වෙත අවධානය යොමු කරයි. 'Microfiction', 'Flash Fiction', 'Very Short Story' වැනි විවිධ නාමයන්ගෙන් හඳුන්වන මෙම ශානරය 'ක්ෂුද්‍ර ප්‍රබන්ධමය කෙටිකතා' ලෙස හඳුන්වනු ලැබේ. කේ. ජයතිලකගේ (1926-2011) නිර්මාණ කෘතිවල හමුවන ක්ෂුද්‍ර ප්‍රබන්ධමය ආකෘති පිළිබඳ ව විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ යි. කේ. ජයතිලකගේ නිර්මාණ කෘතිවල ක්ෂුද්‍ර ප්‍රබන්ධමය ආකෘති හමුවන්නේ ද? ඔහුගේ මුල්කාලීන සහ පසුකාලීන ක්ෂුද්‍ර ප්‍රබන්ධ අතර ආකෘතිමය වෙනස්කම් පවතී ද? යන්න මෙහි පර්යේෂණ ගැටලු වේ. මෙහි දී පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ කේ. ජයතිලක විසින් විරචිත *ව්‍යංගා* (1960), *කුඩුගොත් රචනා* (1992), *අන්පසුරු* (2010), *සංකල්පන* (2011), *නිරිබන* (2011) යන කෘති පරිශීලනය කෙරිණි. මෙම කෘති සම්බන්ධ ව ශාස්ත්‍රීය වශයෙන් අවධානය යොමු කළ විද්වතුන් කිහිපදෙනෙකු සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡා ඔස්සේ ද කරුණු එක්රැස් කළ අතර, සියලු දත්ත විශ්ලේෂණයෙන් අනතුරුව අවසන් නිගමනවලට එළඹුණි. සිංහල ක්ෂුද්‍ර ප්‍රබන්ධමය කෙටිකතා කලාවේ විකාසනය විමසන විට හමුවන මුල් ම කෘතිය වන්නේ මහගම සේකර සමගින් කේ. ජයතිලක එක් ව රචනා කළ **ව්‍යංගා** කෘතිය යි. අනතුරුව කේ. ජයතිලකගේ අවධානය මෙම කුඩා ගද්‍ය විශේෂය කෙරෙහි යොමු වී ඇති බව ඔහුගේ පසුකාලීන කෘතිවලින් හෙළි වේ. සිංහල කෙටිකතාවලට සාපේක්ෂ ව ක්ෂුද්‍ර ප්‍රබන්ධවල ආකෘතිය වෙනස් ස්වරූපයකින් යුක්ත ය. ක්‍රියාව, චරිත, පසුබිම, කාල සීමාව, අන්තර්පයීතත්වය සහ අවසානය මෙහි දී එකිනෙකට වෙනස් වේ. කේ. ජයතිලකගේ ක්ෂුද්‍ර ප්‍රබන්ධ සෙසු ක්ෂුද්‍ර ප්‍රබන්ධ සමගින් සංසන්දනය කළ විට නිගමනය කළ හැකි වන්නේ ඒවායේ වචන සීමාව ඉතා අල්ප අගයක් ගන්නා බව යි. ඔහුගේ ක්ෂුද්‍ර ප්‍රබන්ධවල අන්තර්පයීතත්වය බහුල ව දක්නට ලැබේ. ලෝක ප්‍රකට චරිත සහ සම්භාව්‍ය සාහිත්‍යයෙහි හමුවන චරිත ඔහුගේ කතාවල බහුල ව හමු වේ. කේ. ජයතිලකගේ මුල්කාලීන සහ පසුකාලීන ක්ෂුද්‍ර ප්‍රබන්ධ අතර ආකෘතික වශයෙන් විවිධත්වයක් පවතී. ව්‍යංගා කෘතියෙහි පවතින උපමා කතා ස්වරූපය පසුකාලීන කෘතිවල දක්නට නොලැබෙන අතර, එම ක්ෂුද්‍ර ප්‍රබන්ධවල ආකෘතිමය වශයෙන් විවිධත්වයක්, සංක්ෂිප්ත භාවයක් මෙන් ම සංවර්ධනයක් ද දක්නට ලැබේ. ඇතැම් කතාවල නාට්‍යමය සංවාද, අක්ෂර රටා සහ ගණිතමය සංකේත භාවිත කර ඇත. මෙම කරුණුවලට අනුව කේ. ජයතිලකගේ කෘතිවලින් ක්ෂුද්‍ර ප්‍රබන්ධමය ආකෘතීන් හමුවන බවත්, ඔහුගේ මුල්කාලීන සහ පසුකාලීන ක්ෂුද්‍ර ප්‍රබන්ධ අතර පැහැදිලි වෙනස්කම් දක්නට ලැබෙන බවත් නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද :** ආකෘතිය, කේ. ජයතිලක, ක්ෂුද්‍ර ප්‍රබන්ධ, සිංහල කෙටිකතාව, සිංහල ක්ෂුද්‍ර ප්‍රබන්ධමය කෙටිකතා කලාව

# Micro-Fictional Structures in the Books of K. Jayathilaka : An Investigative Study

Rev. Horagala Vimalathissa
Department of Sinhala, University of Colombo.
horagalavimalathissa@gmail.com

**Abstract**

This research focuses on a new genre of Sinhala short stories. This genre known by different names like 'Micro-fiction', 'Flash Fiction', 'Very Short Story' etc. is known as 'Micro Fiction Short Stories' in Sri Lanka. The purpose of this research is to investigate the micro-fictional patterns found in the books of K. Jayathilaka (1926-2011). The research problems here are whether micro-fictional forms are found in K. Jayathilaka's books, and whether there are stylistic differences between his early and later micro-fictions. Here, I use the five books written by K.Jayathilaka, *Vyanga* (1960), *Kudugoth Rachana* (1992), *Athpasuru* (2010), *Sankalpana* (2011), and *Niribatha* (2011). Additionally, collected information through the interviews conducted with several scholars who were academically focused on these books, and the data analyzed to come to the final conclusions. Considering the evolution of the Sinhala micro-fiction short story, the first book I found was *Vyanga* written together with Mahagama Sekara. It has been revealed in his later books and said his attention has been focused on this small type of prose. Compared to Sinhala short stories, the format of micro-fiction is different. Here, the action, characters, background, period, intertextuality, and end are different. When compare K. Jayathilaka's micro-fictions with other writers, I could conclude that the word limit has been very special. The allegorical form of his and Mahagama sekara's book *Vyanga* is not found in the later books. There are stylistic diversity between K. Jayathilaka's early and later micro-fictions. Some stories use dramatic dialogues, character patterns and mathematical symbols. According to these facts, it can be concluded that micro-fiction forms are found in K. Jayathilaka's books, and that there are clear differences between his early and later micro-fictions.

**Keywords** : K.Jayathilake, Micro-fiction, Sinhala Micro-fiction, Short Story Art, Sinhala Short Story, Structure.

# මායා යථාර්ථවාදී සිංහල ක්ෂුද්‍ර ප්‍රබන්ධමය කෙටිකතාවල අන්තර්ගතයේ සහ ආකෘතියේ විශේෂතා පිළිබඳ අධ්‍යයනයක් : තෝරාගත් කෙටිකතා සංග්‍රහ ඇසුරිනි

ඉවන්තා සඳුනි ජයසේන
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
iwanthasanduni@gmail.com

**සාරසංක්ෂේපය**

කෙටිකතාව ලොව පුරා ජනප්‍රිය සාහිත්‍යාංගයකි. වර්තමානයේ ජනප්‍රිය සාහිත්‍ය උපශානරයක් ලෙස ක්ෂුද්‍ර ප්‍රබන්ධමය කෙටිකතා හැඳින්විය හැකි ය. සමකාලීන මනුෂ්‍ය ජීවිතයෙහි යම් සිද්ධියක් ආශ්‍රය කර ගනිමින් මනුෂ්‍ය චරිත ක්ෂණික ව අනාවරණය කර හෝ ආඛ්‍යානමය අවස්ථාව ප්‍රධාන කරගනිමින් ලියන කතා ක්ෂුද්‍ර ප්‍රබන්ධමය කෙටිකතා වේ. මායායථාර්ථවාදී සිංහල ක්ෂුද්‍ර ප්‍රබන්ධමය කෙටිකතාවල අන්තර්ගතයේ සහ ආකෘතියේ විශේෂතා කෙබඳු ද යන්න යෝජිත පර්යේෂණයේ ගැටලුව යි. මායායථාර්ථවාදය සහ ක්ෂුද්‍ර ප්‍රබන්ධමය කෙටිකතා යන්න න්‍යායිකව හඳුනා ගනිමින් මායායථාර්ථවාදී සිංහල ක්ෂුද්‍ර ප්‍රබන්ධමය කෙටිකතාවල ආකෘතියේ සහ අන්තර්ගතයේ විශේෂතා හඳුනාගැනීම මෙම පර්යේෂණයේ මූලික අරමුණු විය. එහි දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ පුස්තකාල සහ අන්තර්ජාල පරිශීලනය කොට දත්ත රැස්කර එම දත්ත විස්තරාත්මක ක්‍රමය උපයෝගී කරගනිමින් විශ්ලේෂණය කරනු ලැබී ය. සිංහල ක්ෂුද්‍ර ප්‍රබන්ධ ලෙස මෙහි දී හඳුනා ගන්නේ ලියනගේ අමරකීර්තිගේ කෙටිකතා කලාව කෘතියේ වචන 1000ට අඩු ‘කෙටිම කෙටිකතා’ ලෙස හඳුන්වන සාහිත්‍ය උපශානරය යි. සිංහල ක්ෂුද්‍ර ප්‍රබන්ධමය කෙටිකතා වෙන ම ශානරයක් ලෙස හඳුනා ගන්නේ ඉතා මෑතක දී ය. තුන්වන ලෝකයේ රටවල ජනප්‍රියත්වය දිනාගත් විචාරවාදයක් වශයෙන් මායායථාර්ථවාදය හැඳින්විය හැකි ය. මෙය යථාර්ථවාදයෙහි සංකීර්ණත්වය පිළිබිඹු කරන සංකල්පයකි. ආශ්චර්යවත් සිදුවීම් මගින් යථාර්ථය ගැඹුරින් ප්‍රතිනිර්මාණයට උත්සාහ දැරීම සහ රූපනාත්තරණය මායායථාර්ථවාදයේ ලක්ෂණ ද්වයකි. මායායථාර්ථවාදි ක්ෂුද්‍ර ප්‍රබන්ධමය කෙටිකතාවල පොදුවේ ආරම්භයක්, මැදක් හා අවසානයක් ඇත. තේමාත්මක ව ගොඩනැගුණු කතා ප්‍රවෘත්තියක් හා ඒකාබද්ධතාව මත ගොඩනැගුණු කතා වින්‍යාසයක් ද වේ. වචන භාවිත කර ඇත්තේ අරපිරිමැස්මෙනි. සිදුවීම් සඳහා වැඩි ඉඩක් ලැබී ඇත. කිසියම් රිද්මයක් ඇත. සියුම් බව සඳහා වැඩි ඉඩක් තිබේ. රචනෝපක්‍රම භාවිත කර ඇත. විශේෂයෙන් හඳුනාගත හැකි ලක්ෂණය වන්නේ සංකේත භාවිතය යි. ධ්වනිතාර්ථ හා ව්‍යංග්‍යාර්ථ බහුල යි. මායායථාර්ථය තුළින් යථාර්ථය නිරූපණය කරයි. ඒ අනුව මායායථාර්ථවාදි ක්ෂුද්‍ර ප්‍රබන්ධමය කෙටිකතාවල කලාත්මක සහ අර්ථාන්විත ආකෘතියක් සහ අන්තර්ගතයක් දැකගත හැකි අතර එය පාඨකයා සක්‍රීය පාඨකයෙකු බවට පත් කරයි.

ප්‍රමුඛ පදඃ අන්තර්ගතය, ආකෘතිය, ක්ෂුද්‍ර ප්‍රබන්ධමය කෙටිකතා, කෙටිකතාව, මායායථාර්ථවාදය

# A Study of Specialties of the Content and Form in Magical Realistic Micro fictional Short Stories (based on selected short stories)

Iwantha Sanduni Jayasena
University of Peradeniya
iwanthasanduni@gmail.com

**Abstract**

The short story is a popular form of literature all over the world. Micro fictional short stories can be called as one of the most popular literary subgenres today. They are based on an incident in contemporary human life, with immediate human characters revealed or with the narrative moment as the main focus. The research problem is What are the characteristics of the content and form of magical realism sinhala micro fictional short stories. The main purpose of this research was to theoretically identify magical realism and micro fictional short stories and to identify the specialties of the content and form the magical realism sinhala micro fictional short stories. There, data was collected by using the library and the internet through the qualitative research method and the data was analyzed using the descriptive method. Sinhala micro-fiction is identified here as the literary genre known as 'ketima ketikata' of less than 1000 words in Liyanage Amarakirthi's book The Art of Short Stories. It is only recently they have been recognized as a separate genre. Magical realism can be called as a criticism that has recently gained popularity in third world countries. This is a critical concept that reflects the complexity of realism. Transfiguration and the attempt to deeply recreate reality through miraculous events are two hallmarks of Magical realism. There is a beginning, a middle and an end. Words are used sparingly. There is more space for events. There is some rhythm. Techniques are used. A particularly recognizable feature is the use of symbols. Magical Realism represents reality through reality. Accordingly, an artistic and semantic form and content can be seen in the them, which make the reader an active reader.

**Keywords:** Content, Format, Magical Realism, Micro fictional short stories, Short story

# සද්ධර්මාලංකාරයෙහි විද්‍යමාන මායා යථාර්ථවාදී සාහිත්‍ය ලක්ෂණ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්: තෝරාගත් කතා කිහිපයක් ඇසුරින්

දිල්හානි වාසනා ජයරත්න

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

g.dilhaniwasana@gmail.com

**සාරසංක්ෂේපය**

සම්භාව්‍ය ධර්ම ව්‍යාඛ්‍යානයක මූලික අරමුණ ජනයා දහම් මාවතට යොමු කරගැනීම හා ධර්මාවබෝධය ලබාදීම යි. එලෙස හඳුනාගත් ධර්ම ව්‍යාඛ්‍යාන කෘතියක් ලෙස ධර්මකීර්ති සංඝරාජ හිමියන්ගේ *සද්ධර්මාලංකාරය* හඳුනාගත හැකි ය. මෙම ග්‍රන්ථ රචනා කිරීමේ අරමුණ ඉටුකරගැනීමට තත් කතුවරුන් විවිධ සාහිත්‍ය උපක්‍රම භාවිතයට ගෙන ඇත. එලෙස උපයුක්ත කරගත් සාහිත්‍ය උපක්‍රමයක් ලෙස මායා යථාර්ථවාදී සාහිත්‍ය න්‍යාය හඳුනාගත හැකි වේ. මෙම පර්යේෂණයේ දී *සද්ධර්මාලංකාරයේ* විද්‍යමාන මායා යථාර්ථවාදී සාහිත්‍යය ලක්ෂණ හඳුනාගනිමින්, එම කෘතියෙහි අරමුණ සාක්ෂාත්කරණය සඳහා මායා යථාර්ථවාදී සාහිත්‍ය ලක්ෂණ ඉවහල් වී ඇති ආකාරය පරීක්ෂාවට ලක්කිරීම සිදුකෙරුණි. සද්ධර්මාලංකාරයෙන් විද්‍යමාන මායා යථාර්ථවාදී සාහිත්‍ය ලක්ෂණ එම ග්‍රන්ථය රචනා වීමේ අරමුණ සාක්ෂාත්කරණය සඳහා බලපෑම් කරනුයේ කවරාකාරයෙන් ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව යි. පර්යේෂණයේ මූලික අරමුණ නූතන සාහිත්‍ය විචාරවාද ඔස්සේ සම්භාව්‍ය සිංහල සාහිත්‍ය කියවමින් එමගින් තත් කෘතියෙහි අරමුණු සාක්ෂාත්කරණය සඳහා එම විචාරවාදී සාහිත්‍ය ලක්ෂණ භාවිත වී ඇති ආකාරය අධ්‍යයනය කිරීම යි. පුස්තකාල හා අන්තර්ජාල පරිශීලනයෙන් සපයාගත් දත්ත ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ මායා යථාර්ථවාදී සාහිත්‍ය න්‍යාය ඇසුරින් විශ්ලේෂණය කිරීම පර්යේෂණ ක්‍රමවේදය යි. මෙහි දී යුගීය පාඨක, ශ්‍රාවක ජනයා ධර්ම මාවතට යොමු කරගැනීම පිණිස ධර්ම දේශනා කිරීමේ දී සද්ධර්මාලංකාරයෙහි අවස්ථා, සිද්ධි හා චරිත නිරූපණය සඳහා මායා යථාර්ථවාදී ලක්ෂණ දරන අවස්ථා උපයුක්ත කොට ගෙන තිබෙන බව අනාවරණය විය. එම ලක්ෂණ සර්වකාලීන අගයකින් යුක්ත ව ඉදිරිපත් කර ඇති හෙයින් පාඨකයාත් ශ්‍රාවකයාත් සම්භාව්‍ය සාහිත්‍යය කෙරෙහි වැඩි නැඹුරුතාවක් දක්වන බව ද කිව හැකි ය. එමෙන් ම සද්ධර්මාලංකාරය වැනි සම්භාව්‍ය ග්‍රන්ථ හුදෙක් ධර්ම ව්‍යාඛ්‍යානයක් ලෙස පමණක් නොසලකා වර්තමානයේ සාකච්ඡා කෙරෙන නූතන විචාරවාදී චින්තන ධාරාව ඔස්සේ අධ්‍යයනය කරමින් නව අර්ථමාන ගවේෂණය කළ හැකි බව ද අනාවරණය වුණි. ඒ අනුව සම්භාව්‍ය සිංහල සාහිත්‍ය කෘති පශ්චාත් නූතනවාදී විචාර සිද්ධාන්ත ඔස්සේ පඨනය කළ හැකි බව මෙම පර්යේෂණය මඟින් නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද :** ධර්මකීර්ති සංඝරාජ හිමි, ධර්ම ව්‍යාඛ්‍යාන, මායා යථාර්ථවාදය, සද්ධර්මාලංකාරය

# An Investigative Study of the Magical Realism Literary Traits in Saddharmalankara (With Selected Tales)

Dilhani Wasana Jayarathna,

Department of Sinhala, University of Peradeniya,

g.dilhaniwasana@gmail.com

**Abstract**

The main purpose of a classical Dharma discourse is to direct people to the path of Dhamma and to give them an understanding of Dharma. Dharmakirti Sangharaja Thero's *Saddharmalankara* can be recognized as a Dharma commentary work recognized in this way. To accomplish the purpose of writing these books, the authors have used various literary techniques. Magical realism can be identified as a literary technique employed in this way. In this research, is was done by identifying the apparet Magical realism literary features of *Saddharmalankara* and examining how the magical realism literary features have helped to achieve the purpose of that work. The research problem here is how the magical realism literary features of *Saddharmalankara* affect the achievement of the purpose of writing those books. The main purpose of the research is to read classical Sinhala literature through modern literary criticism and thereby study how those critical literary features have been used to achieve the objectives of the work. The research methodology is to analyze the data obtained through the use of libraries and the Internet through the qualitative research method based on Magical realism literary. Here, it was revealed that in order to direct the readers and disciples to the path of Dharma, during the preaching of the Dharma, instances, events and characters in the Tat Grant were used to portray Magical realism characteristics. It can also be said that since those characteristics are presented with an all-time value, the reader and disciple are more inclined towards classical literature. It was also revealed that classical texts such as *Saddharmalankara* can be explored for new meanings by studying them through the current of modern critical thinking, not just as a Dharma explanation. Accordingly, this research can conclude that classic Sinhala literary works can be read through postmodernist critical theories.

**Keywords:** Classical Literature, Dharma Exegesis, Literary Traits, Magical Realism, Saddharmalankara

# ස්ත්‍රිය පිළිබඳ දෘෂ්ටිවාද ප්‍රතිනිර්මාණය වැළැක්වීමෙහි ලා නූතන පද්‍ය කාව්‍යයේ දායකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්: තෝරාගත් නූතන පද්‍ය කාව්‍ය කිහිපයක් ඇසුරින්

බැදිගම්තොට සාරද හිමි
සිංහල අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
bedigamtotasaradahimi@gmail.com

**සාරසංක්ෂේපය**

මිනිසා තම සන්නිවේදන කටයුතු සඳහා මානව භාෂාව භාවිත කරයි. භාෂා ව්‍යවහාරයේ දී මිනිසා විසින් දැනුම්වත් ව හෝ නොදැනුම්වත් ව සන්නිවේදනය කරනු ලබන, බැලූ බැල්මට නිවැරදි යැයි හැඟෙන විචාරාත්මක ව ගවේෂණය කිරීමේ දී නිවැරදි නොවන අදහස්, මතවාද හා සංකල්ප දෘෂ්ටිවාද ලෙස හඳුනාගත හැකි ය. දෘෂ්ටිවාද සමාජීය නිෂ්පාදනයකි. සාමාජයේ කිසියම් පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් දෘෂ්ටිවාද ගොඩනැඟීමේ මූලික පරමාර්ථය ඔවුන් සතු බලය තවදුරටත් පවත්වා ගැනීම වේ. දෘෂ්ටිවාද නිර්මාණය කරන පිරිස් ඒවායේ වලංගුභාවය ආරක්ෂා කරගැනීමට ආගම, සංස්කෘතිය පැරණි උරුමය වැනි සංකල්ප විශේෂයෙන් එම මතවාදවලට සම්බන්ධ කර ගනිති. මේ අයුරින් සෑම සමාජ සංස්ථාවක් ම මුල් කරගනිමින් දෘෂ්ටිවාද බිහි වී ඇත. එම දෘෂ්ටිවාද අතර ස්ත්‍රිය සම්බන්ධ දෘෂ්ටිවාද බහුල ව දැකිය හැකි ය. එබැවින් ස්ත්‍රිය පිළිබඳ දෘෂ්ටිවාද ප්‍රතිනිර්මාණය වැළැක්වීමෙහි ලා නූතන පද්‍යයේ උපයෝගිතාව කවරකාර වේ ද යන්න අධ්‍යයනය කිරීම මෙහි පර්යේෂණ ගැටලුව වේ. ඒ අතරින් ස්ත්‍රිය පිළිබඳ නිමර්ාණය වී ඇති දෘෂ්ටිවාද ප්‍රතිනිර්මාණය වැළැක්වීම සඳහා නූතන පද්‍ය කාව්‍යයේ දායකත්වය පිළිබඳ අධ්‍යයනය මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ. සමාජයේ සෑම මනුෂ්‍යයෙක් ම ලිංගිකත්වය නමැති කාරණයේ දී ජීවවිද්‍යාවට අනුව ස්ත්‍රී/පුරුෂ වශයෙන් දෙවර්ගයකට අයත් වුව ද පොදුවේ සියලු දෙනා අයත් වන්නේ මනුෂ්‍ය වර්ගයට වේ. එහෙත් සමාජය විසින් ගොඩනගන ලද දෘෂ්ටිවාද මුල් කරගෙන ස්ත්‍රිය දෙවන පුරවැසියෙක් බවට ඌනනය කොට තිබේ. ස්ත්‍රියක් වීම නිසා මනුෂ්‍යයෙකුට ලැබිය යුතු වටිනාකම ඇයට අහිමිවීම පිළිබඳ භේදවාචකය සමාජයෙන් තුරන් කිරීමට මෙම පර්යේෂණයෙන් ප්‍රබල දායකත්වයක් සැපයේ. මෙම පර්යේෂණයට අදාළ සාහිත්‍ය විමර්ශනයේ දී නූතන පද්‍ය කාව්‍ය බහුල වශයෙන් ආශ්‍රය කරගත් අතර තවත් බොහෝ සාහිත්‍යය ශානරවලට අදාළ කෘති භාවිතයට ගැනිණි. එසේ ම මෙම අධ්‍යයනයේ දී බටහිර විචාර ධාරාවේ ස්ත්‍රීවාදය සම්බන්ධ න්‍යායික සංකල්ප විශේෂයෙන් භාවිත විය. මෙහි පර්යේෂණ ක්‍රමවේදය ලෙස සාහිත්‍ය මූලාශ්‍රය පාදක කොටගත් ගුණාත්මක ක්‍රමවේදය යොදා ගැනිණි. දත්ත රැස් කර ගැනීමේ දී පුස්තකාල පරිශීලනය හා අන්තර්ජාලයෙන් ලබා ගත් තොරතුරු බෙහෙවින් ප්‍රයෝජනවත් විය. ඒ ඔස්සේ ලබාගත් දත්ත විශ්ලේෂණ විධික්‍රමය යොදා ගනිමින් විමර්ශනය කිරීම සිදුවිය. ඒ අනුව ස්ත්‍රිය පිළිබඳ දෘෂ්ටිවාද බොහොමයක් ප්‍රතිනිර්මාණය වැළැක්වීමට නූතන පද්‍ය මගින් ප්‍රබල දායකත්වයක් සැපයෙන බව නිගමනය කළ හැකි ය. නූතන කවිය සමාජයේ මානව චින්තනය නවමු මෙන් ම ප්‍රගතිශීලී දිශාවකට යොමු කර ඇති අතර විශේෂයෙන් ස්ත්‍රිය පිළිබඳ මානව හිතවාදී කතිකාවක් ගොඩනැගීමට ඒ ඔස්සේ සමත් වී තිබීම ප්‍රශංසනීය වේ.

**ප්‍රමුඛ පද :** දෘෂ්ටිවාද, නූතන පද්‍ය කාව්‍ය, ප්‍රතිනිර්මාණය වැළැක්වීම, ස්ත්‍රිය

# An Investigative Study of the Contribution of Modern Poetry to Countering the Reconstruction of Ideologies about the Woman: From Selected Modern Poems

Rev. Bedigamtota Sarada
Department of Sinhala University of Peradeniya
bedigamtotasaradahimi@gmail.com

**Abstract**

Man has been using human language for his communication activities. Ideas, ideologies, and concepts that are not correct in critical exploration can be identified as ideologies, which are communicated by humans knowingly or unknowingly in the use of language. Ideology is a social product. The primary objective of any creating ideologies by individual or group of individuals in the society is to maintain their power. In order to protect the validity of their ideologies, the people who produce ideologies specially attach concepts like religion, culture, heritage, etc. to those ideologies. In this way, ideologies have been born based on all social institutions. Among those ideologies, ideologies about woman have also been produced. Therefore the research problem here is to study how the use of modern poetry is to prevent the reconstruction of visualism about women. the aim of this research is to study the contribution of modern poetry to prevent the reconstruction of such ideologies. Although every human being in the society belongs to two types of male/female in the matter of sex according to biology, in general, all of them belong to the genus called human. However, two women has gained less power based on society's ideologies. This research makes a strong contribution to eliminate the tragedy of lacking the power a human being deserves due to being a woman. In the literature review related to this research, modern poems were widely consulted and works related to many other literary genres were used. The qualitative method based on the literature sources was used as the research method. Also, in this study, the theoretical concepts of the Western critical studies are especially used. The data was collected from the library references and the Internet. The data was analyzed using the data analysis method. Accordingly, it can be concluded that modern poetry makes a strong contribution to prevent the reconstruction of many negative ideologies about women. Modern poetry directs the human thinking of the society in a new and progressive direction and it is commendable that it is able to build a humanist discourse especially about women.

**Keywords:** Ideology, Modern Poetry, Reconstruction the reproduction, Woman

# සංයුක්ත කවිය පාඨකයාට කොතෙක් දුරට විචාරාත්මකව කියවිය හැකිද යන්න පිළිබඳ විමර්ශනයක් : තෝරාගත් සංයුක්ත කවි කිහිපයක් ඇසුරින්

පී. පී. රංගනී
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
bhagyaugc@gmail.com

**සාරසංක්ෂේපය**

ශබ්දකේන්ද්‍රීයතාව වෙනුවට දෘශ්‍යකේන්ද්‍රීය රසයක් ජනිත කරන්නා වූ නව්‍යතම පද්‍ය ආකෘතියක් වශයෙන් සංයුක්ත කවිය හඳුනාගත හැකි ය. ගී කාව්‍ය ආකෘතියෙන් ආරම්භ වූ සම්භාව්‍ය පද්‍ය ආකෘතිය ක්‍රමානුකූල ව සිව්පද, දෙපද, සඳැස්, නිසඳැස් වශයෙන් විවිධ ආකෘති පසු කරමින් සංයුක්ත කවිය දක්වා පැමිණ ඇත. මෙම කාව්‍යාකෘතිය අනෙකුත් ආකෘතිවලට සාපේක්ෂ ව ආකර්ෂණීය වන අතර දෘශ්‍යරූපී සන්නිවේදනයක් සිදු කරයි. වෙනත් කාව්‍ය ආකෘතිවලට සාපේක්ෂ ව සංයුක්ත කවිය කියවීම උදෙසා පාඨක සබුද්ධිකභාවය බලපානු ලබන්නේ කෙලෙස ද? යන්න පර්යේෂණ ගැටලුව වූ අතර පර්යේෂණයේ මූලික අරමුණ වූයේ සංයුක්ත කවියෙන් නිරූපිත අර්ථය පොදු පාඨකයාට එක හා සමාන ව රසවිඳිය හැකි ද යන්න හඳුනා ගැනීම යි. සංයුක්ත කවියට ඉලක්ක පාඨකයෙක් සිටී ද යන්න හඳුනා ගැනීම අනු අරමුණක් විය. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ගුණාත්මක ක්‍රමවේදය යොදා ගැනුණි. පර්යේෂණ විධික්‍රම වශයෙන් සම්මුඛ සාකච්ඡා සහ ශාස්ත්‍රීය ග්‍රන්ථ පරිශීලනය සිදු කෙරුණි. දෙපද, සිව්පද, නිසඳැස් කාව්‍ය ආකෘති ඔස්සේ කවියා සමස්ත කාව්‍ය සංකල්පනාව ම පාඨකයා කරා රැගෙන යන අතර පාඨකයා එය ස්වකීය බුද්ධි ප්‍රමාණයෙන් රස විඳියි. එහෙත් සංයුක්ත කවියා පාඨකයාට ඇතැම්විට ලබා දෙනුයේ තනි වචනයක් වන අතර පාඨකයා එහි දී වචනාර්ථය අභිභවන ලද දෘශ්‍යමය කියවීමක් කළ යුතු ය. එනම් සංයුක්ත කවිය විචාරාත්මක ව රසවින්දනයෙහි ලා පාඨකයාට කවියා නොපවසන බොහෝ තැන් ස්පර්ශ කරන්නට සිදුවනු ඇත. පාඨකයා ඒ සඳහා විචාරාත්මක චින්තනයෙන් සුපෝෂණය විය යුතු ය. ඒ අනුව පොදු පාඨකයාට එක හා සමාන ව සංයුක්ත කවියෙන් සංග්‍රහ කරනු ලබන බුද්ධිමය කාව්‍ය සංකල්පනා වින්දනය කිරීමට අපහසු බව මෙම පර්යේෂණය ඔස්සේ අනාවරණය විය. එසේ ම සංයුක්ත කවිය සාමාන්‍ය පාඨකයාගෙන් දූරස්ථ වූත් සබුද්ධික පාඨකයින් ආමන්ත්‍රණය කරන්නක් බව තවදුරටත් අනාවරණය කරගත හැකි විය.

**ප්‍රමුඛ පද:** ආකෘතිය, පාඨකයා, දෘශ්‍යකේන්ද්‍රීයතාව, ශබ්දකේන්ද්‍රීයතාව, සංයුක්ත කවිය, සබුද්ධිකභාවය,

# An investigation on the extent to which the reader can critically read the composite poem : Based on few selected composite poem

P.P.Rangani Bhagya Premathilaka
University of Peradeniya
bhagyaugc@gmail.com

**Abstract**

Composite poetry can be identified as an innovative form of verse that generates a visual-centric taste instead of phonetic–centricity. The classical verse form, which started with the lyrical form, has gradually passed through the forms of quatrain poems, couplet poems, free verse and has reached the composite poetry. This form of poetry is attractive compared to other forms and makes a visual 'signification'. How does the reader's intelligence affect the reading of composite poetry compared to other forms of poetry?, is the research problem of this study. The primary objective of this research is to identify whether the meaning conveyed by the composite language can be equally enjoyed by the general reader and the sub-objective would be to identify whether the composite poem has a target readership. To achieve this objective, qualitative method was used as the research method, which was achieved through Interviews and reference to academic writing. The poet conveys the entire poetic concept to the reader through, quatrain poems, couplet poems, free verse and the reader enjoys it with his own intelligence. But the composite poet sometimes gives the reader a single word and the reader must do a visual reading that would surpass the literal meaning. In other words, while critically appreciating the composite poem, the reader will have to 'touch' many places that the poet does not tell. The reader should be 'enriched' with critical thinking in order to achieve this goal. Accordingly, it was revealed through the research that it is difficult for the general reader to think of the intellectual poetic concepts presented in the composite poem. Further, through this research, it was further revealed that the composite poem is far away from the common reader but addresses the intelligent readers.

**Keywords :** Composite Poetry, Intelligibility, Mode, Phonetic - centricity, Reader, Visual centric

# ඓතිහාසික කතාපුවත් නූතනවාදී ව ප්‍රතිනිර්මාණයට රුවන් බන්දුජීව දැක්වූ සාමර්ථ්‍යය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක් (මීළඟ මීවිත පද්‍ය කෘතිය ඇසුරිනි)

පී. එස්. බණ්ඩාරනායක

පේරාදෙණි විශ්වවිද්‍යාලය

prasansandaru222@gmail.com

**සාරසංක්ෂේපය**

රුවන් බන්දුජීවගේ බොහෝ කාව්‍ය නිර්මාණවල පෙනෙන වස්තුවිෂය වර්තමාන සිංහල කවියෙහි කැපීපෙනෙන මුහුණුවරක් ගනී. *මීළඟ මීවිත* කාව්‍ය කෘතිය ඇසුරින් සිදු කරනු ලැබූ මෙම අධ්‍යයනයේ දී ඓතිහාසික කතා පුවත් නූතනවාදී ව ප්‍රතිනිර්මාණයට බන්දුජීව දැක්වූ සාමර්ථ්‍යය පිළිබඳ විචාරාත්මක විමසීමක් සිදුකෙරේ. කවියෙකුගේ පරම වගකීම කුමක් දැයි තේරුම් ගත් කවියකු වශයෙන් රුවන් බන්දුජීව සමාජ යථාර්ථයන්ගේ ගැඹුරු තලයන් ස්පර්ශ කරයි. අතිශය සංක්ෂිප්ත ව රචනා කෙරෙන ඔහුගේ ඇතැම් පද්‍ය සමාජයේ මෙතෙක් වැඩි අවධානයක් යොමු නොවූ පෙදෙසක් ආවරණය කරන්නට සමත් වෙයි. සමාජ ගැටලුවක් සාකච්ඡා කරන බන්දුජීව එම සමාජ ගැටලුව ඓතිහාසික කතා පුවතක් සමග මුසුකරමින් නූතනවාදී ව ප්‍රතිනිර්මාණය කරන්නට තැත් දරනු මෙහි ලා අධ්‍යයනය කරන්නට හැකි විය. එමඟින් නිර්මාණය වඩාත් තීව්‍ර ලෙස සමාජයට මුදාහරින්නට කවියා සමත් වේ. ඉතිහාසගත සිදුවීම්වල නෂ්ටාවශේෂ අදත් හෙටත් සමාජයේ කාලයට අනුරූප ආකාරයෙන් සිදුවෙමින් පවතී. **මීළඟ මීවිතෙහි** 'කුණ්ඩලකේසී' එබන්දකි. වඩාත් නැවුම් සහ අරුම පුදුම ලෙස කවිය නිර්මාණය කරන්නට බන්දුජීව මේ අයුරින් ඓතිහාසික කතා පුවත් යොදා ගැනීමේ දී ඇතැම් විටෙක කතා පුවතේ හරය, තවත් විටෙක චරිත, තවත් විටෙක ඉන් නැගෙන සංකල්පමය තත්ත්ව උචිත අයුරින් නූතන සමාජ සිදුවීම් සමග මුසු කිරීම සිදු කරයි. එය ඉතාමත් නූතනවාදී පරිකල්පනයක් සේ ම, කාව්‍යකරණයට ඓතිහාසික කතා පුවත් යොදාගත්ත ද ඉන් පුරාකතාව සේ ම නූතන සමාජ තත්ත්වය යන ද්වය ම ඡේදනය කොට දැක්වීම අපූර්ව සංසිද්ධියකි. ඓතිහාසික සිදුවීම් වර්තමාන සමාජයේ ඇතැම් සිදුවීම් සමග ඉතා හොඳින් සමපාත වන ආකාරය *මීළඟ මීවිතෙහි* එන 'සැළලිහිණියෝ උඹට කොහොම සතුටක් ඇත් ද' , 'මේනකා' , 'බෞද්ධාලෝක මාවතේ අවුකන අනුරුව' යනාදි කවි කිහිපයකින් ම හඳුනාගත හැකි විය. මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක ක්‍රමවේදය යටතේ දත්ත රැස් කරන අතර ප්‍රාථමික මූලාශ්‍රය ලෙස *මීළඟ මීවිත* පද්‍ය සංග්‍රහය උපයුක්ත කර ගැනුණි. ඒ අනුව මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව වූයේ එම ඓතිහාසික පුවත් රුවන් බන්දුජීවගේ කවි තුළ ප්‍රතිනිර්මාණය වන්නේ කෙසේ ද? යන්න යි. පුරාණ කතාවක් හෝ සිද්ධියක් ප්‍රතිනිර්මාණය කිරීමේ දී බන්දුජීව එය නූතනත්වය සමග ගළපන ආකාරය සාර්ථක ද යන්න විමසීම මේ අධ්‍යයනයේ අරමුණ විය. දැවෙන සමාජ ප්‍රශ්න දෙස සාම්ප්‍රදායික ඇසින් නොබලා ඓතිහාසික කතා පුවත් යොදාගෙන අපූර්ව අයුරින් නූතනවාදී ව ඉදිරිපත් කිරීමට රුවන් බන්දුජීව අතිශය පුළුල් ශක්‍යතාවක් දක්වන බව හඳුනාගත හැකි වීම මෙම පර්යේෂණයේ ප්‍රතිඵලය සේ දැක්විය හැකි ය.

**ප්‍රමුඛ පද** - ඓතිහාසික කතාපුවත්, නූතනවාදී ප්‍රතිනිර්මාණය, වර්තමාන සිංහල කවිය, වස්තුවිෂය, සමාජ ගැටලු

# A critical study of Ruwan Bandujeewa's ability to recreate historical stories in a modernistic way (based on the poetry of Meelanga Meewitha)

P.S. Bandaranayaka

University of Peradeniya

prasansandaru222@gmail.com

**Abstract**

As a prominent feature of present Sinhala poetry, the theme of many of Ruwan Bandujeeva's poetic works takes a different form. The purpose of this study, which was conducted in connection with the poem *'Milanga Meevitha'*, was to engage in a critical study of Bandujiva's ability to recreate historical stories in a modernist manner. As a poet who correctly understood what is the ultimate responsibility of a poet, Ruwan Bandujeeva touches the deeper levels of social realities. In some cases, his poems, which are composed very briefly with three or four verses, are able to cover an area that has not been noticed so far in the society. It can be studied here how Bandujeewa attempts to recreate the social problem in a modernist manner by combining it with a historical story when he discusses a social problem. In this way, the poet is able to release his creation to the society more intensively. The remnants of historical incidents are taking place in society today and tomorrow. '*Kundalakesi*' in *Milanga Meewitha* is one such story. In order to create the poem in a more fresh and surprising way, Bandujeeva sometimes mixes the core of the story, sometimes the characters, and sometimes the conceptual conditions arising from it with modern social events in this way. It is a very modernist imagination and although historical stories are used for poetry, it is a wonderful incident to intersect and present both the historical story and the modern social situation. How historical events coincide with certain events in the present day society can be well identified by several poems such as *'Salalihiniyo umbata kohoma sathutak athda?' , 'Menaka' , 'Bauddhaloka mawathe awukana anuruwa'* , which are included in the *Meelanga Meewitha*. For this study, data is collected under qualitative method and *Meelanga Meewitha* poetry collection was used as a primary source. Accordingly, the main problem of this research was how those historical stories are recreated in Ruwan Bandujeewa's poems. In recreating an ancient story or phenomenon, how wonderfully Bandujeeva juxtaposes it with modernity can be studied in many poems in *Meelanga Meewitha.* It can be recognized that Ruwan Bandujeewa has a very high ability to present the burning issues of the society in a modernist way without looking at the traditional eyes using historical stories and it can be mentioned here as the results of this research.

**Keywords:** Contemporary Sinhala Poetry, Historical stories, Modernistic reconstruction, Object, Social problems

# නූතන සිංහල පද්‍ය සාහිත්‍යයේ ප්‍රස්තුත විවරණය සඳහා ස්ත්‍රීවාදයෙහි උපයෝගීතාව පිළිබඳ අධ්‍යයනයක්

බී. එම්. බී. ජී. තාරුෂිකා ලක්ෂානි ජයරත්න
සිංහල අධ්‍යයන අංශය
පේරාදෙණි විශ්වවිද්‍යාලය
lakshanibm97@gmail.com

**සාරසංක්ෂේපය**

ස්ත්‍රියට එරෙහි ව ක්‍රියාත්මක වන පුරුෂ ආධිපත්‍යයට විරුද්ධත්වය දැක්වීමට ස්ත්‍රීවාදය ආරම්භය විය. ස්ත්‍රීවාදී සාහිත්‍ය විචාරය ඔස්සේ ස්ත්‍රිය කෙරෙහි පවතින සාම්ප්‍රදායික උපකල්පනවලට ප්‍රතිවිරෝධය දක්වයි. ස්ත්‍රීත්වය වූ කලි ස්වභාව ධර්මයෙන් ලද කායික උරුමයකි. එහෙත් ස්ත්‍රීභාවය වූ කලි ඇය දෙස ඇගේ ශාරීරික අවයව කරණ කොටගෙන ගොඩනඟන ලද සමාජ මතවාදයකි. මෙම සමාජ මතවාදය හේතුවෙන් ස්ත්‍රිය බොහෝ අවස්ථාවල දී හිංසාවටත්, පීඩාවටත් ලක්වන්නීය. මෙම පීඩිත ස්ත්‍රියගේ ස්වභාවයත්, එහි යථාර්ථය නිරූපණයත් නූතන සිංහල පද්‍ය ඇසුරින් අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ දී සිදු වේ. ස්ත්‍රීත්වය පදනම් කොටගෙන ගොඩනැඟී ඇති සමාජ සම්මත ඔස්සේ ඇගේ ඛේදනීය තත්ත්වය නූතන සිංහල පද්‍ය සාහිත්‍යය මඟින් සනාථ වන්නේ ද යන ගැටලුව මුල් කරගනිමින් සිදුකළ මෙම පර්යේෂණයේ අරමුණු වූයේ, නූතන සිංහල පද්‍ය සාහිත්‍යය, ස්ත්‍රියගේ ඛේදනීය යථාර්ථය විවරණය කර ඇති ආකාරය අධ්‍යයනය කිරීම හා පුරුෂයාට සාපේක්ෂ ව ස්ත්‍රිය සමාජානුයෝජනය වන ආකාරය අධ්‍යයනය කිරීම යි. මෙකී අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවැසි ගුණාත්මක දත්ත හා තොරතුරු පුස්තකාල පරිශීලනයෙන් සහ විද්‍යුත් මූලාශ්‍රය භාවිතයෙන් සපයා ගැනේ. එමෙන් ම එම දත්ත සහ තොරතුරු විස්තරාත්මක ක්‍රමය උපයෝගී කොටගනිමින් පර්යේෂණය සඳහා උපයුක්ත කොටගැනේ. ගුණාත්මක දත්ත ඔස්සේ සිදුකරන ලද පර්යේෂණයට අනුව ස්ත්‍රිය සංස්කෘතික රාමුවෙන් සීමා කිරීමක් කොට සමාජගත කිරීමට වෑයම් කරන ආකාරය දැකගත හැකි විය. මේ සඳහා භාවිත කෙරෙන ප්‍රාථමික මූලාශ්‍රය ලෙස සුහර්ෂිණී ධර්මරත්නගේ **එහෙම** *වරදක් කරලා නෑ මම*, දිනූ රාජගුරුගේ *මල් වඩම් සිනාසිය යුතුයි*, මහින්ද ප්‍රසාද් මස්ඉඹුලගේ *හිරුත් හිම පියල්ලක*, කේ. කේ. සමන් කුමාරගේ *නගා මැරූ අල* යන කාව්‍ය සංග්‍රහ උපයුක්ත කොට ගැනේ. මෙහි දී සමාජ, සංස්කෘතික වශයෙන් පමණක් නොව ස්ත්‍රියගේ ශාරීරාංග ද්‍රව්‍යකරණයට ලක් ව ඇති බවත්, ඒ ඔස්සේ ඇය හුදු ලිංගික කාර්යය සඳහා භාවිත උපකරණයක් බවට ඌනනය කර ඇති ආකාරයත් දැකගත හැකි වේ. ඒ අනුව නූතන සමාජයේ ස්ත්‍රියගේ භූමිකාව සමාජගත කිරීමෙහිලාත්, ඇගේ ජීවන තත්ත්වය සාධනීය මට්ටමකට යොමු කිරීමෙහිලාත් පුරුෂ පක්ෂයට මෙන් ම සාම්ප්‍රදායික ස්ත්‍රීන්ට ද මෙකී භූමිකාව යථාර්ථවත් ව නිරූපණය කොට දැක්වීමට නූතන කවිය මහඟු සේවාවක් සපයා ඇති බව නිගමනය කළ හැකි වේ.

**ප්‍රමුඛ පද :** නූතන පද්‍ය සාහිත්‍යය, යථාර්ථ නිරූපණ, ස්ත්‍රී භාවය, ස්ත්‍රීවාදය, සමාජානුයෝජනය

# A Study of the Utility of Feminism for the Interpretation of Terror in Modern Sinhala Poetry

B. M. B. G. Tharushika Lakshani
Department of Sinhala, University of Peradeniya
Lakshanibm97@gmail.com

## Abstract

Feminism began to oppose the oppression of men against women. Feminist literature criticizes traditional assumptions about women through criticism. Feminine is a physical inheritance from nature. But the woman is a social ideology built on her through her bodily organs. Due to this social ideology, women are persecuted and oppressed in many cases. In this research, the character of this oppressed woman and its reality is studied with the help of modern Sinhala poetry. The problem is how her tragic situation has been expressed through modern Sinhala poetic literature based on the social norms built on the basis of femininity was used for research. The purpose of this research was to study how the modern Sinhala poetic literature has interpreted the tragic reality of women are socialized and represented in society in relation to men. To achieve these objectives, quality data and information will be provided through library access and electronic sourcing. And the data and information are used for the research using the descriptive method. According to the research conducted through qualitative data, it was see how the woman tries to be socialized as restriction from the cultural frame work. As the primary source used for this, Suharshani Dharmarathna –*Ehema Waradak Karala Na Mama,* Dinu Rajaguru – *Malwadam Sinasiya Yuthui,* Mahinda Prasad Mas Imbula – *Hiruth Hima Piyallaka*, K.K. Saman Kumara – *Naga Maru Ala* Poem books are used. Here, not only Socio – Culturally, but the woman has been materialized to her physical parts and through that, she has been reduced to a sexual function. Accordingly it can be concluded that modern poetry has provided a great service is socializing the role of women in the modern society and in bringing her quality of life to a positive level.

**Keywords** : Femininity, Feminism, Modern Poetry, Realization, Socialism

# සාහිත්‍ය; මහා සම්ප්‍රදාය හා චූල සම්ප්‍රදාය ලෙස වර්ගීකරණය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

සම්පත් ඒ. ජී. ඒ.
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
agaruna20@gmail.com

**සාරසංක්ෂේපය**

සංස්කෘතිය යන්න මිනිසාගේ ආකල්ප, සිතුම් පැතුම්, ආචාර විධි සහ මානව සබඳතා ආදියෙහි සමස්ත එකතුවෙන් නිර්මිත වන්නා වූ සංකල්පයකි. පුද්ගල සමාජානුයෝජනය හා සමාජ ජීවියකු වශයෙන් මිනිසා අත්පත් කරගන්නා සියලු අංග, සංස්කෘතියේ නියෝජන වෙයි. ඒ අනුව සාහිත්‍යය ද සංස්කෘතියේ කලාත්මක මුහුණුවර පිළිබිඹු කරන දර්ශකයකි. යම් සාහිත්‍ය ධාරාවක විකාසනය උදෙසා සංස්කෘතිය කොතරම් සාධනීය මාධ්‍යයක් වනවා ද යන්න මෙන් ම එය එක එල්ලේ අධ්‍යයනයට නතු කරගත හැකි අන්දමේ පහසු කාර්යයක් නොවන බව ද මෙහි දී අවබෝධ වෙයි. එබැවින් සංස්කෘතිය පිළිබඳ දළ අවබෝධයක් ලබා ගැනීම සිංහල සාහිත්‍යයේ විකාසනය පිළිබඳ හැදෑරීමට සපයන්නේ ඉමහත් පිටිවහලකි. ඊ. බී. ටයිලර්ට අනුව මිනිසාගේ අගය කරන්නාවූත් පරිණත වූත් දැනුම, විශ්වාස, කලා, සදාචාරධර්ම, නීති රීති, සිරිත් විරිත් හා අනෙකුත් හැකියාවල සමස්තය සංස්කෘතිය වේ. ඒ අනුව සාහිත්‍යය සහ සංස්කෘතිය යන්න අත්‍යන්තයෙන් බැඳී පවතින්නා වූ සාධක දෙකකි. ඒ ඒ සාහිත්‍ය ප්‍රවාහයන් ගොඩනැඟීම උදෙසා එම සංස්කෘතික හරපද්ධතීන් කෙරෙන් සැපයෙන්නේ ඉමහත් දායකත්වයකි. ඒ අනුව සංස්කෘතිය යන්න වටහා ගැනීමත් ලාංකේය සිංහල සාහිත්‍ය ගොඩනැගීමෙහි ලා සංස්කෘතියෙන් ලද පිටිවහල හඳුනා ගැනීමත් කෙරෙන් සාහිත්‍ය යන්න සංස්කෘතියේ දර්ශකයක් ලෙස ඉස්මතු වන්නේ කෙසේ ද යන්න හඳුනාගැනීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ යි. විදග්ධ ප්‍රිය සාහිත්‍යය කෙරෙන් ගොඩනැඟෙන මහා සම්ප්‍රදායත් එකී නිර්මාණයන්ගේ ලක්ෂණත් හඳුනාගනිමින් මහා සම්ප්‍රදායේ නිර්මාණ කෙරෙන් සංස්කෘතිය විවරණය වන්නේ කෙසේ ද යන්න විමසා බැලීමත්, ජන සංස්කෘතිය, ජනශ්‍රැතිය ඇසුරෙහි ගොඩනැඟෙන චූල සම්ප්‍රදායේ නිර්මාණ කෙරෙන් මෙරට ගැමි සංස්කෘතිය නිරූපණය වන්නේ කෙසේ ද යන්න විමසා බැලීමත් මෙම පර්යේෂණයේ අරමුණු අතර වේ. ලාංකේය සිංහල සාහිත්‍යය විකාසනයේ දී ඒ ඒ කාල රාමුවට මෙන් ම සමාජ සංස්කෘතියට හැඩගැසී ඇති ආකාරයත්, එකී සංස්කෘතික අංග සාහිත්‍ය තුළින් පිළිබිඹු වන ආකාරයත් විමසා බැලීමේ දී සංස්කෘතියෙහි දර්ශකයක් ලෙසින් සාහිත්‍යය හඳුන්වාදීමේ වරදක් නොමැති බව පැහැදිලි වෙයි. ගුණාත්මක පර්යේෂණයක් වූ මෙමගින් විදග්ධ සමාජය ඇලුම් කළ පාණ්ඩිත්‍ය ප්‍රිය සාහිත්‍ය ධාරාව මහා සම්ප්‍රදාය ලෙසත්, ලාංකේය ගැමි සංස්කෘතිය හා බැඳි ගැමිජීවන රටාව තුළින් පෝෂණය වූ සාහිත්‍ය ධාරාව චූල සම්ප්‍රදාය ලෙසත් හඳුනාගත හැකි ය. ඒ ඒ සම්ප්‍රදායන් කෙරෙන් ලාංකේය සිංහල සංස්කෘතිය පිළිබිඹු වන ආකාරය මෙහි දී අධ්‍යයනයට බඳුන් කොට ඇත.

**ප්‍රමුඛ පද :** චූල සම්ප්‍රදාය, මහා සම්ප්‍රදාය, සංස්කෘතිය, සිංහල සාහිත්‍යය, සිංහල සාහිත්‍යයේ විකාසනය

# An Investigative Study on the classification of Sinhala literature as Maha Sampradaya and Chula Sampradaya

Sampath A.G.A
Sabaragamuwa University of Sri Lanka
agaruna20@gmai.com

**Abstract**

Culture is a concept that is made up of the whole collection of human attitudes, thoughts, manners, and human relations. All aspects of individual socialisation and human acquisition as a social being are representations of culture. Accordingly, literature is also an indicator that reflects the artistic face of culture. It is understood that culture is a positive medium for the dissemination of a certain literary stream and that it is not an easy task that can be studied in one go. Therefore, gaining a thorough understanding of the culture provides a great foundation for the study of the evolution of Sinhala literature. Culture is the totality of knowledge, beliefs, arts, morals, laws, customs, and other capacities that man appreciates and matures. Accordingly, literature and culture are two factors that are closely related. A great contribution is provided by those cultural value systems to the formation of each literary stream. The basic purpose of this research is to understand the meaning of culture and identify the background of culture in literature. Among the objectives of this research are to examine how the culture is interpreted through the works of the great tradition by identifying the great tradition that is formed from popular literature and the characteristics of those works, and to inquire how the village culture of this country is represented through the works of the 'Chula' tradition that is formed in association with folk culture and folklore. It becomes clear that there is no mistake in introducing literature as an indicator of culture when examining how Sri Lankan Sinhala literature has been shaped by the respective time frame and social culture in broadcasting and how these cultural elements are reflected in literature. The scholarly literary stream favored by sophisticated society can be recognized as the Maha Sampradaya, and the Chula Sampradaya is the literary stream nurtured through the rural lifestyle associated with the Sri Lankan village culture. The way in which Sri Lankan Sinhalese culture is reflected in each tradition has been studied here.

**Keywords:** Chula tradition, Culture, Evolution of Sinhala literature, Maha tradition, Sinhala literature

# පරමාර්ථ ධර්මයන්හි අර්ථ විශ්ලේෂණය කරගැනීමෙහි ලා විශුද්ධිමාර්ග මහාසන්‍යයෙහි උපයෝගිතාව පිළිබඳ විමසීමක්

**(ලක්ඛණ-රස-පච්චුපට්ඨාන-පදට්ඨාන විග්‍රහය ඇසුරෙනි)**

පිංකන්දේ දමිතසාර හිමි
කැලණිය විශ්වවිද්‍යාලය.
damithasara@gmail.com

**සාරසංක්ෂේපය**

*පාලි විසුද්ධිමග්ගය* බුද්ධඝෝෂාචාර්යයන් විසින් ව්‍යවහාර වර්ෂ පස්වන සියවසෙහි රචිත ථෙරවාදයේ මූලික ධර්ම සංග්‍රහය යි. තත් කෘතියේ දුරවබෝධ පද උත්තානීකරණය සඳහා **පරමත්ථමඤ්ජූසා** නමින් විසුද්ධිමග්ගටීකාවක් ද බදරතිත්ථවාසී ධම්මපාල තෙරුන් විසින් සම්පාදිත ය. මෙම කෘති දෙකෙහි ම අන්තර්ගත කරුණු සමුච්ත කරමින් *විශුද්ධිමාර්ග මහාසන්නය* දඹදෙණි යුගයෙහි  කලිකාල සාහිත්‍ය සර්වඥපණ්ඩිත පරාක්‍රමබාහු රජු විසින් රචනා කරනු ලැබේ. එවකට පාලි භාෂාවෙහි නුහුරු ජනයාට ධර්මයෙහි ගම්භීරාර්ථ ග්‍රහණය උදෙසා එය මහදු උපකාරයක් සැපයිණි. චිත්ත-චෛතසික ආදි පරමාර්ථ ධර්මයන්ගේ යථා ස්වභාවය වටහා ගැනීම උදෙසා ලක්ඛණ-රස-පච්චුපට්ඨාන-පදට්ඨාන වශයෙන් චතුර්විධ විභාග ක්‍රමයක් *විසුද්ධිමග්ගය* ඇතුළු අට්ඨකථාවන්හි එයි. විශේෂයෙන් *විසුද්ධිමග්ගයෙහි* සීල, සමාධි, පඤ්ඤා යන මූලික පද විග්‍රහය උදෙසා මෙකී න්‍යාය ම උපයෝගී කොට තිබේ. ශීලනලක්‍ෂණය, අවිකම්පනලක්‍ෂණය, ධර්මස්වභාවප්‍රතිවේධලක්‍ෂණය පිළිවෙළින් සීල, සමාධි, ප්‍රඥාවේ ලක්ඛණ විභාගය යි. දුශ්ශීලවිධ්වංසනය, වික්‍ෂෙපවිධ්වංසනනය, මොහවිධ්වංසනය පිළිවෙළින් රස විභාගය යි. කාය-වාග්-මන පිරිසිදුභාවය, කම්පනවිරහිතබව, අසම්මොහය පච්චුපට්ඨාන විභාගය යි. හිරි-ඔත්තප්ප, සුඛය, සමාධිය පදට්ඨාන විභාගය යි. මෙසේ චතුෂ්ක ත්‍රිත්‍වයක් මගින් නොහොත් ස්වභාව දොළොසක් ඔස්සේ සීල, සමාධි, පඤ්ඤා විග්‍රහය සිදුකර ඇත. යථොක්ත පාරිභාෂික පදාර්ථ වටහා ගැනීමට පාලි විසුද්ධිමග්ගයට පමණක් සීමා වීම ධර්මධර ඡේකයන්ට ම උචිත ය. හුදී ජනයාට වෙනත් සුගම පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ. එකී රික්තකපූරණය දෙවැනි පැරකුම් රජු විසින් මනාව සිදුකරන්නේ ලීනාර්ථපද වර්ණනාවක් ලෙසිනි. අර්ථ පරීක්‍ෂණයෙන් වටහාගත නොහැකි සංකල්පයන්ට නිදසුන් දක්වමින් පාඨකයාගේ ගැටලු විසඳීමට සමත්වීම මහඟු ශාස්ත්‍රීය දායාදයකි. ශීලනාර්ථය යනු කායකර්මාදීන්ගේ අවිප්‍රකීර්ණත්‍වය සහ කුශලධර්මයන්ට වන පිහිටාධාරය බව යනුවෙන් අර්ථ දක්වයි. පදට්ඨාන යනු ආසන්න කාරණය බව දක්වමින් භෞතික ද්‍රව්‍යාත්මක වස්තූන් කිහිපයක පැවැත්මට ආසන්න හේතුව උපමා කරගනිමින් මෙකී පරමාර්ථයන්හි පදට්ඨාන විශ්ලේෂණය කරයි. එසේම බෞද්ධ ඥානවිභාගයේ පරිභාවිත ස්වලක්‍ෂණය හෙවත් අනන්‍යතාව ද සාමාන්‍ය ලක්‍ෂණය හෙවත් අන්‍යොන්‍යතාව ද මෙම ධර්ම විශ්ලේෂණයෙහි ලා උපයෝගි කරගනියි. මෙසේ *පාලි විසුද්ධිමග්ගයෙහි* ධර්මාර්ථ විභාගය උදෙසා *සිංහල විසුද්ධිමග්ග මහාසන්නයෙන්* ලැබෙන පිටුබලය කෙතෙක්දැයි මෙහි ලා අධ්‍යයනය කෙරේ. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයයන් උපයුක්ත කොට ගනිමින් මෙම පර්යේෂණය සිදුකිරීමට අපේක්ෂිත ය.

**ප්‍රමුඛ පදඃ** පච්චුපට්ඨාන, පදට්ඨාන, රස, ලක්ඛණ, විසුද්ධිමග්ග

# An Inquiry into the Usefulness of Vishuddhimagga-Mahasanya in Analyzing the Meaning of Paramatthā-s

Ven. Pinkande Damithasara
Department of Pali and Buddhist Studies, University of Kelaniya.
damithasara@gmail.com

## Abstract

The Pali *Visuddhimagga* is the basic canon of Theravada written by Ven. *Buddhaghosa* in the fifth century AD. Ven. *Badaratitthavāsi Dhammapāla* also composed a *Visuddhimaggatīkā* called *Paramatthamanjūsa* to exaggerate the far-fetched verses of that work. The Visuddhimagga Mahāsannaya was written by King Parakramabāhu, Honored with the name of *Kalikāla Sāhitya* Pandita in *Dambadeni* period, collecting the contents of both these works. At that time, it provided a great benefit to the people who were not familiar with the Pali language in order to grasp the essence of the Dhamma. In order to understand the real nature of objective doctrines such as Chitta-Cetasika, a fourfold examination system as *Lakkhana-Rasa-Paccupaṭṭhāna-Padaṭṭhāna* is found in the *Attakatha*-s including the *Visuddhimagga*. Especially in Visuddhimagga, this same theory has been used for the analysis of the basic terms *sīla*, *samādhi*, *paññā*. *Seelanalakkhaṇa*, *Avikampanalakkhaṇa*, *Dhammassabhāvapativedhalakkhaṇa* are the Lakkhanā-s examination of Seela, Samadhi and Paññā respectively. *Dussīlaviddhansana*, *Vikkhepaviddhansana*, *Mohaviddhansana* are the taste test respectively. Purity of body-speech-mind, non-violence, dispassion is the exam of *Paccupaṭṭhāna*. *Hiri-Otthappa, Sukha, Samadhi* are *Padaṭṭhāna* analysis. Thus the analysis of *Sīla*, *Samādhi* and *Paññā* has been done through a set of four or twelve natures. It is appropriate for Dharmadharā-s readers to limit themselves to the Pali *Visuddhimagga* to understand the actual terminology. Ordinary people need a different explanation. The complement is well done by King *Parakum* II as a exegetical work. It is a great academic gift to be able to solve the reader's problems by showing examples of concepts that cannot be understood through semantic analysis. *Śilanartha* means the uncomplicatedness of the practitioners and the adherence to the skills. Analyzing *Padaṭṭāna* in these terms, the proximate cause of the existence of several physical material objects is illustrated by stating that *Padaṭṭāna* is the proximate cause. Also, the characteristic or identity used in Buddhist epistemology and generality or reciprocity are used in the analysis of this doctrine. In this way, the support received from the Sinhala *Visuddhimagga-Mahasanna* for the Pali *Visuddhimagga* Dharma exam is studied here. This research is expected to be conducted using primary and secondary sources under the qualitative research methodology.

**Keywords**: Lakkhaṇa, Paccupaṭṭhāna, Padaṭṭāna, Rasa, Visuddhimagga

# සක්‍රීය පඨනය, ලක්ෂ්‍යාර්ථය හා රූපකය (අනුරාධා නිල්මිණි, නදුන් යසිත දසනායක හා ලක්ෂාන්ත අතුකෝරලගේ කාව්‍ය නිර්මාණ ආශ්‍රිත අධ්‍යයනයක්)

ඔසඳ ගුණරත්න
සිංහල අධ්‍යයන අංශය, කොළඹ විශ්වවිද්‍යාලය
osandasinhala@gmail.com

**සාරසංක්ෂේපය**

සාහිත්‍ය නිර්මාපකයා හා පරිශීලකයා අතර සබඳතාව ගොඩනැගෙන්නේ සාහිත්‍ය නිර්මාණයක අර්ථ උත්පාදන ක්‍රියාවලිය ඇසුරෙනි. පද්‍ය නිර්මාණවල අර්ථ උත්පාදනය පිළිබඳ න්‍යාය ධර්ම පෙර'පර දෙදිග ම සාහිත්‍ය විචාරයෙහි දැකගත හැකි ය. සංස්කෘත සාහිත්‍යයේ භාවිත කෙරෙන විවිධ විචාරවාද පිළිබඳ විග්‍රහයක යෙදෙන හේමපාල විජයවර්ධන ආනන්දවර්ධනගේ *ධ්වන්‍යාලෝක* කෘතියෙහි අදහස් ද පාදක කරගනිමින් තහවුරු කරන්නේ සාහිත්‍ය නිර්මාණයක පරම ඵලය රසය ජනනය කිරීමෙහි ලා අර්ථ උත්පාදනයෙහි වැදගත්කම යි. මෙහි දී රසවාදය හා ධ්වනිවාදය අතර'ති සම්බන්ධය තවදුරටත් දක්වන විජයවර්ධන අර්ථ උත්පාදන ව්‍යාපාරත්‍රය වන අභිධා, ලක්ෂණා හා ව්‍යඤ්ජනා ඇසුරෙන් පිළිවෙළින් වාච්‍ය, ලක්ෂ්‍ය හා ව්‍යංග්‍ය යන අර්ථත්‍රය මතු වීම විවරණය කරයි. සිය *නව කවි සලකුණ* කෘතිය තුළ ස්ටීවන් ඩොබින්ස්, ටෙඩ් කොහේන් හා එඩ්වඩ් හර්ස්ච් ආදි නූතන විචාරකයන්ගේ මත උපුටා දක්වන ලියනගේ අමරකීර්ති නූතන බටහිර සාහිත්‍ය විචාරය තුළ රූපකයේ වැදගත්කම දක්වන්නේ සක්‍රීය පඨනය උදෙසා සහෘදයා කෙරෙහි එය බලපෑම් කරන අයුරු අවධාරණය කරමිනි. රූපකය යනු ලක්ෂ්‍යාර්ථය ඇසුරින් මතු වන්නක් බව සංස්කෘත කාව්‍ය විචාරයේ පිළිගැනීම යි. ඒ අනුව, පාඨකයාට කාව්‍ය නිර්මාණාවබෝධයට ලක්ෂ්‍යාර්ථය ද උපයෝගී වේ යන උපන්‍යාසය ගොඩනැගීමට ඉඩ ලැබේ. නූතන සිංහල සාහිත්‍ය විචාරය ප්‍රමාණ කරගත් අධ්‍යයනයක දී මෙම උපන්‍යාසය වඩාත් වැදගත් වන්නේ හුදෙක් වාච්‍යාර්ථය හා ව්‍යංග්‍යාර්ථය පිළිබඳ අවධානය යොමු කළත් ලක්ෂ්‍යාර්ථය පිළිබඳ අවධානය යොමු නොකරන අතර ම රූපකය හුදු කාව්‍යාලංකාරයක් ලෙස පමණක් සැලකීමට නූතන විචාරකයා පෙලඹී ඇති හෙයිනි. වර්තමානයේ කැපී පෙනෙන පද්‍ය නිර්මාණකරුවන් වන ලක්ෂාන්ත අතුකෝරල, නදුන් යසිත දසනායක හා අනුරාධා නිල්මිණීගේ කාව්‍ය නිර්මාණ ඇසුරින් උක්ත උපන්‍යාසය පර්යේෂණයට ලක් කිරීම මෙම අධ්‍යයනයේ දී සිදු වේ. මෙකී කවි-කිවිඳියන් තෝරා ගැනීමේ දී ඔවුන්ගේ නිර්මාණ, දිවයිනේ ප්‍රමුඛ සම්මාන උළෙළ සඳහා නිර්දේශ වීම, සම්මානයට පාත්‍ර වීම හා අපගේ පෞද්ගලික අභිමතය ද හේතු විය. උක්ත නිර්මාණකරුවන් දෙදෙනා හා නිර්මාණකාරිය රූපක ඇසුරින් ලක්ෂ්‍යාර්ථ මතුකරන්නේ කෙසේද යන්න විමර්ශනය කිරීම පර්යේෂණ ගැටලුව වූ අතර හුදෙක් ව්‍යංග්‍යාර්ථ ජනනය ම නොව ලක්ෂ්‍යාර්ථ ජනනය ද නූතන කවීන් සක්‍රීය පාඨකත්වය සඳහා යොදාගත් බව තහවුරු කිරීම පර්යේෂණයේ අරමුණ විය. දත්ත රැස් කිරීම සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ පුස්තකාලය හා අන්තර්ජාලය පරිශීලනය කෙරුණු අතර විස්තරාත්මක ක්‍රමවේදය ඇසුරින් එය විශ්ලේෂණය කෙරිණි.

**ප්‍රමුඛ පදඃ** ධ්වනිවාදය, රූපකය, ලක්ෂ්‍යාර්ථය, සක්‍රීය පඨනය, සහෘදයා

# Active reading, *Lakshyartha* and metaphor

(A Study on the Poetry of Anuradha Nilmini, Nadun Yasitha Dasanayake and Lakshantha Athukorala)

Osanda Gunarathne
Department of Sinhala, University of Colombo
osandasinhala@gmail.com

**Abstract**

The relationship between the writer and the reader, is formed through the creation of meaning in a literary work. Criticizing poetic creations with special attention to the creation of meaning is a special feature of both Eastern and Western literary criticism. Wijayawardena (1967) who is engaged in an analysis of the various criticisms used for the criticism of Sanskrit literature, based on the ideas of Anandawardena's *Dhvanyaloka*, affirms the importance of the generation of meaning in the generation of *rasa*, which is the ultimate result of a literary work. Wijayawardena, who further shows the relationship between *rasa* and *dhvani*, also commented on the emergence of the meanings of Vachya, Lakshya and *Vyangya* respectively from the association of Abhidha, Lakshya and Vyanjana, which are the means of creating meaning. Citing the views of modern critics such as Stephen Dobbins, Ted Cohen and Edward Hirsch in his new work, Amarakirti (2016), highlights the importance of metaphor in modern Western literary criticism, emphasizing how much it influences the reader for active reading. It is the acceptance of Sanskrit poetic criticism that metaphor is an outgrowth of meaning. Accordingly, it is allowed to construct the hypothesis that the literary work user or friend is also used in building a relationship with the poetry. In a quantitative study of modern Sinhala literary criticism, this birth is more important because it appears that the modern Sinhala literary critic is motivated to consider the metaphor as a mere poetic expression, even if he only focuses on the literal and figurative meaning, but does not pay attention to the purpose. In this study, this hypothesis is researched through the poetic works of Lakshantha Athukorala, Nadun Yasitha Dasanayake and Anuradha Nilmini, who are notable poets of modern Sinhala literature. In selecting these poets the researcher was influenced with his personal preference as well as the fact that their work have been awarded during last decade. The research problem was to investigate how these writers have used metaphors to bring out the meaning in order to encourage the readership to actively enjoy the poetry, and the aim of the research was to confirm that modern poets not only use metaphors but also the creation of meaning through active readership. To collect data, the library and the internet were used through the qualitative research method and it was analyzed using the descriptive method.

**Keywords**: Active reading, Dhwaniwada, Lakshyartha ,Metaphor, Reader

# කෝට්ටේ යුගයේ සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ දියුණුවට බලපෑ හේතු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

මධූෂාන් අයි. එම්. එම්.
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
madushamilinda9@gmail.com

**සාරසංක්ෂේපය**

මහින්දාගමනය හේතු කරගෙන බ්‍රාහ්මී අක්ෂර මාලාව හිමි වූ අතර ක්‍රි. පූ. තුන්වන සියවසේ දී ලේඛන කලාවෙහි ආරම්භය සිදුවිය. මුල් කාලයේ දී එම ලේඛන කලාව භාවිත කරමින් ලෙන් ලිපි වැනි දේ සටහන් කරන ලදි. ඉන්පසු සාහිත්‍යය බිහි විය. එය සම්භාව්‍ය සිංහල සාහිත්‍යය ලෙස හඳුන්වනු ලැබේ. එකී සම්භව්‍ය සිංහල සාහිත්‍යය ලංකාවේ එක් එක් යුගයන්හි යම් යම් වෙනස්කම්වලට භාජනය වෙමින් දියුණු විය. එලෙස සාහිත්‍යයේ දියුණුවට පත් වූ යුගයක් ලෙස කෝට්ටේ යුගය නම් කිරීමට පිළිවන. එම යුගයෙහි සාහිත්‍යයේ දියුණුවට බලපෑ හේතු තෝරාගත් මූලාශ්‍රය කිහිපයක් ඇසුරෙන් හඳුනාගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. අන් යුගයන්ට සාපේක්ෂ ව කෝට්ටේ යුගයේ එතරම් සාහිත්‍යයේ දියුණුවක් ඇති වීමට හේතු අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. ඊට තොරතුරු සපයා ගැනීමට ප්‍රාථමික මුලාශ්‍රයත් ද්වීතියික මූලාශ්‍රයත් මඟින් විමර්ශනය සිදුකරන ලදි. කෝට්ටේ යුගයේ විවිධ වර්ගයේ ග්‍රන්ථ රාශියක් රචනා වූ බව *මහාවංසයේ* තෙවන කොටසෙහි සඳහන් වී ඇත. සංදේශ කාව්‍ය, භක්ති කාව්‍ය, හටන් කාව්‍ය, ප්‍රශස්ති කාව්‍ය, සිලෝ කාව්‍ය, අස්න කාව්‍ය, උපදේශ කාව්‍ය, කෝෂ ග්‍රන්ථ, ධර්ම ග්‍රන්ථ ඒ අතර වේ. එලෙස ම ගිහි පැවිදි උගත් පඬිවරුන් රාශියක් ග්‍රන්ථකරණයෙහි නියැළීම ද, කොට්ටේ යුගයෙහි සාහිත්‍යයේ දියුණුවක් ඇති විමට හේතු විය. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි, වෑත්තෑවේ හිමි, විදාගම මෛත්‍රී හිමි, පැවිදි උගතුන් ලෙසත් හයවන පැරකුම්බා රජු ගිහි උගතෙකු ලෙසත් ග්‍රන්ථකරණයේ නිරත වූවන් අතර වේ. තව ද දියුණු පිරිවෙන් නිර්මාණය විම ද හේතු විය. පැපිලියාන සුනේත්‍රා දේවි පිරිවෙන, කෑරගල පද්මාවතී පිරිවෙන එසේ බිහි වූ පිරිවෙන් අතර වේ. අන් යුගයන්ට සාපේක්ෂ ව කෝට්ටේ යුගයෙහි සම්භාව්‍ය සාහිත්‍යයෙහි දියුණුවක් නිර්මාණය වූ ආකාරය සාහිත්‍යමය මූලාශ්‍රයවල සඳහන් තොරතුරු ඔස්සේ නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද:** කෝට්ටේ යුගය, ගිහි-පැවිදි උගතුන්, සම්භාව්‍ය සාහිත්‍ය, සාහිත්‍යයේ දියුණුව

# On the factors that influenced the development of classical Sinhala literature in the Kotte era An exploratory study

Madhushan I.M. M

Rajarata University of Sri Lanka

madushamilinda9@gmail.com

**Abstract**

Due to Mahindagamana, Brahmi script was acquired from the 3rd century BC The beginning of writing also took place. In the early days, art of writing, such as cave letters can be noted. Then came literature. It is known as classical Sinhala literature. A classic Sinhala literature in each era of Ceylon, undergoing certain changes developed. In this way, Kotte's era can be named as an era in which literature developed. The aim of this research is to identify Reasons that influenced the development of literature in the period, with some selected historical sources. In periods The problem of this research is to study the reasons for the development. primary sources and secondary sources are investigated. Books were composed during the Kotte era is mentioned in this section. Sandesha Kavya, Bhakti Kavya, Hutan Kavya, Prashti Kavya, Silo Kavya, Asna Kavya, Upadesha Kavya, Kosha Granth, Dharma Granth are among them. In the same way, the layman is educated. A large number of scholars were engaged in book-writing, and the development of literature in the Kotte era can be noticed. Sri Rahula Thero of Thotagamuwe, Vettathewe Thero, Maithri Thero of Vidagama, as learned priests. King Parakumba VI was also engaged in writing books as a lay scholar. The creation of Piriven also led to an improvement in the literature of the Kotte era. Papiliana Sunetra Devi Pirivena, Keragala Padmavathi Pirivena, Devinuwara Irugalthilaka Pirivena were some prestigious academic institutions. A development of classical literature in Kotte period can be deduced from the information mentioned in the literary sources.

**Keywords:** Books, Classics, Kotte era, Literature

# 1990 - 2020 කාල සීමාවෙහි සිංහල නවකතා රචකයන් විසින් උපයුක්ත ආඛ්‍යාන රීතිවල විසදෘශතා

## (ලියනගේ අමරකීර්ති, එරික් ඉලයප්ආරච්චි, කීර්ති වැලිසරගේ හා සමන් වික්‍රමාරච්චිගේ නවකතා ආශ්‍රිත අධ්‍යයනයක්)

තනුජා අග්‍රනී ගමගේ
කැලණිය විශ්වවිද්‍යාලය
thanujagamage1226@gmail.com

**සාරසංක්ෂේපය**

සිංහල නවකතාවේ ප්‍රභවය, මෙරට පැවති සම්භාව්‍ය කතා කලාවේ ක්‍රමික විකාසනය, බටහිර නවකතා කලාවේ ආභාසය මෙන් ම 19වන සියවසේ මැද භාගයේ ඇති වූ ශාස්ත්‍රීය පුනර්ජීවනය නිසා සිදු වූ බව සැලකිය යුතු ය. බටහිර සාහිත්‍යයේ විවිධ ආඛ්‍යාන රීතිවල ආභාසය සමාරම්භක යුගයේ පටන් ලැබුව ද පුද්ගල චරිතාභ්‍යන්තරය විවරණය කරන නවකතා **විරාගය** රචනාවීමත් සමග බිහි විය. සිරි ගුනසිංහගේ *හෙවනැල්ල* නවකතාව මෙහි සන්ධිස්ථානයකි. 1960 - 1990 කාල පරිච්ඡේදය තුළ බිහි වූ නවකතා නිර්මාණ බහුතරයක් යථාර්ථවාදී නිර්මාණ ලෙස සැලකිය හැකි වුවත් විශ්ව සාහිත්‍යයේ ආභාසය ලබමින් විවිධ ආඛ්‍යාන රීති භාවිතයට නවකතාකරුවන් දැක්වූ උනන්දුව මේ යුගයේ දී කැපී පෙනේ. මෙම වකවානුවේ මධ්‍ය භාගය තුළ මෙරට සිදු වූ සමාජ, දේශපාලනික පෙරළි හා ගැටුම් මෙරට නවකතා සාහිත්‍යය කෙරෙහි ද බලපැවැත්විණ. ඒ අනුව යථාර්ථවාදය ප්‍රතික්ෂේප කිරීම සඳහා සමාජ වාතාවරණයෙන් ම පෙලඹීමක් සිදුවුණු අතර එකී ප්‍රවේශය ඉක්මවා ගිය සංවාදයක් සමාජය තුළ ජනනය විය. කාලයක් තිස්සේ පර්යේෂණාත්මක මට්ටමින් සිංහල සාහිත්‍ය නිර්මාණකරණයට යොදාගැනුණු බටහිර නිර්මාණාත්මක සංකල්ප නොහොත් රචනා රීති නවකතාකරණයෙහි ලා බහුල ලෙස භාවිත වනු පෙනෙන්නේ 1990 – 2020 කාල පරිච්ඡේදය තුළ ය. ඒ අනුව ලියනගේ අමරකීර්ති, එරික් ඉලයප්ආරච්චි, කීර්ති වැලිසරගේ හා සමන් වික්‍රමාරච්චි යන තෝරාගත් නවකතා රචකයින්ගේ නිර්මාණ මෙම අධ්‍යයනය මගින් විමර්ශනය කෙරේ. මෙකී පර්යේෂණයේ ගැටලුව වන්නේ 1990-2020 කාල පරිච්ඡේදයේ රචිත නවකතා මගින් නිරූපිත විසදෘශ ආඛ්‍යාන රීති මොනවා ද? යන්න යි. ඒ අනුව නවකතා රචකයන් විසින් භාවිත නිර්මාණ රීතිවල විසදෘශතා මෙන් ම ඒ ඒ නවකතා මගින් නිරූපිත බහුවිධ ආඛ්‍යාන රීති කෙරෙහි ද මෙහි දී අවධානය යොමු වේ. පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ, මෙම කාල පරිච්ඡේදය තුළ රචිත නවකතා කෙරෙහි බලපෑ බටහිර සාහිත්‍යයෙහි බලපෑම හා ආඛ්‍යාන රීතිවල පවතින විසදෘශභාවය හඳුනා ගැනීම යි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ පුස්තකාලය හා අන්තර්ජාල මූලාශ්‍රය භාවිත කෙරෙන අතර පෙර දැක්වූ නිර්මාණකරුවන්ගේ ග්‍රන්ථ ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ද අදාළ විචාරවාද පිළිබඳ විචාර ග්‍රන්ථ ද්විතීයික මූලාශ්‍රය ලෙස ද යොදා ගනිමින් පර්යේෂණය සිදු කෙරේ.

**ප්‍රමුඛ පද:** ආඛ්‍යාන රීති, ආභාසය, බටහිර විචාරවාද, විසදෘශතා, සිංහල නවකතා

# Disparities in Narrative styles Used by Sinhala Novelists : 1990 - 2020

(A study based on Liyanage Amaraparachchi, Eric Ilayapaarachchi, Keerthi walisarage and Saman Wickremarachchi's novels)

Thanuja Gamage
University of Kelaniya
thanujagamage1226@gmail.com

**Abstract**

The novel has a unique place among other literature genres. It can be noted that the origin of the Sinhala novel took place at the beginning of the 20th century as a result of the gradual evolution of the classical storytelling in Sri Lanka, the inspiration of the western novel art and the academic revival that took place in Sri Lanka in the middle of the 19th century. Although the influence of various narrative styles of western literature started in the opening period, the use of Sinhala novelists in their creations, going slightly beyond the realistic method, is more noticeable with the group of novels that comment on the personal character from the 1950s. Siri Gunasinghe's novel *Hewanella* is a turning point here. Although the majority of Sinhala novels produced in the period of 1960-1990 can be considered as realistic works, the interest shown by novelists in the use of various narrative rules inspired by universal literature is notable in this era. The social and political upheavals and conflicts that took place in the country during the middle half of this period also affected the novel literature in the country. Accordingly, there was an impetus from the social environment itself to reject realism and a conversation about literature that exceeded realism was generated in the society. Western critical concepts or composition rules, which have been used to create Sinhala literature at an experimental level for a long time, seem to be widely used in novelization in the period of 1990 - 2020. The main objective of using novels published in this period as the field of study of this research was to study the impact of those concepts. Under that, the works of selected novelists Liyanage Amarakirthi, Eric Ilayaparachchi, Keerthi Welisarage, Saman Wickramarachchi are investigated in this study. The problem of this research is, what are the descriptive narrative rules depicted in the novels written in the period (1990-2020) to go Accordingly, attention is paid here to the differences in the design rules used by novelists as well as to the multiple narrative rules depicted through a single novel. The main purpose of the research is to identify the differences in the narrative rules and the Western literary influence that influenced the novels written in this period. Under the qualitative research methodology, the methods of using library books and literature survey were used and the research is done using the books of the a fore mentioned designers as the primary source and the critical books of the related criticisms as the secondary sources.

**Keywords:** Disparities, Inspiration, Narrative Rules, Sinhala Novels, Western critical concepts

# සාංදෘෂ්ටිකවාදී විචාර න්‍යාය සහ නවකතා විචාරය; විචාරාත්මක අධ්‍යයනයක්

ඩබ්. එම්. එන්. ඩී. වීරසිංහ
රුහුණ විශ්වවිද්‍යාලය
nadeeshaweerasinghe98@gmail.com

**සාරසංක්ෂේපය**

මානව පැවැත්ම විග්‍රහ කරමින් ජීන් පෝල් සාත්‍රෙ මානවවාදී අධ්‍යයනයක් වශයෙන් සාංදෘෂ්ටිකවාදී න්‍යාය ඉදිරිපත් කර ඇත. මෙම අධ්‍යයනය මගින් අපේක්ෂා කරන්නේ සාංදෘෂ්ටිකවාදී විචාර න්‍යායේ මූලික ප්‍රවේශ කෙරෙහි අවධානය යොමු කරමින් නූතන නවකතා විචාරයට සාංදෘෂ්ටිකවාදය භාවිත කිරීමේ යෝග්‍යතාවයි. මෙය තෝරාගත් නවකතා ත්‍රිත්වයක් ඇසුරින් විග්‍රහ කෙරෙයි. පර්යේෂණ ගැටලුව වන්නේ මානව චෛතසික විවරණය කිරීම කෙරෙහි සාංදෘෂ්ටිකවාදී විචාර න්‍යාය වැදගත් වන්නේ කෙසේ ද? යන්න අධ්‍යයනය කිරීම යි. මාර්ටින් වික්‍රමසිංහගේ **විරාගය**, එදිරිවීර සරච්චන්ද්‍රගේ **මළගිය ඇත්තෝ** සහ සයිමන් නවගත්තේගමගේ **සංසාරාරණ්‍යයේ දඩයක්කාරයා** යන යුගත්‍රයක නවකතා ත්‍රිත්වයක් මෙහි දී තෝරා ගැනිණි. නවකතා විචාරයේදී ගතානුගතික විචාර ක්‍රමවේද අභිභවා ගිය මානවවාදී අර්ථකථනයකට සාංදෘෂ්ටිකවාදී ප්‍රවේශය අවශ්‍ය වන බව අවධාරණය කිරීම අධ්‍යයනයේ අරමුණ විය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සාහිත්‍ය අධ්‍යයනය සහ නිරීක්ෂණය යන දත්ත රැස් කිරීම සිදු විය. සාංදෘෂ්ටිකවාදයේ දී මනෝවිශ්ලේෂණවාදය, විග්‍රහාත්මක දත්ත විශ්ලේෂණයේ න්‍යායාත්මක පදනම විය. බර්නාඩ් ෆ්‍රෙච්මන්ඩ් විසින් පරිවර්තනය කරන ලද ජීන් පෝල් සාත්‍රේගේ *සාංදෘෂ්ටිකවාදය* (*Existentialism*) කෘතිය අධ්‍යයනයේ පදනම විය. එහි ඇතුළත් සාංදෘෂ්ටිකවාදයේ මූලික ප්‍රවේශ අනුව නවකතා විග්‍රහ කරන විට පැහැදිලි වූයේ මානව චෛතසික සහ චර්යාවන්ගේ ක්‍රියාකාරීත්වය බාහිර සාධකවල බලපෑමෙන් ගොඩනැගුණ ද ඒවා විග්‍රහ කිරීමේ දී අනන්‍ය ලක්ෂණ පිළිබඳ සහ පොදු මනුෂ්‍යත්වයේ සාරය පිළිබඳ අවධානය චරිතවලට සාධාරණයක් ඉටු කරන බව යි. ලිංගිකත්වය, කුතුහලය, සමාජශීලීත්වය වැනි තත්ත්ව කෙරෙහි මිනිසා විවෘත ව මෙන් ම ආවෘත ව ද අනායාසයෙන් නැඹුරු වෙයි. අරවින්ද, දෙවොන්දරා සං වැනි චරිත මගින් මානවවාදී විචාරයේ අවශ්‍යතාව අවධාරණය කෙරිණි. නවකතා මගින් ස්පර්ශ කරන පුද්ගල අනන්‍යතා සහ ගතිකත්ව පිළිබඳ අවබෝධයක් මෙම චරිත මගින් අනාවරණය කරයි. සංස්කෘතික සම්මතවලට එකඟ නොවන චර්යා ගතානුගතික විචාර සම්ප්‍රදායන්ට අනුව අසම්මත යැයි විවේචනය කළ ද, මානව ස්වභාවය අනුව සාංදෘෂ්ටිකවාදය මිනිසා වැරදිකරුවෙකු කිරීමට පෙර චෛතසික ක්‍රියාවලිය විශ්ලේෂණය කරයි. විවෘත ජීවන ශෛලියක් අපේක්ෂා කළ ද, චින්තනයේ විවෘත බව කෙරෙහි අවධානය යොමු නොකර තිබීම මානව චරිත කෙරෙහි අපගාමී නිරීක්ෂණ සිදු කිරීමට හේතු වී ඇති බව අධ්‍යයනයෙන් අනාවරණය විය.

**ප්‍රමුඛ පද:** පුද්ගල අනන්‍යතාව, බාහිර සාධක, මනුෂ්‍යත්වයේ සාරය, මානවවාදය, සාංදෘෂ්ටිකවාදය

# Existentialism Theory and Criticism of Novels: A critical Study

W.M.N.D.Weerasinghe
University of Ruhuna
nadeeshaweerasinghe98@gmail.com

**Abstract**

Analyzing human Existence, Jean Paul Sartre has presented the existentialism theory as a humanist study. In this contest the study is expected to analyze the impact of existentialism on modern novel focusing on the basic approaches of existentialism theory. The problem of the study is how the influence of the existentialism to interpret human thoughts in novel in humanistic way. The study launched through the analysis of Martin Wickramasinghe's *Viragaya*, Ediriweera Sarachchandra's *Malagiya Etto*, and Nawagattegama's *Sansaranyaye Dadayakkaraya*. The objective of the study is to emphasize the need of existentialism method for a humanistic interpretation in novel criticism. Under the qualitative research method, the data collected through the literature study. Existentialism and psychoanalysis were the theoretical foundations of data analysis. This study based on Jean Paul Sartre's existentialism, translated by Bernard Frechtmen. This study revealed that although activities of people emotions are formed by influence of external factors, in analyzing them, paying attention to the unique characteristics and essence of common humanity does justice of the characters. Man naturally tends to be open and close to toward situations like sex, curiosity, sociability. The need for humanistic criticism was emphasized by the characters of Aravinda and Devondara. Novels accustom the reader to a way of thinking that broadness of his critical outlook and mentality. These characters revealed that understanding of individual identities and dynamic that the novel touch on. Behavior that does not confirm to cultural norms is considered. This study signified that despite the expectation of an open life style, lack of focus on free thinking has led to regressive observation of human characters.

**Keywords:** Discrimination, Existentialism, Humanism, Individuality, Influences of external facts

# ශ්‍රී ලංකාවේ මාර්ගගත පොදු ප්‍රවේශ සූචිවල (OPACs) සිංහල පුද්ගල නාම සාධිකාරී පාලනය

ආචාර්ය ප්‍රියංවදා වනිගසූරිය
පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
priyanwada@kln.ac.lk

**සාරසංක්ෂේපය**

පුස්තකාල මූලාශ්‍රය පහසුවෙන් සොයාගැනීම හා කර්තෘන් හඳුනාගැනීම සඳහා පුද්ගල නාම බෙහෙවින් වැදගත් වේ. පුස්තකාල ස්වයංක්‍රීයකරණ පද්ධතිවල ජනප්‍රිය ම ගවේෂණ මාර්ගය වන්නේ පුද්ගල නාම යටතේ ගවේෂණය කිරීම බව පූර්ව පර්යේෂණවලින් අනාවරණය වී ඇත. එහෙත් පුද්ගල නාමවල ඇති විවිධතා සාර්ථක තොරතුරු සමුද්ධරණයට, සමාන තොරතුරු මූලාශ්‍රය සම්බන්ධීකරණයට සහ ප්‍රකාශන හිමිකම් කළමනාකරණයට අහිතකර ලෙස බලපායි. සිංහල පුද්ගල නාම භාවිතයේ දී වැරදි ලෙස අක්ෂර වින්‍යාස යොදාගැනීම, එක ම කර්තෘ නාමය ආකාර කිහිපයකින් භාවිතය සහ කර්තෘවරුන් දෙදෙනෙකුට එක ම නම පැවතීම නිසා එකී නාම භාවිතයන් පරිගණකයට හඳුනාගැනීමට නොහැකි ය. එවිට සිදුවන්නේ සංලේඛ පුද්ගලයන් දෙදෙනෙකු ලෙස හඳුනා ගැනීම යි. මෙම ගැටලුව විසඳීම සඳහා පුස්තකාලයවල ජාත්‍යන්තර ව පිළිගත් සාධිකාරී පාලන ගොනු පවත්වාගෙන යයි. ශ්‍රී ලංකාවේ විවිධ පුස්තකාල වර්ගවල නිසි ජාත්‍යන්තර සාධිකාරී ගොනු නොසලකා කර්තෘ නාම ආකෘති රටා අනුගමනය කරන බව හඳුනාගත හැකි ය. මෙම ව්‍යාකූලත්වය අවම කිරීම සඳහා සුදුසු සම්පූර්ණ ස්වයංක්‍රීය කර්තෘ නාම සාධිකාරී ගොනුවක් සකස් කිරීම අත්‍යවශ්‍ය වේ. මීට අමතර ව, සාධිකාරී පාලන කාර්යයන් සඳහා නිසි අක්ෂර පරිවර්තන ක්‍රියාවලියක් අනුගමනය කළ යුතු ය. මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය වූයේ කෘතියක් එහි නිශ්චිත පෞද්ගලික නාමයෙන් හඳුනා ගැනීම සඳහා ස්වයංක්‍රීය සාධිකාරී ගොනුවක් සකස් කිරීම යි. මෙම අධ්‍යයනයේ දී නාම විචලනය හඳුනා ගැනීම සඳහා නියැඳිය ලෙස ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය හා මොරටුව විශ්වවිද්‍යාලයේ මාර්ගගත පොදු ප්‍රවේශ සූචිවල භාවිත ශීර්ෂ තේරීමට ඇතුළත් කළ කර්තෘන්ගේ නම් භාවිත කළ අතර ඒවා ලැයිස්තුගත කිරීම හා ස්වරූප හඳුනාගැනීමට සංඛ්‍යානමය ක්‍රමයක් භාවිත කර ඇත. එවැනි අවස්ථාවල කර්තෘ නාම සාධිකාරී පාලනය භාවිත කර තිබේ ද? යන්න පරීක්ෂා කිරීම සඳහා වෙබ් සමීක්ෂණ ක්‍රමය භාවිත කරමින් තෝරාගත් පුස්තකාලයවල මාර්ගගත පොදු ප්‍රවේශ සූචි පරීක්ෂා කරන ලදී. ඒ සඳහා පෙර නාම පරීක්ෂා කිරීම, අදාළ ශීර්ෂ නාමය සොයා තහවුරු කිරීම, ශීර්ෂ පද නිර්ණය කිරීම, ශීර්ෂයන්හි ස්වරූපය නිශ්චය කර ගැනීම සහ විවිධ නාම ස්වරූප යටතේ එක ම පුද්ගලයෙකු පෙනී සිටී දැයි පරීක්ෂා කිරීම සිදුකරන ලදි. අධ්‍යයනය මගින් හඳුනාගත් කර්තෘන්ගේ නම් සෙවීමේ දෝෂ අවම කිරීම සඳහා, පිළිගත් කතුවරුන්ගේ වඩාත් ප්‍රසිද්ධ නම් සඳහා සුදුසු නාම ආකෘති ස්වයංක්‍රීය ව හඳුනාගැනීම හා උද්ධරණය සඳහා ලැයිස්තුවක් සම්පාදනය කෙරිණි. එමගින් සාධිකාරී ගොනුවක් භාවිත කර සියලු ම පුස්තකාලයවල පහසුකම් සැලසීම මගින් රටක පුද්ගල නාමවල ඒකමිතියක් ඇති කළ හැකි වේ.

**ප්‍රමුඛ පදඃ** පුස්තකාල, මාර්ගගත පොදු ප්‍රවේශ සූචි, සාධිකාරී පාලනය, සිංහල කර්තෘ නාම, ශ්‍රී ලංකාව

# Authority Control of the Sinhala Personal Names in the Online Public Access Catalogues (OPACs) in Sri Lanka

Dr. Priyanwada Wanigasooriya
Senior Lecturer, Department of Library and Information Science, University of Kelaniya
priyanwada@kln.ac.lk

**Abstract**

Personal names play a crucial role in finding library sources and identifying authors. Previous research has revealed that the most popular search path in library automation systems is searching under personal names. However, variations in personal names adversely affect the quality of information retrieval, the linking of related resources, and copyright management. When using Sinhala personal names, misspellings of names, use of the same author's name in several forms, and the presence of the same name for two authors make it impossible for computers to recognise the use of such names. Consequently, those entries are retrieved as two separate individuals. To this, libraries employ internationally accepted authority control files. In Sri Lanka, it is evident that many libraries adhere to name formatting patterns without giving due consideration to proper international authority formats. Establishing a suitable fully automated author name authority file is essential to minimise this confusion. Additionally, adopting appropriate transliteration processes is essential for effective authority control functions. The primary objective of this study was to develop an automated authority file for the accurate identification of books by their respective authors' names. The names of authors recorded in the OPACs of the National Library of Sri Lanka and the University of Moratuwa were used as a sample to identify name variation, and a statistical method was used to list them and identify patterns. To ascertain the utilisation of author name authority control in such occasions, OPACs of selected libraries were examined using the web survey method. This process included examining previous names, confirming relevant name headings, determining access points, determining the form of headings, and verifying whether the same individual appeared under various name forms. The study compiled a list for automatic recognition and retrieval of appropriate name forms for the well-known names of recognised authors, to reduce errors in searching author names identified during the study. It enables uniformity of personal names in a country by facilitating all libraries using a single authority file.

**Keywords:** Authority Control, Libraries, Online Public Access Catalogues, Sinhala Authors Name, Sri Lanka

# පොළොන්නරු යුගයේ සෙල්ලිපිවලින් හෙළිවන සමාජ කුල ක්‍රමය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (තෝරාගත් සෙල්ලිපි ඇසුරෙන්)

පී. එල්. ඒ. රුවන්ති කුරේ
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.
ruwanthicooray90@gmail.com

**සාරසංක්ෂේපය**

පොළොන්නරු රාජධානි යුගයේ සමාජ කුල ක්‍රමය පිළිබඳ කරුණු විමංසනය කිරීමේ දී අනුරාධපුර රාජධානි යුගයේ සමාජ කුල ක්‍රමයට වඩා බොහෝ වෙනස්කම් අනාවරණය වෙයි. පොළොන්නරු රාජධානි යුගයේ සමාජ කුල ක්‍රමය පිළිබඳ විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය. දහවන හා එකොළොස්වන සියවස්වල මෙරටට බලපෑම් කළ දකුණු ඉන්දියානු ආක්‍රමණ හා සංක්‍රමණ හේතුවෙන් දකුණු ඉන්දියානු සමාජ සංස්ථාවල ආභාසය දේශීය සමාජයේ කුල ක්‍රමය සකස් කරලීමට කොතෙක් දුරට බලපෑම් කළේ ද, එමගින් පොළොන්නරු යුගයේ සමාජ කුල ක්‍රමය ගොඩනැගුණු ආකාරය කෙබඳු ද? යන්න සොයා බැලීම මෙහි පර්යේෂණ ගැටලුව වශයෙන් හඳුනා ගැනුණි. ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍යය, ක්ෂුද්‍ර යන සංකල්පය ද උත්තම, අධම සහ මහාකුල, හීනකුල යන සංකල්පය ද මෙකල ව්‍යවහාර වී තිබේ. අනුරාධපුර යුගයේ පැවති ලම්බකර්ණ හා මෞර්ය යන ගෝත්‍රයන්ට අමතර ව කිලිඟු, බලිගෝජක, මොනසීහ ආදි ගෝත්‍ර හා කාලිංග, චන්ද්‍ර, ගිරි, පාණ්ඩ්‍ය ආදි වංශ කිහිපයක් ද රජ, බමුණු, වෙළෙඳ, ගොවි වශයෙන් ප්‍රධාන කුල හතරක් ද පොළොන්නරු යුගයේ සිට නිර්මාණය වූ බවක් දක්නට ලැබේ. පොළොන්නරු උතුරු වාසල් දොරටුව අබියස නිශ්ශංකමල්ල රජු පිහිටුවා ඇති සෙල්ලිපියක සඳහන් වන පරිදි පොළොන්නරු යුගයේ දී රාජ්‍ය බලය දැරීමට තරම් ගොවි කුලය ශක්තිමත් ව පැවතී ඇත. සමාජයේ අති බහුතරයක් ගොවිකුල ඇත්තෝ ය. එහෙත් රජු අවධාරණය කළේ ගොවි කුලයෙන් පැවත එන අයට රාජ්‍යයත්වය උරුම නොවිය යුතු බව යි. රාජ වංශිකයන් හිරුගෙන් හෝ සඳුගෙන් පැවත එන බව මෙකල පිළිගෙන ඇත. කපු, පෙහෙර, කුඹල්, වළන්, ලෝකුරු ආදි වශයෙන් වෘත්තිය මත පදනම් වූ කුල රාශියක් ද පැවතී තිබේ. පළමුවන විජයබාහු රජුගේ අඹගමුව සෙල්ලිපියෙහි සඳහන් පරිදි පහත් කුලවල සාමාජිකයින් හඳුන්වා ඇත්තේ 'අධම ජාතීන්' යනුවෙනි. සමාජය තුළ උසස් හා පහත් යනුවෙන් ප්‍රධාන ස්ථර දෙකක් වූ බව මෙයින් අනාවරණය වෙයි. ඒ අනුව තත්කාලීන ජන සමාජය තුළ සමාජ කුල ක්‍රමය ගොඩනැගීම සඳහා දකුණු ඉන්දීය සමාජ සංස්ථාවන්හි ආභාසය ඉවහල් වූ බව අවධාරණය කරගත හැකි වීම සහ සමාජය කුල, ගෝත්‍ර හා වංශ වශයෙන් බෙදී පැවති ආකාරය අනාවරණය කර ගත හැකි වීම මෙම පර්යේෂණයේ වැදගත්කම තීව්‍ර කරයි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ ප්‍රාථමික මූලාශ්‍රය ලෙස අදාළ ශිලාලිපි අධ්‍යයනයත් ද්විතීයික මූලාශ්‍රය ලෙස *මහාවංශය*, *Epigrapia Zeylanica Vol II* ආදි ග්‍රන්ථ පරිශීලනයත් සිදු කෙරුණි. ඒ අනුව දකුණු ඉන්දීය ආභාසය මත පොළොන්නරු රාජධානි යුගයේ සමාජ කුල ක්‍රමය කුල, ගෝත්‍ර හා වංශ වශයෙන් බෙදී නිර්මාණය වී පැවති ආකාරය පිළිබඳ ව මෙම පර්යේෂණයෙන් කරුණු අනාවරණය විය.

**ප්‍රමුඛ පදඃ** කුල ක්‍රමය, ගෝත්‍ර හා වංශ, පොළොන්නරු යුගය, සමාජය, සෙල්ලිපි

# An Investigative Study of the Social Caste System as Revealed by Inscriptions in Polonnaruwa Era (Based on Selected Inscriptions)

P.L.A Ruwanthi koorey
Department of Sinhala, University of Kelaniya
ruwanthicooray90@gmail.com

**Abstract**

Analysing the facts about the social caste system of the Polonnaruwa period reveals many differences compared to the Anuradhapura period. The primary objective of this research was to investigate the social caste system of the Polonnaruwa period. The research problem is to investigate to what extent the influence of the South Indian social institutions due to the South Indian invasions and migrations that affected this country in the eleventh and nineteenth centuries, influenced the caste system of the local society, and thus how the social caste system was built in the Polonnaru period. The concepts of *Kshatriya, Brahmin, Vaishya*, *Kshudra*, *Uttama, Adhama, and Mahā Kula*, Hīna Kula have also been used at this time. In addition to the *Lambakarna* and *Mōriya* tribes that existed in the Anuradhapura era, the tribes of *Kiligu*, *Baligojaka, Monaseeha*, etc., lineages of *Kālinga, Chandra, Giri, Pāndya*, etc. and four main castes such as King, Bamunu, Traders and Farmers seem to have been created since the Polonnaru era. As stated in an inscription established by King Nisshankamalla at the Polonnaruwa Northern Gate, the farming caste was strong enough to hold the state power during the Polonnaru period. The vast majority of the society belonged to the farming caste, but the king emphasised that the descendants of the farming caste should not inherit the statehood. It was accepted at this time that the dynasties were descended from the Sun or the Moon. There were also many castes based on professions such *as Kapu, Behera, Kumbal, Valan, Lōkuru,* etc. In the Ambagamuwa inscription of King Vijayabāhu, the members of the lower castes were called as degraded people. This reveals that there were two main layers in society, high and low. Accordingly, it can be revealed that the influence of the South Indian social institutions affected in creation of the social caste system in contemporary society and how the society was divided into castes, tribes, and lineages. Under the qualitative research method, primary data were gathered by studying the respective inscriptions, and secondary data were gathered using *Mahāvaṃsa*, and *Epigrapia Zeylanica Vol II*. Accordingly, it can be concluded that the social caste system was divided into castes, tribes, and lineages during the Polonnaruwa period based on the influence of South India.

**Keywords:** Inscriptions, Polonnaruwa Era, Society, The Caste System, Tribes and Lineages

# දහවන සියවසේ සෙල්ලිපිවල ඇතුළත් බදු ක්‍රම පිළිබඳ විග්‍රහාත්මක අධ්‍යයනයක් (තෝරාගත් සෙල්ලිපි ඇසුරින්)

ජී. ඩී. රංගිකා චතුරංගනී ගංගොඩවිල
කැලණිය විශ්වවිද්‍යාලය
gangodawilarangikachathurangan@gmail.com

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලාංකේය ඉතිහාසය ගොඩනගන්නෙකුට සෙල්ලිපි තරම් අගය කළ හැකි වෙනත් ප්‍රාථමික මූලාශ්‍රයක් නැති තරම් ය. ක්‍රිස්තු පූර්ව තෙවන සියවසේ සිට ක්‍රමයෙන් සෙල්ලිපි විකාශනය වූ අතර එමගින් ලක්දිව දේශපාලන, ආර්ථික, සමාජ, සංස්කෘතික හා ආගමික යනාදි සෑම ක්ෂේත්‍රයක් පිළිබඳ ව ම කරුණු හෙළිවෙයි. ක්‍රිස්තු වර්ෂ දසවන සියවසේ සෙල්ලිපි මගින් ප්‍රකාශ වන්නේ යුගාවලි වශයෙන් ගතහොත් මධ්‍යතන සිංහල අවධිය යි. මෙම අවධියේ ආර්ථික ක්‍රියාවලියේ මූලික ආදායම් ක්‍රමය බවට පත් වූයේ බදු අය කිරීම ය. බද්දක් යනු සෘජු ප්‍රතිලාභ නොලබා රජයට කළ යුතු අනිවාර්ය ගෙවීමකි. ඒ අනුව බද්ද වනාහි පෞද්ගලික දේපළ හිමියන් විසින් රජයට සහයෝගයක් වශයෙන් ගෙවන ලද ගෙවීමක් ලෙස හැඳින්විය හැකි ය. ක්‍රිස්තු වර්ෂ දසවන සියවසේ ලියවුණු සෙල්ලිපි මගින් හඳුනාගත හැකි බදු වර්ග පිළිබඳ ව තොරතුරු අනාවරණය කර ගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ යි. දහවන සියවසේ සෙල්ලිපිවල ඇතුළත් බදු ක්‍රම පිළිබඳ හා එහි ස්වභාවය හා රාජ්‍යය පාලනයට එකී බදු ක්‍රමය දායක වූයේ කෙසේ ද? යන්න මෙම පර්යේෂණයට පාදක වන පර්යේෂණ ගැටලුව වේ. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ ප්‍රාථමික හා ද්විතීයික සාහිත්‍ය මූලාශ්‍රය යොදාගනිමින් පර්යේෂණය සිදුකර තිබේ. දසවන සියවසේ සෙල්ලිපි මගින් බදු ක්‍රම සම්බන්ධයෙන් පනවන ලද ව්‍යවස්ථා රෙගුලාසි හා විධි විධාන පිළිබඳ ව විමසීමේ දී රජයේ අවශ්‍යතා පූරණය සඳහා විටෙක බදු අය කළේ ද්‍රව්‍ය වශයෙන් හෝ මූල්‍යමය වශයෙනි. එනම් මානව ශිෂ්ටාචාරයේ රාජ්‍ය යන සංකල්පය මතුවීමත් සමඟ ම යම් යම් අවශ්‍යතා අරමුණු කොටගෙන බදු අය කළ බවට සෙල්ලිපි සාක්ෂ්‍ය දරයි. ක්‍රිස්තු වර්ෂ දසවන සියවසේ ලියැවුණු තෝරාගත් සෙල්ලිපි කිහිපයක දැක්වෙන මෙලාට්සි, දසවිධ, ගම්පාට්ට, පෙරනාට්ටියම්, රට්දග්, පාට්ට, අයබදු, තෙල්පද්ද, සුත් බඩු, වරද දඩ අට, රද්දඩ, උල්වාඩු, ගෙදඩ්, සිහින්දඩ, කීණ, කොදඩ්, බිම්සොවස්, කුලී, මහවර්, යනාදි වශයෙන් බදු ක්‍රම රාශියක් පිළිබඳ ව කරුණු අනාවරණය විය. මෙම අධ්‍යයනයෙන් ක්‍රිස්තු වර්ෂ දසවන සියවසේ ක්‍රියාත්මක වූ බදු ක්‍රම ඔස්සේ සංවිධිත සමාජයක් බිහිකිරීමට රජවරුන් ගත් උත්සාහය කෙතරම් ද යන්න පිළිබඳ මනා අවබෝධයක් ලබාගත හැකි වූ බව සඳහන් කළ යුතු ය.

**ප්‍රමුඛ පදඃ** අනුරාධපුරය, ආර්ථිකය, දසවන සියවස, බදු ක්‍රම, සංවිධිත සමාජය.

# An Investigation on the Nature of Taxation in Inscriptions Belong to 10th Century A.D (Based on Selected Inscriptions)

G.D. Rangika Chathurangani Gangodawila
University of Kelaniya
gangodawilarangikachathurangan@gmail.com

**Abstract**

There is hardly any primary source that a person who investigates Sri Lankan history can appreciate more than the inscriptions. Inscriptions, which trace their origins back to the third century B.C., reveal facts about every field of politics, economy, society, culture, and religion. Inscriptions of the 10th century A.D. reveal the medieval Sinhalese period in terms of epochs. Taxation became the primary source of income in the economy at this stage. A tax is a compulsory payment to the government without direct benefits. Accordingly, tax can be described as a payment made by private property owners as support to the government. The main purpose of this research is to uncover information about the types of taxes that can be identified by the inscriptions written in the tenth century AD. The nature of the tax system included in the inscriptions of the tenth century and how the tax system contributed to the government is the research problem of the present study. Data were gathered using primary and secondary literature sources under the qualitative research method. In inquiring about the constitutional regulations and provisions imposed by the inscriptions of the tenth century, taxes were sometimes levied materially or financially to meet the needs of the government. It is evident from these inscriptions that taxes were imposed to cater to specific needs, with the emergence of the state within human civilisation. Findings reveal that numerous tax methods documented in these inscriptions, including *Melātsi, Dasavida, Gampatti, Peranāttiyam, Ratdag, Pātta, Ayabadu, Telpadda, Sut Badu, Warada Dada Ata, Raddada, Ulwādu, Gedad, Sihindada, Kīna, Kodad, Mimsowas, Kulī,* and *Mahawar.*Furthermore, this study illustrates how the kings worked hard to create an organized society through the tax systems implemented in the tenth century AD.

**Keywords:** Anuradhapura, economy, 10th century, taxation, organized society.

# භාෂණ සිංහලයේ භාවිත වන රූඪී හා ඉඟිවැකි පිළිබඳ විමසුමක්

ඩබ්ලිව්. කරුණාරත්න
ගිරාගම ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය
karugiratc@gmail.com

**සාරසංක්ෂේපය**

වාග්විද්‍යාවේ විෂය පථය වන භාෂාවේ, භාෂණය හා ලේඛනය යනුවෙන් ස්වරූප දෙකකි. වාග්විද්‍යාත්මක අධ්‍යයනවල දී භාෂණයට වැඩි අවධානයක් දක්වනු ලැබේ. සිංහල භාෂණයේ දක්නට ලැබෙන 'ඉහේ මලක් පිපුණා', 'ඔළුව ඉදිමිලා' වැනි සාම්ප්‍රදායික යෙදුම් ඇතැම්හු රූඪී නමින් ද ඇතැම්හු ඉඟිවැකි නමින් ද අවිශේෂයෙන් හඳුන්වති. ඉඟිවැකි හා රූඪී නමින් හඳුන්වන්නේ එක ම සංකල්පයක් ද නැතිනම් සංකල්ප දෙකක් දැයි විමසා බැලීම මෙම පර්යේෂණයේ අරමුණ විය. විස්තරාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කරමින් සිදු කළ මෙම පර්යේෂණය සඳහා සිංහල භාෂාවේ භාවිත වන ඉඟි වැකි හා රූඪී සියයක් පමණ විශ්ලේෂණය කළ අතර  වෙනත් භාෂා කිහිපයක රූඪීවල ස්වභාවය ද අධ්‍යයනයට කෙරුණි. 'ඉඟිවැකි' හැඳින්වීම සඳහා සංස්කෘත භාෂාවේ 'රූඪී' යන්න ද පාලි භාෂාවේ 'රූළ්හි' යන්න ද පර්යාය වශයෙන් යෙදේ. ව්‍යාකරණානුකූල නෛරුක්තික විග්‍රහයකින් අර්ථකථනය නොකළ හැකි වචන 'රූඪී' නමින් මාතෘ භාෂාවල අර්ථ දැක්වේ. පාලියේ 'මණ්ඩප' යනු රූඪීයකි. 'මත් වන දේ බොන්නා' යනු එහි වාච්‍යාර්ථයයි. එහෙත් මණ්ඩප යන්නෙහි රූඪී අර්ථය 'සමාන අදහස් ඇති අය රැස්වන තැන' යන්න යි. 'ගෝචර' යන්නෙහි වාච්‍යාර්ථය 'ගවයන්ගේ හැසිරීම' වුවත් එහි රූඪී අර්ථය 'ගොදුරු' යන්න යි. රූඪී සඳහා යෙදෙන ඉංග්‍රීසි පර්යාය පදය වන IDIOM යන්නෙහි අදහස තනි වචනයකින් අර්ථය තේරුම් ගත නොහැකි යන්නයි. නිදසුන් ලෙස Colour යනු වර්ණය වුවත් Colour-blind (වර්ණාන්ධ) Join the colour (හමුදාවට බැඳෙනවා) Off – colour (සනීප මඳ) යන අර්ථ සඳහා භාවිත වේ. වෙනත් භාෂාවල මෙන් වාච්‍යාර්ථයෙන් පැහැදිලි කළ නොහැකි අර්ථ දෙන රූඪී සිංහල භාෂණයේ දක්නට ලැබේ. 'කජු කනවා', 'දෙහි කපනවා', 'කිඹුල් කඳුළු', 'ඇගේ මාළු නටනවා' වැනි යෙදුම්හි අර්ථය වාච්‍යාර්ථය ඉක්මවා තිබේ. ඒ අනුව පැහැදිලි වන්නේ වාච්‍යාර්ථයෙන් පැහැදිලි කළ නොහැකි 'රූඪී' ද සිංහල භාෂාවේ ඇති බව යි. එසේ ම 'බහින කලාව', 'මූණේ දැලි ගානවා', 'ඉහේ මලක් පිපුණා' වැනි  වාච්‍යාර්ථයෙන් එහි ආරූඪ අර්ථයට ඉඟි සපයන යෙදුම් ද ඇත. ඒවා රූඪී නො ව 'ඉඟිවැකි' ය.  විස්තරාත්මක අධ්‍යයනයක් සහිත ව කළ මෙම පර්යේෂණය මගින් එළඹුණු නිගමනය වූයේ ඉඟිවැකි හා රූඪී යනු එක ම සංකල්පයක් නො ව එකිනෙකට වෙනස් සංකල්ප දෙකක් බව යි.

**ප්‍රමුඛ පදඃ** ඉඟිවැකි, භාෂණය, රූඪී, වාච්‍යාර්ථය, සාම්ප්‍රදායික යෙදුම්

# An Investigation about the Idioms (*Rūḍhi*) and Hints (*Iňgiwäki*) in Spoken Sinhala

W.Karunarathna
Professional Development Center For Teachers – Giragama
karugiratc@gmail.com

**Abstract**

Language, which is the scope of linguistics, has two forms, speech and writing. In linguistic studies, more attention is paid to speech. Traditional expressions like *'ihē malak pipunā'*, *'oluva idimilā*', in the Sinhala language, are known by some people as *Rūḍhi* (idioms) and also as *Iňgiwäki* (hints). The objective of this research was to investigate whether what is known as *Rūḍhi* and *Iňgiwäki* is one concept or two concepts. For this research, which was carried out following the descriptive research method, about 100 idioms (*Rūḍhi*) and hints (*Iňgiwäki*) used in the Sinhala language were analysed and the nature of idioms in several other languages was also studied. 'Hints' (*Iňgiwäki*) are called in Sanskrit as '*Rūḍhi*' and in Pāli as *'Rūḷhi'*. Words that cannot be interpreted by grammatical etymological analysis are defined as '*Rūḍhi* ' in native languages. In Pāli '*maṇḍapa*' is a *Rūḍhi*. It denotative meaning is 'a person who drinks drinker intoxicants'. But the *Rūḍhi* (idiomatic) meaning of '*maṇḍapa*' is a 'place where like-minded people gather'. Although the denotative meaning of 'gōcara' is 'behaviour of cattle', its *Rūḍhi* (idiomatic) meaning is 'object'. The English synonym for *Rūḍhi*, Idiom, means words cannot be taken individually to understand the meaning. For instance, although 'colour' means 'colour of something', it is used to mean 'colour-blind (unable to distinguish certain colours), 'join the colour' (join the army), and 'off-colour' (not well). As in other languages, *Rūḍhi* (idioms), which cannot be explained literally, is also found in Sinhala. The meaning of phrases such as '*Kadju kanawa*' (eating cashews), *'Humbas biya'* (phobia of anthills), *'kimbul kandulu heleema'* (shedding crocodile tears) and *'Ange malu natanawa'* (body flesh dancing) have gone beyond the denotative meaning. Accordingly, it is clear that *Rūḍhi* (idioms), which cannot be explained denotatively, is also found in the Sinhala language. Also, there are phrases like *'Bahina Kalava'*, *'Mune Dali Ganawa'*, *'Golubeli Gamana'* which give clues to its deep meaning. They are not *Rūḍhi*, but 'hints' (*Iňgiwäki*). Accordingly, it can be concluded that '*Iňgiwäki'* and *Rūḍhi* are not the same concept but two different concepts.

**Keywords:** Allusive, Conventional Applications, Discourse, Rhetoric, Rūḍhi

# ප්‍රාකෘත යුගයේ බ්‍රාහ්මී ශිලාලේඛනවලින් හඳුනා ගත හැකි මත්ස්‍ය සංකේතයේ සන්නිවේදනාර්ථ පිළිබඳ අධ්‍යයනයක්

කේ. ඩී. මලීෂා දිල්හානි
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
upekhasawmini@gmail.com

**සාරසංක්ෂේපය**

පෙරදිග පුරාණ සන්නිවේදන සංකේතයක් ලෙස මත්ස්‍ය ලකුණ සමාජගත වී ඇත. පෙරදිග රටවල මෙන් ම බොහෝ දකුණු ආසියාතික රටවල ද පැරණි සටහන්වල මත්ස්‍ය සලකුණ අන්තර්ගත වන අතර ශ්‍රී ලාංකේය පුරාණ ලේඛනවල ද මත්ස්‍ය සංකේතය සඳහා සාධක හමු වේ. මෙම පර්යේෂණයෙන් විමසා බැලෙන්නේ ලාංකේය බ්‍රාහ්මී සෙල්ලිපිවලින් හඳුනා ගත හැකි මත්ස්‍ය සංකේතයේ සන්නිවේදන ස්වභාවය පිළිබඳ ව යි. ජාත්‍යන්තර මට්ටමේ ව්‍යාප්තියක් පෙන්නුම් කරන මත්ස්‍ය සංකේතයේ දේශීය අර්ථකථනය කෙබඳු ද යන්න සොයා බැලීමත්, ශිෂ්ටාචාරගත අප්‍රකට ලේඛන ක්‍රමය වටහා ගැනීමත් මෙම පර්යේෂණයේ අරමුණු වේ. ලාංකේය ශිලාලේඛනවලින් නිරූපණය වන මත්ස්‍ය සංකේතයේ දේශීය අර්ථකථනය කෙබඳු ද? යන්න විමසා බැලීම මෙහි පර්යේෂණ ගැටලුව යි. ලාංකේය මත්ස්‍ය සංකේතයේ සන්නිවේදනාර්ථ ගවේෂණය කිරීමේ යෝග්‍ය මූලාශ්‍රය වන්නේ ශිලාලේඛන බැවින් මෙම පර්යේෂණයේ පර්යේෂණ නියැදිය වශයෙන් තෝරා ගැනෙන්නේ ප්‍රාකෘත යුගයේ රචනා වූ බ්‍රාහ්මී ශිලාලේඛන යි. මෙම අධ්‍යයනය, ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට යටත් ව ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ක්ෂේත්‍ර අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා සහ මෙම විෂයට අදාළ ප්‍රාථමික ග්‍රන්ථ අධ්‍යයනය සිදු කෙරිණි. ග්‍රන්ථ හා පර්යේෂණාත්මක කෘති ද්විතීයික මූලාශ්‍රය ලෙස යොදා ගෙන ඇති අතර සඟරා, පුවත්පත් තෘතීයික මූලාශ්‍රය ලෙස පරිශීලනය කර ඇත. මෙකී ක්‍රමවේද ඔස්සේ දත්ත රැස් කර විශ්ලේෂණය කිරීමෙන් බ්‍රාහ්මී සෙල්ලිපිවලින් නිරූපණය වන මත්ස්‍ය සංකේතයේ දේශීය සන්නිවේදනය කෙබඳු දැයි අවබෝධ කොට ගත හැකි ය. ප්‍රාකෘත යුගයේ ශිලාලේඛනවල බ්‍රාහ්මී නොවන සංකේතයක ස්වරූපයෙන් කේවල ව හා වෙනත් බ්‍රාහ්මී නොවන සංකේත සමඟ මිශ්‍ර වී බහු සංකේතයක ස්වරූපයෙන් ද මත්ස්‍යා සටහන් වී ඇත. ඒ අනුව මත්ස්‍ය සංකේතය සඳහා දිය හැකි අර්ථකථන කිහිපයකි. කේවල මත්ස්‍ය සංකේතය මගින් රුහුණු ප්‍රදේශය පාලනය කරන ලද ධර්මරාජ පරම්පරාව නිරූපණය කොට ඇති අතර මත්ස්‍යා සහ ගරාදි වැට යන සංකේතද්වය සටහන් වීමෙන් 'දම' යන ප්‍රාදේශීය රාජ පරම්පරාව සහ 'ගමණී' යන පරම්පරා නාමය නිරූපිත ය. මොවුන්ගේ පොදු නාමය වූයේ කතරගම ක්ෂත්‍රියයන් යනුවෙනි. එම නිසා රෝහණයේ නිල ලාංඡනය ලෙස තම අනන්‍යතාව දැක්වීම උදෙසා මත්ස්‍ය සංකේතය භාවිත කර ඇති බැව් සිතිය හැකි ය. එමඟින් දේශීය රාජ පරම්පරාවක් මෙම මත්ස්‍ය සංකේතය භාවිත කළේ යැයි තහවුරු කර ගත හැකි අතර ලාංකේය ශිලාලේඛන අධ්‍යයනය කිරීමෙන් මත්ස්‍ය සංකේතයේ ලාංකේය භාවිතය කෙබඳු ද යන්න අවබෝධ කොට ගත හැකි විය.

**ප්‍රමුඛ පදඃ** ප්‍රාකෘත යුගය, බ්‍රාහ්මී නොවන සංකේත, බ්‍රාහ්මී ශිලාලේඛන, මත්ස්‍යයා, සන්නිවේදනාර්ථ

# A Study of the Communicative Meanings of the Symbol of the Fish in Brahmi Inscriptions during the Prakit Age

Maleesha Dilhani
Department of Sinhala, University of Kelaniya
upekhasawmini@gmail.com

## Abstract

The symbol of the fish has been socialised as an ancient communication symbol in the East. In Eastern countries as well as in many South Asian countries, ancient records contain the fish symbol, and evidence for the fish symbol is also found in Sri Lankan ancient writings. This research examines the communicative nature of the fish symbol that can be identified in Sri Lanka Brahmi Inscriptions. The objectives of this research are to find out what is the local interpretation of this symbol of the fish, which shows an international expansion, and to understand the hidden writing system of civilisation. The research problem is to investigate the local interpretation of the fish symbol depicted in Sri Lankan inscriptions. Therefore, since inscriptions are the appropriate source for exploring the communicative meaning of the Sri Lankan fish symbol, the Brahmi inscriptions composed in the Prakit period are selected as the research sample of this research. Subject to a qualitative research method, field study, interviews, and primary literature study related to this subject were used as the primary sources. Books and research work have been used as the secondary sources and magazines and newspapers have been used as the tertiary sources. By collecting and analysing data through these methods, it is possible to understand the local communication of the fish symbol depicted in the Brahmi inscriptions. Prakrit era inscriptions record the fish as a single symbol in the form of a non-Brahmi symbol and the form of multiple symbols mixed with other non-Brahmi symbols. Accordingly, there are several possible interpretations of the fish symbol. The single fish symbol represents the Dharmaraja dynasty that ruled the Ruhunu area and the dual symbols of fish and garadi fence represent the local royal dynasty of " Dama" and the family name of " Gamani". Their common name was Kataragama Kshatriyas. Therefore, it is possible to think that the fish symbol has been used as the official logo of Rohana to show his identity. This confirms that a local dynasty used this fish symbol. Accordingly, by studying Sri Lankan inscriptions, it is possible to understand the usage of the fish symbol in Sri Lanka.

**Keywords:** Brahmi Inscriptions, Communicative Nature, Fish Symbol, Non- Brahmi symbols, Prakit Era

# සිංහල භාෂාවේ සම්භවය පිළිබඳ දක්වා ඇති මත පිළිබඳ අධ්‍යයනයක්

අයි. ඩී. ගිම්හානි මලීෂා දිසානායක
කැලණිය විශ්වවිද්‍යාලය
gmaleesha315@gmail.com

**සාරසංක්ෂේපය**

භාෂාව යනු මානව වර්ගයාට පමණක් සුවිශේෂ සන්නිවේදන මාධ්‍යයක් වේ. සිංහල භාෂාවේ සම්භවය කවදා කෙසේ සිදුවුණි දැයි නිශ්චිතව ම ප්‍රකාශ කළ නොහැකි වුවත් භාෂාව පිළිබඳ තොරතුරු ගවේෂණය කරනු ලබන භාෂාවේදීන් විසින් ඒ පිළිබඳ ව විවිධ මත ඉදිරිපත් කර ඇත. ඒ අනුව විද්‍යාත්මක සහ ඓතිහාසික තොරතුරු ගවේෂණය කරමින් සිංහල භාෂාවේ සම්භවය පිළිබඳ ව දක්වා ඇති ප්‍රධාන මත කිහිපයක් පාදක කොට ගනිමින් අධ්‍යයනයක් සිදු කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වෙයි. සිංහල භාෂාව පිළිබඳ භාෂාවේදීන් දක්වා ඇති මත විමසමින් සිංහල භාෂා සම්භවය සිදු වූයේ කෙසේ ද? යන්න විමසා බැලීම මෙහි පර්යේෂණ ගැටලුව යි. අදාළ තොරතුරු ඇතුළත් ග්‍රන්ථ, ලිපි, සඟරා ආදිය ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය ලෙස ගෙන ගුණාත්මක දත්ත ක්‍රමවේදය යටතේ සිංහල භාෂාවේ සම්භවය පිළිබඳ මත අධ්‍යයනය කරනු ලැබිණි. ඒ අනුව සිංහල භාෂාවේ සම්භවය ඉන්දු ආර්ය භාෂා ගණයක් බවට වන මතය, ව්‍යාකරණමය සහ වාක්කෝෂමය සාධක ඉදිරිපත් කරමින් ජේම්ස් කෝඩිනර්, විල්හෙල්ම් ගයිගර්, සෙනරත් පරණවිතාන වැනි උගතුන් ඉදිරිපත් කර ඇති අතර එය ඉන්දු අනාර්ය භාෂා ගණයට අයත් බව සිංහල වාක්කෝෂයේ පවතින ද්‍රාවිඩ ලක්ෂණ පදනම් කරගනිමින් තියඩෝර් ජී. පෙරේරා, රීස් ඩේවිඩ්ස් වැනි වියතුන් ප්‍රකාශ කර ඇත. තව ද සිංහල භාෂාවේ නිෂ්පන්න පද දක්නට ලැබීම හේතු කොට ගෙන සිංහල භූමියේ ම උපන් භාෂාවක් බවට ද මත ඉදිරිපත් වේ. ඒ අනුව මෙම පර්යේෂණයේ ප්‍රතිඵල වශයෙන් ඉදිරිපත් කළ හැක්කේ සිංහල භාෂාව වඩාත් භාරතීය ආභාසයට ලක්වන බව පෙනී යන කරුණක් වුවත් එය සිංහල භූමියේ ම පාරිශුද්ධ භාෂාවක් ලෙස උපත ලබා පසුකාලීන ව ඇති වූ සමාජීය කරුණු පදනම් කරගනිමින් ඉන්දු ආර්ය සහ අනාර්ය ලක්ෂණ මිශ්‍ර කරගනිමින් වර්තමානයේ ව්‍යවහාර වන තත්ත්වයට පත් වූ බව යි.

**ප්‍රමුඛ පදඃ** අනාර්ය, ආර්ය, නිෂ්පන්න, භාෂා සම්භවය, සිංහල භාෂාව

# A Study of the Opinions Expressed about the Origin of the Sinhala Language

I.D. Gimhani Maleesha Dissanayake
University Of Kelaniya
gmaleesha315@gamil.com

**Abstract**

Language is a means of communication unique to mankind. Although it is not possible to say exactly when and how the Sinhala language originated, the linguists who research the language have presented different opinions about it. Accordingly, the objective of this research is to explore the scientific and historical information and conduct a study based on some of the main opinions given about the origin of the Sinhala language. The research problem is to investigate how the Sinhala language originated based on the opinions given by linguists about the Sinhala language. Opinions on the origin of the Sinhala language were studied using books, articles, and magazines that contain relevant information as primary and secondary sources under the qualitative research method. Here scholars such as James Cordinor, Wilhelm Geiger, and Senarath Paranawithana have presented grammatical and lexical facts on the origin of the Sinhala language as an Indo-Aryan language, and based on the Dravidian features in the Sinhala lexicon, Theodore G. Perera and Rees David have stated that it belongs to the category of non-Indo Aryan languages. Moreover, due to the occurrence of words derived from the Sinhala language, it is also suggested that Sinhala is a native language. According to the results of this research, it can be presented that although the Sinhala language is more influenced by India, it was born as a pure language in the Sinhalese land itself, and based on the social facts that arose later, it became the current state of use, mixing both Indo-Aryan and non-Indo Aryan characteristics.

**Keywords:** Aryan, Language, Non-Indo Aryan, Origin of Sinhala, Sinhala Language

# සිංහල පරිමිත ව්‍යවහාරවල ස්වාධීනතා පිළිබඳ අධ්‍යයනයක්

ඒ. එස්. ෂෙහාන් ඩිල්ශංක
පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය
shehandilshanka123@gmail.com

**සාරසංක්ෂේපය**

සමාජයේ පවතින අතිශයින් විශේෂ වූ කාර්යය සඳහා පමණක් යොදා ගන්නා භාෂාත්මක ව්‍යවහාර 'පරිමිත ස්වරූප' යනුවෙන් හැඳින්විය හැකි ය. ජේ. ආර් ෆර්ත් (J.R. Firth) මෙකී ස්වභාවය හඳුන්වා දී ඇත්තේ 'Restricted Language' යනුවෙනි. එය 'පරිමිත භාෂා' යනුවෙන් සිංහල භාෂාවට හඳුන්වා දෙන ලද්දේ මහාචාර්ය සුගතපාල ද සිල්වා විසිනි. ඇතැමුන් පරිමිත ස්වරූප ලෙස දක්වා ඇත්තේ 'ප්‍රාස්තාවික ස්වරූප' ය. එහෙත් පරිමිත ස්වරූපයේ ඊට ම ආවේණික ස්වාධීනතා කිහිපයක් හඳුනාගත හැකි ය. මෙම භාෂා ස්වරූපයේ ඇතුළත් සුවිශේෂ ලක්ෂණයක් වන්නේ එම ව්‍යවහාර වෙනස් නොවී පැවතීම යි. එනම් භාෂා විකාසනයේ දී පැනනගින විවිධ බලපෑම් හේතුවෙන් එකී භාෂාවේ ස්වභාවය වෙනස් නොවන ස්වභාවය යි. අභිචාරාත්මක ලක්ෂණවලින් යුක්ත වීම ද මෙහි ඇතුළත් අනන්‍යතාවකි. නිදසුනක් ලෙස මහකැලේ යෑමේ දී භාවිත බස්වහර, ශ්‍රී පාද වන්දනයේ දී භාවිත බස්වහර සහ කමතේ දී භාවිත බස්වහර ආදිය පෙන්වා දිය හැකි ය. මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව ලෙස සැලකෙන්නේ සිංහල භාෂා පරිමිත ස්වරූපයෙහි ස්වභාවය හා ස්වාධීන ලක්ෂණ කෙබඳු ද? යන්න විමසා බැලීමයි. ඒ අනුව පරිමිත ස්වරූප පිළිබඳ පවතින මිථ්‍යා මත බැහැර කිරීම ද නිරවද්‍ය පරිමිත ස්වරූප හඳුනා ගැනීම ද කෙරෙහි අවධානය යොමු කෙරුණි. මෙම අධ්‍යයනයේ දී භාෂාව හා සම්බන්ධ ග්‍රන්ථ සහ පර්යේෂණාත්මක කෘති ප්‍රාථමික සහ ද්විතීය මූලාශ්‍රය ලෙස ද සඟරා, වෙබ් අඩවි තෘතීය මූලාශ්‍රය ලෙස ද යොදාගෙන ඇත. පර්යේෂණයට අදාළ අධ්‍යයන ප්‍රතිඵල වන්නේ සිංහල භාෂා ව්‍යවහාරයෙහි ඇතුළත් විවිධ භාෂා ප්‍රභේද අතරින් මෙතෙක් 'පරිමිත ව්‍යවහාර' යන්න හඳුනා ගැනීමේ දී උද්ගතව පැවති අර්බුදකාරී අවස්ථා හඳුනා ගනිමින් සිංහල පරිමිත ස්වරූපයන්හි අනන්‍ය ලක්ෂණ වටහා ගැනීමට ඉඩ ප්‍රස්ථා විවර කිරීම යි. එමගින් සිංහල භාෂාව අධ්‍යයනය කරන්නෙකුට මුහුණ දීමට සිදුවන දුෂ්කරතා ද අවම වීම සිදු වේ. මෙම පර්යේෂණයෙහි නිගමනය වන්නේ, පරිමිත ස්වරූප යනු පමණට බිණීම හෙවත් අවශ්‍ය පමණට කතා කරන, මිනිසාගේ අභිචාරාත්මක විශ්වාස සමඟ බද්ධ වූ, භාෂාව අලංකාර කරන, ස්වාධීන ලක්ෂණයන්ගෙන් යුත් ඉතා සීමාසහිත භාෂා ව්‍යවහාරයක් බව යි.

**ප්‍රමුඛ පදඃ** පරිමිත භාෂා, ප්‍රාස්තාවික ස්වරූප, සිංහල, භාෂා ව්‍යවහාරය, ස්වාධීන ලක්ෂණ

# A Study of Unique Characteristics in Restricted Langauge Usage in Sinhala

A.S. Shehan Dilshanka
Faculty of Graduate Studies, University of Kelaniya
shehandilshanka123@gmail.com

**Abstracts**

Usage in language that serves highly specific functions in society can be termed 'Restricted Forms.' This concept was introduced by J. R. Firth as 'Restricted Language.' It was adapted as '*Parimita Bhāshā'* into Sinhala by Professor Sugathapala De Silva. Some have referred to these restricted forms as 'registers'. However, some unique independence of the restricted form can be identified. A remarkable characteristic of this form is that it remains unchanged over time. That is to say, the nature of a language does not change due to various influences during the evolution of language. Furthermore, ethical characteristics are also a significant identity of this. For instance, the language used when travelling in great forests, the language used when worshipping Sri Pada, and the language used when engaging in threshing activities. The research problem is to investigate the nature and independent characteristics of these restricted forms. Accordingly, the attention was also drawn to dispelling existing myths about restricted forms and identifying accurate restricted forms. The study utilises books and research works related to language as primary and secondary sources, while magazines and websites serve as tertiary sources. The results of this research demonstrate that by understanding the crises that have arisen in identifying "restricted usgae" within the various language varieties of Sinhala, it is possible to grasp the unique characteristics of Sinhala restricted forms. Furthermore, this research aims to alleviate the challenges encountered by students learning the Sinhala language. It can be concluded that restricted usage is a very limited language usage with independent characteristics, which is only used when necessary, interwoven with the moral beliefs of man, embellishing the language.

**Keywords**: Distinctive Features, Registers, Restricted language, Sinhala Language

# අනුරාධපුර යුගයේ කාන්තා භූමිකාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (අනුරාධපුර යුගයේ ශිලා ලේඛන ඇසුරෙන් )

එච්. ඩබ්. එම්. ජී. එස්. එස්. හේරත්
කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
herathshani14@gmail.com

**සාරසංක්ෂේපය**

ලක්දිව ඉතිහාසය විමසා බලන විට අනුරාධපුර යුගයට අදාළ සමාජීය, දේශපාලනික, ආර්ථික හා සංස්කෘතික වශයෙන් විද්‍යමාන සාක්ෂ්‍ය බොහෝ ප්‍රමාණයක් ශිලාලේඛනාශ්‍රයෙන් සපයාගත හැකි ය. ඓතිහාසික තොරතුරු මූලාශ්‍රය විමසා බලන විට කුවේණිය, සංඝමිත්තා තෙරණිය, අනුලා බිසව, හේමමාලා කුමරිය ආදි ප්‍රභූ කාන්තාවන් පිළිබඳ තොරතුරු හමු වුව ද සාමාන්‍ය කාන්තාවන් පිළිබඳ තොරතුරු සඳහන් වන්නේ ඉතා අල්ප වශයෙනි. ඒ අනුව ක්‍රි.පූ. 3වන සියවස සිට 10වන සියවස තෙක් අතීත ලංකාවේ කාන්තාවන් පිළිබඳ තොරතුරු ගවේශනාත්මක ව අධ්‍යයනය කිරීම හා අනුරාධපුර යුගයේ කාන්තාවට තත්කාලීන සමාජයේ කුමන ආකාරයේ ජීවන රටාවක් උරුම වූවා දැයි යන්න විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වී ඇත. ප්‍රධාන වශයෙන් *epigraphia zeylanika* සහ *Inscriptions of Ceylon* කෘති පාදක කොට ගෙන තොරතුරු රැස්කොට එම කෘතිවල කාන්තාවන් පිළිබඳ ව සඳහන් වන සෙල්ලිපි, ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ විශ්ලේෂණය කෙරුණි. එසේ අනුරාධපුර යුගයට අයත් ශිලාලේඛනවල සඳහන් තොරතුරු අනුව පැහැදිලි වන කරුණක් නම් අනුරාධපුර යුගයේ කාන්තාව සමාජයේ වැදගත් ස්ථානයක් හිමිකර ගෙන සිටි බව යි. එමෙන් ම රහතන් වහන්සේ, භික්ෂූන් වහන්සේ, භික්ෂුණීන් වහන්සේ වෙනුවෙන් ලෙන් පූජාකිරීමේ දී මූලිකත්වය ගෙන කටයුතු කළ පිරිස අතර කාන්තාවට ද ප්‍රමුඛස්ථානයක් හිමි ව තිබේ. රජ කෙනෙකු විසින් රචිත සෙල්ලිපි බොහෝ ප්‍රමාණයක රජු හැඳින්වීමට රජුගේ මව පිළිබඳ ව තොරතුරු සඳහන් කළ ද, ලෙන් ලිපි රචනා කිරීමේ දී ඒ එක් එක් කාන්තාවගේ පියා හෝ ස්වාමිපුරුෂයා පිළිබඳ ව ද සඳහන් කරමින් ඇය කවරෙකුගේ දියණියක දැයි, කවරෙකුගේ බිරිඳක දැයි යන අනන්‍යතාව පෙන්වා දීමට කටයුතු කළ බව අනාවරණය වේ. ඒ අනුව අනුරාධපුර යුගයේ කාන්තාව සමාජ, දේශපාලන, ආර්ථික හා ආගමික කටයුතු සඳහා සක්‍රීය ව තම දායකත්වය ලබා දී ඇති දැයි යන අධ්‍යයනයට අවශ්‍ය සාධක බොහෝ ප්‍රමාණයක් ශිලාලේඛනවල සඳහන් ව තිබිණි.

**ප්‍රමුඛ පද:** අනුරාධපුර යුගය, කාන්තාව, දේශපාලනය, සමාජය, සෙල්ලිපි

# An Investigative Study of the Role of Women in the Anuradhapura Period (Based on the Inscriptions of the Anuradhapura Period)

H.W.M.G.S.S.Herath
University of Kelaniya
herathshani14@gmail.com

## Abstract

When examining the history of Sri Lanka, a lot of social, political, economic, and cultural evidence of the Anuradhapura period can be provided from inscriptions. When examining the sources of historical information, although there is a considerable amount of information about elite women such as *Kuveni, Therani Sanghamitta, Queen Anula, Princess Hemamala,* etc., less information is mentioned about ordinary women. Accordingly, the objective of this research is to investigate the information about women in Sri Lanka from the 3rd century BC to the 10th century and to investigate what kind of lifestyle the women of the Anuradhapura era inherited in that society. Mainly based on the work *Epigraphia Zeylanika* and *Inscriptions of Ceylon* data were gathered and inscriptions that contain information about women were analysed under qualitative research method. According to the information mentioned in the inscriptions belonging to the Anuradhapura period, it is clear that women occupied an important position in society during the Anuradhapura period. Also, women played a prominent place among the people who took the initiative in offering caves for arahants, bhikkhus, and bhikkhunis. Although many of the inscriptions written by a king mentioned about mother of the king to refer to the king, it is revealed that when writing cave letters, the father or husband of each woman was mentioned to show the identity of the daughter and whose wife she is. Thus, it can be concluded that the women of the Anuradhapura period have actively contributed to social, political, economic, and religious affairs.

**Keywords:** Anuradhapura Period, Inscriptions, Politics, Role of Women Society

# හා-තොල, තල්ලේ සිදුර සහිත පුද්ගලයන්ගේ සහ ප්‍රතිකාර ක්‍රම මඟින් එය යථා තත්ත්වයට පත්කරගත් පුද්ගලයන්ගේ භාෂණ සිංහල ස්පර්ශ සහ ඝර්ෂ ශබ්ද උච්චාරණය පිළිබඳ වාග්විද්‍යාත්මක අධ්‍යයනයක්

ඩබ්.එම්.එන්.කේ.කේ. හුලුගල්ල
කැලණිය විශ්වවිද්‍යාලය
hulugallanadeeshani727@gmail.com

**සාරසංක්ෂේපය**

ළදරුවාගේ කළල අවධියෙහි පළමු මාස තුන ඇතුළත උඩු තොල සහ උඩු තල්ල නිසි පරිදි සවි නොවීමෙන් 'හා-තොල' සහ 'තල්ලේ සිදුර' ඇති වේ. මෙවැනි රෝගාබාධ සහිත දරුවන්ගේ උපතේ සිට මාස තුනක් ගත වූ විට 'හා-තොල' යථා තත්ත්වයට පත්කිරීමේ පළමු සැත්කම සිදුකරන අතර, 'තල්ලේ සිදුර' යථා තත්ත්වයට පත්කිරීමේ පළමු සැත්කම සිදුකරනුයේ උපතේ සිට මාස 6-12 අතර කාලයේ දී ය. තව ද කිසිදු සැත්කමක් නොකර රෝගාබාධය ඒ අයුරින් ම පවතින පුද්ගලයෝ ද වෙති. මෙහි අරමුණ වනුයේ 'හා-තොල' සහ 'තල්ලේ සිදුර' සහිත පුද්ගලයන්ගේ සහ එම රෝගාබාධය සැත්කමක් මඟින් යථා තත්ත්වයට පත් කරගත් පුද්ගලයන්ගේ භාෂණ සිංහල ස්පර්ශ සහ ඝර්ෂ ශබ්ද උච්චාරණය පිළිබඳ තුලනාත්මක වාග්විද්‍යා අධ්‍යයනයක් සිදුකිරීම යි. මෙහි පර්යේෂණ ගැටලුව වනුයේ හා-තොල සහ තල්ලේ සිදුර සහිත පුද්ගලයන්ගේත් ප්‍රතිකාර ක්‍රම මඟින් එය යථා තත්ත්වයට පත් කරගත් පුද්ගලයන්ගේත් භාෂණ සිංහල ස්පර්ශ සහ ඝර්ෂ ශබ්ද උච්චාරණ ස්වරූපය කෙබඳු ද? යන්න අධ්‍යයනය කිරීම යි. පර්යේෂණය සඳහා ප්‍රාථමික දත්ත රැස්කිරීමේ දී මෙම රෝගාබාධ සහිත පුද්ගලයන් පස්දෙනෙකු සහ සැත්කම් මඟින් රෝගාබාධය යථා තත්ත්වයට පත් කරගත් පුද්ගලයන් පස් දෙනෙකු ඇසුරු කරගන්නා ලදී. පර්යේෂණ කාර්යයයෙහි ලා විශ්ලේෂණය කර ඇත්තේ භාෂණ සිංහල ස්පර්ශ සහ ඝර්ෂ ශබ්දයන්ගේ උච්චාරණාත්මක ස්වභාවය පමණි. ඒ අනුව, භාෂණ සිංහල ස්පර්ශ සහ ඝර්ෂ ශබ්ද යෙදෙන පදවල පදගත විස්තෘතිය සලකා බලා එම සෑම ආකාරයකට ම අයත් පද, උච්චාරණය කිරීමට සලස්වා ඔවුන්ගේ භාෂණ දුබලතාවන් කවරාකාර ද? යන්න අධ්‍යයනය කරන ලදී. මෙම පර්යේෂණයට අදාළ ද්විතීයික දත්ත ඊට අදාළ පොත්-පත්, සඟරා ආදිය අධ්‍යයනය කිරීමෙන් ලබාගෙන ඇත. මෙම පර්යේෂණයෙහි සුවිශේෂතාව වනුයේ හා-තොල, තල්ලේ සිදුර සහිත සහ ප්‍රතිකාර ක්‍රම මඟින් එම රෝගී තත්වයන් මගහරවාගත් යන කාණ්ඩ දෙකට අයත් පුද්ගලයන් මඟින් භාෂණ සිංහල ස්පර්ශ සහ ඝර්ෂ ශබ්දයන්හි උච්චාරණාත්මක ලක්ෂණ සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීමට හැකි වීම යි. මෙම භාෂකයන් ඇසුරෙන් පැහැදිලි උච්චාරණාත්මක විවිධතාවක් දක්නට ලැබීම පර්යේෂණ ප්‍රතිඵලය විය. මේ අනුව, නිගමනය කළ හැකි වන්නේ රෝගාබාධ සහිත පුද්ගලයන් මඟින් උච්චාරණාත්මක දුබලතාවන් පැහැදිලි ව දැකගත හැකි බවත්, නිසි ප්‍රතිකාර ලැබූ පුද්ගලයන්ගේ භාෂණයන්හි සාධනීය ලක්ෂණ පිළිබිඹු වන බවත් ය.

**ප්‍රමුඛ පද:** ඝර්ෂ ශබ්ද, තල්ලේ සිදුර, වාග්විද්‍යාව, ස්පර්ශ ශබ්ද, හා තොල

# A Linguistic Study on Sinhala Plosive and Fricative Sound Pronunciation of Individuals with Cleft Lip and Palate, and Those Who Recovered it through Treatment

W. M. N. K. K. Hulugalla
University of Kelaniya
hulugallanadeeshani727@gmail.com

**Abstract**

During the first three months of fetal development, the proper fusion of the upper lip and palate may fail, resulting in conditions known as "cleft lip" and "cleft palate." The initial corrective surgery for "cleft lip" is typically performed three months after birth, while the procedure for correcting a "cleft palate" occurs between 6-12 months post-birth. Moreover, there are also people whose disease remains the same without any surgery. This research aims to conduct a comparative linguistic analysis of Sinhala plosive and fricative sound pronunciation among individuals with cleft lip and palate and those who have undergone corrective surgery. The research problem is: "What is the speech form of Sinhala plosive and fricative sound pronunciations among individuals with cleft lip and cleft palate, as compared to those who have recovered it through treatment? "Primary data for this research were collected from five individuals with untreated cleft lip and palate conditions and five individuals who have successfully recovered it through surgery. The research specifically analyses the phonological aspects of spoken Sinhala plosive and fricative sounds, studying the distribution of these sounds in words commonly using plosives and fricatives in spoken Sinhala. Secondary data were gathered using relevant books and magazines. This study is unique in its way as it provides a comparative analysis of the phonetic characteristics of Sinhala plosive and fricative sounds in two distinct groups: those with cleft lip and palate conditions and those who have successfully recovered it through treatment. The research findings indicate clear differences in pronunciation between individuals who have received treatment for their medical conditions and those who have not. Thus, it can be concluded that speech impairments can be seen in people with diseases, and positive features are reflected in the speech of people who have received proper treatment.

**Keywords:** Cleft Lip, Cleft Palate, Fricative Sounds, Linguistics, Plosive sound

# වේවැල්කැටිය ශිලා ලේඛනයෙන් හෙළිවන ගම්බද උසාවි ක්‍රමය හා බලතල බෙදීම පිළිබඳ අධ්‍යයනයක්

ඩී. එම්. එන්. ජී. කේ. දිසානායක
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
geethikakumuduni0@gmail.com

**සාරසංක්ෂේපය**

අතීත ලංකාවේ සමාජ ආර්ථික දේශපාලන තොරතුරු විමර්ශනයේ දී සෙල්ලිපි අධ්‍යයනය මගින් ලබාගත හැකි දායකත්වය අතිමහත් ය. ක්‍රි.ව. 10 වන සියවසේ ලක්දිව පැවති පැරණි සමාජ ව්‍යූහය හා එහි ක්‍රියාත්මක වූ ගම්බද උසාවි ක්‍රමය හා බලතල පිළිබඳ වේවැල්කැටිය පුවරු ලිපිය ඇසුරින් සාකච්ඡා කිරීම මෙමගින් අපේක්ෂිත ය. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ ක්‍රි.ව. 10 වන සියවසේ පැවති ගම්බද උසාවි මගින් සමාජ ගැටලු විසඳීමෙහි ලා භාවිත කළ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේද හඳුනා ගැනීම යි. ඇතැම් විටෙක එවැනි පුරාණ ක්‍රම වර්තමානයට වුව ද ගළපා ගැනීමේ හැකියාව විමසා බැලිය හැකි ය. ඒ අනුව මෙම පර්යේෂණයට අදාළ ගැටලුව වනන්නේ ක්‍රි.ව. 10 වන සියවසට අයත් ගම්බද උසාවි ක්‍රමය හා පාලන බලතලවල ස්වභාවය කෙබඳු ද? යන්න විමසා බැලීම යි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදා ගනිමින් ශිලා ලේඛන විමර්ශන මූලාශ්‍රය ලෙස Epigraphia Zeylanica Volume 01 කෘතියේ එන වේවැල්කැටිය පුවරු ලිපියත්, අදාළ සෙසු ග්‍රන්ථත්, වීඩියෝ පට හා අන්තර්ජාල වෙබ් පරිශීලකයන් ද යොදා ගැනුණි. වේවැල්කැටිය සෙල්ලිපිය හතර වන මිහිඳු රජුගේ නවවන රාජ්‍ය වර්සයේ දී පිහිටුවන ලද අතර මෙම පුවරු ලිපිය ඓතිහාසික වශයෙන් වැදගත් වන්නේ එම සමාජ ව්‍යූහයන්හි ක්‍රියාත්මක වූ සමාජ පාලන ක්‍රම, නීති රීති හා දඬුවම් ක්‍රම පිළිබඳ ව තොරතුරු සංග්‍රහ කරන බැවිනි. එසේ ගම්බද උසාවි ආශ්‍රිත නීති රීති ක්‍රියාත්මක වීම මගින් තදීය සමාජයේ ගොඩ නැගෙන හර පද්ධති, සමාජ හරයන් හා සාමාජ ධර්මතාවන් ආරක්ෂා වී පවතින්නට ඇති බව සිතිය හැකි ය. මෙම පුවරු ලිපියට අනුව දඬුවම් ලැබිය හැකි වැරදි ක්‍රියා ලෙස නම් කර ඇත්තේ මනුෂ්‍ය ඝාතනය, සොරකම, ශාරීරික වද හිංසා පැමිණවීම, මීගවයින්, එළගවයින්, එළුවන් ආදි සත්ව ඝාතනයන් ය. මෙවැනි අපරාධ සඳහා සම්බන්ධ තැනත්තන්ට දෙනු ලැබූ දඬුවම් ක්‍රමය වූයේ මරණ දණ්ඩනය, අංගහානි කිරීම, දඩ ගෙවීම හා වස්තු රාජසන්තක කිරීම යනාදිය යි. නීති කඩකරන්නා වූ පාලක පක්ෂයට මෙන් ම පාලිත පක්ෂයට ද මෙම දඬුවම් ක්‍රමය වලංගු වූ බව ශිලා ලේඛනයේ සඳහන් ය. ඒ අනුව ක්‍රි.ව. 10 වන සියවසට අයත් වේවැල්කැටිය ශිලා ලේඛනයෙන් ප්‍රකට වන ගම්බද උසාවි ක්‍රමය හා බලතල කෙතෙක් දුරට ප්‍රජාතන්ත්‍රවාදී ද හා නූතන පාලන ක්‍රියාකාරකම්වලට දායක කොට ගත හැකි වන්නේ කෙසේ දැයි යන්න මෙම පර්යේෂණය ඔස්සේ අවබෝධ කොට ගත හැකි වේ.

**ප්‍රමුඛ පදඃ** දඬුවම් ක්‍රම, නීතිය, පාලන බලතල, පැරණි සමාජ ක්‍රමය, වේවැල්කැටිය ශිලා ලිපිය

# A Study on Village Court System and Division of Powers as Revealed by the *Wewalkatiya* Stone Inscription

D. M. N. G. K Dissanayake
Department of Sinhala, University of Kelaniya
geethikakumuduni0@gmail.com

**Abstract**

The contribution of inscriptions in the investigation of social, economic, and political information of the past Sri Lanka is immense. It is expected to discuss the old social structure of Sri Lanka as far back as the 10th century and the village court system and powers that operated in it based on the information of the "Wewalkatiya" stone inscription. The primary objective of this study is to identify the democratic methods used in solving social problems by the village courts in the 10th century. Sometimes, it is possible to examine the possibility of adapting such ancient methods even to the present. Accordingly, the research problem of this study is to investigate the nature of the village court system of the 10th century and its governing powers. Subject to the qualitative research method, information on the "Wewalkatiya" stone inscription in Epigra Zelenice Volume 01, other related books, videos, and internet web users were used as the source of the inscriptions investigation. The "Wewalkatiya" stone inscription was established during the ninth reign of King Mihindu IV and this is of historical importance because it reveals information about the social control methods, rules, and punishments that were implemented in those social structures. Thus, it is possible to think that social values and morals may have been protected due to the value systems built up in these societies by the implementation of rules and regulations related to village courts. According to this inscription, the offences punishable are murder, theft, physical torture, and the killing of animals like cattle, cows, goats, etc. The punishments were the death penalty, mutilation, payment of fines, confiscation of property, etc. Also, the facts mentioned in the inscription reveal that this punishment system was valid for the ruling class as well as the controlled party who violated the above punishments. Accordingly, it is possible to understand how far the village court system and powers, which are known from the 10th century "Wewalkatiya" inscription, are democratic and can contribute to modern governance activities.

**Keywords:** Ancient Social System, Governing System, Punishment, Rules, Slab Inscriptions

# සිදත් සඟරා අක්ෂර ප්‍රභේද නාමකරණයෙහි ලා වීරසෝළියම් ද්‍රවිඩ ව්‍යාකරණ ග්‍රන්ථයෙහි ආභාසය පිළිබඳ අධ්‍යයනයක්

ජයෝධා බුද්ධිප්‍රිය
බප/ මීග/ සා. සෙබස්තියන් බාලිකා මහා විද්‍යාලය, කඳාන.
buddhijayo1909@gmail.com

**සාරසංක්ෂේපය**

කවර භාෂාවක් අධ්‍යයනය කළ ද එම භාෂාවේ අක්ෂර මාලාව කෙරෙහි දැඩි අවධානයක් යොමු විය යුතු ය. සිංහල භාෂා ඉතිහාසය පිළිබඳ අධ්‍යයනයේ දී සිංහල භාෂා ප්‍රභවය හා විකාශනය උදෙසා ඉන්දු-ආර්ය භාෂා ඉවහල් වූ බව බොහෝ දෙනාගේ මතය යි. එනමුත්, සිංහල භාෂාව සහ දෙමළ භාෂාව සංසන්දනාත්මක ව විග්‍රහ කරන විට සිංහල භාෂාව නිර්මාණය වීමෙහි ලා දෙමළ භාෂා ආභාසය නොමඳ ව ලද බව මනා ව පැහැදිලි වේ. සිදත් සඟරා ව්‍යාකරණ ග්‍රන්ථය සහ වීරසෝළියම් දෙමළ ව්‍යාකරණ ග්‍රන්ථයේ සාම්‍යතා ඒ බව සනාථ කරනු ඇත. යථෝක්ත ග්‍රන්ථද්වය අන්තර්ගතමය වශයෙන් මෙන් ම ආකෘතිකමය වශයෙන් ද සමානතා පෙන්නුම් කරයි. සිදත් සඟරා ව්‍යාකරණය කෙරෙහි වීරසෝළියම් ද්‍රවිඩ ව්‍යාකරණ ග්‍රන්ථය කෙතෙක් දුරට බලපා තිබේ ද? යන්න මෙහි පර්යේෂණ ගැටලුව යි. සිදත් සඟරාවෙහි අක්ෂර ප්‍රභේද නාමකරණය කොට ඇති පරිදි ප්‍රාණාක්ෂර-ගාත්‍රාක්ෂර යන නාමයන් දෙමළ භාෂා ආභාසය මත නිර්මාණය වූ බව හඳුනාගෙන ඇත. තව ද, ගාත්‍රාක්ෂර 'හල් අකුරු' යනුවෙන් නම් කිරීම උදෙසා ද දෙමළ ආභාසය යම් තරමකින් හෝ ඉවහල් වූ බව විශද කෙරේ. එලෙස සිංහල භාෂා විකාශනයෙහි ලා දෙමළ භාෂා සංස්පර්ශය හේතු වූ බව සාධක ඇසුරින් පෙන්වා දීම මෙහි අරමුණ යි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේද අනුගමනය කරමින් ද්විතීයික මූලාශ්‍රය ලෙස වෛෂයික සිංහල ග්‍රන්ථ, දෙමළ ග්‍රන්ථ සහ අනෙකුත් මූලාශ්‍රය මෙන් ම තෘතීයික මූලාශ්‍රය වශයෙන් අන්තර්ජාල ලිපි, සඟරා ආදිය අධ්‍යයනය කිරීමට අපේක්ෂා කෙරේ. සිංහල භාෂා ව්‍යාකරණ නිර්මාණය කිරීමේ දී සිංහලයේ මාතෘ භාෂා ලෙස සැලකෙන පාලි, සංස්කෘත ආදි භාෂා විශාල සේවයක් ඉටු කළේ ය. නමුත් සිදත් සඟරා අක්ෂර නාමකරණයේ දී වීරසෝළියම් දෙමළ ව්‍යාකරණ ග්‍රන්ථය මගින් ඍජු බලපෑමක් එල්ල වූ බව අනාවරණය කරගත හැකි ය.

**ප්‍රමුඛ පද :** අක්ෂර නාමකරණය, ආභාසය, දෙමළ භාෂාව, වීරසෝළියම්, සාම්‍යතා

# A Study of the Influence of the Tamil Grammar Book *Veera Soliyam* on the Naming of Letters of *Sidath Sangarawa*

Jayodha Buddhipriya
WP/ NG/ St. Sebastian's Balika Maha Vidyalaya, Kandana.
buddhijayo1909@gmail.com

**Abstract**

In the study of any language, close attention should be paid to the Alphabet of that language. When studying the history of the Sinhala language, many people think that the Indo-Aryan languages influenced the origin and evolution of the Sinhala language. However, when the Sinhala language and Tamil language are analysed comparatively, it is evident that the Tamil language has intensely influenced the creation of the Sinhala language. The similarities between the grammar books of *Sidath Sangarawa* and *Veera Soliyam* will confirm that. The abovementioned two books show similarities in content and form. The research problem is to investigate if there is any influence of the grammar book *Veera Soliyam* on *Sidath Sangarawa*. It is identified that the naming of the letters of *Sidath Sangarawa* as vowels and consonants was created under the influence of the Tamil language. Also, it is explained that Tamil was to some extent influenced in the naming of consonants as *"Hal Akuru"*. Thus, the objective of this is to indicate that the contact with the Tamil language has caused the development of the Sinhala language. Following the qualitative research method, it is expected to study related books in Sinhala, books in Tamil, and other sources as secondary sources, and as tertiary sources the articles on the internet, and magazines will be utilised. In the creation of the Sinhala grammar, native languages that are Pali and Sanskrit languages have contributed immensely. However, it will be revealed that the grammar book *Veera Soliyam* was a direct influence on the naming of the letters of the Sinhala grammar book *Sidath Sangarawa*.

**Keywords:** Naming Letters, Sidath Sagarawa, Similarities, Tamil Language, Veera Soliyam

# පොළොන්නරු යුගයේ සන්නස් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

පී. ජී. පියුමි සඳමාලි
කැලණිය විශ්වවිද්‍යාලය
sandamalipiyumi941@gmail.com

**සාරසංක්ෂේපය**

පොළොන්නරුව වනාහි ලාංකේය ඓතිහාසික පරිච්ඡේදයෙහි ද්විතීය යුගය වන අතර වාග්වේදීන්ගේ විභේදනයට අනුව මධ්‍යතන යුගය යි; සිංහල සන්නස් සාහිත්‍යයේ ප්‍රථම යුගය යි. එච්. සී. පී. බෙල් මහතා පවසන පරිදි සන්නස් යනු රත්රන්, රිදී, තඹ හෝ තල්පත් වැනි අමුද්‍රව්‍යයක් භාවිත කරමින් රජු විසින් පමණක් නිකුත් කරන්නා වූ රාජකීය ලේඛනයකි. මෙරට සන්නස් විකාසනය පිළිබඳ තතු අනුරාධපුර යුගයේ අභයගිරිය තඹ සන්නස, වල්ලිපුරම් රන් සන්නස දක්වා විහිදී ගිය ද සන්නසක තිබිය යුතු ආකෘතික ලක්‍ෂණයන්ගෙන් හෙබි සන්නස් පත්‍රයක් මුලින් ම නිර්මාණය වූයේ පොළොන්නරු යුගයේ දී ය. පනාකඩුව සන්නස මෙම යුගයෙහි ප්‍රථම සන්නස වන අතර අල්ලයි සන්නස, දොරටියාව සන්නස, බමුණාගල සන්නස, පරිවාර සන්නස් ලෙස පෙන්වා දිය හැකි ය. ඒ අනුව පොළොන්නරු යුගයේ සන්නස් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් යන මෙම පර්යේෂණයට අදාළ ගැටලුව වන්නේ පොළොන්නරු යුගයේ දේශපාලන, ආර්ථික, ආගමික හා සමාජීය සාධක මෙන් ම මධ්‍යකාලීන භාෂා ලක්‍ෂණ ප්‍රමුඛ භාෂා විශේෂතා පොළොන්නරු යුගයේ සන්නස් ඇසුරින් ප්‍රතීයමාන වන්නේ කවර අන්දමින් ද? යන්න විමසා බැලීම යි. මෙම පර්යේෂණයෙහි අරමුණු අතර සිංහල සන්නසෙහි ආරම්භක සන්ධිස්ථානය හඳුනාගැනීම, පොළොන්නරුව යුගයට අයත් සන්නස් පිළිබඳ ව විමසා බැලීම, සන්නස් පිළිබඳ නූතන අධ්‍යයනයන් පහසු කරවීම, සන්නස් සාහිත්‍යය පිළිබඳ ඇති දුර්මත ඛණ්ඩනය කිරීම සඳහා නිරවද්‍ය විෂය කරුණු ගෙන හැර දැක්වීම, තත් යුගයේ සන්නස් පිළිබඳ තොරතුරු විරල හෙයින් එකී රික්තකය සම්පූර්ණ කිරීම යනාදිය ප්‍රධාන වෙයි. මෙම අධ්‍යයනහේ දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට යටත් ව ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ක්ෂේත්‍ර අධ්‍යයනය සිදු කළ අතර ග්‍රන්ථ හා පර්යෙෂණාත්මක කෘති ද්විතීය මූලාශ්‍රය ලෙස ද, සඟරා, පුවත්පත්, වෙබ් අඩවි තෘතීය මූලාශ්‍රයන් ලෙස ද පරිශීලනය කර ඇත. උක්ත ක්‍රමවේද ඔස්සේ දත්ත රැස්කර විශ්ලේෂණය කිරීමේ දී මහාවංශය වැනි කෘතීන්හි සඳහන් නොවන ඓතිහාසික කරුණු අනාවරණය වූ අතර තත් යුගයේ දේශපාලනික, ආගමික, ආර්ථික, සමාජීය සාධක මෙන් ම මධ්‍යකාලීන භාෂා ලක්ෂණ ප්‍රමුඛ භාෂා විශේෂතා රැසක් අවබෝධ කරගත හැකි විය.

**ප්‍රමුඛ පදඃ** අල්ලයි, දොරටියාව, පනාකඩුව, පොළොන්නරු යුගය, බමුණාගල, සන්නස්

# An Investigative Study of the *Sannas* of the Polonnaruwa Age

P. G. Piyumi Sandamali

University of Kelaniya

sandamalipiyumi941@gmail.com

**Absract**

Polonnaruwa is the second period of the Sri Lankan historical chapter, and according to the differentiation of linguists, it belongs to the medieval period; The first period of Sinhala *Sannas* literature. According to H.C.P. Bell, Sannas is a royal document issued only by the king using materials such as gold, silver, copper, or palm leaves. Although the facts about the development of *Sannas* in Sri Lanka extend to Abhayagiriya Copper *Sannasa*, and Vallipuram Gold *Sannas*a of the Anuradhapura period, a *Sannas* sheet having the formative characteristics that a *Sannasa* should have was first created in the Polonnaruwa era. *Panakaduwa Sannasa* is the first *Sannasa* of this era and *Allai Sannasa, Doratiyava Sannasa,* and *Bamunagala Sannasa*, can be pointed out as Sannasa made after that. Accordingly, the research problem is to investigate the political, economic, religious, and social factors of the Polonnaruwa period, as well as in what way the many language peculiarities, including the medieval language characteristics reflected in the *Sannas* of the Polonnaruwa period. Among the objectives of this research are to identify the origin of Sinhala *Sannas,* to find out the *Sannas* belonging to the Polonnaruwa period, to facilitate modern studies on *Sannas*, to outline the accurate subject matter to alleviate misconceptions about *Sannas* literature, and to fill the gap as information about the *Sannas* of the Polonnaruwa period is scarce in the contemporary society. Subject to the qualitative research method field study was used as primary sources, while books and research work were used as secondary sources. Magazines, newspapers, and websites were used as secondary sources. By collecting and analysing data through the above methods, historical facts not mentioned in works such as the Mahavamsya were revealed and many language peculiarities, including the medieval language characteristics, as well as the political, religious, economic, and social factors of the Tat era, could be identified.

**Keywords**: Allai, Bamunagala, Doratiya, Panakaduwa, Polonnaruwa Era, Sannas

# මුල්කාලීන රූපවාහිනී කාටූන් වැඩසටහන්වලට සාපේක්ෂ ව සමකාලීන කාටූන් වැඩසටහන්වල සිංහල භාෂාවේ ගුණාත්මකභාවය සහ වත්මන් ළමා පරපුරේ භාෂා භාවිතය කෙරෙහි ඒවායේ බලපෑම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඩී. එම්. සෙනාලි මධුෂිණී දිසානායක
නාට්‍ය, සිනමා හා රූපවාහිනී අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
senali23022000@gmail.com

**සාරසංක්ෂේපය**

රූපවාහිනිය වූ කලී වර්තමාන සන්නිවේදන මාධ්‍ය අතර ප්‍රමුඛ පෙළේ මාධ්‍යයකි. ඕනෑම පුද්ගලයෙකුට තොරතුරු සම්ප්‍රේෂණය කිරීමට රූපවාහිනී වැඩසටහන් මගින් හැකියාව ඇත. මේ අතුරින් කුඩා දරුවන්ට නිර්මාණය වූ කාටූන් වැඩසටහන්වලට හිමිවන්නේ විශේෂ ස්ථානයකි. මන්ද කුඩා දරුවන්ගේ චර්යා රටාවන්, ආකල්ප සහ භාෂා භාවිතය ආදි සාධකවලට බලපෑමක් ඇති කිරීමට කාටූන්වලට හැකියාව පවතින බැවිනි. මෙම අධ්‍යයනයේ දී සමකාලීන කාටූන් වැඩසටහන්වල වචන මාලාව සහ භාෂාව හැසිරවීම ආදි භාෂාමය අන්තර්ගතය අධ්‍යයනය කිරීමත්, මුල්කාලීන රූපවාහිනී යුගයේ විකාශය වූ කාටූන් වැඩසටහන් සහ සමකාලීන කාටූන් වැඩසටහන්වල සිංහල භාෂාවේ ගුණාත්මකභාවය පිළිබඳ තුලනාත්මක විග්‍රහයක නිරත වීමත් සහ මුල් අවධියේ කාටූන්වලට සාපේක්ෂ ව සමකාලීන කාටූන්වලින් ළමා පරපුරේ භාෂා භාවිතයට හඳුනාගත හැකි බලපෑමක් සිදු වී තිබේ ද යන්න සොයා බැලීමත් අපේක්ෂා කෙරේ. මේ සඳහා ප්‍රසිද්ධ රූපවාහිනී නාලිකාවල විකාශය වන කාටූන් වැඩසටහන්වල නියැදියක් භාවිත කෙරෙන අතර නියැදුම් ක්‍රමය ලෙස පොකුරු නියැදීම භාවිත කිරීමට අපේක්ෂා කෙරේ. පර්යේෂණය සඳහා දත්ත රැස් කිරීමේ දී ප්‍රාථමික දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය ලෙස වයස අවුරුදු පහ-දහය අතර දරුවන් සිටින දෙමව්පියන් සහ දරුවන් සිය දෙනෙකුගේ නියැදියක් මගින් දත්ත රැස් කිරීමට අදහස් කරයි. පරීක්ෂණයේ නිරවද්‍යභාවය උදෙසා ස්තෘත සසම්භාවී නියැදුම් ක්‍රමය භාවිත කිරීමට බලාපොරොත්තු වේ. ප්‍රශ්නාවලියකින් දෙමව්පියන්ගේ ප්‍රතිචාර ලබා ගැනීමට අදහස් කරන අතර සරල භාෂා ඇගයීම් ක්‍රම මගින් දරුවන්ගේ භාෂා ප්‍රවීණතාව සහ සන්නිවේදන කුසලතා පිළිබඳ දත්ත ලබා ගැනීමට බලාපොරොත්තු වේ. අනතුරුව, මෙම ක්‍රමද්වය ඔස්සේ ලබා ගන්නා ලද දත්ත විශ්ලේෂණයට ලක් කර නිගමනයකට එළඹීමට අපේක්ෂා කෙරේ. එසේ ම ද්විතියික දත්ත වශයෙන් මුල් රූපවාහිනී යුගයේ වැඩසටහන්වල භාෂා භාවිතය හා සම්බන්ධ පොත් පත්, සඟරා, ලිපි ගොනු සහ අන්තර්ජාලය මූලාශ්‍රය කරගනිමින් තොරතුරු ලබා ගැනීමට බලාපොරොත්තු වේ. මෙම අධ්‍යයනයෙන් භාෂා සංවර්ධනය කෙරෙහි රූපවාහිනී නාලිකාවල දායකත්වය පිළිබඳ ව පැහැදිලි අවබෝධයක් ලබාගැනීමට හැකියාව ලැබෙනු ඇති අතර එසේ ම, සමකාලීන කාටූන් වැඩසටහන්වලින් දරුවන්ගේ භාෂා හැකියාවන්ට සිදුකරන බලපෑම පිළිබඳ ව ද නිවැරදි ව හඳුනා ගැනීමට අපේක්ෂා කෙරේ.

**ප්‍රමුඛ පද:** භාෂා භාවිතය, මුල්කාලීන කාටූන්, ස්තෘත සසම්භාවී නියැදුම් ක්‍රමය, සමකාලීන කාටූන්, සිංහල භාෂාවේ ගුණත්වය

# An Investigative Study on the Quality of Sinhala Language in Contemporary Cartoons Compared to Early Television Cartoons and Their Impact on Language Usage of the Current Generation of Children

D.M. Senali Madhushini Dissanayake
Department of Drama, Cinema and Television, University of Kelaniya
Senali23022000@gmail.com

**Abstract**

Television serves as a prominent means of communication in contemporary society, with the capacity to transmit information to any person. Among them, cartoons designed for young children hold a unique position due to their potential to impact behavioural patterns, attitudes, and language usage in children. This investigative study aims to study the linguistic content such as vocabulary and language usage of contemporary cartoon programmes, to engage in a comparative analysis of the quality of Sinhala language in cartoon programmes telecasted in the early era and contemporary cartoon programmes, and to find out whether contemporary cartoons have had a detectable effect on the language use of children in comparison to early cartoons. To this, a sample of cartoon programmes aired on popular TV channels will be examined, utilising cluster sampling as the preferred sampling method. Primary data will be collected through a sample of parents who have children aged from 5-10 years and one hundred children. To ensure data accuracy, a stratified random sampling technique will be employed. Questionnaires will be utilised to gather responses from parents, while simple language assessments will be used to gather data on children's language proficiency and communication skills. Then, data gathered from these sources will be analysed to draw comprehensive conclusions. Additionally, secondary data will be gathered from relevant literature, including books, magazines, articles, and internet sources regarding language use in early television programmes. This study will provide a clear understanding of the contribution of television channels to language development, and it is also expected to accurately identify the impact of contemporary cartoon programmes on children's language abilities.

**Keywords:** Cluster Sampling, Contemporary Cartoons, Early Cartoons, Language Usage of Children, Quality Of Sinhala Language, Stratified Random Sampling Method

# සිංහල අවධි විභක්ත්‍යර්ථය හා ආධාර විභක්ත්‍යර්ථය ලේඛන දෙමළ භාෂාවේ දී භාවිත ආකාරය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

උඩගලදෙණියේ ධම්මවිමල
වාග්විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
dhammawimala@kln.ac.lk

**සාරසංක්ෂේපය**

විභක්ති යන්න පාළියේ 'විභත්ති' ලෙසින් ද සිංහලයේ 'විබත්' ලෙසින් ද අර්ථ ගැන්වේ. විභක්ති යන්නෙන් 'බෙදීම' යන්න අර්ථය හැඟවෙයි (විභජීයන්තීති විභත්තියෝ). ''වි'' පූර්ව තනාදි ගණික ''භජ්'' ධාතුවට 'ක්තින් (ති)' කෘත් ප්‍රත්‍යය එක් කිරීමෙන් සෑදෙන 'විභක්ති' යන්න ස්ත්‍රී ලිංග කෘදන්තයෙකි. 'නමින් පර වැ බෙදනු ලබනුයේ විබත් නම්' යනුවෙන් සිදත් සඟරා කතුවරයා අදහස් කරනුයේ නාම ප්‍රකෘතියක අර්ථය කර්තෘ, කර්ම, කරණ ආදි අර්ථයන් සඳහා බෙදා දැක්වීමට උපකාර වන ප්‍රත්‍යය ලෙස යි. එමෙන් ම වාක්‍යයක නාම පදයන්හි ව්‍යාකරණ ක්‍රියාකාරිත්වය වෙනස් වීම විභක්තිය නම් වන බව දෙමළ ග්‍රන්ථවල විග්‍රහ කර ඇත. ව්‍යාකරණ ක්‍රියාකාරිත්වය යනු වාක්‍යයෙහි නාම පදයටත් ක්‍රියාපදයටත් අතර ඇති වාක්‍ය රීතිය බව හඟවයි. සිංහල මාතෘ භාෂකයා දෙවන බසක් ලෙස දෙමළ භාෂාව ඉගෙන ගැනීමේ දී විභක්ති ප්‍රයෝග කුමන ආකාරයකට භාවිත කිරීම සුදුසු වේද යන ගැටලුවට නිරතුරු ව මුහුණ දෙයි. ඒ අනුව මහාචාර්ය ඩබ්. එස්. කරුණාතිලකයන්ගේ *සිංහල භාෂා ව්‍යාකරණය* හා මහාචාර්ය එම්. ඒ. නුහ්මාන්ගේ *அடிப்படைத் தமிழ் இலக்கணம்* (අඩිප්පඩෛත් තමිළ් ඉලක්කණම්) ග්‍රන්ථය ප්‍රාථමික මූලාශ්‍රයන් ලෙස භාවිත කෙරෙමින් සිංහල අවධි විභක්ත්‍යර්ථය හා ආධාර විභක්ත්‍යර්ථය ලේඛන දෙමළ භාෂාවේ දී භාවිත වන ආකාරය පිළිබඳ තුලනාත්මක ව අධ්‍යයනය කරන ලදී. සිංහල භාෂාවේ අවධි විභක්ති හා ආධාර විභක්තිය යනුවෙන් විභක්ති දෙකක් පැහැදිලි ව ම දක්නට තිබිය දී එකී විභක්ති අර්ථයන්ගෙන් ප්‍රකාශ කෙරෙන අර්ථයන් ලේඛන දෙමළ භාෂාවේ දී ප්‍රකාශ කිරීමට එක ම විභක්ති ප්‍රත්‍යයක් භාවිත වීම මෙයට බලපාන ප්‍රධාන කාරණයක් ලෙස ද පෙන්වා දිය හැකි ය. තව ද සිංහල මාතෘ භාෂකයා ස්වකීය අදහස් ඍජු ව දෙමළ භාෂාවට පරිවර්තනය කිරීමේ දී සිංහල විභක්තිවල භාවිතය පිළිබඳ නිවැරදි අවබෝධයක් තිබීම ම දෙමළ විභක්ති ප්‍රයෝග නිවැරදි ව භාවිත කිරීමට මෙන් ම අවබෝධ කරගැනීමට මනා පිටිවහලක් වන බව මෙහි දී අවධාරණය කර ගත හැකි ය.

**ප්‍රමුඛ පදඃ** අවධි විභක්තිය, ආධාර විභක්තිය, දෙවන බස, මව් බස, විභක්ති

# A Comparative Study on the Use of Meanings of Sinhalese Ablative Case and Locative Case in Written Tamil Language

Ven. Udagaladeniye Dhammawimala
Department of Linguistics, University of Kelaniya
dhammawimala@kln.ac.lk

**Abstract**

The term case (*vibhakti)* is defined as '*vibhatti'* in Pāli and '*vibat'* in Sinhalese. '*Vibhajīyantīti vibhattiyō',* that is, case means 'division'. *Vibhakti* is a feminine participle formed by adding the participle suffix '*Ktin'* (*ti*) to the root *bhaj* with '*vi'* prefix. The author of the *Sidat Sañgarawa* said, '*namin para vä bedanu labanuyē vibat nam'; vibhakti* is the suffix that helps a noun stem to divide its meaning into agent, objective, instrument, etc. Further, it has been analysed in Tamil texts that the change of grammatical function of the nouns in a sentence is called the case. Grammatical function refers to the sentence rule between the noun and the verb in a sentence. The Sinhala native speaker is constantly faced with the problem of how to use methods of using cases appropriately when learning Tamil as a second language. Accordingly, *Sinhala Bhāshā Vyākaraṇaya* written by Prof. W.S. Karunathilake and *Aḍippaḍait Tamiḷ Ilakkaṇam* (*அடிப்படைத் தமிழ் இலக்கணம்*) by Professor M.A. Nuhman have been used as primary sources, and a comparative study of the use of meanings of Sinhala Ablative Case and Locative case in written Tamil was conducted. According to the results of this study, it can be pointed out that while there are two cases in Sinhalese that are Ablative and Locative case, the fact that a single case suffix is used to express the meanings of those two cases in Tamil, is a major factor affecting Sinhala native speakers who study Tamil as a second language. Moreover, it can be emphasised here that when Sinhala native speakers directly translate their ideas into the Tamil language, having a correct understanding of the use of Sinhala cases itself will assist in using and understanding the methods of using cases in Tamil accurately.

**Keywords:** Ablative Case, Cases, Locative case, Native Language, Second Language

# මහනුවර යුගයේ සන්නස්වලින් හෙළිවන දීමනා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (තෝරාගත් සන්නස් හා තුඩපත් ආශ්‍රයෙන්)

එස්. එම්. ටී. යූ. සෙනවිරත්න
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
thanuudeshi@gmail.com

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ක්‍රි.ව. 1590-1815 දක්වා කාලය මහනුවර රාජධානි යුගය ලෙසින් හඳුනා ගැනේ. පළමු වන වන විමලධර්මසූරිය රජුගෙන් (ක්‍රි.ව. 1592-1604) ආරම්භ වී ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගෙන් (ක්‍රි.ව. 1798-1815) අවසන් වන මෙම යුගය ලාංකේය ඉතිහාසයේ සන්නස් හා තුඩපත් වැඩි ම ප්‍රමාණයක් ලිය වී ඇති යුගය ලෙස හඳුනා ගත හැකි ය. මෙම යුගයේ සබරගමු දිසාවට අයත් තෝරාගත් සන්නස් හා තුඩපත් ආශ්‍රයෙන් මෙම අධ්‍යයනය සිදුවෙයි. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ, සන්නස් හා තුඩපත් ප්‍රදානයන් මඟින් දෙන ලද දීමනා පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කිරීම යි. රජු විසින් කෙනෙකුගේ විශේෂ සුදුසුකමකට ප්‍රසාදය පළ කරනු සඳහා ප්‍රදානය කළ බුහුමන හෝ වතු පිටි ආදිය පිළිබඳ හෝ සහතික කරන ලද රාජ්‍ය මුද්‍රාව සහිත ලියවිල්ල 'සන්නස්' නමින් හැඳින්වෙන අතර රාජ්‍ය නියෝගය මත මහා අධිකාරම්වරුන් විසින් හෝ ඒ ප්‍රදේශය භාර දිසාවගේ අත්සනින් කිසියම් අයෙකු වෙත ඉහත ආකාර ප්‍රදානයන් සම්බන්ධයෙන් දෙනු ලබන ලියවිල්ල 'තුඩපත්' ලෙසින් ද හැඳින්වේ. ප්‍රභූන් ඇතුළු සාමාන්‍ය ජනතාව උදෙසාත්, විහාර දේවාලයවල නඩත්තුව උදෙසාත් පවරා දෙන ලද යම් යම් දීමනා මෙම සන්නස් හා තුඩපත් හි ප්‍රධාන වශයෙන් ඇතුළත් ය. මෙහි දී අධ්‍යයනය ක්‍රමවේදය ලෙස ගුණාත්මක පර්යේෂණ විධියත් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයත් යොදාගනු ලැබේ. ප්‍රාථමික මූලාශ්‍රය ලෙස කිරිඇල්ලේ ඤාණවිමල හිමියන් විසින් රචනා කරන ලද සපරගමුවේ පැරණි ලියවිලි ග්‍රන්ථයේ සඳහන් පැරණි ලියවිලි අතරින් තෝරාගත් සන්නස් හා තුඩපත් ද ද්විතීයික මූලාශ්‍රය ලෙස සබරගමු ඉතිහාසය සම්බන්ධයෙන් ලිය වී ඇති විමර්ශනාත්මක ග්‍රන්ථ හා ලේඛන ද යොදාගනු ලැබේ. කරන ලද සේවාවේ බැරෑරුම්කම හෝ රජු යම් කටයුත්තක් සම්බන්ධයෙන් ප්‍රසාදයට පත්වීමේ ප්‍රමාණය මත දීමනාවේ ස්වරූපය හා වටිනාකම තීරණය වී ඇත. ප්‍රභූන් හෝ සාමාන්‍ය ජනයා වෙත ලබා දී ඇති සන්නස්වල භූමි ප්‍රමාණයන් ඇතැම් විට අදාළ පුද්ගලයාගේ 'බඩවැඩිල්ලට' ලෙසින් ද, ඇතැම් දීමනා 'නින්දගම්' ලෙසින් ද, ඇතැම් දීමනා අදාළ පුද්ගලයාගේ නමේ කොටසක් යෙදූ ගොඩමඩ ඉඩම් සහිත භූමි ප්‍රමාණයන් ලෙසින් ද වන අතර භික්ෂූන් විෂයෙහි පෞද්ගලිකව දී ඇති දීමනා ද දක්නට ලැබේ. ඒ අනුව මේ අධ්‍යයනයේ දී බොහෝ ඉතිහාස ග්‍රන්ථවල දක්නට නොලැබෙන අදාළ යුගයට අයත් සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික තොරතුරු රැසක් ද සපයා ගත හැකි ය.

**ප්‍රමුඛ පද:** තුඩපත්, දීමනා, මහනුවර යුගය, සන්නස්, සබරගමු දිසාව

# An Investigative Study of the Offering Rituals Revealed from the *Sannas* of the Kandy Period (Based on selected *Sannas* and *Tudapath*)

S. M. T. U. Senaviratne
University of Kelaniya. Kelaniya
thanuudeshi@gmail.com

**Abstract**

In Sri Lankan history the period from 1590 to 1815 is known as the period of Kandy Kingdom. This era which started with the first King Wimaladharmasuriya (1592-1604 AD) and ended with King Sri Wikrama Rajasingha (1798-1815 AD), can be recognized in the history of Sri Lanka in which *Sannas* and *Tudapath* were mostly written. This study is based on the selected *Sannas* and *Tudapath* of this era belonging to the Sabaragamuwa district. The objective of this study is to conduct an exploratory study on the allowances given by *Sannas* and *Tudapath* Grants. The document with the state seal affixed or certified by the king in favour of one's special qualification is known as *sannas,* and the document given on a state order related to the above grants to someone by the *Maha Adhikaram* or by the signature of the Local District *Adhikaram* of the area is called *Tudapath.* These *sannas* and *thudapath* include certain allowances for the nobles and common people and the maintenance of temples. Here primary and secondary sources are used subject to qualitative research method. As the primary sources, *Sannas* and *Tudapath* selected from the old writings of Sabaragamuwe written by *Ven. Kirielle Gnanavimala Thero* and the investigative books and documents written about the history of Sabaragamuwa are used as secondary sources. The form and value of the gift have been determined based on the seriousness of the service rendered or the extent to which the king is pleased with a certain matter. The areas of the *Sannas* given to the nobles or the common people are sometimes as the '*badawedilla'* of the person concerned, some grants are as '*Nindagam'*, some grants are as land with a village with a part of the name of the person concerned, and some grants are given privately in the subject of monks. Accordingly, in this study, numerous social, economic, political, and cultural information about the relevant era, which is not found in many historical books, can be obtained.

**Keywords:** Grants , Kandy Era, Sabaragamu District, Sannas, Tudapat

# සිංහල භාෂාවේ ණ-න-ල-ළ භේදය: භාවිතය හා පරිණාමීය ලක්‍ෂණ පිළිබඳ පදිම විචාරාත්මක අධ්‍යයනයක්

හඟුරන්කෙත සීලවිමල හිමි
hanguranketh seelavimala@gmail.com

**සාරසංක්ෂේපය**

සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී එහි මූලිකාංග අතර පද පරිණාමයට ප්‍රමුඛත්වයක් හිමි වේ. පද පරිණාමයේ දී දැකිය හැකි විශේෂ අංගයක් ලෙස ශබ්ද හඳුනා ගත හැකි ය. එකී ශබ්ද උච්චාරණ විවිධතා අනුව විවිධ ප්‍රභේදවලට බෙදෙන බව කණ්ඨජ, දන්තජ සහ මූර්ධජාදි ප්‍රභේද මගින් පැහැදිලි වේ. එම ප්‍රභේදවලට අයත් දන්තජ සහ මූර්ධජ ශබ්ද වන ණ-න-ල-ළ යන ශබ්ද සිංහල භාෂාවේ විවිධතා දක්වන්නේ කවර පදනමකින් ද යන්න විමර්ශනය කිරීම මෙම පර්යේෂණයෙන් සිදු වේ. මෙම පර්යේෂණයේ දී සිංහල භාෂාවේ ණ-න-ල-ළ භාවිතය උච්චාරණ විශේෂතා මූලික කොට ගෙන පවතින්නේ ද නැතහොත් පරිණාමීය ලක්‍ෂණ උපයුක්ත ව පවතින්නේ ද යන්න සොයාබැලීම මූලික අරමුණ යි. එය ම පර්යේෂණයේ ගැටලුව ලෙස ද අවධානයට ලක් කෙරේ. ණ-න-ල-ළ භේදයේ භාවිතය හා පරිණාමීය ලක්‍ෂණ විමසීම පරමාර්ථ කර ගත් මෙම පර්යේෂණයේ දී පළමු ව එකී භේදය සහිත පද රැස් කිරීම සිදු කෙරේ. පර්යේෂණ නියැදිය ලෙස යොදා ගැනුණේ *අමාවතුර* හා *බුත්සරණ* කෘතිවල සඳහන් නාම වචන පමණකි. අනතුරුව සපයා ගත් දත්ත මූල භාෂාවන්හි කවරාකාරයෙන් දක්නට ලැබේ ද යන්නත් පරීක්‍ෂා කර පදිම විචාරාත්මක විග්‍රහයක් සිදු කරනු ලැබේ. පදිම විචාරාත්මක න්‍යාය උපයෝගී කර ගැනීමේ දී ජාත්‍යන්තර ශබ්ද ශික්‍ෂා හෝඩියට අනුව ප්‍රතිලේඛනය සහ සමාන අවස්ථා උච්චාරණ රටා අනුව වර්ගීකරණය කර ගැනීම දත්ත විශ්ලේෂණයට යටත් වේ. මෙම පර්යේෂණයෙන් අපේක්ෂිත ප්‍රතිඵල වන්නේ සිංහල භාෂාවේ නාම වචනවල යෙදෙන ණ-න-ල-ළ අක්ෂර කවර පදනමකින් යෙදී ඇත් ද යන්න හෙළි කිරීමයි. තවදුරටත් සිංහල භාෂාවේ ණ-න-ල-ළ භේදයේ පැවැත්ම කෙරෙහි හේතු වූ උච්චාරණමය හෝ පරිණාමීය සාධක මෙම පර්යේෂණයෙන් විශද වනු ඇති බව මූලික අපේක්ෂාවකි.

**ප්‍රමුඛ පද:** උච්චාරණ විශේෂතා, ණ-න-ල-ළ භේදය, පද පරිණාමය, පදිම විචාරය, ශබ්ද

# Na-ɳa-la-ɭa Division of Sinhala Language: A Morphological Study of Usage and Evolutionary Characteristics

Ven. Hanguranketha Seelawimala
hangurankethseelavimala@gmail.com

## Abstract

In focusing on the origin and evolution of the Sinhala language, the evolution of the word has a fundamental place among its basic elements. In the evolution of words, sounds can be identified as a special feature. Varieties such as Alveolar (Dental) and Retroflex, etc. reveal that these sounds are divided into various divisions according to variations in the articulation of sounds. This research investigates on what basis the sounds Na-ɳa-la-ɭa, which belong to those varieties, indicate the diversity of the Sinhala language. The main objective of this research is to study whether the usage of Na-ɳa-la-ɭa in the Sinhala language is based on phonological features or evolutionary features. It is also used as the research problem. In this research, which aims to investigate the usage and evolutionary characteristics of Na-ɳa-la-ɭa, first, words with that difference are collected. Sample of the research contains only the nouns mentioned in the books *Butsaɽənə* and *Ama:vatuɽə* are used. Next, a morphological analysis is performed by examining how the collected data appear in the original languages. Data analysis includes transcription according to the International Phonetics Alphabet and classification of the same instances according to phonetic patterns. The expected result of this research is to reveal the base of Na-ɳa-la-ɭa characters used in nouns in the Sinhala language. Furthermore, it is a basic expectation that the phonological or evolutionary factors that led to the existence of differentiation of na-ɳa-la-ɭa in the Sinhala language will be clarified through this research.

**Keywords:** Alveolar-Retroflex, Evolution, Na-ɳa-La-ɭa Division, Phonetics, Sinhala Language

# ශ්‍රී ලාංකික ජන සමාජයේ ආගමික පසුබිම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (ක්‍රි.ව 9-10 සියවස්වල රචිත අත්තාණි ශිලාලේඛන ඇසුරෙන්)

එච්. එම්. අයේෂා චතුරංගි
ශාස්ත්‍රපති (බෞද්ධ අධ්‍යයනය) ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
achathurangi94126@gmail.com

**සාරසංක්ෂේපය**

ක්‍රි.ව අටවන හා දහවන සියවස් අතර කාලයේ ශ්‍රී ලංකාවේ ලියැවුණු ටැම් ලිපි විශේෂයක් ලෙස අත්තාණි ශිලාලිපි හඳුනාගත හැකි ය. කිසියම් රජකු හෝ රජයේ උසස් නිලධාරියකු විසින් පුද්ගලයෙකුට, ආයතනයකට හෝ සමූහයක් වෙත රාජ සභාවේ අනුමැතිය සහිත ව ප්‍රදානය කරන ලද විශේෂ බලතල, අයිතිවාසිකම් හා වරප්‍රසාද මෙම ලේඛන මගින් පවරා දී ඇත. විශේෂයෙන් ම අත්තාණි ශිලාලේඛන කිසිදු සංශෝධනයකට ලක් වී නොමැති බැවින් තත්කාලීන සමාජ ප්‍රපංචයන්ගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ අධ්‍යයනයේ දී සමකාලීන සාහිත්‍ය මූලාශ්‍රයවලට වඩා විශ්වසනීය තොරතුරු රැසක් සංග්‍රහ කරයි. ඒ අනුව අත්තාණි ශිලාලේඛනයන්හි අන්තර්ගත තොරතුරු ආශ්‍රයෙන් පැරණි ලාංකේය ජන සමාජයේ ආගමික පසුබිම පිළිබඳ විමර්ශනය කිරීම හා එහි ගතිකයන් හඳුනාගැනීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ යි. ක්‍රි.ව 9-10 සියවස්හි ශ්‍රී ලංකාවේ ආගමික පසුබිම පිළිබඳ ව හඳුනාගැනීමේ දී අත්තාණි ශිලාලේඛනවලින් ලැබෙන දායකත්වය කෙබඳු ද? යන්න අධ්‍යයනය කිරීම මෙහි පර්යේෂණ ගැටලුව යි. ගුණාත්මක දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය මෙහි පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් භාවිත කරන ලදී. උක්ත අධ්‍යයනයට අනුව, මෙම යුගයේ බහුතරයක් අත්තාණි ශිලා ලිපිවලින් රජවරුන් හා සංඝ සමාජය වෙත කරන ලද විවිධ පරිත්‍යාග මෙන් ම වරප්‍රසාද පිළිබඳ ව ද තොරතුරු හමුවේ. සමකාලීන ආරාම නඩත්තුව රාජ්‍ය පාලකයා හා සෙසු නිලධාරීන් විසින් සිදු කරන ලද බව තිඹිරිවැව ලිපිය, ගොන්නෑව ලිපිය ආදි ලිපි මගින් ප්‍රකට වේ. මහා විහාරයේ බෝධිය නැවීමේ කාර්යය කළ මෙහෙණින් වහන්සේලාට කළ පරිහාර දීමනාවක් පිළිබඳ ව කලත්තෑව ලිපියේ සඳහන් වේ. ආරාම පරිපාලනය පිළිබඳ තොරතුරු මෙන් ම "මේ ආන්නෑ උලැසන කළ කෙනෙක් ඇත්නම් කවුඩු බලු වෙත්වා.!" යනුවෙන් ආරාමික සම්පත් අවභාවිත කරන්නන්ට කරන ලද ශාප පාඨ ආදිය පිළිබඳ තොරතුරු ද බහුල ව හමුවේ. අත්තාණි ටැම් ලිපිවලින් සැලකිය යුතු ගණනක භාෂාත්මක ප්‍රයෝග ලෙස සැලකිය හැකි සංකේත ගණනාවක් දක්නට ලැබේ. ඉර-හඳ සංකේතවලින් දීමනාවේ පැවැත්ම පිළිබඳවත් බලු-කපුටු සංකේතවලින් ආරාමික සම්පත් අවභාවිත කිරීමේ විපාකය පිළිබඳවත් පෙන්වා දෙයි. නූතනයේ ද 'ආරාමික වස්තු අවභාවිත කිරීම බල්ලන් කපුටන් වී ඉපදීමට හේතු වන්නේ ය' යන විශ්වාසය ජනයා අතර පැවැතීමෙන් වාච්‍ය සන්නිවේදනයට වඩා ප්‍රබල සන්නිවේදන කාර්යයක් මෙමගින් සිදු ව ඇතැයි සැලකිය හැකි ය. මේ අනුව ක්‍රි.ව 9-10 සියවස්හි ලාංකේය සමාජයේ ආගමික පසුබිම විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීමේ දී අත්තාණි ශිලාලේඛන මනා පිටිවහලක් වන බැව් නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද** : අත්තාණි, ආගමික අභිචාර, ශාප පාඨ, සංකේත , සංඝ සමාජය

# An Investigative Study of the Religious Background of Sri Lankan Society (Based on the *Attani* Inscriptions of the 9th-10th Centuries AD)

H.M. Ayesha Chathurangi

Master of Arts ( Buddhist Studies) Buddhist and Pali University of Sri Lanka

achathurangi94126@gmail.com

**Abstract**

*Attani* inscriptions can be identified as a type of *Tam* inscriptions written in Sri Lanka between the eighth and tenth centuries AD. These documents confer special powers, rights, and privileges granted by a king or a high official of the government to a person, institution, or group with the approval of the royal court. Especially since the *Attani* inscriptions have not undergone any revision, it was possible to identify more reliable information of that period than the contemporary literary sources. Accordingly, the main objective of this research is to investigate the religious background of the ancient Sri Lankan society and identify its dynamics with the information contained in the *Attani* inscriptions. What is the contribution of the *Attani* inscriptions in identifying the religious background of Sri Lanka in the 9th-10th centuries AD? is the research problem of this study. A qualitative research method was used to gather data in the present study. According to the above study, most of the *Attani* inscriptions of this era show various donations and privileges made by the kings to the sangha society. It is known from the *Thimbirivewa* inscription, *Gonnewa* inscription, etc. that the monastery maintenance at that time was carried out by the king and other officials. There is information about a *parihara* gift given to the bhikkuni who bathed the *bodhi* of the Maha Viharaya in the *Kalatthewa* inscription. Information about the monastery administration, as well as information about the curses such as *"if there is someone who violated these orders, let him be a crow or dog*" are written for those who misuse the properties of temples. In a considerable number of *Attani Tam* inscriptions, there are several symbols that can be considered as linguistic effects. The symbol of Sun-Moon indicates the existence of gifts and dog-crow images indicate the consequences of misusing properties of temples. It can be considered that this has a stronger communication function than verbal communication because even in contemporary society there exists a belief among people that the misuse of properties of temples will cause people to be born as dogs and crows. Thus, it can be concluded that the *Attani* inscriptions are a good basis for investigating the religious background of Sri Lankan society in the 9th-10th centuries AD.

**Keywords:** Attani, Curse Phrases, Religious Practices, Sangha Society, Symbols.

# කල්‍යාණවතී රැජිණගේ රුවන්වැලි සෑ පුවරු ලිපියෙන් හෙළිවන පූජා විධි පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ජේ. ඒ. කේ. සුදර්ශන[1], කේ. ටී. ආර්. එස්. කිරිඇල්ල[2]
සිංහල අධ්‍යයනාංශය[1], ඉතිහාසය සහ පුරාවිද්‍යා අධ්‍යයනාංශය[2]
රුහුණ විශ්වවිද්‍යාලය
kasunsudarshana17@gmail.com

**සාරසංක්ෂේපය**

ඓතිහාසික තොරතුරු නිරවුල් ව හා නිවැරදි ව සමාජගත කිරීමේ දී ශිලාලේඛනවලට ප්‍රමුඛස්ථානයක් හිමි වේ. ලෙන්ලිපි, ගිරිලිපි, පුවරුලිපි, ටැම්ලිපි ආදි වශයෙන් ද පූර්ව බ්‍රාහ්මී හා අපර බ්‍රාහ්මී වශයෙන් ද සෙල්ලිපි වර්ගීකරණය කළ හැකි ය. දැනට විද්‍යමාන ව පවතින සෙල්ලිපි අතුරෙන් රුවන්වැලි සෑ මළුවෙහි පිහිටි කල්‍යාණවතී රැජිණියගේ පුවරු ලිපිය ක්‍රි.ව 1203 දී සම්පාදනය කරන ලද, අපර බ්‍රාහ්මී ලක්ෂණයන්ගෙන් යුක්ත වූවකි. ඉතා පැරණි සාධක පිළිබඳ ව තොරතුරු හෙළි කරන්නා වූ මෙම පුවරු ලිපියේ එකල සමාජයේ තිබූ ආගමික පූජා විධි පිළිබඳ කරුණු රැසක් අන්තර්ගත වේ. පර්යේෂණ අරමුණ වනුයේ රුවන්වැලි සෑ මළුවෙහි පිහිටි කල්‍යාණවතී රැජිණියගේ පුවරු ලිපියෙන් හෙළි කෙරෙන පූජා විධි පිළිබඳ ව විමර්ශනය කිරීම යි. මෙම පර්යේෂණයේ ගැටලුව වනුයේ රුවන්වැලි සෑ මළුවෙහි පිහිටි කල්‍යාණවතී රැජිණියගේ පුවරු ලිපියෙන් හඳුනාගත හැකි පූජාවන්ගේ ස්වභාවය කෙබඳු ද? යන්න විමසීම යි. පූජා විධි ක්‍රම පිළිබඳ විවිධ ශිලාලේඛන රචනා වුව ද, කල්‍යාණවතී රැජිණගේ පුවරු ලිපියෙන් හෙළිවන පූජා විධි පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි පර්යේෂණ සීමාව වේ. මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ වන පරිදි අධ්‍යයනය කෙරුණු අතර දත්ත රැස් කිරීම සඳහා පුස්තකාලය අධ්‍යයන ක්‍රමවේදය සහ ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය යොදා ගැනුණි. පුස්තකාලය අධ්‍යයනයේ දී ප්‍රාථමික මූලාශ්‍රය මෙන් ම ද්විතීයික මූලාශ්‍රය ද උපයෝගී කර ඇත. රැස් කරගත් දත්ත විස්තරාත්මක විශ්ලේෂණය යටතේ අධ්‍යයනය කොට සටහන්, වගු, රූප සටහන් මඟින් දත්ත සංවිධානය කර තිබේ. කල්‍යාණවතී රැජිණියගේ පුවරු ලිපියෙහි පෙළ හා අර්ථ විවරණය පිළිබඳ ව පර්යේෂකයන්ගේ අවධානය යොමු වී ඇතත්, එහි සඳහන් ආගමික අංශයේ පූජා විධි පිළිබඳ ව එතරම් අවධානයක් යොමු නොවූ බව ප්‍රථමයෙන් හඳුනා ගන්නා ලදි. එහි දී කල්‍යාණවතී රැජිණගේ දෙවන පාලන සමයේ දෙවෙනි අවුරුද්දෙහි පරාක්‍රමබාහු රජුගේ හා අනෙක් රජවරුන්ගේ භාණ්ඩාගාරික විජයනාවන් විසින් සිය භාර්යාව වූ සුමේධා හා බෑණනුවන් වූ ලංකාධිකාර කොටදනවු දෙවල්නාවන් විසින් රුවන්වැලි සෑයට පූජා පැවැත්වීම පිළිබඳ සාධක හඳුනා ගත හැකි විය. කල්‍යාණවතී රැජිණගේ පාලන සමයෙහි කාන්තාවක විසින් සිදු කරන ලද පූජෝත්සව සංවිධානය වී ඇති ආකාරය අධ්‍යයනය කිරීම මගින් තත්කාලීන පාලකයන් සංස්කෘතිමය රාමුවක පිහිටා ආගම විෂයයෙහි නැඹුරු වී ඇති ආකාරය සහ ආගමික පූජා විධි සිදුකළ රාජ්‍ය පාලනයක් ගෙන ගිය පාලක පිරිසක් සිටි බවට ද කරුණු අනාවරණය විය.

**ප්‍රමුඛ පද** : ආගමික, කල්‍යාණවතී රැජිණ, පූජා විධි, රුවන්වැලි සෑ ලිපිය, ශිලාලේඛන

# A Study on the Offering Rituals Revealed in the Ruwanweliseya Slab Inscription of Queen Kalyanavati

J.A.K.Sudarshana[1], K.T.R.S.Kiriella[2]
Department of Sinhala[1], Department of History and Archaeology[2]
University of Ruhuna
kasunsudarshana17@gmail.com

**Abstract**

Inscriptions play a prominent role in socialising information clearly and accurately. Inscriptions can be classified into Cave, Rock, Slab, and Pillar inscriptions, as well as early Brahimi scripts and later Brahmi scripts. Among the existing inscriptions, the slab inscription of the Queen Kalyanavati at the courtyard of the Ruwanweliseya was compiled in A.D. 1203 and is a later Brahmi script. The script reveals information about ancient facts, including religious rituals and offerings of that period. The objective of the study is to investigate the religious offerings stated in the slab inscription of Queen Kalyanavati in the courtyard of the Ruwanweliseya. The research problem is to investigate the nature of offering methods revealed in the slab inscription of Queen Kalyanavati in the courtyard of the Ruwanweliseya. Although there are various inscriptions on the offering methods, the study is limited to the offering methods revealed in the inscription of Queen Kalyanavati. Subject to qualitative research method, library sources, and field studies were used to gather data. In the library sources, both primary and secondary sources were utilised. The Descriptive Analysis Method was used to analyse the collected data and then organised into notes, tables, and diagrams. Although researchers have focused on the text and interpretation of Queen Kalyanavati's inscription, it was first identified that not much attention was paid to the religious rituals mentioned in it. Furthermore, the inscription states that during the second year of the second reign of Queen Kalyanavati, the treasurer of King Parakramabahu and other kings directed his wife Sumedha and brother-in-law Lankadikara Kotadanavu Devalnawan to perform the religious rituals to the Ruwanweliseya. It was observed through the inscription how women during the reign of Queen Kalyanavati organised offering ceremonies and that the rulers of that period paid much attention to religious rituals within a cultural framework during their time of rule.

**Keywords**: Offerings, Queen Kalyanavati, Religious, Ruwanweliseya, Slab Inscriptions

# කුංචුට්ටු කෝරළයේ ධීවර කර්මාන්තය හා හේන් ගොවිතැන ආශ්‍රිත බස්වහර පිළිබඳ සාහිත්‍ය විමර්ශනයක්

ඩී. එම්. ආර්. එම්. කුමාරසිංහ
කැලණිය විශ්වවිද්‍යාලය - කැලණිය
hmtrasanga@gmail.com

**සාරසංක්ෂේපය**

කුංචුට්ටුව යනු දෙමළ භාෂාවෙන් බිඳී ආ ග්‍රාම නාමයකි. එය කුඩා උල්පත යන අර්ථය ලබා දේ. කෝරළය යන්න රටපුරා පරිපාලන බෙදීම් හැඳින්වෙන නාමයකි. ඉංග්‍රීසි පාලනයට එරෙහි ව කැරලි ගැසූ සිංහලයන්ගේ පවුල් පිටින් ඝාතනය කිරීමට ඉංග්‍රීසි රාජ්‍ය පාලනය නියෝග කිරීමත් සමග ඔවුන්ගේ පරම්පරා වශයෙන් විනාශ කිරීමට පටන් ගත්හ. මෙම අවාසනාවන්ත සිද්ධියේ දී ගම්බිම් අත හැර වයඹ හා මධ්‍යම පළාත් සිංහලයෝ උතුරු දෙසට සංක්‍රමණය වූහ. එසේ සංක්‍රමණය වූ ජනතාවගෙන් මෙම කුංචුට්ටු කෝරළය ජනාවාසකරණයට ලක් වී තිබේ. වර්ෂ දෙසීයක තරම් ඉතිහාසයක් කුංචුට්ටු කෝරළයේ ජීවත්වන්නන්ට ඇත. දඩයම හා හේන් ගොවිතැන මොවුන්ගේ මුල් ජීවන වෘත්තීන් විය. එදිනෙදා ආහාර සඳහා මසුන් ඇල්ලීමේ කාර්යය මෑත කාලීන ව ධීවර කර්මාන්තයක් බවට පත් වී ඇත. මාතෘ භාෂා අධ්‍යයනය මගින් ප්‍රාදේශීය හෝ පළාත් මට්ටමේ අනන්‍යතා සිද්ධි අධ්‍යයනය හා භාෂාත්මක ප්‍රයෝග හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ යි. විශේෂයෙන් ම ගමත් නගරයත් පළාත් සංස්කෘතිය සමඟ සංඝට්ටනය වන වත්මන් සමාජ ක්‍රමය තුළ ක්‍රමික පරිණාමය ඔස්සේ භාෂාත්මක ප්‍රයෝග වෙනස් වූ අයුරු හඳුනා ගැනීම සඳහා ක්‍රමවේදයක් තිබිය යුතු ය. කුංචුට්ටු කෝරළයට පමණක් සීමා වූ සජීවි භාෂා ප්‍රයෝග, ජනශ්‍රැති හා මුඛ පරම්පරානුගත තොරතුරුත් ආශ්‍රය කොට ගෙන මෙම පර්යේෂණය සිදු කිරීමට අදහස් කළේ දේශීය අනන්‍යතාවන් මතු පරපුරට දායාද කිරීම සඳහා ය. ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයක ම පැනනගින භාෂා රටා ඒ ඒ සමාජ ස්තරය තුළ වියැකී ගොස් තිබෙන අවධියක එය රැකගැනීම වඩාත් යෝග්‍ය වේ. ජන ජීවිතයේ තොරතුරු මෙන් ම ජන වහර පිළිබඳ භාෂාත්මක ප්‍රයෝග මතුපරපුරට ඉතාමත් වැදගත් ය. මෙම පර්යේෂණය සඳහා අවශ්‍ය දත්ත සපයා ගැනීම ප්‍රාදේශීය වාර්තාකරණ, ක්ෂේත්‍ර චාරිකා හා සම්මුඛ සාකච්ඡා මගින් සිදු කෙරිණි. ජන ජීවිතයේ ඇතැම් සිරිත් නාගරීකරණය හේතුවෙන් වියැකී ගොස් තිබේ. කුංචුට්ටු කෝරළයේ පුරාවෘත්ත සජීවී ලෙසින් ද, ජනප්‍රවාද ලෙසින් ද, රජරට ජනතාවගේ තොරතුරු එළිකිරිම් ද ඒ තුළින් අනාගත පරපුරට යමක් ඉතිරි කළ යුතු බව ද මෙයින් ගම්‍ය වේ. හේන් ගොවිතැන ආශ්‍රිත බස් වහර හා ධීවර කර්මාන්තය ආශ්‍රිත බස් වහර ද ඒ ආශ්‍රිත ව සිදු වන්නා වූ සාහිත්‍ය විමර්ශනයක් පිළිබඳ සජීවී තොරතුරු රැසක් ද මෙම පර්යේෂණය මගින් අනාවරණය කර ගැනීමට හැකියාව ලැබේ.

**ප්‍රමුඛ පද:** කුංචුට්ටු කෝරළය, ජනශ්‍රැති, හේන් ගොවිතැන, ධීවර කර්මාන්තය

# A Literary Investigation on the Fishing Industry and Chena Cultivation in Kunchuttu Korala

D.M.R.M.Kmarasinghe
University of Kelaniya – Kelaniya
hmtrasanga@gmail.com

**Abstract**

Kunchuttuwa is a village name derived from Tamil. It gives the meaning of a small spring. Korala is a name given to administrative divisions across the country. The British government ordered the killing of Sinhalese families who rebelled against the British rule and as a result, their generations started to be destroyed. In this unfortunate incident, the Sinhalese of the North-West and Central Provinces left their villages and migrated towards the North. This Kunchuttu Korala was settled by the people who thus migrated. The people living in this Kunchuttu Korala have a history of around two hundred years. Hunting and chena cultivation were their initial occupations. Later, fishing for daily food has become a fishing industry in recent times. The objective here is to identify linguistic effects and case studies of local or provincial-level identity through studying native languages. There should be a method to identify how those linguistic effects have changed through systematic evolution, especially in such a period where the village and the city merge with the provincial cultures. The purpose of this study is to pass on the local identity to the next generation by identifying the unique characteristics of Kunchuttu Korala such as living language effects, folklore and oral tradition information. It is more appropriate to preserve language patterns in every part of our country at a time when such information has faded in the respective social layer. The information of the folk life and the linguistic effects of the usage of people are very important for future generations. Data were collected through local reporting, field visits, and interviews. Some customs in people's lives have disappeared due to urbanisation. This also implies that the chronicles of Kunchuttu Korala should be revealed alive, as legends, and the information about the Rajarata people should be revealed and thus leave something for future generations. This research uncovers many lively information about the language related to chena cultivation and and a related literature investigation.

**Keywords:** Chena Cultivation, Fisheries, Folklore, Kunchuttu Korala

# සංස්කෘතික ස්වාධීනත්වය ගොඩනැඟීම සඳහා සංස්කෘතික පරිසරවිද්‍යාවේ දායකත්වය පිළිබඳ අධ්‍යයනයක්

කේනුර ගීසර[1] එච්. එච්. ඒ. කරුණාරත්න[2]
[1]නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ashoka@sjp.ac.lk[1] kenura.00@gmail.com[2]

**සාරසංක්ෂේපය**

මානවවිද්‍යාඥ ජුලියට් ස්ටුවර්ට් (1902-1972) විසින් රචිත 'සංස්කෘතික විපර්යාසයේ සිද්ධාන්ත' යන කෘතියෙහි මිනිසුන් විවිධ පරිසර තත්ත්වවලට අනුවර්තනය වන අන්දම කෙරෙහි අවධාරණය යොමු කෙරන ශික්ෂණය හැඳින්වීම සඳහා සංස්කෘතික පරිසරවිද්‍යාව (Cultural Ecology) න්‍යාය හඳුන්වාදෙන ලදී. ඕනෑම භූමියක ඇතිවන ජනාවාස කේන්ද්‍රකර ගනිමින් සංස්කෘතීන් බිහිවන බවත්, එම ජනාවාසවල සංස්කෘතික විවිධත්වය බිහිවීම සඳහා සංස්කෘතික පරිසරවිද්‍යාව බලපාන බවත් මෙහිදී අවධාරණය කෙරෙයි. ප්‍රධාන සංස්කෘතික කණ්ඩායම් තුළ උපසංස්කෘතීන් බිහිවීම සඳහා භූ භෞතික පරිසරය බලපාන්නේ කෙසේ ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. පර්යේෂණ අරමුණ වන්නේ මෙවැනි මූලික භූ කලාප කේන්ද්‍රකරගෙන ගොඩනැගෙන උපසංස්කෘතිවල විවිධත්වය අධ්‍යයනය කිරීමයි. මේ සඳහා අධ්‍යයන ප්‍රදේශ ලෙස මධ්‍යම කඳුකරයේ හුදෙකලා ප්‍රදේශයක් හා වියළි කලාපීය තැනිතලා ප්‍රදේශයක් භාවිත කරන ලදී. මෙම ප්‍රදේශවල සංස්කෘතික පරිසරය නිර්මාණය වීමෙහි ලා පරිසරය බලපෑ ආකාරය හඳුනා ගැනීම සඳහා මෙම අධ්‍යයනය සිදුකරන ලද අතර විවිධ පාරිසරික තත්ත්වවලදී සංස්කෘතික විවිධත්වය ඇතිවීම මෙහි දී විමර්ශනයට බඳුන් කරන ලදී. දත්ත රැස්කිරීම සඳහා භාවිත කරන ලද ක්‍රමවේද අතර සහභාගිත්ව නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා, සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය, සිතියම් අධ්‍යයනය ආදී ක්‍රම යොදා ගැනුණි. දත්ත විශ්ලේෂණයේ දී මානව ධර්මතා හා අවශ්‍යතා මහා සංස්කෘතියෙන් ව්‍යුක්තව උපසංස්කෘති වෙනම ආරකින් බිහිවීමට සංස්කෘති හා එයට බලපාන ලද භූගෝලීය සාධක මගින් තහවුරු කරගැනීම සිදුවිය. පර්යේෂණයේ ප්‍රතිඵල වශයෙන් ස්වාභාවික පරිසරයට ඇතුළත් අංග සහ එම පරිසරයට අයත් සංස්කෘතියේ අභ්‍යන්තර ක්‍රියාකාරීත්වය අතර පවතින සබඳතාව තේරුම් ගැනීමට හැකි විය. මෙහි දී පාරිසරික තත්ත්වයන් හේතුවෙන් ප්‍රධාන සංස්කෘතියේ ඇති උපසංස්කෘති බිහිවීමත් ඒවා එකිනෙකට වෙනස් ලක්ෂණ පෙන්නුම් කිරීමට මේ භූ භෞතිකයේ බලපෑම සිදුවූ බවත් මෙම අධ්‍යයනයේදී පෙනී ගියේය. එම උප සංස්කෘතිවල එකිනෙකට වෙනස් සුවිශේෂ ලක්ෂණ හඳුනා ගැනීමට හැකි විය. මිනිසා විසින් මෙසේ පරිසරය හා දක්වන සුවිශේෂ අනුවර්තනය ඓතිහාසික ප්‍රවේණියකින් ළඟා කරගත් බව මෙමගින් තහවුරු කර ගැනිණි. ඊට නිශ්චිත පරිසරයක ජීවත්වීම, තාක්ෂණික භාවිතය යන කරුණු ඇතුළත් බව පෙනී ගියේ ය. මෙම අධ්‍යයනය මගින් සංස්කෘතිය බිහිවීම සඳහා අදාළ ජනාවාස පිහිටි භූමිය හා වෙනත් ජනාවාසවල ආභාසය බලපාන බවත් පසුව එම සංස්කෘතීන් අදාළ පරිසරයට අනුගත වෙමින් ස්වාධීන සංස්කෘතියක් බිහිකර ගැනීමට බලපාන ආකාරයත් පිළිබඳව සංස්කෘතික පරිසර විද්‍යාත්මක න්‍යාය මගින් පෙන්වා දෙන ලදී.

**ප්‍රමුඛපද :** ජනාවාස, භූ භෞතික පරිසරය, සංස්කෘතිය, සංස්කෘතික පරිසරවිද්‍යාව

# A Study of the Contribution of Cultural Ecology to the Construction of Cultural Independence

KenuraGeesara[1]H.H.A.Karunarathna[2]

[1]Department of Applied Archaeology, Nagananda International Institute for Buddhist Studies,

University of Sri Jayewardenepura

ashoka@sjp.ac.lk[1] kenura.00@gmail.com[2]

## Abstract

In the book “Theories of Cultural Change” written by anthropologist Juliet Stewart (1902–1972), the Theory of Cultural Ecology was introduced to describe the discipline that emphasises how people adapt to different environmental conditions. It is emphasised here that cultures are formed by centering the settlements that occur on any land and that cultural ecology affects the emergence of cultural diversity in those settlements. The research problem is to investigate how the geophysical environment affects the emergence of subcultures within the main cultural groups. The research objective is to study the diversity of subcultures that are built around these basic geographical regions. An isolated area in the central highlands and a dry zone plain area were used as study areas for this purpose. These studies were conducted on how the environment affected the creation of the cultural environment in these areas, and the emergence of cultural diversity in different environmental conditions was investigated here. The methods used for data collection included Participant Observation, Interviews, Literature Study, Map Study, etc. In the data analysis, it was confirmed by the cultures and geographical factors that influenced the emergence of sub-cultures in different ways, abstracted from the main culture. As a result of the research, it was possible to understand the relationship between the elements included in the natural environment and the inner operation of the culture belonging to that environment. In this study, it was found that due to the environmental conditions, the sub-cultures of the main culture were born, and they showed different characteristics due to the influence of this geophysics. It was possible to identify distinct characteristics of those subcultures. This confirmed that the special adaptation shown by man to the environment has been achieved through historical genetics. It was found that it includes living in a certain environment and using technology. Through this study, it was concluded through the Theory of Cultural Ecology that the influence of land where a certain settlement is located and other settlements affect the formation of the culture, and then the culture adapts to the relevant environment to create an independent culture.

**Keywords:** Culture, Cultural Ecology, Geophysical Environment, Settlement

# ආදිවාසී ජනතාවගේ ආහාර පරිභෝජන රටාවේ වෙනස්වීම කෙරෙහි පුද්ගලබද්ධ සංවර්ධන ව්‍යාපෘතිවලින් සිදුවන බලපෑමඃ දඹාන ආදිවාසී ගම්මානය ආශ්‍රයෙන්

එන්. ඩී. නාමරත්න
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
bamunuachchi@gmail.com

**සාරසංක්ෂේපය**

එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධිත ආදිවාසීන් පිළිබඳ කමිටුවේ නිර්වචනය පරිදි ආදිවාසීන් යනු, යම්කිසි රටක හෝ ප්‍රදේශයක මුල් පදිංචිකරුවන්ගෙන් පැවත එන ජන කොටස්වලින් සමන්විත ප්‍රජාවකි. මහාවංශයට අනුව ශ්‍රී ලාංකේය ආදිවාසීන්ගේ සම්භවය සිදුවන්නේ කුවේණියගේ දරු දෙදෙනාගෙනි. ඒ අනුව දීර්ඝ ඉතිහාසයක් සහිත මේ ආදිවාසීන් සතුව ඔවුනටම ආවේණික සංස්කෘතියක් නිර්මාණය වී තිබේ. මහියංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දීර්ඝ කාලයක් තිස්සේ වාසය කරන දඹාන ආදිවාසීන්ට ද වනාන්තරය කේන්ද්‍ර කරගත් ස්වයංපෝෂිත වූ ද ඔවුනටම අනන්‍ය වූ ද සංස්කෘතියක් පැවති බව ඔවුන්ගේ සම්භවය හා පරිණාමය සම්බන්ධයෙන් සිදුකර ඇති විද්වත් පර්යේෂණ මගින් අනාවරණය වේ. යටත්විජිතයක්ව තිබී නිදහස ලැබූ පසු බලයට පත් විවිධ දේශපාලන බලධාරීන් විසින් එතෙක් පැවති යැපුම් ආර්ථිකය වෙනුවට සමස්ත ශ්‍රී ලංකාවට ම වාණිජ අර්ථ ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබිණි. ඊට සමගාමීව සමාජ සංවර්ධන ව්‍යාපෘති මෙන් ම පුද්ගල සංවර්ධන ව්‍යාපෘති ද හඳුන්වා දෙනු ලැබිණි. මේ පර්යේෂණයේ ගැටලුව වන්නේ විවිධ සමාජ, ආර්ථික හා දේශපාලන ක්‍රියාකාරකම් අතුරින් පුද්ගල සංවර්ධන ව්‍යාපෘතිවල බලපෑම හේතු කොටගෙන දඹාන ආදිවාසීන්ගේ ආහාර සංස්කෘතිය කෙරෙහි කවර බලපෑමක් සිදු වී ඇත්දැයි විමර්ශනය කිරීම ය. ඒ අනුව මෙහි දී අවධානය යොමු කෙරෙන්නේ තත් සංවර්ධන ව්‍යාපෘති අතුරින් පුද්ගලබද්ධ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳවත් ඒවා දඹාන ආදිවාසීන් අතර ක්‍රියාත්මක වීමෙන් ඔවුන්ගේ සංස්කෘතියේ ප්‍රමුඛාංගයක් වන ආහාර පරිභෝජන රටාවේ වෙනස්වීම් හටගැනීමට එමගින් සිදු වූ බලපෑම් පිළිබඳවත් ය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුව සිදුකෙරෙන මේ පර්යේෂණය සඳහා දත්ත රැස්කිරීමේ දී දඹාන ආදිවාසීන් පිළිබඳව ලියැවුණු පර්යේෂණ කෘති ද සම්මුඛ සාකච්ඡා ද ප්‍රත්‍යක්ෂ නිරීක්ෂණ ද භාවිත කෙරිණ. දඹාන ආදිවාසීන්ගේ සංස්කෘතියට අයත් ආහාර රටාවේ විපර්යස්ථ වීම කෙරෙහි බලපෑම් ඇතිකෙරෙන චර්යාවන් ඔවුන් අතර ජනිත කෙරුණු, 1948 - 2022 දක්වා ක්‍රියාත්මක වූ ආහාර මුද්දර ක්‍රමය (1978), සහල් සලාක ක්‍රමය (1979), ජනසවිය ව්‍යාපාරය (1989), සමෘද්ධි ව්‍යාපාරය (1989) සහ දිවිනැගුම ව්‍යාපාරය (2013) යන ව්‍යාපෘතීන් සහ ඒවායේ බලපෑම ද අවධානයට යොමු කෙරිණි. පූර්වෝක්ත දත්ත විශ්ලේෂණය කිරීමේ දී අලවර්ග, දඩමස්, මීපැණි, ධාන්‍ය වර්ග, එළවළු හා පලතුරු පමණක් සාම්ප්‍රදායිකව ආහාර සඳහා යොදාගත් ආදිවාසීන් මේ වන විට තිරිඟු පිටි සහිත ආහාර කෙරෙහි ද සොසේජස් වැනි සුපිරි වෙළඳසල් ආශ්‍රිත ආහාර හා පැණිබීම භාවිතය කෙරෙහි ද ශීඝ්‍ර නැඹුරුවක් දක්වන බව නිගමනය කරගත හැකි විය.

**ප්‍රමුඛපදඃ** අතීත ආහාර රටාවන්, ආදිවාසීන්, දඹාන, පුද්ගලබද්ධ සංවර්ධන ව්‍යාපෘතීන්, වර්තමාන ආහාර රටාවන්

# Impact of Community Development Projects on Changes in Food Consumption Patterns of Indigenous People: With Reference to Dambana Tribal Village

N.D. Namarathna
Faculty of Graduate Studies, University of Kelaniya
bamunuachchi@gmail.com

## Abstract

According to the definition of the Committee on Indigenous Peoples of the United Nations, indigenous people are a community consisting of people descended from the original inhabitants of a country or region. According to the Mahavansa, the Sri Lankan indigenous people originate from the two children of Kuweni. Accordingly, these indigenous people, who have a long history, have created a unique culture of their own. The scholarly research conducted regarding indigenous peoples' origin and evolution reveals that the Dambana indigenous people, who were established in the Mahiyanganaya Divisional Secretariat, had a self-sufficient and unique forest-centred culture. After gaining independence, the various political authorities who came to power introduced a commercial economic system to the whole of Sri Lanka in place of the subsistence economy that existed until then. Simultaneously, social development projects, as well as community development projects, were also introduced. The problem of this research is to investigate the impact of community development projects among various social, economic and political activities on the food culture of the Damban indigenous tribes. Accordingly, the focus here is on the community development projects and the effects that they have had on the changes in the food consumption pattern, which is a priority of their culture, by implementing them among the indigenous people. The qualitative research method was used for this research, and research books written about the Dambana indigenous people, interviews, and direct observations were used to collect the data. The projects, the food stamp system (1978), the rice ration system (1979), the Janasaviya movement (1989), the Samurdhi movement (1989), and the Divineguma movement (2013), which were operated from 1948 to 2022, mainly caused changes in the food pattern of the culture of Dambana indigenous people. In the analysis of the previous data, it is concluded that the indigenous people who traditionally used only yams, wild meats, bee honey, grains, vegetables, and fruits for food are now showing a rapid tendency towards food with wheat flour and supermarket-related foods such as sausages and snacks.

**Keywords**: Indigenous People, Dambana, Community Development Projects, Past Food Patterns, Present Food Patterns

# මහනුවර යුගයේ සිතුවම්වල සාම්ප්‍රදායික උද්භිද සැරසිලි පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

පූජ්‍ය පදියතලාවේ අමරවංශ හිමි
padiyathalaweamarawansa933@gmail.com

**සාරසංක්ෂේපය**

ගස්, වැල්, පියුම්, පියුම්පෙති, ලියවැල් හා සුළිවැල් ආදිය යොදා ගනිමින් සිතුවම් අලංකාර කිරීම උද්භිද සැරසිලි නමින් හඳුන්වයි. සපුමල්, මානෙල්මල්, මල්වැල්, ලියවැල් ආදිය ස්වාභාවික පරිසරයෙන් සකසා ගන්නා සැරසිලි ය. කඩුපුල්මල්, සීනමල්, පරසතුමල්, හා කතිරමල් ආදිය කාල්පනික ව සකසා ගන්නා උද්භිද සැරසිලි ය. සාම්ප්‍රදායික සිංහල උද්භිද සැරසිලිවල මෙම කොටස් දෙක ම දක්නට ඇත. නිර්මාණකරුවා මේවා භාවිත කර ඇත්තේ චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණවලට ය. දිව්‍ය රූප හා මනඃකල්පිත සත්ත්ව රූපවලින් පුදුමය හා විස්මය ඇති කරයි. උද්භිද සැරසිලිවලින් කවරාකාර සන්නිවේදනයක් ලබාදෙන්නේ ද යන්න පරීක්ෂා කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වූ මේ පර්යේෂණයෙහි ගැටලුව වශයෙන් තබාගන්නා ලද්දේ මහනුවර යුගයේ සිතුවම්වල සාම්ප්‍රදායික උද්භිද සැරසිලි නිර්මාණවලින් නිර්මාණකරුවා අපේක්ෂාකර ඇත්තේ කුමක්ද?' යන්නයි. උද්භිද මෝස්තර කලාවේ රේඛා භාවිතය, නිර්මාණාත්මක බව, පරමාර්ථ හා උද්භිද සැරසිලි ස්ථාන ගත කළ ආකාරය අධ්‍යයනය කිරීම ප්‍රධාන අරමුණ බවට පත්විය. සාම්ප්‍රදායික උද්භිද සැරසිලිවල දී භාවිත වුණු පාට වර්ග, පින්සල් හා ශිල්පීය ක්‍රමවේද හඳුනා ගැනීම පර්යේෂණයේ උපඅරමුණු වේ. මහනුවර ප්‍රදේශයේ සිදුකරන ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් මූලික දත්ත රැස්කර ගැනුණ අතර ද්විතීයික මූලාශ්‍රය වශයෙන් භාවිත කර ඇත්තේ උද්භිද සැරසිලි සම්බන්ධයෙන් මුද්‍රිත හා අමුද්‍රිත පර්යේෂණ කෘති, පුවත්පත්, සඟරා හා වීඩියෝ පට, චිත්‍ර ආදි විද්‍යුත් මෙන් ම මුද්‍රිත මාධ්‍යයෙන් ප්‍රකාශිත දත්තයි. 'උද්භිද සැරසිලිවලට ගස්, වැල්, පියුම් හා පියුම් පෙති ආදිය තෝරා ගැනීමේ දී ඒවායේ පැහැය, හැඩය, ස්වාභාවිකත්වය ආදිය කෙරෙහි අවධානය යොමුකර ඇත්තේ නරඹන්නාගේ රසවින්දනය පාදක කරගෙන ය.' යන්න පර්යේෂණ උපන්‍යාසය විය. ක්‍රි. ව. 1940 දී පළමු වරට මුද්‍රණය වූ ටී. යූ. ද සිල්වා කර්තෘත්වය දරන 'පැරණි සිංහල චිත්‍ර සැරසිලි මෝස්තර' නම් කෘතියේ දී පරසතුමල, කඩුපුල්මල රූප සහිත ව ඉදිරිපත්කර ඇත. එහෙත් ඒවායේ ඇති වටිනාකම් පිළිබඳ විමසීමක් කර නැත. පූර්ව පර්යේෂණ වශයෙන් මෙම කෘතියත්, මාතෘකාවට අදාළ තොරතුරු ඇතුළත් එල්. ටී. පී. මංජු ශ්‍රී, නන්දදේව විජේසේකර, ආනන්ද කුමාරස්වාමි, එස්. පී. චාල්ස් වැනි වියතුන් විසින් රචිත කෘතිත් පර්යේෂණයට අදාළ වන වෙනත් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය කෘතිත් අධ්‍යයනය කරන ලදී. මහනුවර යුගයේ සිතුවම්වල දක්නට ලැබෙන ගස්, වැල් හා මල්සැරසිලි පමණක් අධ්‍යයනය කිරීම පර්යේෂණ සීමාව විය. මෙම යුගයේ දී නිර්මාණකරුවා ස්වාභාවික පරිසරයෙන් අරගත් උද්භිද සැරසිලි භාවිත කර ඇත්තේ උපදේශාත්මක පණිවිඩයක් ලබාදීමට නොවේ. එහෙත් කාල්පනික උද්භිද සැරසිලිවලින් නරඹන්නා විස්මයට පත්කිරීමටත්, යහපත් ක්‍රියා කිරීමෙන් දිව්‍ය සම්පත් ලබා ගැනීමට හැකි බවත් එහි දී දිව්‍ය ලෝකවල ඇති ගස්, වැල් හා පියුම් ආදියෙන් පාරිසරික සුන්දරත්වය විඳීමට හැකි බවත් පෙන්වා දීම අරමුණු බවට පත් වී ඇත. මෙයට අමතර ව ස්වතන්ත්‍ර නිර්මාණයේ අගය වැඩිකර ගැනීමටත්, සුන්දරත්වය රැක ගැනීමටත්, ප්‍රධාන නිර්මාණයේ හිස්තැන් පිරවීමටත් උපක්‍රමයක් ලෙස භාවිත කර ඇත. බෞද්ධාගමෙන් ඈත් වූ ජනයා විහාරයට හෝ දේවාලයට හෝ මාලිගාවට හෝ කැඳවා ගැනීමේ සියුම් උපාය මාර්ගයක් වශයෙන් ද උද්භිද සැරසිලි යොදාගෙන තිබේ. මෙම සොයා ගැනීම් පර්යේෂණයෙන් අනාවරණ කරගත් ප්‍රතිඵල යි.

ප්‍රමුඛපද : උද්භිද සැරසිලි, නිර්මාණකරුවා, මනඃකල්පිත සැරසිලි, මහනුවර යුගය

# An Experimental Study of Traditional Botanical Decorations in Kandy Period Paintings

Rev. PadiyathalaweAmarawansa
padiyathalaweamarawansa933@gmail.com

**Abstract**

Trees, plants, vines, lotuses, petals of lotus, creeper designs, and tendril designs are used creatively to decorate a place or object are called botanical decorations. *Sapumal*, lilies, flowers, garlands, etc. can be known as decorations made from the natural environment. *Kadupulmal*, *Seena Mal*, *Parasathumal*, *Kathiramal,* etc. can be introduced as botanical decorations that are created imaginatively. Traditional Sinhala botanical decorations consist of both these parts. Designers use botanical decorations in paintings, sculptures, carvings, and architecture. Divine images and imaginary animal images indicate surprise and amazement. This research aims to examine what kind of communication is provided by botanical decorations, and the research problem is to investigate what the designer expected from the traditional botanical decorative designs in the paintings of Kandy period. The main objective of the research is to study the use of lines, creativity, purpose, and placement of botanical decorations in the art of botanical design. The sub-objectives of the research were to identify the colours, brushes, and techniques used. Primary data were collected through the field studies conducted in Kandy area, and printed and non-printed research books and research papers, and printed and electronic sources such as newspapers, magazines and videos, pictures, etc. were used to obtain secondary data. The hypothesis of the research is that *"In botanical decorations, attention has been paid to their shape, colour, shape and naturalness based on the enjoyment of the viewer*". In the book *'Parani Sinhala Chitra Mosthara'*, first printed in 1940 by T. U. De Silva, *Parasathumala* and *Kadupulmala* are presented with images. However, no inquiry has been made about their values. Apart from this, books by L.T.P. Manju Sri, Nandadeva Wijesekara, Ananda Coomaraswamy, S.P. Charles, and other primary and secondary sources were utilised. The limitation of the research was trees, vines, and flower designs found only in the paintings of the Kandy period. In this era, the designer used botanical decorations taken from the natural environment, not to convey a didactic message. The designer has intended to create happiness in the viewer's mind with the botanical decorations. In addition, botanical decorations have been used as a strategy to fill the gaps in the main design and to bring Buddhist people to the temples.

**Keywords:** Botanical Decoration, Designer, Dye, Figurative Decoration, Kandy Period

# රාජකීය පුරාවෘත්ත පිළිබඳ ජනශ්‍රැති අධ්‍යයනයක් (මාතර ග්‍රාම නාම ඇසුරෙනි)

සන්ධ්‍යා කහඳගමගේ
සිංහල අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර
spkahandagamage@gmail.com

**සාරසංක්ෂේපය**

මාතර දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දහසයකින් සමන්විත වූවකි. ඒ ඒ කොට්ඨාසයට අදාළ ප්‍රධාන ග්‍රාම නාම ප්‍රමාණය පන්සිය පනහ ඉක්මවා යයි. මෙකී ග්‍රාම නාම ගොඩනැගීම පිළිබඳව ජනතාව අතර විවිධ මතිමතාන්තර පවතියි. දිගුකලක් තිස්සේ පැවතෙන ගමක නාමය සම්බන්ධ විවිධ ලුහුඬු ශ්‍රැති දක්නා ලැබේ. ග්‍රාම නාමයේ සම්භවය ආශ්‍රයෙන් ඓතිහාසික, සමාජ සංස්කෘතික තොරතුරු විමසා බැලිය හැකිය. මාතර ග්‍රාම නාම සම්බන්ධයෙන් එවැනි තොරතුරු "මාතර ග්‍රාම නාම සහ එහි විත්ති" යන කෘතියෙහි අන්තර්ගත ය. එසේ වුවත් එය ජනශ්‍රැති විද්‍යාත්මක ප්‍රවේශයකින් අධ්‍යයනය කර නැත. මෙම පර්යේෂණයේ ගැටලුව වනුයේ 'මාතර ග්‍රාම නාම මගින් ප්‍රකට වන රාජකීය පුරාවෘත්ත කවරේ ද? එහි ස්වභාවය කෙබඳු ද?' යන්නයි. ඉතිහාසයත් ජනශ්‍රැතියත් අතර පවතින සබඳතාව හඳුනා ගැනීම මෙහි අරමුණයි. මෙම පර්යේෂණය සඳහා මාතර ග්‍රාම නාම පිළිබඳව ලියැවී ඇති පොතපත පරිශීලනය ප්‍රමුඛ වශයෙනුත් දත්ත දයකයන් හමුව අහඹු නියැදි ක්‍රමය ඔස්සේ තොරතුරු ලබා ගැනීම ද්විතීය වශයෙනුත් සිදු කෙරිණ. එහිදී සම්මුඛ සාකච්ඡා, සහභාගිත්ව නිරීක්ෂණ සහ ප්‍රශ්නමාලා ක්‍රමය යොද ගැනිණ. ග්‍රාම නාම සම්බන්ධ රාජකීය සම්භවයක් සහිත පුරාවෘත්ත පමණක් අධ්‍යයනයට ලක් වේ. ඒ අනුව වළගම්බා රජු, දුටුගැමුණු රජු, විජයබා රජු, කුමාරදස රජු, මිණිකිරුළු රජු වැනි රාජකීයයන් හමු වේ. මෙම රජවරුන් අතර ප්‍රබල අය සේ ම ප්‍රාදේශීය රජවරු ද සිටිති. පුරාවෘත්තය වූ කලී අර්ධ ඓතිහාසික බවක් සහිත, පෙනෙන අතීතයක සිදු වූ සංසිද්ධියකි. චූල සාහිත්‍යයට අයත් පුරාවෘත්තයක විවිධ ප්‍රභේද සහ සම්මිශ්‍රණ ද දක්නට ලැබේ. ලංකාවේ රාජ්‍යත්වය පවත්වා ගැනීමට මාතර ප්‍රදේශයෙන් ලැබී ඇති පිටුබලය පිළිබඳව මහා සම්ප්‍රදයේ එන ඇතැම් තොරතුරු චූල සම්ප්‍රදයගත ග්‍රාමනාම මගින් ද සනාථ වෙයි. ආක්‍රමණ, කුමන්ත්‍රණ, පලායාම්, පිරිස් ඒකරාශී කිරීම්, ආරක්ෂා කිරීම්, සටන් කිරීම්, ජයග්‍රහණ, වෙහෙර විහාර ගොඩනැගීම්, නිදන, මිත්‍ර සම්බන්ධතා වැනි බොහෝ කරුණු මෙම ප්‍රවාද සමග සම්මිශ්‍රිතව ඇත. පොළොන්නරුවේ ප්‍රබල රජකු වූ විජයබා රජු සම්බන්ධ පුරාවෘත්තය මාතර ප්‍රචලිතව ඇති බව ග්‍රාම නාමවලින් හෙළිවන අතරම පනාකඩුව තඹ සන්නස මගින් එය සනාථ වේ. විවිධ වූ වෙනත් ජනශ්‍රැති මූලාශ්‍රය සමග මුසු වෙමින් මෙම පුරාවෘත්ත ග්‍රාම නාම සමග සංරක්ෂිතව පවතින බව නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පදඃ** ග්‍රාම නාම, පුරාවෘත්ත, මාතර, රජ, රාජ්‍යත්වය

# A Folklore Study of Royal Legends (Based on Village Names in Matara)

Sandhya Kahandagamage
Department of Sinhala, University of Ruhuna, Matara
spkahandagamage@gmail.com

**Abstract**

The Matara district comprises 16 Divisional Secretariat Divisions, and the number of village names related to each division exceeds five hundred and fifty. Divergent opinions exist among the populace concerning the origins of these village names. Various legends, deeply entrenched over time, are intertwined with the nomenclature of these settlements. Historical and socio-cultural insights regarding village names in Matara can be explored in books "*Matara Grama Nama*" and its companion, "*Matara Grama Nama saha Ehi Vitti*." However, it is worth noting that these narratives have yet to be approached from an ethnographic perspective. The research problem is to investigate which royal legends are known by Matara village names, and what is its nature. The primary objective of this study is to The aim is to identify the relationship between history and folklore. In this study, books written on the village names of Matara were used to gather primary data. Additionally, a data collection methodology based on random sampling, involving interviews, participant observation, and questionnaires were used as secondary sources. The present study primarily focuses on legends of royal origin associated with village names. Accordingly, King *Valagamba*, King *Dutugemunu*, King *Kumaradasa*, and King *Minikirulu* were found and among these kings are regional kings as well as powerful ones. A legendary is a semi-historical phenomenon that took place in the apparent past. Various variants and combinations of a legend belonging to *Chola* literature are also found. Some of these legends shed light on the support that the Matara region provided in maintaining Sri Lankan statehood. These narratives intertwine with tales of invasions, conspiracies, escapes, personal gatherings, defenses, battles, victories, construction of temples, treasure troves, friendly relations, and more. The village names reveal that the legend related to King Vijayaba, who was a powerful king of Polonnaruwa, is popular in Matara, while it is confirmed by the Panakaduwa Copper Sannasa. It can be concluded that these legends are preserved along with the village names, mixed with various other folk sources.

**Keywords:** King, Kingdom, Legend, Matara,Village Names

# සිසුන්ගේ මෘදු කුසලතා සංවර්ධනය සඳහා සාහිත්‍යයෙන් ලැබෙන පිටුබලය : වර්තමානයේ පාසල්වල ක්‍රියාත්මක වන ප්‍රාථමික විෂය මාලාවේ අන්තර්ගත ළමාකතන්දර ඇසුරෙන්

නිර්මලා ජයසිංහ
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය
nirmalajayasingha7@gmail.com

**සාරසංක්ෂේපය**

සමස්ත මානව සංහතියේ ම ප්‍රගමනය උදෙසා අධ්‍යාපනයෙන් ලැබෙන්නේ මහගු පිටුබලයකි. ඒ අනුව එහි මුල් ම අදියර වන ප්‍රාථමික අධ්‍යාපනය මානවයාගේ සමස්ත සංවර්ධනයෙහි ලා උපකාරී වන්නකි. විධිමත් සහ අවිධිමත් යන ප්‍රභේද ද්වය ඔස්සේ ලබන අධ්‍යාපනයෙන් ශිෂ්‍යයා දෘඪ කුසලතා මෙන් ම මෘදු කුසලතා ද අත්පත්කර ගනියි. දෘඪ කුසලතාවලින් සිසුවෙකුට ලැබෙන දැනුම ඵලදායී ලෙස භාවිත කිරීමටත්, අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී ඵලදායී ලෙස මෙන් ම මනා සුසංයෝගයකින් යුතු ව අන්තර්ක්‍රියා සිදුකිරීමටත් අවශ්‍ය ගුණාංග ලැබෙනුයේ මෘදු කුසලතාවලිනි. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ මෘදු කුසලතා වර්ධනය සඳහා අධ්‍යාපනයේ ජාතික අරමුණුවලින් මෙන් ම මූලික නිපුණතාවලින් ද අවධානය යොමු කර ඇත. 21වන සියවසෙහි අධ්‍යාපනය තුළ ද මෘදු කුසලතා සංවර්ධනය සඳහා ලබා දී ඇත්තේ සුවිශේෂ ස්ථානයකි. ඒ අනුව සැකසුණු ප්‍රාථමික අධ්‍යාපන විෂය මාලාවෙන් සිසුන් වෙත මෘදු කුසලතා සම්ප්‍රේෂණය කරනු වස් සාහිත්‍යය මගින් ලබාදෙන්නේ මහගු පිටුබලයකි. ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාව ද සාහිත්‍යය සමග අත්‍යන්තයෙන් බද්ධ ව පවතී. මේ පර්යේෂණයේ දී ප්‍රාථමික විෂය මාලාවේ ඇතුළත් ළමා කතන්දර 05ක් ඇසුරෙන් සිසුන්ගේ මෘදු කුසලතා සංවර්ධනය සඳහා ලබා දී ඇති ඉඩහසර කෙබඳු දැයි අධ්‍යයනයට පාත්‍ර විය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුව සිදු කෙරෙන මෙම අධ්‍යයනයට අදාළ දත්ත රැස් කෙරුණේ ප්‍රාථමික විෂය මාලාවේ අන්තර්ගත ළමා කතන්දර විශ්ලේෂණයෙන්, තෝරා ගැනුණු පාසල් කිහිපයක ගුරුවරුන් හා දෙමව්පියන් සමග සිදුකෙරුණු සම්මුඛ සාකච්ඡාවලින් සහ ශිෂ්‍ය ක්‍රියාකාරකම් ප්‍රත්‍යක්ෂ ව නිරීක්ෂණය කිරීමෙනි. රැස්කරන ලද දත්ත විශ්ලේෂණය කිරීමෙන් එළඹුණු නිගමන වූයේ ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ළමාකතන්දර ඇතුළත් කිරීමෙන් සිසුන්ගේ රසඥතාව වර්ධනයට, නිර්මාණාත්මක කුසලතා වර්ධනයට, රංගන කාර්යයේ නිරත වීමට, සන්නිවේදන කුසලතා වර්ධනයට, යහපත් ආකල්ප වර්ධනයට විවේචනාත්මක හා විශ්ලේෂණ කුසලතා වර්ධනය වීමට මෙන් ම සමාජශීලීත්වය, ඉවසීම, නායකත්ව කුසලතා, සමාජචිත්තවේගීය කුසලතා වැනි මෘදු කුසලතා වර්ධනය වීමට ද එම කතන්දරවලින් සැලකිය යුතු පිටුබලයක් සැපයෙන බව ය.

**ප්‍රමුඛ පද:** දෘඪ කුසලතා, ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාව, මෘදු කුසලතා, සාහිත්‍යය, ළමාකතන්දර,

# Contribution of Literature for the Development of Soft Skills of Students: Based on Children's Stories in the Primary Curriculum Currently Implemented in Schools

Nirmala Jayasinha

Department of Early Childhood Development and Primary Education, National Institute of Education

nirmalajayasingha7@gmail.com

**Abstract**

Education is a great support for the progress of the entire humanity. Thus, primary education, which is the first stage, is assisting in the overall development of the human beings. The student acquires hard skills as well as soft skills through formal and informal education. Soft skills are the qualities that a student needs to effectively use the knowledge gained from hard skills and to interact effectively and harmoniously in interpersonal communication. In Sri Lanka's education system, the national goals of education as well as the basic competencies have drawn attention to the development of soft skills. In the education of the 21st century as well, a special place has been given to the development of soft skills. Literature provides great support in imparting soft skills to the students through the accordingly prepared primary education curriculum. The primary education curriculum is also closely intertwined with literature. In this research, the opportunities provided for the development of soft skills of the students were examined in relation to the five children's stories included in the primary curriculum. Subject to qualitative research method, data were gathered through the analysis of children's stories included in the primary curriculum, interviews conducted with teachers and parents of the selected schools, and direct observation of student activities. The analysis of the collected data revealed that by including children's stories in primary education, assists in the development of students' tastefulness, creative skills, acting skills, communication skills, good attitude and critical and analytical skills as well as sociability, patience, leadership skills, and also the stories provide significant support for the development of soft skills such as social-emotional skills.

**Keywords:** Children's Stories, Hard Skills, Literature, Primary Education Curriculum, Soft Skills

# ශ්‍රී ලංකාවේ දකුණු පළාතට ආවේණිකව සිදුකරනු ලබන "කිරිපෝය" චාරිත්‍රය පිළිබඳ සමාජ සංස්කෘතික අධ්‍යයනයක්.

එච්. එන්. ටී. සිල්වා

භාෂා අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

nadunsilva1997@gmail.com

**සාරසංක්ෂේපය**

ලංකාවේ දකුණු පළාතට අයත් අහුංගල්ල, බලපිටිය, කොස්ගොඩ, අම්බලන්ගොඩ යන ප්‍රදේශවල පමණක් ජීවත්වන, හලාගම කුලයේ ජනතාව අතර විශේෂයෙන් ප්‍රචලිතව පවතින, ඇසළ මංගල්‍යය මූලික කරගනිමින් වාර්ෂිකව සිදුකරනු ලබන ගෘහාශ්‍රිත ආගමික පුද පූජා චාරිත්‍රයක් ලෙසත්, දකුණුලක ප්‍රාදේශික ජන සංස්කෘතියට අයත් ජනශ්‍රැති අංගයක් ලෙසත් 'කිරිපෝය චාරිත්‍රය' හැඳින්විය හැකි ය. පළමුවන විජයබාහු රජු දවස ආරම්භ වූවා යැයි සලකනු ලබන කිරිපෝය; 'ශුද්ධපෝය', 'සුද්දෙපෝය', 'දෙල්පෝය' යන නම්වලින් ද හැඳින්වේ. එසේම කිරිපෝය චාරිත්‍රය සිදුකර කිරි ආහාර අනුභව කිරීම මෙම ප්‍රදේශවල ජනතාව ව්‍යවහාර කරනු ලබන්නේ "ජොරාමරනවා" යනුවෙනි. රුහුණු කතරගම මහාදේවාලයේ කප් සිටවූ දා සිට මේ සඳහා පේවන ජනතාව ඇසළ පොහොය දින සවස් යාමයේ දී තම නිවෙස්වල කිරිපෝය චාරිත්‍රය සිදුකරති. ඒ අනුව දකුණු පළාතට ආවේණික ගෘහාශ්‍රිත ආගමික පුද පූජා චාරිත්‍රයක් ලෙස කිරිපෝය චාරිත්‍රය පාරම්පරික සිරිත්විරිත්වලට අනුව පවත්වාගෙන එනු ලබන්නේ ද? යන්න, මෙහි පර්යේෂණ ගැටලුව වූ අතර වර්තමානයේ මෙම ප්‍රදේශවල ජනතාව කිරිපෝය චාරිත්‍රය සිදුකරන ආකාරය සමාජ සංස්කෘතික වශයෙන් අධ්‍යයනයට ලක් කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය. මෙහි දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුව සහභාගීත්ව නිරීක්ෂණය ඔස්සේ පර්යේෂණ ක්ෂේත්‍රය ගවේෂණය කර, සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් දත්ත හඳුනාගෙන, එම දත්ත රැස්කරගෙන, පසුව ඒ සියලු දත්ත මනාව විශ්ලේෂණය කිරීමෙන් පර්යේෂණ නිගමනයන්ට එළඹිණි. ඒ අනුව වර්තමාන සමාජයෙහි සුළු වෙනස්කම් කිහිපයක් පමණක් කිරිපෝය චාරිත්‍රය සිදුකිරීමේ දී දැකගත හැකිවුවත්, අතීතයේ සිට පාරම්පරිකව පැවත එන සාම්ප්‍රදායික සිරිතට විරිතට මුල් තැනක් දෙමින් සුවිශේෂ පාරම්පරික ආගමික චාරිත්‍රයක් ලෙස අදටත් මේ ප්‍රදේශවල සෑම නිවසකම පාහේ ඇසළ පොහොය දිනයට කිරිපෝය චාරිත්‍රය නොකඩවාම සිදුකරනු ලබන බව පර්යේෂණ නිගමනය වශයෙන් පෙන්වා දිය හැකිය.

**ප්‍රමුඛ පදඃ** ආගමික චාරිත්‍රය, කිරිපෝය, පාරම්පරික සිරිත්විරිත්, ලංකාවේ දකුණු පළාත, සමාජ සංස්කෘතිය

# A Social and Cultural Study of the Ritual of *Kiri Poya* which is Unique to the Southern Province of Sri Lanka

Silva H.N.T.

Department of Languages, Faculty of Social Science and Humanities,

Rajarata University of Sri Lanka

nadunsilva1997@gmail.com

**Abstract**

The '*Kiri Poya'* ritual' is an annual domestic religious offering ritual based on the *Esala* festival, which is especially popular among the *Halagama* caste people live only in the areas of Ahungalla, Balapitiya, Kosgoda, Ambalangoda in the Southern Province of Sri Lanka, and a folk element belonging to the regional folk culture of the south. *Kiri Poya* also known as '*Shudda Poya'*, '*Sudde Poya'*, and '*Del Poya'* has been started since the reign of King MahaVijayabahu. Also, the practice of eating dairy food after *Kiri Poya* is called '*Joramaranava*'. Ever since *Kapsituwema* of *Ruhunu Kataragama Mahadewala*, people who are devoted to this, have been performing the *Kiri Poya* ritual at homes in the evening of *Esala Poya*. Accordingly, the research problem is to investigate whether the *Kiri Poya* ritual is maintained according to traditional customs as a domestic religious offering ritual peculiar to the Southern Province. The primary objective was to study the socio-cultural way in which the people of these regions perform the *Kiri Poya* ritual. Subject to the qualitative research method, the research conclusions were found by exploring the research field through participatory observation, identifying data through interviews, collecting the data, and then thoroughly analysing all the data. Accordingly, although only a few minor changes can be seen in the performance of the *Kiri Poya* ritual in today's society, the research concluded that the *Kiri Poya* ritual is continuously performed on *Esala Poya* Day in almost every house in these areas, giving priority to the traditional custom that has been inherited from the past.

**Keywords:** *Kiri Poya*, Religious Ritual, Social and Cultural, Southern Province of Sri Lanka, Traditional Customs

# නිලගම සිත්තර පරම්පරාවේ අනන්‍යතා ලක්ෂණ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

## (නීලගිරි රජමහාවිහාරයේ බුදුසිරිත නිරූපිත සිතුවම් ඇසුරෙන්)

ඩබ්. එම්. සී. එච්. ධර්මවර්ධන
කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
charikadharmawardhana@gmail.com

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලාංකේය කලා ඉතිහාසය අධ්‍යයනයේ දී විවිධ චිත්‍ර සම්ප්‍රදායන් මෙන් ම ඒවා රැකගත් චිත්‍ර ශිල්පී පරම්පරා පිළිබඳ තොරතුරු ද සාහිත්‍ය මූලාශ්‍රයේ සහ ජනප්‍රවාදයේ අන්තර්ගත ය. සමකාලීන සංස්කෘතිය පමණක් නොව චිත්‍ර නිර්මාණය කළ චිත්‍ර ශිල්පී පරම්පරාවලට ආවේණික වූ නිර්මාණ සම්ප්‍රදායන් ද මේවා ඇසුරින් විමර්ශනය කිරීමට හැකි වෙයි. මධ්‍යම පළාතේ ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නිලගම ග්‍රාමයේ ජීවත්වන නිලගම චිත්‍ර පරම්පරාව ශ්‍රී ලාංකේය චිත්‍ර ශිල්ප පරම්පරා අතර විශේෂ වෙයි. සීගිරි චිත්‍ර නිර්මාණයේ දී නිලගම සම්ප්‍රදායේ පාරම්පරික දායකත්වය ලැබුණු බව ජනප්‍රවාදයේ කියවෙයි. පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත්කමක් උසුලන නිලගම නීලගිරි රජමහාවිහාරයේ ඇති සිතුවම් මෙම පරම්පරාව විසින් චිත්‍රණය කරන ලද ඒවා වෙයි. කාලීන සමාජ තොරතුරු මෙන් ම චිත්‍ර සම්ප්‍රදායේ විශේෂ ලක්ෂණ ද අනාවරණය කර ගත හැකි මෙම නීලගිරි රජමහාවිහාරයේ සිතුවම්, චිත්‍රණය කොට ඇත්තේ නිලගම සිත්තර පරම්පරාවේ හතරවැනි පරම්පරාව වන ජීවන්නයිදේ විසිනි. බුද්ධ චරිතයේ විවිධ අවස්ථා ලෙස සූවිසි විවරණය ප්‍රධාන දොරටුවේ වම්පසත්, මුළු බිත්තිය පුරාමත්, බුදුබවට පත්වීමේ සත්සතියේ අවස්ථා දකුණු පස බිත්තියේත්, දර්ශනීය ලෙස සිතුවම්කොට තිබේ. නීලගිරි විහාරස්ථානයේ සිතුවම් ඇසුරෙන් නිලගම සිත්තර පරම්පරාවේ චිත්‍රකරණයේ දී භාවිත ශිල්පක්‍රම අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි. නිලගම චිත්‍ර සම්ප්‍රදාය බුද්ධ චරිතය ආශ්‍රිත සිදුවීම් චිත්‍රණයේ දී ශ්‍රී ලාංකේය පුරාණ චිත්‍ර පරම්පරා අතර අනන්‍යතාවක් ඇති කරගෙන ඇත්තේ කෙසේ ද ? යන්න විමසීම පර්යේෂණයේ ගැටලුවයි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුව ග්‍රන්ථ සංධාර ක්‍රමවේදය, ක්ෂේත්‍ර ගවේෂණ ක්‍රමවේදය යන ක්‍රම ඇසුරෙන් මෙම පර්යේෂණ කටයුතු සිදුකෙරෙයි. ශ්‍රී ලාංකේය චිත්‍ර පරම්පරාවන් අතරින් අභාවයට යමින් පවතින නිලගම සිත්තර පරපුරෙහි නිර්මාණාත්මක අනන්‍යතාව සමාජගත කිරීම සහ ඒ පිළිබඳ තවත් අධ්‍යයන මංපෙත් විවර කිරීම උදෙසා මෙම පර්යේෂණ පත්‍රිකාව ඉදිරිපත් කෙරෙයි.

**ප්‍රමුඛ පදඃ** චිත්‍ර පරම්පරා, නිලගම ගුරුකුලය, නීලගිරිවිහාරය, බුද්ධචරිතය, ශිල්පීය අනන්‍යතාව

# An Investigative Study on the Identity Characteristics of the Nilagama Generation of Painters: Based on the Neelagiri Rajamahavihara Painting Depicting Buddhist Practices

W.M.C.H. Dharmawardhana
University of Kelaniya
charikadharmawardhana@gmail.com

**Abstract**

In the study of Sri Lankan art history, information on the various painting traditions as well as the generations of painters who preserved them, are found from the sources of literature and the content of folklore. Not only the contemporary culture but also the design traditions and traditions inherent to the generations of painters are engaged in paintings can be investigated in relation to this. The Nilagama generation of Painters live in the Nilagama Village of the Galewela Divisional Secretariat of the Central Province is special among the Sri Lankan generations of painting. Legend says that the Nilagama tradition has contributed in creating of Sigiri art. The paintings in the Nilagama Neelagiri temple which is of archaeological importance were painted by this generation. The paintings of the Neelagiri Raja Maha Viharaya, which reveal the special features of the traditional social information and the painting tradition, were painted by *Jeevan Naide*, the fourth generation of Nilagama Painters. Suvisi commentary (*Suvisi Vivarana*) on the various stages of the Buddha's character on the left side of the main entrance and throughout the entire wall, and the seven weeks (*Sath Sathiya*) of the enlightenment of Buddha on the right wall are spectacularly depicted. The primary objective is to study the techniques used in the painting of the Nilagama Generation of Painters based on the paintings of the Neelagiri temple. The research problem is to investigate how the Nilagama painting tradition has created an identity among the generations of Sri Lankan painters in the paintings of the events related to Buddha. Subject to the qualitative research methodology, this research was conducted using a review of literature and field research. This research attempted to socialise the creative identity of the declining Nilagama Generation of Painters among the generations of Sri Lankan painters and to open more ways of study about it.

**Keywords:** Generation of Painters, Nilagama School, Neelagiri Temple, The Character of Buddha, Technical Identity

# මහනුවර යුගයේ චිත්‍ර කලාවෙන් නිරූපිත හස්ති රූපයේ කලාත්මක විකාසනය පිළිබඳ විමර්ශනයක්
## (තෝරාගත් විහාර ඇසුරින්)

ඩබ්. එම්. නදීශා මධුරංගි
කැලණිය විශ්වවිද්‍යාලය
wasalagenadeesha75@gmail.com

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ චිත්‍ර කලාවට දීර්ඝ ඉතිහාසයක් ඇත. ප්‍රාග් ඓතිහාසික, අනුරාධපුර, පොළොන්නරු, මහනුවර ආදි යුග ගණනාවක සිට ඓතිහාසික විකාසනයක් චිත්‍ර කලාවට උරුම ව පවතී. එම කලායුග අතර මහනුවර යුගයේ චිත්‍ර කලාවට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. මිනිස්, සත්ත්ව, උද්භිද මෙන් ම කාල්පනික වස්තූන් මෙකල චිත්‍රයට නැඟිණ. ඒ අතරින් හස්ති රූපයට විශේෂ ස්ථානයක් හිමි විය. දෙගල්දොරුව විහාරයෙහි ඇති ඇලි ඇතු දන් දීම, රිදී විහාරයෙහි කාන්තා රූප නවයක් යොදාගෙන නිර්මාණය කර ඇති නවනාරි කුඤ්ජරය ලෙස හැඳින්වෙන හස්ති රුව මෙන් ම මාර පරාජය ආදි සිතුවම්වල ද හස්ති රූපය විවිධ අයුරින් සිතුවමට නගා ඇත. උත්තුංගභාවය, මහේශාක්‍යභාවය මෙන් ම වාසනාවේ සුභ සංකේතයක් ලෙස ද හස්ති රූපය භාවිත වූයේ යැයි විශ්වාස කෙරේ. මහනුවර අවධියේ දී විවිධ වස්තු විෂයන් යටතේ චිත්‍රිත හස්ති රූපවල කලාත්මක විකාසනය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි. එම යුගයේ නිර්මිත හස්ති රූපවල නිර්මාණ ලක්ෂණ සෙසු යුගවල නිර්මිත හස්ති රූපවලට වඩා අනන්‍යතාවක් සහිත ද? ඒ හා සමඟ සමාජ සංස්කෘතික බලපෑමක් ඇති ද යන්න සෙවීම මෙහි පර්යේෂණ ගැටලුවයි. රිදී විහාරය, දෙගල්දොරුව විහාරය හා දඹුල්ල විහාර ආශ්‍රිත ව සිතුවම් ප්‍රාථමික අධ්‍යයන මූලාශ්‍රය ලෙස භාවිත කරමින් ද සාහිත්‍ය හා පුරාවිද්‍යා මූලාශ්‍රය කෙරෙහි අවධානයෙන් ද ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ මෙම පර්යේෂණය සිදුකර ඇත. මෙම අවධියේ චිත්‍ර සහිත දෙගල්දොරුව, දඹුල්ල, රිදී විහාරය ආදි තෝරාගත් ස්ථාන කිහිපයක සිතුවම්හි හස්ති රූපය නිර්මාණයේ දී එහි හැඩය, වර්ණ භාවිතය හා ප්‍රමාණය සකස්කරගෙන ඇති ආකාරය පිළිබඳ මෙමගින් අවධානය යොමු කෙරේ. මෙකී අධ්‍යයනයෙන් මහනුවර අවධියේ නිර්මාණය වුණු සිතුවම් තුළ හස්ති රූපයේ කලාත්මක පසුබිම පිළිබඳ මනා අවබෝධයක් ලබාගත හැකි වේ.

**ප්‍රමුඛ පද :** මහනුවර යුගය, රේඛාකරණය, වර්ණ, සැරසිලි, හස්තිරූපය

# An Investigation into the Artistic Evolution of the Elephant Image Depicted in Paintings of Kandy Period
## (Based on Selected Temples)

W.M.Nadeesha Madhurangi
University of Kelaniya
wasalagenadeesha75@gmail.com

**Abstract**

Art in Sri Lanka has a long history. There is a historical evolution of art since prehistoric Anuradhapura, Polonnaruwa, Kandy, etc. Among those eras of art, Kandy era of art has a special place. Humans, animals and botanica as well as imaginary objects are depicted in these paintings. Among them, image of elephants has a prominent place. Elephants in Degaldoruwa Vihara, offering elephants in Degaldoruwa Temple, *NavanariKujjeiya*, which is created using nine female figures in Ridivihara, as well as *Mara Parajaya*, etc., also depict elephants in different ways. It is believed that the elephant image was used as a symbol of prosperity and good luck. The main purpose of this research is to study the artistic configuration of the exquisite elephant images under different architectural styles during the Mahanuwara period. The research problem of this research is to find out if there is more identity than the idols created in that era? Does it have a similar socio-cultural impact. This research was conducted under the qualitative research methodology, using the paintings of Ridi Viharaya, Degaldoruwa Viharaya and Dambulla Viharaya as primary study sources and paying attention to literary and archeological sources. This will focus on how the shape and size of the hand has been prepared in the paintings of selected places such as Degaldorowa, Ridivihara, Dambulla, etc., with paintings of this period. Through this study, a good understanding of the artistic background of the hand image in the paintings created in the Kandy period can be gained.

**Keywords:** Colours, Decorarion, Elephant image, Kandyan era, Linearization

# සමාජගත "නාග"සංකල්පය ලාංකේය කලාව තුළ ප්‍රතිබිම්බිත ස්වභාවය පිළිබඳ අධ්‍යයනයක් (කැටයම් සහ මූර්ති කලාව ඇසුරෙන්)

ඒ. ජී. ප්‍රභාෂා දිල්ෂානි
කැලණිය විශ්වවිද්‍යාලය
prabhashadilshani8@gmail.com

**සාරසංක්ෂේපය**

"නාග"නමින් හඳුන්වනු ලබන උරග විශේෂයෙහි ඇති ප්‍රබල ගති ස්වභාව නිසා නාගයන් යනු වන්දනීයත්වයට පත්වන සත්ත්ව විශේෂයක් බවට පත්ව තිබේ. නාග රූපය සිංහල සමාජ -සංස්කෘතිය හා බෞද්ධ දර්ශනය තුළ මුල් බැසගෙන ඇති ආකාරය අනුව නාගයන් පදනම් කරගනිමින් ගොඩනැගුණු නාග සංකල්ප රාශියක් දක්නට හැකි වේ. එනම් නාග රූපය මඟින් ගින්න, ජලය, වර්ෂාව, ශක්තිය, ලිංගිකත්වය, ප්‍රඥාව, වෛරය, ධනය, බලය, තෘෂ්ණාව, සෞභාග්‍යය, ආරක්ෂාව, උසස්බව, කාලය, සෞඛ්‍ය සනීපාරක්ෂාව හා ශ්‍රේෂ්ඨත්වය වැනි සන්නිවේදනාර්ථ නිරූපණය වේ. කිසියම් ජන කොට්ඨාසයක් නියෝජනය කරන ගෝත්‍රික සංකේතයක් ලෙස ද, මූර්ති ශිල්පයට එක් වූ නාග සංකල්පය මඟින් කිසියම් දාර්ශනික අදහසක් ලෝකයට කියාපෑමට කලාකරුවා සමත් ව තිබේ. විවිධ ප්‍රකාශන අර්ථ මූලික කරගනිමින් සමාජගත වී ඇති නාග රූපය කැටයම් හා මූර්ති කලාව මඟින් සංකේතවත් කරන්නේ කෙබඳු ආකාරයෙන් ද? යන්න පර්යේෂණ ගැටලුව වේ. සමාජගත වූ සංකල්පයන් කලාවට එක්වන ස්වභාවය හා මූර්ති හා කැටයම් කලාව සඳහා පදනම් වූ නාග සංකල්පයේ විශේෂතා හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණයි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමය යටතේ ප්‍රාථමික දත්ත අධ්‍යයනය කිරීමත්, ද්විතීයික හා තෘතීයික දත්ත ඔස්සේ පර්යේෂණය සිදුකිරීමත්, එමගින් නිශ්චිත නිගමනයකට එළඹීමත්, අපේක්ෂිත විය. මේ අනුව දුරාතීතයේ පටන් නූතනය දක්වා බෞද්ධ හා හින්දු මූර්ති ආශ්‍රිතව නාගයා සංකේතවත් කළ නිර්මාණ විශාල ප්‍රමාණයක් දක්නට ඇති බවත්, එම නිර්මාණ විවිධ සන්දර්භ ඔස්සේ විද්‍යමානවන බවත් හඳුනාගත හැකි විය. විශේෂයෙන් ම කැටයම් හා මූර්ති කෙරෙහි නාග රූපයේ බලපෑම ප්‍රබල ය. මුරගල, වාහල්කඩ, කොරවක්ගල හා මකර තොරණ යන කැටයම් පදනම් කරගනිමින් එක් එක් කැටයම් නිර්මාණ සඳහා නාග රූපය ඇතුළත් කිරීමට පාදක වූ අර්ථයන් නිශ්චය කොටගැනීමෙන් මූර්ති සහ කැටයම් කලාවට නාග සංකල්පයේ බලපෑම පිළිබඳ තොරතුරු සනාථ කොටගත හැකි විය. සමාජගත සංකල්පය ම කලාව තුළින් නිරූපණය කිරීමෙහි ලා කලාකරුවාගේ නැඹුරුව කෙසේදැයි ඒ අනුව හඳුනාගත හැකි වේ.

**ප්‍රමුඛ පදඃ** කැටයම්, නාගයා, නාග සංකල්පය, මූර්ති, සංකේත

# A Study of the Concept of the Socialised "*Naga*" as Reflected in Sri Lankan Art (Based on Engravings & Sculptures)

A.G.P.Dhilshani
University of Kelaniya
prabhashadilshani8@gmail.com

**Abstract**

Cobras are worshipped because of their power in the reptile known as "Naga". This Naga image is reflected in the Sinhalese social - culture and Buddhist philosophy. Many Naga concepts based on Naga's can be seen. That is the image of the cobra represents fire, water, rain, energy, sex, wisdom, hatred, wealth, power, lust, prosperity, protection, superiority, time, health hygiene& greatness. As a tribal symbol representing a certain group of people. The artist has been able to Coney some philosophical ideas to the world through the concept of the serpent added to the sculpture. In what way is the image of the snake, which has been socialized based on various expressive? The research problem is the meanings symbolized by the art of cravings and sculpture. The main purpose of this research is to identify the characteristics of the naga concept based on the nature of socialized concepts in art and sculpture and craving art. expected to study the primary data under the qualitative research method and conduct the research through secondary and tertiary data. It is recognized that there are a large number of designs symbolizing the serpent in Buddhist and Hindu sculpture from ancient times to modern times. These designs appear i various contexts. The influence of the cobra image is particularly strong on cravings and sculptures. Based on the *Muragala, Vahalkada, Koravakgala & MakaraThorana*. This information about the influence of the naga concept sculpture and engravings art could be confirmed by determining the meanings based on the inclusion of the snake image in each craving. It is possible to recognize the tendency of the artist to represent the concept of socialization through art.

**Keywords:** Concept of Naga, Craving, Naga, Sculpture

# පන්සියපනස් ජාතක පොතෙන් විද්‍යමාන ආහාර සංස්කෘතියෙහි ආයුර්වේදීය වටිනාකම් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

## (තෝරාගත් ජාතකකතා දහයක් ඇසුරෙන්)

පී. එස්. ගොඩකන්ද

රුහුණ විශ්වවිද්‍යාලය

pabasarasev@gmail.com

**සාරසංක්ෂේපය**

කිසියම් ජන සමාජයක් සතු ආහාර සංස්කෘතිය එකී ජන සමාජයේ සංස්කෘතික අනන්‍යතාව ප්‍රකාශ කරන මූලික අංගයකි. එම නිසා ආහාර සංස්කෘතියේ අනිවාර්ය අංග ලෙස ගැනෙන ආහාර වර්ග, ආහාරවල පවතින පෝෂ්‍ය පදාර්ථ, ආහාර සංරක්ෂණ විධි සහ ආහාර සකස් කර ගන්නා ආකාර ඒ ඒ සංස්කෘතිය අනුව විවිධ හා විශේෂ ස්වභාවයක් ගනී. එබැවින් කිසියම් රටක ආහාර පිළිබඳව සිදුකරන අධ්‍යයනය එරට සංස්කෘතියේ ස්වභාවය ද අධ්‍යයනය කිරීමක් වේ. සාමාන්‍යයෙන් ආහාර සම්බන්ධයෙන් බලපවත්නා පෝෂණ ගුණ සේ ම ඖෂධීය වටිනාකම් ද ඇත. ඇතැම් ආහාර වර්ග ඖෂධයක් වශයෙන් ද භාවිතයට ගැනීම ඊට හේතුවයි. එය සුලබ ව දකින්නට ලැබෙන්නේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ දී ය. බොහෝ විට අපගේ ප්‍රධාන ආහාර වේලට එක්වන පලා වර්ග, ධාන්‍ය වර්ග, එළවළු වර්ග, මාංශ වර්ග, පලතුරු වර්ග ආයුර්වේදයේ දී සැලකෙන්නේ ඖෂධීය අගයක් සහිත ආහාර වශයෙනි. මූලාශ්‍රයගත තොරතුරු අතර සාහිත්‍ය මූලාශ්‍රයක් වශයෙන් වැඩි අගයක් සහිත *පන්සියපනස් ජාතක පොත* ආහාර සම්බන්ධයෙන් පවතින සිරිත් විරිත්, ආකල්ප, විශ්වාස, ආහාර සම්පාදනක්‍රම, ආහාරවල ගුණාත්මකභාවය සහ උත්සව වැනි කරුණු රැසක් අනාවරණය කරයි. ඒ අතර ඖෂධීය අගයක් සහිත ආහාර ගැන ද ඇතැම් තැනක සඳහන් වෙයි. අමුධාන්‍ය, කැඳ වර්ග සහ සූකර මාංශ පිළිබඳ හමුවන තොරතුරු ඉන් කිහිපයකි. එබැවින් පන්සිය පනස් ජාතක පොතෙන් විද්‍යමාන ආහාර සංස්කෘතිය හා බැඳුණු තොරතුරුවල කිසියම් ආයුර්වේදීය වටිනාකමක් වේදැයි විමර්ශනය කිරීම මෙහි පර්යේෂණ ගැටලුවයි. ආහාර සම්බන්ධයෙන් ආයුර්වේදයේ පවතින සංකල්ප සහ න්‍යායාත්මක තත්ත්ව ජාතකපොතෙන් නිරූපණය වන්නේ කෙසේ ද යන්න හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණයි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ පුස්තකාල නිරීක්ෂණය, පන්සිය පනස්ජාතක පොතෙහි සංස්කරණ, ආයුර්වේදය පිළිබඳ පොත්පත්, පර්යේෂණාත්මක ලිපි, සඟරා, පුවත්පත් හා දේශන සටහන් ආශ්‍රයෙන් දත්ත එක් රැස් කිරීම සිදුවේ. ඒ අනුව බණ කථා සාහිත්‍යයට අයත් වැදගත් මූලාශ්‍රයක් වශයෙන් ගැනෙන පන්සිය පනස් ජාතක පොතෙහි විද්‍යමාන ආහාර සංස්කෘතියෙහි සාම්ප්‍රදායික හා සංස්කෘතික ලක්ෂණ අභිභවා කිසියම් ආයුර්වේදීය අගයක් ඉස්මතු වන බව පර්යේෂණයෙන් නිගමනය වෙයි.

**ප්‍රමුඛ පද** : ආහාර, ආයුර්වේද, පන්සිය පනස් ජාතකපොත, වෛද්‍යක්‍රමය, සංස්කෘතිය, සමාජය

# An Investigative Study of Ayurvedic Values Revealed in the *Pansiya Panas Jathaka Potha* (Based on Ten Selected *Jathakas*)

P. S. Godakanda
University of Ruhuna
pabasarasev@gmail.com

**Abstract**

The food culture of any society is a basic element that expresses the cultural identity of that society. Therefore, the types of food, oils, sweets, nutrients in food, food preservation methods and ways of preparing food, which are considered integral parts of food culture, are different and special according to the culture. Because of that, the study of the food of a country is also a study of the nature of that country's culture. Foods in general have important nutritional as well as medicinal values. This is because certain types of food which are mainly consumed as food are also used as medicine. It is especially seen in Ayurvedic medicine. Most of our main meals including *kola*, *mukunuwanna*, gram, *kohirabi*, snake gourd, ridge gourd, pork, eggs, mutton, bananas and avocados are considered as food with medicinal value in Ayurveda. Among the sourced information, the *Pansiya Panas Jathaka Potha*, which is highly valued as a literary source, reveals many facts about food, such as customs, attitudes, beliefs, methods of food preparation, quality of food and festivals. Foods with medical value are also mentioned in some places. Raw grains, pork and porridge are some of them. Therefore, the research problem here is to investigate if there is any Ayurvedic value in the information associated with the food culture of the *Jathaka Potha*. The purpose of this research is to identify how the concepts and theoretical aspects of Ayurveda related to food are represented in the *Jathaka Potha*. Under the methodology of qualitative research, library observation, editions of the *Jathaka Potha*, books on Ayurvedic medicine, research articles, newspapers, and lecture notes are collected. Accordingly, the research revealed that some Ayurvedic value prevails over the material and cultural characteristics of the food culture in the *Jathaka Potha*, which is considered as a source belonging to Banakata literature.

**Keywords:** Ayurvedic Medicine, Culture, Food, *Pansiya Panas Jathaka Potha*, Society

# අනුරාධපුර ශ්‍රී මහබෝධිය පිළිබඳ ජනශ්‍රැති අධ්‍යයනයක්; දරමිටි පොහොය ඇසුරෙන්

ආර්.එස්.එස්. සෙව්වන්දි

සිංහල අධ්‍යයන අංශය

රුහුණ විශ්වවිද්‍යාලය

මාතර

sssrathnapala97@gmail.com

**සාරසංක්ෂේපය**

ක්‍රි. පූ. 03වන සියවසේ ශ්‍රී මහබෝධියේ දක්ෂිණ ශාඛාව ලක්දිවට වැඩම කළ තැන් සිට ම එය මෙරට බැතිමතුන්ගේ වන්දනාවට පාත්‍ර විය. අනුරාධපුරයේ රෝපිත මෙම බෝධීන් වහන්සේ සත්ත්ව උවදුරුවලින් ආරක්ෂාකර ගැනීම සඳහා එකල වැසියෝ බෝධීන්වහන්සේ වටා ගිනිමැල ගසා සතුන් පලවාහැරීම සිදු කළහ. බෝධීන්වහන්සේ පිදීමට වසරක් පාසා පැමිණෙන බැතිමත්හු ගිනිමැල ගැසීම සඳහා දරමිටියක් රැගෙන ඒම පුරුද්දක් කර ගත්හ. මෙය නිකිණි පොහොය නිමිති කරගෙන විශේෂයෙන් සිදු වූ බැවින් එය *'දරමිටි පොහොය'* වශයෙන් හැඳින්වේ. *'දරමිටි පෙරහැර'* යනු එයට පර්යායය නාමයකි. වර්තමානයේ පවා ඇසළ මස වන්දනාවේ පැමිණෙන ඇතැමුන් විසින් සංකේතාත්මකව කුඩා දර මිටියක් රැගෙන පැමිණ බෝමළුවේ කෙළවරක තැන්පත්කර යන බව ජනප්‍රවාදගතව පවතී. ඒ අනුව මෙහි පර්යේෂණ පසුබිම වන්නේ ජනප්‍රවාදගත කරුණු ඒකරාශී කොට එම පුවත්වල සත්‍ය අසත්‍ය බව නිශ්චය කරමින් දරමිටි පොහොයෙහි වැදගත්කම පිළිබඳ නිගමනයකට එළඹීමයි. බෝසමිඳුන් උදෙසා වෙන් වූ දරමිටි පොහොයෙහි උපයෝගිතාව විනිශ්චය කිරීමත් එහි මූලාරම්භයේ පටන් විකාසනයෙහි පවතින ආවේණික ලක්ෂණ හා විශේෂතා උපුටා දැක්වීමත් කාලානුරූපීව සිදුවන සමාජ පරිණාමය හා තාක්ෂණික විපර්යාස හේතුවෙන් අස්පර්ශිත සාධක (ජනශ්‍රැති) රැකගැනීමත් මෙම පර්යේෂණයෙහි අරමුණ වූ අතර මෙයට තුඩුදුන් ගැටලුව වූයේ අස්පර්ශිත සාධක ඔස්සේ අනාවරණය වන දරමිටි පොහොය යන්න කුමක්දැ'යි සසාධකව තහවුරුකර ගැනීමයි. ශ්‍රී මහාබෝධිය උදෙසා වෙන් වූ දරමිටිපොහොය මූලාරම්භයේ සිට වර්තමානය දක්වා වූ කාලසීමාව තුළ එහි උපයෝගිතාව හා සමාජ සංස්කෘතික පැතිකඩ හා ලේඛනගතව පවතින තොරතුරු අධ්‍යයනය මෙහි පර්යේෂණ සීමාව වන අතර මෙහි පර්යේෂණ ක්‍රමවේදය වන්නේ ගුණාත්මක ක්‍රමවේදයයි. අදාළ ක්ෂේත්‍ර අධ්‍යයනයෙහි නියැලී සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සහ පුස්තකාල ක්‍රමවේදය ඔස්සේ දත්ත සංවිධානය කිරීම සිදු වේ. එහි දී *දරමිටිපෝය* අතීතයේ බෝධීන්වහන්සේගේ ආරක්ෂාවට දායකත්වය සැපයූ බව දත්ත විශ්ලේෂණයේ දී අනාවරණය වන අතර නූතන සමාජයේ තාක්ෂණික දියුණුව නිසා දරමිටි පොහොයෙහි වටිනාකම ගිලිහී ගොස් ඇති බව පර්යේෂණ නිගමනය ලෙස ඉදිරිපත් වේ.

**ප්‍රමුඛ පද :** අස්පර්ශිත, ගිනිමැල, ජනශ්‍රැති, දරමිටිපොහොය, ශ්‍රී මහබෝධිය

# An Ethnographic Study of the Anuradhapura Sri Maha Bodhi; In Association With *Daramiti Pohoya*

R.S.S.Sewwandi
University of Ruhuna, Matara
sssrathnapala@gmail.com

**Abstract**

Since the southern branch of Sri Maha Bodhi was donated to Srilanka in the 3rd century BC, the devotees of this country worshipped it. To protect this bodhi tree planted in Anuradhapura from animal threats, the residents of that time made bonfires around the bodhi tree and chased away animals. Devotees who come every year to offer Bodhi make it a habit to bring a stick to light the bonfire. This happened especially on the occasion of the Nikini full moon Poyaday, so it is called 'DaramitiPohoya'. 'Daramiti Perahera' is a synonym for it. Even today, it is said that some people who come on the Esala month pilgrimage symbolically bring a small bundle of firewood and place it in a corner of the Bo tree. Accordingly, the background of this research is to collect the legendary facts determine the truth and falsity of it and conclude the importance of DaramitiPohoya.The objectives of this research were to judge the utility of the DaramitiPohoya dedicated to the Bo tree to cite the inherent characteristics and specialities of evolving since its origin and to preserve the intangible factors (folklore) due to social evolution and technological changes over time. The research problem is What DaramitiPohoya is and reveals it through the intangible factors. The limitation of the research is the study of the information that is documented and its utility and socio-cultural profile in the period from the beginning of the DaramitiPohoya dedicated to Sri Maha Bodhi. This research is based on the study of the literature sources related to the qualitative data analysis method. Going to the relevant field, collecting data through questionnaire methods, interviews and library methods, organising the data by analyzing the same facts through scholarly discussions, ideologies and literature sources, and presenting the results through summary and electronic methods. It is revealed in the data analysis that Daramiti Poya contributed to the protection of Bodhi in the past and the research findings are that the value of Daramiti Poya has been lost due to the technological development of modern society.

**Keywords:** Anuradhapura, Bonfire (Ginimala), *Daramiti Pohoya*, Folklore, Intangible Factors (*Asparshitha*), Sri Maha Bodhi

# කළුතර දිස්ත්‍රික්කය තුළ පවතින අප්‍රකට ඇදහිලි විශ්වාස පිළිබඳ අධ්‍යයනයක්. (තෝරාගත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස පහක් ඇසුරිනි )

ටී. ජී. එස්. මිනෝලි
කැලණිය විශ්වවිද්‍යාලය
sumeeshaminoli89@gmail.com

**සාරසංක්ෂේපය**

ජනශ්‍රැතිය වනාහි සෑම මිනිස් ජාතියකටම උරුම වූ ඒ ඒ ජාතියට ආවේණික වූ පෞරාණික සංස්කෘතික උරුමයකි. ලක්දිව පුරා ජනශ්‍රැතිය තවමත් ජීවමාන කලාවක් ලෙස පවතින බව නොරහසකි. පෞරාණික සංස්කෘතික උරුමයන් වන ජනශ්‍රැතියේ එක් කොටසක් ලෙස ඇදහිලි විශ්වාස හැඳින්විය හැකි ය. මානවයා පරිසරය මතින් නිර්මාණය වූ පරිසරය සමග ජීවත්වන සත්වයෙකි. සමාජය බිහි වූ දා පටන් මානවයා තමන්ට අවබෝධ කරගත නොහැකි වූ තම විෂය පථයට හසු නොවන බොහෝ දේ විශ්ව ශක්තිය ලෙස ද එසේත් නැතිනම් අද්භූත දේවල් හෝ දෙවියන්, යකුන්, භූතයන්, ප්‍රේතයන්, යක්දෙස්සන්, කුම්භාණ්ඩයන් වැනි චරිත ලෙස ද සලකා විශ්වාසයන් සහ ඇදහිලි ක්‍රම සාදාගනු ලැබී ය. එම විශ්වාස ඇදහිලි නිසා මිනිසුන් ධර්මයට නැඹුරු වීම ද දක්නට ලැබේ. එසේම එම විශ්වාස ඇදහිලි මගින් තම ජීවිත සරුසාර වේය යන ආකල්පය ද දරා ඇත. විවිධ ව්‍යසනයන් හා දුක් පීඩා ආශ්‍රිතවත් ඇදහිලි විශ්වාස පවතී. වර්ෂාව, සුළි සුළං, නාය යෑම්, සුනාමි වැනි උපද්‍රවවල දී මෙන් ම ලාංකික සමාජයේ පැපොල, සරම්ප, වසූරිය තවමත් "දෙවියන්ගේ ලෙඩ" ලෙස හඳුන්වා සුව වීමට පුද පූජා බාර හාර පවැත්වේ. නිවසක් ඉදිකරන විට පවා මෙම ඇදහිලි විශ්වාස පවතියි. මෙසේ විමසන විට ජීවිතයේ විවිධ අවස්ථා මෙම ඇදහිලි විශ්වාස මත රඳා පවතී. අදටත් කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය වශයෙන් අප්‍රකටව මෙම ඇදහිලි විශ්වාස පවතී. උඩුවර ගමේ අසන්නට ලැබූ 'මහගහ' වෘක්ෂ ඇදහිල්ල සහ ' කොරොස්දූව ' ගමෙන් අසන්නට ලැබූ 'කිරිපලු රුක' වෘක්ෂ වන්දනය ඊට නිදසුන් ය. මෙලෙස පවතින ඇදහිලි විශ්වාස අප්‍රකටව පැවතීම ගැටලුවකි. එම ඇදහිලි විශ්වාස යටපත් වී පැවතීමෙන් ඒවා එම ප්‍රදේශවල සිටින පිරිසට පමණක් සීමා වීම සිදුවන්නකි. මෙම ඇදහිලි විශ්වාසයන්හි ඇති ප්‍රායෝගික බව, මනෝවිද්‍යාත්මක පදනම කෙබඳුවේ ද යන්න ද ගැටලුවකි. වැඩිදෙනෙකුගේ අවධානය යොමු නොවූ මෙවන් අප්‍රකට ඇදහිලි විශ්වාස සොයා බැලීමටත්, ඒවා අතර පවතින අවිහිංසාව, මානුෂීය බව, මනෝවිද්‍යාත්ම පසුබිම සහ ප්‍රායෝගික බව සොයා බැලීම මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ය. මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදා ගැනීමටත් මුලාශ්‍රය ලෙස ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රය යොදා ගැනීමටත් අදහස් කෙරේ. කළුතර දිස්ත්‍රික්කය තුළ පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණන 14 කි. ඒ අතරින් කළුතර, හොරණ, මතුගම, අගලවත්ත, බුලත්සිංහල, යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පහ නියැදියක් ලෙස යොදා ගැනීමටත් එම පිළිබඳව එම ඇදහිලි පවතින ගම්වල විහාරස්ථානවල විහාරාධිපතිවරුන්, කපු මහතුන් සහ ගම්වාසීන් හමු වී සිදුකරන සම්මුඛ සාකච්ඡා ක්‍රමය උපස්තම්භක කොට ගැනේ. කළුතර දිස්ත්‍රික්කයේ අප්‍රකට ඇදහිලි විශ්වාස සොයා ගැනීමට හැකි වීම නිසා එම ඇදහිලි විශ්වාස මත ගැබ් වී ඇති මනෝ විද්‍යාත්මක පදනම මානුෂීය ගුණාංග හා ප්‍රායෝගික බව මතු කිරීමට හැකි වීමත් ඇදහිලි විශ්වාස සඳහා විද්‍යාත්මක පදනමක් නැති වුව ද ඒවාට සමාජ විද්‍යාත්මක පදනමක් ඇති බව සොයා ගැනීමටත් ශ්‍රී ලාංකික සංස්කෘතියේ දායාදයක් වන ජනශ්‍රැතිය තුළ පවතින ඇදහිලි විශ්වාස පිළිබඳ වර්තමාන තත්වය විශේෂයෙන් ම අප්‍රකට ඇදහිලි විශ්වාසයන් පිළිබඳව අනාගත පරපුරට අවබෝධයක් ලබා ගැනීමට හැකියාව ලැබීමත් යන දේවල් මෙම පර්යේෂණයේ ප්‍රතිඵලය වන්නේය.

**ප්‍රමුඛ පද :** අප්‍රකට ඇදහිලි විශ්වාස, කළුතර දිස්ත්‍රික්කය, ජනශ්‍රැතිය, පුද පූජා සංස්කෘතිය,

# A Study of Local Religious Faiths and Beliefs in Kalutara District

T.G.S. Minoli
University of Kelaniya
Sumeeshaminoli89@gmail.com

**Abstract**

Ethnicity is an ancient cultural heritage inherited by every human race. It is no secret that Ethnicity is still a living art throughout *Lakdiwa*. Faiths and beliefs can be called as one part of ethnicity which is an ancient cultural heritage. Man is an animal created by the environment that lives with the environment. Since the birth of society, human beings imagined many things that were not within their subject range that they could not understand, such as supernatural things or characters such as gods, devils, demons and ghosts. Through that, various faiths and beliefs were born and religious sacrifices have been made to them. Because of those beliefs and faiths, it is also seen that people are inclined towards religion. Also, based on these faiths and beliefs, people have the attitude that their lives will be prosperous. There are also religious beliefs related to various disasters and suffering. In Sri Lankan society, smallpox, measles and smallpox are still known as "God's diseases" and sacrifices are held to cure them during disasters such as rain, cyclones, debts, and tsunamis. Even when building a house, these beliefs are maintained. When asked various situations in life depend on these faith beliefs. These beliefs still exist in the local villages of Kalutara district today. Even today, these beliefs are still locally unknown in the Kalutara district. Examples of this are the '*Mahagaha*' tree worship heard from Uduvara village and the '*KiripaluRuka*' tree worship heard from Koronduwa village. It is a problem that existing religious beliefs remain unknown. Due to the suppression of those religious beliefs, it happens that they are limited only to the people in those areas. The practical and psychological basis of these beliefs is also problematic. This research aims to investigate such faiths and beliefs that have not been paid attention to and to find out the non-violence, humanity, psychological background and practicality among them. It is intended to use qualitative research methodology for this research and to use primary and secondary sources as sources. There are 14 divisional secretariat divisions in Kalutara district. Among them, the five divisional secretarial constituencies of Kalutara, Horana, Matugama, Agalawatta, and Bulathsinhala are used as a sample and the method of interviews conducted by the temple heads and villagers in those areas is considered to be questionable. By being able to find hidden religious beliefs in Kalutara district, being able to bring out the psychological basis, human qualities and practicality embedded in those religious beliefs and being able to examine that even if the religious beliefs have no basis, they have a sociological basis are main results of this research and the other results are the facts that the future generation will be able to gain an understanding of the current state of religious beliefs in Sri Lankan culture, especially the hidden religious beliefs.

**Keywords:** Culture, Folklore, Kalutara District, Sacrifices, Unknown beliefs

# හෙළ කුල ධූරාවලිය මගින් පැරණි ආර්ථික ක්‍රමය පිරිහීමකට ලක්වීම සහ වත්මන් සමාජ, සංස්කෘතික හා ආර්ථික අපගමනයට ලක් වූ ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

බී. එම්. අංජන ඉරෝෂන් බාලසූරිය
කැලණිය විශ්වවිද්‍යාලය
anjanairoshanmedia@gmail.com

**සාරසංක්ෂේපය**

''පෙරදිග ධාන්‍යාගාරය'' යන විරුදාවලිය ලත් ලක්දිව, වර්තමානය වන විට විශ්වීය ජනයා ඉදිරියේ උපහාසයට ලක් වන ආර්ථික සමාජීය මෙන් ම සංස්කෘතික පිරිහීමකට ලක් ව ඇත. මේ පිළිබඳ ගැඹුරින් සලකා බලන කල පෙනී යන්නේ, හෙළයේ පැවති කුල ක්‍රමය මගින්, සංවෘත, ශක්තිමත්, ස්වයංපෝෂිත ආර්ථිකයක් පැවති බවත්, ඒවායෙහි සිදුවූ කාලානුරූපී ක්ෂය වීම මගින් සංස්කෘතිකමය වශයෙන් සියලු සාධක පරිවර්තනයකට ලක්වීම හේතුවෙන් ක්‍රමයෙන් පරිහානියට පත් වූ බව ය. මෙරට සිදු වූ ආක්‍රමණයන් මෙන් ම, මිත්‍රශීලී සංක්‍රමණයන් ද, හරයාත්මක ව ශක්තිමත් ලෙස පැවති කුල ක්‍රමය බිඳී යාමට හේතු වූ සාධක ලෙස ප්‍රමුඛ ව ගිණිය හැකි ය. පැරණි පුරාවිද්‍යාත්මක කැණීම් මගින් හෙළිවන විස්මිත තොරතුරු ආශ්‍රයෙන් ද ගම්‍ය වන්නේ, මෙරට පැවති වෘත්තිය පදනම් කර ගත් කුල ක්‍රමය මත ආර්ථික, සමාජීය හා සංස්කෘතික හර ගිණිය නො හැකි ලෙස අති දියුණු ව පැවති බව ය. කුල ක්‍රමය පදනම් කර ගත් නිෂ්පාදන ක්‍රියාවලිය මගින් ස්වයංපෝෂිත ආර්ථික රටාවක් ගොඩනැගීම හේතුවෙන්, ආහාරපාන පමණක් නොව, කලාව, විද්‍යාව, සංස්කෘතිය හා ශිෂ්ටාචාරවත් වූ සමාජයක් මෙරට තිබූ බව ඉතිහාසය පිරික්සීමේ දී මනාව ස්ඵුට වේ. රටක පරිපාලනයට බලපෑ හැකි සැඟව ගිය හර පද්ධතීන්ගේ ව්‍යුහාත්මක වෙනස්කම් වර්තමානයට ගලපා ගැනීමට ඇති හැකියාව පිළිබඳ වීමසීම හා ලාංකේය කුල ක්‍රමය යනු සමාජීය වශයෙන් මිනිසුන් උස් පහත් කොට සැලකීම නොව, රටේ ආර්ථිකයට හා සංස්කෘතියට ඔවුන්ගේ දායකත්වය සෘජු ව ම හේතු වූ බව ඉස්මතු කර පෙන්වීම, මෙහි අරමුණු හා පරමාර්ථ වේ. විෂය ප්‍රාමාණිකයන් සමඟ කරන සාකච්ඡා, පුරාවිද්‍යාත්මක සාධක පිරික්සීම, ග්‍රන්ථ පරිශීලනය, පුරා විද්‍යාත්මක ස්ථාන හා නටබුන් ආදිය පරීක්ෂා කිරීම මෙහි පර්යේෂණ ක්‍රමවේදයයි.

**ප්‍රමුඛ පද :** ආර්ථික, කුල ධූරාවලිය, පුරාවිද්‍යාත්මක, සංස්කෘතිය, සමාජීය

# How the Current Society, Culture and Economy have Deviated Due to the Deterioration of the Old Economic System by the *Hela* Caste Hierarchy

B M Anjana Iroshan Balasooriya
University of Kelaniya
anjanairoshanmedia@gmail.com

**Abstract**

Lakdiwa, nicknamed the "Grainhouse of the East", has undergone an economic and social as well as a cultural overflow, which is currently being ridiculed in front of the global people. When we consider this in depth, the caste system in Hela, developed, strong self-sufficient economic and social ties, gradually declined due to the transformation of all factors culturally due to the decay of time. Like the invasions that took place in this country, the friendly migrations can be considered as the main factors that led to the breakdown of the caste system which was fundamentally strong. The amazing information revealed by the ancient archaeological excavations also implies that the economic, social and cultural cores were immeasurably developed based on the profession-based caste system that existed in this country. A review of history reveals that there was not only food and drink but also art, science, culture and civilized society in this country due to the formation of a self-sufficient economic pattern through a production process based on the caste system. The aims and objectives of highlighting the ability to adjust the structural changes of the hidden value systems that can affect the administration of a country to the present and the Sri Lankan caste system is not the social status of people, but their contribution to the economy and culture of the country.

**Keywords**: Archaeological, Caste Hierarchy, Culture, Economic, Social

# කඩවත් කෝරළයේ කටුකැලියාව ග්‍රාමයේ බලි ශාන්තිකර්මය පිළිබඳ ජනශ්‍රැති අධ්‍යයනයක්

ආර්. ඩී. ඒ. ඉෂාරා තරංගනී අමරසිංහ
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
Isharatharanganinewpvt@gmail.com

**සාරසංක්ෂේපය**

ජනශ්‍රැතිය පිළිබඳ ඇති තෘප්තියත් කඩවත් කෝරළයේ පිහිටි කටුකැලියාව ග්‍රාමය මා අයත් ග්‍රාමයට ආසන්න ග්‍රාමය වීමත් මෙහි දී කටුකැලියාව ග්‍රාමයේ බලි ශාන්තිකර්මය පිළිබඳ මෙතෙක් ජනශ්‍රැති අධ්‍යයනයක් සිදු ව නොපැවතීමත් මෙම පර්යේෂණයේ යෙදීමට හේතු විය. අධ්‍යයන ක්‍රමවේදය ලෙස මුද්‍රිත පොත්පත් ගවේෂණය, සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදාගත් අතර කටුකැලියාව ග්‍රාමයේ ජනතාව අතර අදටත් බලි ශාන්ති කර්මය දක්නට ලැබේ. බුදු සමයෙන් ශික්ෂිත මෙම ජනයා යක්ෂ, ප්‍රේත ආදී අමනුෂ්‍ය බලවේග හමුවේ බාරහාර පුද පූජා පැවැත්වීමට උත්සහ දැරී ය. දෙවි දේවතා යක්ෂ ප්‍රේතාදීන් සඳහා කෙරෙන පිදවිලිවලින් ඔවුහු සෙතක් ශාන්තියක් අපේක්ෂා කළහ. කඩවත් කොරළයේ 'මල්බලි 'සහ' ඇඹුන්බලි' ලෙස බලි ශාන්තිකර්මය දෙවැදෑරුම් වේ. ග්‍රහ දෝෂ සහ තුන් දොස් සමනය කරගැනීම සඳහා මල්බලිය යොදා ගැනේ. මල්බලිය 'මල්කෙළිය' ලෙස හැඳින්වේ. මල්බලිය සඳහා පලතුරු, බුලත්, පුවක්, සුවඳ වර්ග, කැවිලි වර්ග, කිරිබත් හා හත් මාළුවක් අවශ්‍ය වේ. මෙම ශාන්තිකර්මය පවත්වන්නේ රවි, චන්ද්‍ර, කුජ, බුද, ගුරු, ශුක්‍ර, ශනි, රාහු සහ කේතු යන නවග්‍රහයන්ගෙන් සිදුවන අපල මඟ හරවා ගැනීමට ය. කටුකැලියාව ග්‍රාමයේ ඇඹුන් බලි, 'මහබලි' ලෙසින් ද හැඳින්වේ. නිවසට උතුරු දෙසින් පිහිටි තුඹසක මැටි ඇඹුන් බලිය සඳහා යොදා ගනී. කලින් නියම කර ගත් පරිදි අදාළ දිනයේ සවස් යාමයේ සිට පසුදා පහන් වනතුරු ම ආතුරයා ඉදිරිපස බෙරවයමින් ඒ අනුව පාද තබමින් කවි ගායනා කරමින් බලිඇඳුරෝ නර්තනයේ යෙදෙති. මෙම යාගය සඳහා සකසන යහන මධ්‍යයේ පුල්ලෙයාර් මුත්තා සිහිපත් කිරීමට පොල්ගෙඩියක් තැබීම සාමාන්‍ය සිරිතයි. අඹනු ලැබූ බලිය වර්ණගැන්වීම සඳහා කයිල ගෙඩි යුෂ, අත්තනකොළ යුෂ, පලු පොතු හා අට්ටික්කා පොතු, ඔළිඳ ඇට හා ගඩොල් කුඩුයොදා ගනී. ඇඹූ ග්‍රහයාට අමතර ව අනෙක් ග්‍රහයන් මූර්තිමත් වන පරිදි බලියෙහි ම අඳිනු ලැබේ. මෙම නවග්‍රහයන් සඳහා 'නවකොළ අත්ත' සකස් කරගත යුතු ය. අනතුරු ව බලිය වර්ණ ගන්වා නේත්‍රා තබයි. ආතුරයා නොඉඳුල් පැදුරට කඩතුරාවෙන් වසා රැගෙනවිත් සෙත් ශාන්තිය සිදුකරන බව ගැමියන්ගෙන් අසා දැනගන්නට ලැබුණි. සංස්කෘතික අගය විදහා දක්වන කඩවත් කෝරළයේ කටුකැලියාව ග්‍රාමයේ බලිශාන්ති කර්මය ග්‍රහ අපල දුරුකර ගැනීමේ පුද්ගල පරමාර්ථය ඉක්මවා සමාජ සුභ සිද්ධිය හා කෘෂි ජීවිතයේ විවිධ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ද පවත්වන බව මුඛපරම්පරාගත විස්තර මඟින් තහවුරු කර ගැනීමට හැකි විය.

**ප්‍රමුඛ පද :** ඇඹුන් බලි, බලි පූජා විධි රටා, බලිශාන්ති කර්මය, මල්බලිය, නවග්‍රහ බලි

# Folklore Study on *Bali Shanthikarma* in *Katukeliyawa* Village of *Kadawat Korala*

R.D.A. Ishara Tharangani Amarasinghe

Faculty of Graduate Studies

Isharatharanganinewpvt@gmail.com

**Abstract**

The researcher's interest in folklore, the fact that Katukeliyawa Village of *Kadawth Korala* where the researcher's nearby village is located, and that a folklore study has not been done on omens of Bali Shanthikarma at Katukeliyawa Village in KadawathKorala so far prompted the present researcher to this study. Bali Shanthikarma is still seen today among the people of Katukeliyawa Village. Educated by the Buddha, these people tried to perform *barahara* sacrifices in the face of inhuman forces such as demons and ghosts. They expected peace from the offerings made to the spirits of gods and demons. The offerings of flowers and incense in *Kadawth Korala* are two types of propitiatory sacrifices. As well as flower sacrifice is used to alleviate planetary defects and three doshas. Mal Baliya is also known as '*Mal Keliya*'. Fruits, betel nuts, spices, sweets, butter and seven curries are required for the flower sacrifice. Thus, this shanti karma is preformed to ward off evils caused by the Navagrahas of Ravi, Chandra, Mars, Mercury, Guru, Venus, Shani, Rahu and Kethu. Ambunbali is also known as mahabali in Katukeliyawa Village. Hubas clay is used for ambumbali. It must be located North of the house. As re-arranged, from the evening to the respective day until the morning of the next day, the Aduro beat the drums in front of them, sang poems and performed the Bali Aduro dance by placing their feet accordingly. It is a common ritual to place a coconut in the middle of the couch prepared for this yoga to commemorate the pullayara mutt. Thus, Kaila fruit juice, attana leaf juice, palu bark and attikka bark, olive seeds and brick powder are used to colour the ground rice. A part form the twisted planet, these other Navagrahas are also drawn in the sacrifice itself to be embodied. Also, new leaves should be prepared for these Navagrahas. Then the sacrifice is coloured and the eyes are in the correct place. Meeting women, I heard that the person was covered with a clear mat the perform *sethshanthi*. In comparison, it was possible to confirm through oral generations that the Bali Shantikarma of the village of Katukeliyawa, which demonstrates the culture value, exists beyond the individual objective of removing planetary evils and also meeting the various needs of the social life and agricultural life.

**Keywords:** Bali Pooja, Bali Shantikarma, Mahabali, Navagraha Pooja, Navagraha Shanti

# මාතර ප්‍රදේශයේ වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම් තුළින් පිළිබිඹුවන ලන්දේසි ගෘහ නිර්මාණ ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයක්

යූ. ජී. හිමාෂි දිලිනිකා
කැලණිය විශ්වවිද්‍යාලය
himashidilinika@gmail.com

**සාරසංක්ෂේපය**

යටත්විජිතකරණයත් සමඟ ශ්‍රී ලංකාවට බලපෑම් එල්ල කළ ප්‍රධාන ගණයේ විජාතික කණ්ඩායමක් ලෙස ලන්දේසි හෙවත් ඕලන්ද ජාතිකයන් හඳුනාගත හැකි ය. ලන්දේසි විසින් බලපවත්වන ලද සංකල්ප විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ලාංකික සංස්කෘතිය තුළ මුල්බැස ගත්තේ ය. පූර්වෝක්ත බලපෑම ලාංකේය ගෘහ නිර්මාණ කලාව තුළින් පිළිබිඹු කරන්නේ කෙසේ ද යන්න හඳුනා ගැනීම මෙහි දී අපේක්ෂා කෙරේ. ඒ අනුව මෙහි දී ලන්දේසි ජාතිකයන් විසින් ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශවල ලන්දේසි බලය ව්‍යාප්ත කරන ආකාරය මෙන් ම ලන්දේසි ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදාය ස්වදේශීය ඉදිකිරීම් කෙරෙහි බලපෑ ස්වභාවය ද අධ්‍යයනය කිරීමට අපේක්ෂිත ය. ඒ සඳහා මාතර ප්‍රදේශයේ ලන්දේසි ගෘහ නිර්මාණ කලාව හා ඉදිකිරීම් යොදා ගැනෙන අතර මෙම පර්යේෂණය සඳහා පර්යේෂණ ගැටලුව වන්නේ මාතර ප්‍රදේශයේ ඉදිකිරීම් තුළින් නිර්මාණය වූ ලන්දේසි ගෘහ නිර්මාණ ශිල්පයේ විශේෂතා කෙබඳු ද යන්න විමසා බැලීමයි. මෙම අධ්‍යයනය සඳහා දත්ත රැස්කිරීමට ක්ෂේත්‍ර අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා ආදිය ප්‍රාථමික මූලාශ්‍රය ලෙසත්, පුස්තකාල පරිශීලනය සහ ග්‍රන්ථ අධ්‍යයනය ද්විතීක මූලාශ්‍රය ලෙසත්, තෘතීයික මූලාශ්‍රය වශයෙන් සඟරා, පුවත්පත් හා දේශන සටහන් සහිත ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදාගනු ලැබේ. මේ අනුව ලන්දේසි ගෘහ නිර්මාණ කලාවේ ආභාසය මාතර නගරයේ ඉදිකිරීම් තුළින් හඳුනාගත හැකි ආකාරයත්, එම ගෘහ නිර්මාණ කලාවේ බලපෑම මාතර සෙසු නිර්මාණ සඳහා ද බලපෑම් එල්ල කර තිබෙන්නේ කෙබඳු ආකාරයට ද යන්න අධ්‍යයනය කරමින් ලන්දේසි බලපෑම් මාතර ප්‍රදේශයේ වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම් තුළින් පිළිබිඹු වන ආකාරයත් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදුකිරීමට අපේක්ෂා කෙරේ. එවිට ශ්‍රී ලාංකේය ශිල්ප කලාවට බටහිර ගෘහ නිර්මාණ සම්ප්‍රදායේ ආභාසය ලැබුණු ආකාරය පිළිබඳ ව සසාධක ව කරුණු තහවුරුකර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

**ප්‍රමුඛ පද :** ඉදිකිරීම්, කලා සම්ප්‍රදාය, ගෘහ නිර්මාණ, මාතර, ලන්දේසි

**NCSS-003-33**

# A Study of Dutch Architectural Features Reflected in the Architectural Constructions in the Matara Area

U.G. Himashi Dilinika
University of Kelaniya
hemashidilinika@gmail.com

**Abstract**

The Dutch or Hollanders can be identified as the main foreign group that influenced Sri Lanka with colonization. The concepts helped by the Dutch went through in Sri Lankan culture in various fields. Here, it is expected to identify how the preceding influence is reflected in the art of Sri Lankan architecture in Matara. Accordingly, it is expected to study how the Dutch spread their power in the coastal areas of Sri Lanka. As well as the way of the influence of the Dutch architectural tradition on local construction. For that, Dutch architecture and constructions have been used problem for this research is to examine what are the special features of the Dutch architecture created through the constructions in the Matara area. In this research have been used field visits, and interviews as primary sources, library references and book studies as secondary sources and journals, newspapers, and lecture notes as tertiary sources to collect data. Thus, by studying how the influence of Dutch architectural art can be identified through the construction of Matara city and how the influence of that architectural art has affected other creations in Matara. It is reflected in the architectural constructions of the Matara area. Then it will be possible how Sri Lankan architecture was inspired by the western architectural tradition.

**Keywords:** Architecture, Art Tradition, Construction, Dutch, Matara

# සිංහල සංස්කෘතිය සම්ප්‍රේෂණයෙහි ලා නූතන ළමා ප්‍රකාශනවල බලපෑම (තෝරාගත් කෘති දහයකට විශේෂිත ව)

හංසනී නුවන්මිණි ජයවික්‍රම, ඩබ්.මහේෂා පියුමාලි
ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
contact.jayawickrama@gmail.commaheshapiyumali97@gmail.com

**සාරසංක්ෂේපය**

සංස්කෘතිකාංග පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය කරන ප්‍රශස්ත ම ක්‍රියාමාර්ගයක් ලෙස ළමා කෘති දැක්විය හැකි ය. සංස්කෘතියක පැවැත්ම රඳා පවතින ප්‍රධාන සාධකය වන්නේ ළමා පරපුරයි. ඒ අනුව මෙරට ළමා කෘති රචකයන් සංස්කෘතික සම්ප්‍රේෂණය සඳහා සිය කෘති කවරාකාරයෙන් භාවිත කර ඇත්දැයි අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. මෙරට රචනා කෙරෙන ළමා කෘතිවලින් සිංහල සංස්කෘතිය ළමා පරපුරට සම්ප්‍රේෂණය කිරීමෙහි ලා සිදුකෙරෙන බලපෑම කෙබඳු ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුවයි. මේ සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදාගන්නා ලදි. ප්‍රාථමික දත්ත ලෙස මහනුවර කුණ්ඩසාලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වයස අවුරුදු 6-10ත් අතර දරුවන් 10 දෙනෙකු අහඹු නියැදිය යටතේ සම්මුඛ පරීක්ෂණයට බඳුන් කරන ලදි. තෝරාගත් ළමා කෘති දහයක් ද්විතීයික දත්ත ලෙස යොදා ගනිමින් අන්තර්ගත විශ්ලේෂණයට බඳුන් කරන ලදි. මෙම දත්ත මගින් ළමා කෘති සඳහා යොදා ගෙන ඇති පසුතල, චරිත, පින්තූර, චිත්‍ර හා වර්ණ ආදියෙහි ගුණාත්මකභාවය දෙස අවධානය අඩු වශයෙන් ලබා දී ඇති බව නිගමනය විය. ගෝලීයකරණය වැනි සංකල්ප මත මෙරටට පැමිණෙන විදේශීය සංස්කෘතීන් කෙරෙහි වැඩි අවධානයක් මිස සිංහල සංස්කෘතිය සම්ප්‍රේෂණය කෙරෙහි වර්තමාන රචකයන් අවධානය ලබා දී නොමැති බව ද නිගමනය විය. දරුවන් වර්ණවත් චිත්‍ර හෝ ඡායාරූප හෝ වැඩි වශයෙන් පළ කළ කෘති පරිශීලනය කිරීමට දක්වන්නේ වැඩි ප්‍රවණතාවක් බව ද නිගමනය විය. කිසිදු නිර්මාණකරුවකුගේ නිර්මාණාත්මක ශක්‍යතාවට සීමා පැනවිය නො හැකි නමුත් ජන කොට්ඨාසයක සංස්කෘතියේ පැවැත්ම තීරණය කිරීමට එරට බාල පරපුර වැදගත් වේ. එහෙයින් ළමා කෘති කෙරෙහි නිවැරදි නියාමනයක් සිදුනොවීම ළමා කෘතිවල ගුණාත්මකභාවය කෙරෙහි බලපා ඇති බව තහවුරු විය. එම නිසා ළමා ප්‍රකාශන නිර්මාණකරුවන් දැනුම්වත් කිරීමටත්, ජාතික මට්ටමේ හෝ මැදිහත්වීමක් ලබා දීමත්, අදාළ නිර්දේශ මාලාවක් පැනවීමත් මඟින් සිංහල සාහිත්‍ය පෝෂණය කිරීමටත් සංස්කෘතිය සම්ප්‍රේෂණය උදෙසාත් ළමා කෘති භාවිත කළ හැකි බවට හඳුනාගත හැකි විය.

**ප්‍රමුඛ පදඃ** නූතන බලපෑම, සංස්කෘතික සම්ප්‍රේෂණය, සිංහල සංස්කෘතිය, ළමා ප්‍රකාශන

# The Influence of Modern Children's Publications in the Transmission of Sinhala Culture (Based on Ten Selected Books)

HansaniNuwanmini Jayawickrama, W.MaheshaPiyumali
Department of Mass Communication, University of Kelaniya
contact.jayawickrama@gmail.com, maheshapiyumali97@gmail.com

**Abstract**

The transmission of cultural elements from generation to generation plays a pivotal role in the preservation of a society's identity and heritage. In Sri Lanka, the importance of instilling Sinhala culture in children is paramount, as they represent the future torchbearers of this rich heritage. This research seeks to explore how authors of children's literature in Sri Lanka utilize their works as a medium for cultural transmission. The central question addressed in this study pertains to the impact of children's literature on transmitting Sinhala culture to young readers. Qualitative research methodology was employed to investigate this issue. Primary data was collected through interviews with ten randomly selected children, aged 6-10, from the Kandy Kundsalaya Divisional Secretariat. Additionally, content analysis was conducted on ten selected children's books using secondary data sources. The findings of this research suggest that children's literature in Sri Lanka may benefit from greater attention to the quality of backgrounds, characters, illustrations, and colour schemes. Furthermore, it is evident that contemporary writers have not prioritized the transmission of Sinhala culture but have learned more towards embracing foreign cultures, often driven by the forces of globalization. Notably, children exhibit a proclivity towards colourful visuals and readily available publications. While there are no limits to the creative potential of designers, the younger generation's receptiveness to cultural elements is pivotal in determining the enduring essence of a society's culture. Therefore, it is crucial to acknowledge that the absence of proper regulations on children's literature has had repercussions on the quality of such works. Considering these findings, it becomes imperative to recognize the potential of children's literature in nurturing Sinhala literature and preserving and transmitting cultural heritage. This necessitates engaging creators of children's publications, implementing interventions at a national level, and endorsing a series of pertinent recommendations to safeguard the cultural legacy of Sri Lanka.

**Keywords:** Children's Expressions, Cultural Transmission, Modern Influence, Sinhala Culture

# මොනරාගල දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික ජීවන රටාව පදනම් කරගත් සාම්ප්‍රදායික ආහාර සංස්කෘතිය

එල්. ඒ. එස්. ප්‍රියදර්ශනි
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
sliyanarachchi74@gmail.com

**සාරසංක්ෂේපය**

ලංකාවේ පළාත් නවය අතරින් විශාල භූමි ප්‍රදේශයකින් හා සැලකිය යුතු වන ඝනත්වයකින් ද විෂම වූ දේශගුණික රටාවකින් ද හෙබි පළාතක් ලෙස ඌව පළාත හැඳින්විය හැකි ය. මේ පළාතට අයත් බදුල්ල හා මොනරාගල යන දිස්ත්‍රික්ක දෙකෙන් බදුල්ල ශීත දේශගුණයකින් ද මොනරාගල උෂ්ණ දේශගුණයකින් ද සමන්විත ය. වසරේ වැඩි කාලයක් වියළි කාලගුණයක් පවතින සාම්ප්‍රදායික හේන් හා කුඹුරු ගොවිතැන ජීවන වෘත්තීය කරගත් මොනරාගල දිස්ත්‍රික්කයේ ගැමියන්ගේ ආහාර සංස්කෘතිය සකස් වී ඇත්තේ තත් කෘෂිකාර්මික ජීවන රටාව පදනම් කොටගෙන ය. ගොවිතැන් කටයුතු ආරම්භයේ සිට අවසන් වනතෙක් ම සියලු කටයුතු සාමූහික ව අත්තම් ක්‍රමයට සිදු කළ මොනරාගල පැරැන්නන් තත් අවස්ථාවලට සමගාමී ව ආහාර පිළියෙල කිරීම මෙන් ම අනුභව කිරීම කළේත් සාමූහික ව ම ය. වියළි කාලගුණික තත්වයන් යටතේ කෘෂිකාර්මික කටයුතුවලට ඔරොත්තු දිය හැකි ආකාරයේ ආහාර සංස්කෘතියක් මෙම පළාතේ ගොඩනැගී තිබෙනු නිරීක්ෂණය කළ හැකි ය. මේ පර්යේෂණය සිදුකිරීමේ මූලික අරමුණ වන්නේ වර්තමානයේ වියැකී යමින් පවතින මේ ආහාර සංස්කෘතියට අයත් ආහාර වර්ග, ඒවා සම්පාදනය කිරීමේ ක්‍රමෝපායයන් සහ කල්තබා ගැනීමට අනුගමනය කෙරුණු තාක්ෂණික ක්‍රම පිළිබඳ ව අධ්‍යයනය කිරීම ය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුව සිදු කළ මේ පර්යේෂණය සඳහා දත්ත රැස්කෙරුණේ ඒ සම්බන්ධයෙන් රචිත ලිපි ලේඛන, සාම්ප්‍රදායික ගැමියන් සමග සිදුකෙරුණු සම්මුඛ සාකච්ඡා සහ සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමවේද අනුගමනයෙනි. 'මා වී, හැංගිමුත්තං' වැනි සාම්ප්‍රදායික වීවලින් සකසා ගැනුණු බත් වර්ග, හේන්වලින් නෙළාගත් කුරක්කන්, මෙනේරි, තල, රටකජු, බඩඉරිඟු ආදී ධාන්‍ය, විවිධ අල වර්ග හා වම්බටු, බටු, වට්ටක්කා, පුහුල්, මෑ, මුං, කවුපි, අසමෝදගම් ආදී බොහෝ කටුසර භෝග වර්ග මොනරාගල වැසියන්ගේ ප්‍රධාන ආහාර අතරට අයත්වන බවත් ඒවා තැම්බීම, පිළිස්සීම, වැඩි හා අඩු ගින්දරෙහි පිසීම සහ නොපිස ආහාරයට ගැනීම සිදු කළ බවත් පැහැදිලි වේ. එසේ ම බඩඉරිඟු කොළපුවලින් 'බාන් ගැට ගසා' දුමට උඩින් එල්ලා තැබීමෙන් හා අව්වේ දමා වියළීමෙන් කල් තබා ගැනීමත් අතිරික්ත ව නෙළා ගන්නා තක්කාලි, බණ්ඩක්කා, වම්බටු, මිරිස් ආදිය ද විවිධ ක්‍රම මගින් කල් තබා ගැනීම සිදුකර ඇති බවත් මූලික ව මේ පර්යේෂණය ආශ්‍රයෙන් නිරීක්ෂණය කළ හැකි විය. වර්තමානයේ පවතින ජනප්‍රිය ආහාර රටාව මගින් මේ ප්‍රදේශයේ සාම්ප්‍රදායික ආහාර රටාව කෙරෙහි දැඩි අභියෝගයක් එල්ල වෙමින් පවතින බවත් මේ පර්යේෂණයේ ප්‍රතිඵලවලින් වැඩිදුරටත් නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පදඃ** ආහාර තාක්‍ෂණය, ජනප්‍රිය ආහාර, මොනරාගල සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය, සාම්ප්‍රදායික ආහාර

# Traditional Food Culture Based on Agricultural Lifestyle in Monaragala District

L.A.S. Priyadarshani
Sinhala Department University of Kelaniya
sliyanarachchi74@gmail.com

## Abstract

Among the nine provinces of Sri Lanka, the Uva province can be considered as one of the largest provinces which is rich in a variety of thick forests and exceptional climate. The Uva province is divided into two districts as Badulla and Monaragala. Among the two districts, the Badulla district bears refreshing weather whereas Monaragala district is warmer compared to Badulla. Monaragala district has had warm weather for a considerable period of a year. People who are living here have their style of traditional farming systems and their food facilities have also been greatly influenced by the culture. They have a wonderful system of farming which is based on sharing each other's work from the very beginning till the end and that also includes preparing food and consuming it. The food system of these people is made up of all the necessities that can bear warm weather as well as the agricultural system. Hence, the main objective of this research is to investigate such rare food preparation systems which are disappearing at present and the tactics that they use to keep food without spoiling for longer periods. This research has been built based on self-observation with the participant research system, having done several significant discussions with those people. Apart from that, articles and journals written by various researchers. I was fortunate to experience all of them practically, having practically involved in their day today activities. According to the observation, the harvest that they get from one season should be enough till the next season and that is the biggest gain that they get from a sustainable farming system. Whatever harvest they get from farming is not an easy task due to the danger of various kinds of animal and natural disasters. For such cases, they have a traditional system of keeping them in a store which has long been their practice. These people know the way to keep things longer and protect way by using different types of agricultural materials mixed with ashes, neem leaves etc. The remaining such as tomatoes, lady fingers, brinjal and chillie and so forth kept well protected store in a systematic way. One of the responsibilities of a village housewife is to use those things in a way that will be able to use for the householder and family, nothing should be wasted away. However, as a result of this research, it is understood that such traditional authentic systems have been challenged by the modern fast-growing cuisine styles. It was a visible narration even in the far away villages that their healthy diet system had been replaced by quick yet unhealthy nutrients. The specific characteristic of Monaragala district people is that they have a culturally based and traditional food system that some of the other areas in Sri Lanka could not be found. Therefore, the main idea of this research is to do a proper investigation together with its necessary primary and secondary sources.

**Keywords:** Authentic Food, Monaragala Traditional Agriculture, Popular Food, Science Behind Cuisine

# ආහාර සැකසීමේ දී හා ආහාර පරිභෝජනයේ දී සිංහල ගැමි සමාජය විසින් උපයෝගී කොටගත් පැරණි උපකරණ හා මෙවලම් (ගල්ගමුව කොට්ඨාසයේ සාම්ප්‍රදායික ගම්මාන ඇසුරින්)

ආචාර්ය ඩබ්ලිව්. එම්. මධුවාසල
උපදේශක - කලණ මිතුරු ඒකකය - කැලණිය විශ්වවිද්‍යාලය
maduembogama@gmail.com

**සාරසංක්ෂේපය**

පැරණි සමාජයේ භාවිත කළ මෙවලම් හා උපකරණ නිර්මාණය කර ගැනීමේ දී ප්‍රමුඛත්වය හිමි වූයේ ආහාර පිස ගැනීමේ කාර්යය හා පරිභෝජන කාර්යය සඳහා ය. උපකරණ අවශ්‍යතාව ඉතා සරල ව ඉටුකර ගැනීමට පැරැන්නෝ පුරුදු වූ අතර ප්‍රාථමික අමුද්‍රව්‍ය යොදා ගනිමින් නිෂ්පාදනය කරගන්නා ලද උපකරණ හා මෙවලම් හැකිතාක් දුරට ප්‍රයෝජනයට ගැනිණි. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ආහාර සැකසීමේ දී හා ආහාර පරිභෝජනයේ දී සිංහල ගැමි සමාජය විසින් උපයෝගි කොටගත් උපකරණ හා මෙවලම් මොනවා ද යන්න පිළිබඳ ව විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීමයි. මෙය මූලික වශයෙන් කෘත්‍යාත්මක ක්‍රමය පදනම් කරගත් පර්යේෂණයක් වන අතර එය ආනුභවික දත්ත හා ද්විතීය මූලාශ්‍රය පදනම් වී පවතී. ප්‍රාථමික දත්ත, සම්මුඛ සාකච්ඡා මඟින් පැරණි ගම්වල වෙසෙන වයස අවුරුදු 70 ඉක්ම වූ වැඩිහිටියන්ගෙන් තොරතුරු ලබාගෙන ඇති අතර ද්විතියික මූලාශ්‍රය, පොත්පත් හා පර්යේෂණ ලිපි පර්යේෂණයේ අරමුණට අනුකූල ව භාවිතයට ගන්නා ලදි. පාරිසරික හා සමාජ ශික්ෂණයකින් යුක්ත ව ගම්මානවල පවතින සම්ප්‍රදායයන්ට අනුගත ව එක් පරම්පරාවක් විසින් තවත් පරම්පරාවකට ලබාදෙන දැනුම් පද්ධති පිළිබඳ ගවේෂණයක් මෙහි දී සිදු ව ඇත. පැරැන්නෝ සරල උපකරණ හා මෙවලම් භාවිතයට ගනිමින් පරිසර හිතකාමී ලෙස ජීවන අවශ්‍යතා ඉටුකර ගත්හ. ආහාර පාන සකසා ගැනීමේ දී හා පරිභෝජනයේ දී එහි ඖෂධීය හා පෝෂණ ගුණය නොනැසෙන අයුරින් පිළියෙල කර ගැනීමට මෙම මෙවලම් හා උපකරණ දායක කොට ගත්හ. සාම්ප්‍රදායික ගම්මානවල පරිසර පද්ධතිය නොවෙනස් ව තිබෙන තුරු හුරුපුරුදු ජීවන ක්‍රියාවලීන් නොවෙනස් ව පවතින බව හඳුනාගත හැකි ය. සංස්කෘතික විපර්යාසයකින් තොර ව පවත්වාගෙන ආ මෙම ජීවන සම්ප්‍රදාය පසුකාලීන ව සිදු වූ දේශපාලනික හා සමාජයීය විපර්යාස සමඟ ප්‍රබල සංස්කෘතික කම්පනයකට ලක් ව ඇත. දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් සකසා ගත් මෙම උපකරණ හා මෙවලම් නිෂ්පාදනය නැවත නඟා සිටුවීමට දිරිමත් කිරීම හා භාවිතයට හුරු කිරීම මෙරට ආර්ථික, සමාජයීය හා සෞඛ්‍යමය ගැටලු සඳහා විසඳුම් වශයෙන් යොදා ගත හැකි සරල ක්‍රමෝපායන් ලෙස වැදගත් වේ. විශේෂයෙන් මෙ මඟින් ප්ලාස්ටික්, ඇලුමිනියම් හා පොලිතීන් වැනි නොදිරන භාණ්ඩ භාවිතයෙන් හා පරිහරණයෙන් සිදුවන පාරිසරික, සෞඛ්‍ය මෙන් ම ආර්ථික ගැටලුවලට විසඳුම් වේ. ස්වාභාවික සම්පත් හා සාම්ප්‍රදායික දැනුම් ක්‍රමෝපායයන් ජාතික අවශ්‍යතාවක් ලෙස හඳුනාගෙන භාවිතයට ගැනීමත් සංවර්ධන හා සෞඛ්‍යමය අවශ්‍යතා ලෙස සංස්කෘතික පෞරුෂයකින් යුත් ස්වීය සෞඛ්‍යාරක්ෂිත සංවර්ධන ලක්ෂණ යළි යාවත්කාලීන කිරීමත් ජාතික අවශ්‍යතාවක් බවට යෝජනා කරන අතර එමඟින් සෑම ගෘහ ඒකකයක ම තිරසර මානව සංවර්ධනයකට පදනම ස්ථාපිත කළ හැකි වනු ඇත.

**ප්‍රමුඛ පදඃ** ආහාර, පාරම්පරික ඥානය, පැරණි උපකරණ, මෙවලම්

# Old Equipment and Tools Used by the Sinhala Village Society in Food Preparation and Food Consumption

## (Based on the Traditional Villages of *Galgamuwa* Division)

Dr. W.M. Madu Wasala
Counselor - Kalana Mithuru Unit - University of Kelaniya
maduembogama@gmail.com

**Abstract**

In the creation of tools and equipment used in ancient society, priority was given to the work of cooking and consumption. The ancients used to fulfill the need very simply and the equipment and tools produced using primary raw materials were used as much as possible. The purpose of this study is to investigate the equipment and tools used by the Sinhala village society in food preparation and food consumption. This is research based on empirical methods and it is based on empirical data and secondary sources. Primary data, information was obtained from the elderly living in old villages through interviews and secondary sources, books and research articles were used following the purpose of the research. An exploration of the knowledge systems given by one generation to another generation following the traditions of the villages with environmental and social education has been done here. The ancients used simple equipment and tools to meet the needs of life in an environmentally friendly way. These tools and equipment contributed to the preparation and consumption of food and beverages in such a way that their medicinal and nutritional properties are not lost. As long as the ecosystem in traditional villages remains intact, it can be recognized that traditional life processes remain intact. This tradition of life, which was maintained without cultural change, has been subjected to a strong cultural shock with the political and social changes that have taken place later. Encouraging the re-establishment of the production of these instruments and tools made using local raw materials and getting used to them are important as simple strategies that can be used as solutions to the economic, social and health problems of this country. This will solve the environmental, health and economic problems caused by the use and consumption of non-biodegradable products such as plastic, aluminium and polythene. It is suggested that natural resources and traditional knowledge strategies are identified and used as a national need and that self-health development features with cultural identity as development and health needs are updated as a national need and thus the foundation for sustainable human development can be established in every household unit.

**Keywords:** Food, Old Equipment, Tools**,** Traditional Knowledge

# ශ්‍රී ලංකාවේ කින්නර ජනයාගේ අස්පර්ශිත උරුමය පිළිබඳ ව අධ්‍යයනයක්

එම්. එම්. සිහින සඳරුවන්,[1] එම්. එච්. එච්. හිල්මියා,[2]

භාෂා අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

sihinasandaruwan2000@gmail.com, hairulhilmiya02@gmail.com

**සාරසංක්ෂේපය**

ව්‍යවහාරික, ප්‍රාසාංගික හා ලේඛනගත කලාවන් ද පාරම්පරික දේශීය දැනුම් සම්භාරය පොදුවේ අස්පර්ශිත උරුමය ලෙස ගත හැකි ය. ඒකී අස්පර්ශිත උරුමයෙන් පෝෂණය වූ ජන කණ්ඩායමක් ලෙස ශ්‍රී ලංකාවේ ජීවත්වන කින්නර ජනයා පෙන්වා දිය හැකි ය. ලංකාවේ කින්නර ජනයා බොහෝවිට බාහිර සමාජයෙන් ඈත්වූ පිරිසක් ලෙසින් හඳුනා ගැනේ. එවැනි කණ්ඩායමක් වූ කින්නර ජනයාගේ අස්පර්ශිත උරුමය පිළිබඳ ව අධ්‍යයනය කොට එහි විවිධතා හඳුනාගෙන ඒවා ලේඛනගත කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. කින්නර ජනතාවගේ අස්පර්ශිත උරුමයේ විවිධතා කවරේ ද? ඒ හා බැඳුණු ජන ජීවිතය කෙබඳු ද? යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ගැටලුව විය. මෙම පර්යේෂණයේ ප්‍රස්තුත පර්යේෂණ ක්‍රමය වශයෙන් ගුණාත්මක දත්ත රැස් කිරීමේ පර්යේෂණ ක්‍රමවේදය යටතේ ද්විතියික මූලාශ්‍රය අධ්‍යයනය කරමින් මෙම පර්යේෂණය සිදුකරන ලදී. එහි දී ද්විතියික මූලාශ්‍රය යටතේ පොත්පත්, පුවත්පත්, සඟරා සහ අන්තර්ජාල සඟරා ආදිය මෙන් ම පුස්තකාලය ආදිය පරිහරණය කරන ලදි. මෙලෙසින් කින්නර ජනතාව අධ්‍යයනය කොට ලාංකේය කින්නර ජනතාවට ආවේණික වූ අස්පර්ශිත උරුමයේ විවිධතා පිළිබඳ ව කරුණු අනාවරණය කර ගැනීමට හැකි විය. විශේෂයෙන් කින්නර ජනතාවට ඔවුන්ගේ අද්විතීය වූ ජීවන රටාව සංස්කෘතිය සහ සම්ප්‍රදාය තුළ ගැඹුරින් ම මුල්බැසගත් පොහොසත් අස්පර්ශිත උරුමයන් තිබේ. එම සංස්කෘතියට අයත් වාචික සම්ප්‍රදාය සහ ජනප්‍රවාද, ප්‍රවේණිගත ව පැවත එන ව්‍යවහාර භාෂාව, බෙරවාදනය සහ ගායනය, සාම්ප්‍රදායික දඩයම් ක්‍රම, වැඩිවිය පැමිණීමේ උත්සව, ඇදහිලි හා විශ්වාස, උණ බම්බු සහ තල් කොළ ශිල්පය, ප්‍රජාබැඳීම් (ඥාතීත්වය), ඉවුම් පිහුම් ක්‍රම, තහංචි මෙහි දී අධ්‍යයනය කරන්නට හැකි විය. මෙම අධ්‍යයනයෙන් කින්නර ජනයාගේ අස්පර්ශිත උරුමයේ සංකීර්ණත්වය සහ පොහොසත්කම නිරූපණය කරනු ලැබේ. මෙම අස්පර්ශිත උරුමයන් අනෙකුත් ජන සමාජවලින් වෙනස් වූවක් වේ. කින්නර ජනයාගේ අස්පර්ශිත උරුමයන් රැක ගැනීම ඔවුන්ගේ සංස්කෘතික අනන්‍යතාව සහ ඔවුන්ගේ සාම්ප්‍රදායික ජීවන රටාවේ තිරසර භාවය පවත්වා ගැනීම සඳහා ඉතා වැදගත් වේ. වර්තමානයේ කින්නර ජනතාවගෙන් මෙම උරුමය වියැකී යන තත්ත්වයක් දක්නට ලැබේ.

**ප්‍රමුඛ පද :** අධ්‍යයනය, අස්පර්ශිත උරුමය, කින්නර ජනතාව, ජන ජීවිතය, ශ්‍රී ලංකාව

# A Study of the Intangible Heritage of the Kinnara People of Sri Lanka

M.M. Sihina Sandaruwan,[1] M. H. H. Hilmiya,[2]
Department of Language Studies, Faculty of Sociology and Humanities, Rajarata University of Sri Lanka.
sihinasandaruwan2000@gmail.com"hairulhilmiya02@gmail.com

**Abstract**

Applied, performing and documentary arts can also be considered traditional indigenous knowledge as intangible heritage in general. The Kinnar people living in Sri Lanka can be identified as a group of people who are nourished by that intangible heritage. The Kinnara people of Sri Lanka are often identified as a group that is alienated from the outside society. The purpose of this research was to study the intangible heritage of such a group, the Kinnar people, identify its diversity and document it. What are the varieties of the intangible of the Kinnara people? What is the people's life connected with that? The problem of this research was to study This research was conducted by studying the secondary source under the qualitative data collection research method as the proposed research method of this research. Under the secondary source, books, newspapers, magazines and internet magazines as well as libraries, etc. are used. In this way, it was possible to uncover the facts about the diversity of the intangible heritage of the Kinnar people. The Kinnar people in particular have a rich intangible heritage deeply rooted in their unique lifestyle, culture and traditions. Oral traditions and legends belonging to that culture, inherited colloquial language, drumming and singing, traditional hunting methods, coming of age ceremonies, faiths and beliefs, bamboo and palm leaf crafts, community ties, and cooking methods, Tahanchi can be studied here. it was. This study illustrates the complexity and richness of the intangible heritage of the Kinnara people. These intangible heritages are different from other societies. Preserving the intangible heritage of the Kinnar people is very important to maintain the sustainability of their traditional way of life. Nowadays, there is a situation where this heritage is disappearing from the Kinnara people.

**Keywords:** Intangible Heritage, Kinnara People, People's Life, Sri Lanka, Study

# දඩයම් ක්‍රම හා බැඳුණු ජනශ්‍රැති පිළිබඳ අධ්‍යයනයක්

පූජ්‍ය දෝතළුඔය නාරද හිමි
සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය - ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
dothaluoyanarada2000@gmail.com

**සාරසංක්ෂේපය**

ජනයාගේ ශ්‍රැතිය ජනශ්‍රැතියයි. ඒ අනුව ජනතාව වෙතින් කටවහරෙන් පවත්වාගෙන එමින් ප්‍රවේණියෙන් ප්‍රවේණියට දායාද කර ඇති ඥානය ජනශ්‍රැතිය ලෙස අර්ථ දැක්විය හැකි ය. මෙම ජනශ්‍රැතිවල විවිධ ප්‍රභේද දක්නට ලැබේ. මෙම පර්යේෂණයේ අරමුණ දඩයම්ක්‍රම හා බැඳුණු ජනශ්‍රැතිය පිළිබඳ අධ්‍යයනය කිරීමයි. ඒ සඳහා පර්යේෂණ ගැටලුව වූයේ දඩයම් ක්‍රම හා බැඳුණු ජනශ්‍රැති කෙබඳු ද? එහි විවිධතා මොනවා ද? යන්න පැහැදිලි කර ගැනීමයි. මෙම පර්යේෂණය සාර්ථක කර ගැනීම සඳහා ග්‍රන්ථ පරිශීලනය පර්යේෂණ ක්‍රමවේදය ලෙස භාවිත කරන ලදි. ඈත අතීතයේ සිට ම මිනිසා විසින් තම ආහාර අවශ්‍යතා සපුරාලීම පිණිස සත්ත්වයන් දඩයම් කළ බවට සාධක තිබේ. මිනිසා විසින් කල් යත් ම විවිධ වූ සිද්ධි හා අරමුණු පදනම් ව මේ හා සම්බන්ධ ව ජනශ්‍රැති ගොඩනගාගෙන ඇත. දඩයම් ක්‍රම හා නිර්මාණය වී ඇති කවි, ප්‍රස්තාව පිරුළු, ඉඟිවැකි, ජනකතා, තේරවිලි ආදිය මේ පිළිබඳ ව ඇති ජනශ්‍රැති සේ හඳුනා ගත හැකි ය. උදාහරණයක් ලෙස ප්‍රස්තාව පිරුළක් මෙසේ ය. *"ඇමක් දී මසෙකු අල්ලා ගත්තා වාගෙයි"* ඇම යනු මසුන් ඇල්ලීම පිණිස බිලී කොකුවට අමුණන කෑමකි. මෙය ජන සමාජයේ භාවිතයට ගෙන ඇත්තේ කෙනෙකු උපක්‍රමශීලී ව රැවටීම පෙන්වා දීමට ය. මෙලෙස විවිධ අදහස් ප්‍රකාශ කිරීමට මෙම ජනශ්‍රැති භාවිතයට ගෙන ඇත. යථෝක්ත අධ්‍යයනයේ දී ගම්‍ය වන්නේ දඩයම හා බැඳුණු ජනශ්‍රැති ඇති බවත් එහි විවිධතා දක්නට ඇති බවත් ය. මේවා කවදා කොතනක ආරම්භ වී දැයි නිශ්චිත ව ම කිව නොහැකි වුව ද ජනශ්‍රැතියේ පැවත එන බව සඳහන් කළ යුතු ය.

**ප්‍රමුඛ පදඃ** ගීත, ජනකවි, ජනශ්‍රැතිය, දඩයම් ක්‍රම, ප්‍රස්තාව පිරුළු

# A Study on Folklore Associated with Hunting Techniques

Ven. Dothaluoya Narada Thero
Department of Social Sciences and Comparative Studies
Bhikshu University of Sri Lanka
dothaluoyanarada2000@gmail.com

**Abstract**

Folklore is the wisdom that people pass down from one generation to the next. These folklorists appear to have been established to represent diverse regions. Studying the customs related to hunting techniques was the aim of this research. The following were the research questions: Is a folk tradition that relates to hunting methods? And what versions exist for it? To ensure the success of this study, the literature analysis approach was applied as the research methodology. It was feasible to investigate the hunting customs and traditions that had developed utilizing this research technique. There is proof that humans have been hunting animals for food since the beginning of time. It appears that human beings have produced a folk tradition dependent on many occasions and goals. The folklore surrounding this can be categorized as poems, metaphors, analogies, clues, folktales, and interpretations created using hunting techniques. One can use a metaphor as an illustration. The phrase "*Amakdee maseku allagaththa vage*" A food item called bait is used with a fishing rod to lure fish. Folklore has long used this phrase to refer to deceiving someone. As a result, this folk custom has been used to symbolize many distinct ideas. According to the study mentioned above, there is a folk tradition surrounding hunting that has a wide variety of variations. Although it is impossible to pinpoint a certain time or location

**Keywords**: Folklore, Folk Poems, Hunting Methods, Prastapirulu, Songs

# පරිවර්තනය මගින් සිංහල සංස්කෘතිය නිරූපණය කිරීම: චාර්ල්ස් ඩිකන්ස්ගේ ''ග්‍රේට්එක්ස්පෙක්ටේෂන්ස්" කෘතියේ මුල් සිංහල පරිවර්තනය සහ පුනර්පරිවර්තනයේ භාවිත වී ඇති සමාජ සංස්කෘතිකමය පද පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක්

ඩී. පී. එන්. එස්. දියාලගොඩ

වාග්විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය

navodha47diyalagoda@gmail.com

**සාරසංක්ෂේපය**

භාෂා පරිවර්තනය යනු, එක් භාෂාවකින් ඉදිරිපත් ව ඇති කිසියම් අදහසක් වෙනත් භාෂාවකට හැරවීමයි. මෙම ක්‍රියාවලිය පිළිබඳ ව ගැඹුරින් හැදෑරීමේ දී පැහැදිලි වන කරුණක් වන්නේ, එය හුදෙක් භාෂාත්මක ක්‍රියාවලියක් පමණක් ම නොව, සංස්කෘතිකමය කරුණු හුවමාරු කිරීමේ මාධ්‍යයක් ලෙස ද කටයුතු කරන බවයි. පරිවර්තනය කෙරෙන්නේ විෂම ජාතීය සංස්කෘති දෙකක් අතර නම්, පරිවර්තකයා අභියෝගයකට මුහුණපායි. නිදසුනක් ලෙස, ඉංග්‍රීසි භාෂාවෙන් ලියැවී ඇති කෘතියක්, එය අයත් බටහිර සංස්කෘතියෙන් වෙනස් වූ සිංහල සංස්කෘතියට අයත් සිංහල භාෂාවට පරිවර්තනය කරන විට, සිංහල පාඨකයාට සමීප ලෙස එම පරිවර්තනය ඉදිරිපත් කිරීමේ දී සමාජ සංස්කෘතික පද හා සමරූප යෙදුම් නොමැතිවීම දැක්විය හැකි ය. මෙම පර්යේෂණයේ අරමුණ වූයේ මූලාශ්‍රය කෘතිය එක ම ලක්ෂ්‍ය භාෂාව වෙත දෙවරක් පරිවර්තනය වී ඇති විටෙක දී ලක්ෂ්‍ය භාෂාව අයත් සංස්කෘතියට වඩාත් සමීප ලෙස සමාජ සංස්කෘතික පද පරිවර්තනය කර ඇත්තේ කුමන පරිවර්තනයෙහිදැයි හඳුනා ගැනීම යි. ඒ සඳහා යොදා ගැනුණු, චාර්ල්ස් ඩිකන්ස්ගේ "ග්‍රේට්එක්ස්පෙක්ටේෂන්ස්"(Great Expectations) නම් මූලාශ්‍රය කෘතිය, කලින් කලට, පරිවර්තකයන් කීපදෙනකු විසින් සිංහල භාෂාවට පරිවර්තනය කරනු ලැබ ඇත. එහි මුල් සිංහල පරිවර්තනය වන ඊ. ආර්. එරත්නගේ "*රොමාගේ වාසනාව*" (1944/2016) සහ පුනර්පරිවර්තනය වන චන්ද්‍ර අනගිරත්නගේ "*උදාර අපේක්ෂා*" (2001/2011) ගෙන හැර බලන විට, මූලාශ්‍රය කෘතියේ ඉදිරිපත් කර ඇති සමාජ සංස්කෘතික පද සිංහල පාඨක ප්‍රජාව වෙත රැගෙන ඒමේ දී එකිනෙකට වෙනස් අයුරින් පරිවර්තනය වී ඇති බව දැක ගත හැකි වේ. මූලාශ්‍රය කෘතියෙන් තෝරාගත් සමාජ සංස්කෘතික පද ඇතුළත් උද්ධෘත සහ ඊට අනුරූප මුල් පරිවර්තනය සහ පුනර්පරිවර්තනය තෝරාගෙන ගුණාත්මක ක්‍රමවේදයක් යටතේ සංසන්දනාත්මක විශ්ලේෂණයක් භාවිතයෙන් මෙම පර්යේෂණය සිදුකරනු ලැබ ඇත. එම විශ්ලේෂණයේ දී පැහැදිලි වූයේ පුනර්පරිවර්තනයට වඩා මුල් පරිවර්තනය, දේශීයකරණය නම් ක්‍රමෝපාය ඔස්සේ සිංහල සංස්කෘතියට වඩාත් සමීප ලෙස පරිවර්තනය වී ඇති බවයි.

**ප්‍රමුඛ පද:** ලක්ෂ්‍ය භාෂාව, දේශීයකරණය, පරිවර්තනය, පුනර්පරිවර්තනය, සමාජ සංස්කෘතික

# Portrayal of Sinhalese Culture through Translation: A Comparative Study of the Socio-cultural Terms Used in the Sinhalese First Translation and the Retranslation of Great Expectations by Charles Dickens

D.P.N.S. Diyalagoda
Department of Lingistics, University of Kelaniya
University of Kelaniya
navodha47diyalagoda@gmail.com

## Abstract

Translation is the conversion of an idea in one language to another language. When this process is considered in depth, one clear thing is that it is not merely a linguistic process, but acts as a medium for exchanging culture-related facts. If the translation is done between two heterogeneous cultures, the translator encounters a challenge i.e.the non-availability of equivalent socio-cultural terms when translating a text (belonging to the Western culture) that is originally in English into Sinhalese while presenting with closeness to the Sinhalese reader. This research aimed to identify which translation presents the socio-cultural terms closer to the target language culture when the source text has been translated twice into the same target language. Charles Dickens's Great Expectations has been translated into Sinhalese by several translators from time to time. When its' Sinhalese first Translation, *Romāgē Vāsanāva* by E. R. Erathne (1944/2016) and retranslation *UdāraApēkṣā* (2001/2011) by Chandra Anagirathne are taken into consideration, it is observed that the presentation of socio-cultural terms in the source text to target reader community has been done in ways different from each other. This research has been conducted using a comparative analysis under a qualitative methodology, having selected the extracts with socio-cultural terms from the source text and their corresponding first translation and retranslation. The analysis depicted that, through the strategy of domestication, the translation has been done with closeness to the Sinhalese culture rather than retranslation.

**Keywords:** Domestication, Retranslation, Socio-cultural Terms, Target Language, Translation

# ශිව - පාර්වතී දේව සංකල්පය පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

ආර්. එම්. තුසිත ප්‍රියංකර රත්නායක
කැලණිය විශ්වවිද්‍යාලය
thusithaprathnayaka@gmail.com

**සාරසංක්ෂේපය**

ථෙරවාදී බුදු දහමට සාපේක්ෂ ව ජනප්‍රිය බුද්ධාගම ශිෂ්ටසම්පන්න සමාජයක් ගොඩනඟන යාන්ත්‍රණයක් ලෙස ක්‍රියාත්මක වේ. ජනප්‍රිය බුද්ධාගමේ දක්නට ලැබෙන දේව සංකල්පය එහි ලා පුරෝගාමී මෙහෙවරක් ඉටු කරයි. ''හින්දු සම්ප්‍රදාය සංකීර්ණ චින්තන හා ආචරණ පද්ධති කිහිපයකින් සමන්විත ය. ඒ අතුරෙන් ශිව ඇදහිල්ල, විෂ්ණු ඇදහිල්ල සහ ශක්ති ඇදහිල්ල ප්‍රධාන තැනක් ගනී. 'ශුද්ධ වූ වස්තූන් ආශ්‍රිත විශ්වාස සහ පරිචිති පිළිගත් සියලුදෙනා ම එක ම ආචාර ධර්ම සමාජයකට බැඳ තබන විශ්වාස හා පරිචිති පද්ධතිය ආගම වේ.' යන අර්ථකථනය එක්තරා විදියකින් හින්දු පද්ධතීන්ට ගැළපේ.'' යනුවෙන් මේ සම්බන්ධයෙන් මහාචාර්ය ඒ. සතාසිවම් සූරීන් දක්වා ඇති අදහස ඉතා වැදගත් ය. මෙම ප්‍රකාශය හින්දු සම්ප්‍රදාය මූලික කර ගත්ත ද ජනප්‍රිය බුද්ධාගමෙන් පෝෂණය වූ ලාංකේය සමාජයට ආදේශ කරගත හැකි ය. හින්දු දෙවිවරුන්, ජනප්‍රිය බුද්ධාගම යටතේ පූජාවට ලක් වන බැවිනි. ශිව දෙවියාගේ භාර්යාව පාර්වතියයි. මේ දෙදෙනාගේ දරු දෙදෙනා ස්කන්ධ හා ගණපතියි. ස්කන්ධ දෙවියාටත් ගණපතිටත් සෙසු දේව පිරිවරට වඩා ප්‍රමුඛස්ථානයක් ලැබී තිබේ. 'මහාදේව' යනුවෙන් ද හැඳින්වෙන ශිව යන්නෙහි 'සුබ' යන අර්ථය ඇත. මේ නම ඔහුට යෙදෙන්නේ සියලු ම දෙවිවරුන් එක් ව ගත් කල ඇති බලයට වඩා බලයක් ඔහුට ඇති බැවිනි. ලාංකිකයන් අතර මේ ශිව-පාර්වතී සහ ඔවුන්ගේ දරුවන් වන්දනය කිරීම බෙහෙවින් ම ප්‍රකට ය. මේ පර්යේෂණයේ අරමුණ වන්නේ ලාංකේය ජනප්‍රිය බුද්ධාගමට අයත් පූර්වෝක්ත දේව ගණයා වන්දනය කිරීම හා තදනුබද්ධ මානව විද්‍යාත්මක වටිනාකම පිළිබඳ ව අධ්‍යයනය කිරීම ය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුව මේ සඳහා දත්ත රැස් කෙරුණේ සාහිත්‍ය මූලාශ්‍රයවලින්, ප්‍රත්‍යක්ෂ නිරීක්ෂණවලින් සහ දේව භක්තිකයන් මෙන් ම දේවාලවල කපු මහතුන් සමග සිදු කෙරුණු සම්මුඛ සාකච්ඡාවලිනි. දරු ඵල අපේක්ෂාවෙන් ඇදහීමට ලක් වූ දෙවිවරුන් අතරින් ශිව දෙවියන් ප්‍රමුඛ තැන් ගන්නා බවත් ශිව ලිංගයට රතු මල් මාලයක් පළඳවා කිරි දියරෙන් සෝදා එම කිරි පානයෙන් දරුවන් ලැබෙන බවත් ශ්‍රී ලාංකිකයන් දැඩි ව විශ්වාස කරන බව මේ පර්යේෂණයෙන් අනාවරණය විය. විශේෂයෙන් ම කුඩා දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවල සඵලත්වය උදෙසා දීර්ඝ කාලයක පටන් ගණ දෙවි වන්දනය කරන බවත් තාක්ෂණය දියුණු වර්තමානයේ පවා ඒ විශ්වාසය ශ්‍රී ලාංකිකයන් අතර පවතින බවත් අනාවරණය විය. මෙලෙස දෙවිවරුන් මූලික කරගෙන සිදු කෙරෙන වන්දනමාන සාමූහික ව සිදු කිරීම ඊට මානව විද්‍යාත්මක වටිනාකමක් ගෙනදීමක් ද වේ.

**ප්‍රමුඛ පදඃ** ජනප්‍රිය බුද්ධාගම, ථෙරවාදී බුද්ධාගම, මානව විද්‍යාත්මක වටිනාකම, ශිව-පාර්වතී, හින්දු සම්ප්‍රදාය

# An Anthropological Study of the Shiva – Parvathi Deity Concept

R. M. Thusitha Priyankara Rathnayake
Candidate of MPhil
University of Kelaniya
thusithaprathnayaka@gmail.com

**Abstract**

Compared to Theravada Buddhism, popular Buddhism functions as a mechanism to build a civilized society. The concept of God found in popular Buddhism fulfills a pioneering mission "The Hindu tradition consists of several complex systems of thought and belief. Among them, the faith of Shiva, the faith of Vishnu, and the faith of Shakthi occupy a central place. 'Beliefs related to sacred objects and pachithi Basalk are beliefs and pachim thart bind everyone into a single ethical society.' This religion fits the systems of Hinduism in a way. In this connection." The idea given by Professor Sathasivam surin is very important. This statement can be substituted for Sri Lankan society, which is based on Hindu tradition but nurtured by popular Buddhism Because Hindu gods are sacrificed under popular Buddhism Lord Shiva's wife is Parvathi. The two children of these two are Skandha and Ganapathi. God Skandha and Ganapathi have a prominent position over the rest of God's entourage Shiva, also known as 'Mahadeva' means 'happiness'. This name is applied to him because he has more power than all the gods combined. The worship of this Shiva, Parvathi and their children are very popular among Sri Lankans. The purpose of this research is to study the worship of the prescient deity of Sri Lankan popular Buddhism and the closely related anthropomorphic values According to the qualitative research method, data was collected from literature sources, direct observations and interviews with devotees as well as temples. Crows. Some research also revealed that the Sri Lankans believe that Lord Shiva takes priority to giving birth to children and wearing a garland of red flowers is washed with milk and drinking their milk gives birth to children. People worship to God Ganapathi to achieve success in kids' educational activities this belief has existed among Sri Lankans for a long time and the collective worship of the deities brings anthropological values to it.

**Keywords:** Anthropological Values, Hindu Tradition, Popular Buddhism, Shiva - Parvathi, Theravada Buddhism

# පාරම්පරික හෙළවෙදකම හා ජනවිඥානය සතු රෝග නිවාරණීය විධික්‍රම පිළිබඳ සමාජ මානව විද්‍යාත්මක අධ්‍යයනයක් (ලග්ගල ප්‍රදේශයේ පාරම්පරික දේශීය වෙදකම ඇසුරින්)

කේ. බී. ඒකනායක

හර්ෂණී කේ. මිල්ලගහතැන්න

වසන්ත කේ. දිසානායක,

භාෂා අධ්‍යයන අංශය,  ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.

dwasanta@yahoo.com

**සාරසංක්ෂේපය**

යුරෝපීයයන් මෙරට ආක්‍රමණය කිරීමට ප්‍රථම ඉතා උත්කෘෂ්ට ඇගයුමට ලක්වූ දේශීය පාරම්පරික හෙළ වෙදකමේ මූලාරම්භය හා සබැඳි ලග්ගල රණමුරේ, මී මුරේ ආශ්‍රිත ව අවිනෂ්ට ව පවතී. මෙම ප්‍රදේශයේ ජීවත්වන රජයේ ලියාපදිංචි දේශීය වෛද්‍යවරුන්ගේ මතය වන්නේ දේශීය වෙදකම රාවණ රජුගෙන් පැවතෙන බවත් තම ප්‍රදේශවාසීන් රාවණ රජු දේවත්වයෙන් වැඳුම් පිදුම් කරන බවත් ය. උඩ්ඩිශ තන්ත්‍ර, අර්ක ප්‍රකාශ, නාඩි පරීක්ෂා හා කුමාරතන්ත්‍ර ආදී වෛද්‍ය ග්‍රන්ථ රාවණ රජු රචනා කළ බවට පිළිගන්නා මතයකි. ලග්ගල මීමුරේ ප්‍රදේශය රාවණ නගරය ලෙස පැවති බවට ජනශ්‍රැති රැසක් ද පවතී. ආර්යලංකාවතාර සූත්‍රය හා රාමායණය වැනි කෘති තුළ අන්තර්ගත රත්නගිරි පර්වත ලංකාපුරය තත් ප්‍රදේශාශ්‍රිත නගර බවට මහාචාර්ය විමල විජයසූරිය ද අවධාරණය කරන්නකි. අප අධ්‍යයනයේ ලබාගත් දත්ත අනුව අනාවරණය වූයේ පුලස්ති ඍෂි හා රාවණ රජුගෙන් ආරම්භ වූ දේශීය වෙදකම පසු ව යක්ෂ ගෝත්‍රිකයන් ලබා ගන්නා අතර එය අවිනෂ්ට ව පවත්වාගෙන එන බවයි. මෙම පර්යේෂණයේ ගැටලුව වූයේ පාරම්පරික හෙළ වෙදකම සතු ව පවතින ජන විඥානය හේතුකොටගෙන රෝග නිවාරණය උදෙසා ඉවහල් වන මනෝ චර්යාධර්මයන්ගෙන් සමන්විත සුවිශේෂ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වන්නේ ද යන්නත් එය කෙතරම් දුරට සාධනීය ප්‍රතිඵල ලබා ඇත්තේ ද යන්නත් සොයා බැලීමයි. එමෙන් ම සිංහල සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණ විදහා දක්වන ඓතිහාසික ලග්ගල ප්‍රදේශයේ ජීවත්වන පාරම්පරික හෙළ වෙදපරපුර සතු වෛද්‍ය ක්‍රමවේද අධ්‍යයනට ලක් කරමින් ඔවුන් සතු රෝග නිවාරණීය ජන විඥානය පිළිබඳ විමසීමත් මෙම වෙදදුරන් සතු මුඛපරම්පරාගත දැනුම සංරක්ෂණය කිරීමත් මෙම අධ්‍යයනයේ අරමුණු විය. ප්‍රාථමික මූලාශ්‍රය අධ්‍යයනය හා ද්විතීයික මූලාශ්‍රය අධ්‍යයනය මෙහි මූලික පර්යේෂණ ක්‍රමවේදය විය. එහි දී ක්ෂේත්‍ර අධ්‍යයනය හා සම්මුඛ සාකච්ඡා සිදුකෙරුණි. ඒ අනුව 2016-05-25 සහ 26 හා 2018-03-11 සහ 12, 2023-07-20/21, 2023/10/09 සහ 10 දිනයන්හි තත් ප්‍රදේශාශ්‍රිත ව සිදුකළ ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී කිවුලේවාඩියේ වැලෑනේ වෙද පරපුර (සර්ප විෂ) කෝවිල් මුල්ලේ වෙද පරපුර (අක්ෂිරෝග හා සර්වාංග රෝග) කන්තලේ ගෙදර වෙද පරපුර (කැඩුම් බිඳුම් සර්වාංග රෝග ගව වෙදකම) හා පල්ලේගෙදර වෙද පරපුර (කැඩුම්බිඳුම් හා මානසික රෝග) සමඟ සිදුකළ සම්මුඛ සාකච්ඡා මඟින් දත්ත රැස්කිරීම සිදුකෙරුණු අතර ඔවුන් සතු ව පවතින පාරම්පරික වෛද්‍ය පුස්කොළපොත් විමර්ශනයට ලක් කෙරුණි. මෙම අධ්‍යයනයේ දී අපට අනාවරණය වූයේ හෙළවෙදකමෙහි රෝග නිවාරණීය විධික්‍රම ජනවිඥානය බද්ධ වී පවතින බවයි. අත්දැකීම් හා අත්විඳීම් මත සිදුවන මෙම ක්‍රියාවලියට විශ්ව ශක්ති බලය හා බැඳි යාන්ත්‍රණයක් ඍජුවත් වක්‍රාකාරවත් ක්‍රියාත්මක බව අනාවරණය විය. මෙකී යාන්ත්‍රණය ඔස්සේ සිදුවන වෙදහෙදකම මඟින් රෝගියාගේ කායික හා මානසික මනෝව්‍යාධීන් මූලෝත්පාඨනය කරන බැව් පසක් විය.

**ප්‍රමුඛ පද:** අනන්‍යතා, ජන විඥානය, රෝගනිවාරණීය, සිංහල සංස්කෘතික විධික්‍රම, හෙළවෙදකම

# A Study on Indigenous Medical Treatments of a Traditional Community in Laggala (*Lakegala*) Village in Sri Lanka

K.B. Ekanayake, Harshani Millagahatanna, Wasantha K. Dissanayake, Rajarata University of Sri Lanka, Mihintale
dwasanta@yahoo.com

**Abstract**

Lakegala is the only traditional village left after the construction of the Kaluganga reservoir. Preliminary studies show that the village possesses most of the traditional medical treatment methods and techniques of the past in the region. It is essential to record and analyze their methods so that they are available for future generations. The research problem is what specific treatment methods are possessed by the present community. Primary data was collected through in-depth interviews of key informants during a field visit. Secondary data was collected from historical reports including sources searched through the internet. The following are the research questions addressed in this research: Who are the indigenous community of Rawana? What is their history? What is the theoretical system of the indigenous medicine system? What are the changes in their attitudes? We know any ethnic community has its own beliefs, rituals and treatment methods. How the indigenous medicine treatment influenced by local and Western medical treatments? The main source of information on the indigenous people of Sri Lanka and their medical care including the valuable medical system is the folklore. Studying the history of any country and the hypotheses which are given through the folklore have considerable importance. Especially there is a high probability of finding the knowledge of indigenous medicine through the folklore of Sri Lanka. The indigenous peoples with anthropological, sociological and psychological values are based on the inherited indigenous medicine treatment system. This research study based on the sociological and psychological characteristics used by indigenous medicine consists of two branches of curing physical and mental diseases. This research study explores that there are sociological, anthropological and psychological values of indigenous medicine. Field studies, interviews, questionnaire methods and natural observation were used to prove the above facts.

**Keywords:** Indigenous Knowledge, Indigenous Medicine, Indigenous Medicine Treatment System, Sinhala Culture

# "Avatar: The Way of Water" චිත්‍රපටයෙන් මිනිසා කෙරෙහි සොබාදහම් නීතියේ බලපෑම රූපාත්මකව ප්‍රකට කිරීම සම්බන්ධ සිනමාත්මක අධ්‍යයනයක්

යූ. ඩබ්ලිව්. එන්. සුභාෂනී
සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය
nadeeshasuba1996@gmail.com

**සාරසංක්ෂේපය**

2022 වර්ෂයේ තිරගත වුණු Avatar: The Way of Water චිත්‍රපටය වූ කලී මිනිසා සහ සොබාදහම අතර පවත්නා අන්තර් පුද්ගල සම්බන්ධතාව පිළිබඳ ව සිනමාත්මක කතිකාවක් ඇති කරවන්නකි. චිත්‍රපටයේ ප්‍රකට වන නාවී වැසියන් හා පරිසරය අතර පවත්නා සහසම්බන්ධය ජේම්ස් කැමරන් වඩාත් ප්‍රකට කරන්නේ Avatar: The way of water චිත්‍රපටයෙනි. චිත්‍රපටය ආරම්භයේ සිට අවසානය දක්වා මිනිසාට සොබාදහමේ නියතීන් ඉක්මවා යාමට නොහැකි බව රූපාත්මකව විශද කිරීමෙහි ලා ජේම්ස් කැමරන් සමත් වෙයි. පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ Avatar: The Way of Water චිත්‍රපටයේ මිනිසා සහ සොබාදහම අතර පවත්නා අන්‍යෝන්‍ය සම්බන්ධතාව සහ සොබාදහම් නීතියේ බලපෑම මිනිසා කෙරෙහි කවරාකාරයට ප්‍රකට කෙරෙන්නේ ද යන්න සොයා බැලීමයි. ඒ අනුව පර්යේෂණ ගැටලුව ලෙස සොබා දහමට එරෙහිවන මිනිසා සොබාදහම විසින් ම විනාශකර දමන බව සිනමා ව්‍යාකරණාංග ඔස්සේ කවරාකාරයකට Avatar: The way of water චිත්‍රපටයෙන් විද්‍යමාන වන්නේ ද යන්න දැක්විය හැකි ය. පර්යේෂණ ක්‍රමවේදය යටතේ පරිසරවාදි සාහිත්‍යයික විචාර න්‍යාය භාවිතයට ගැනේ. ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් චිත්‍රපටයත් ඒ සම්බන්ධයෙන් ලියවුණු විචාර ලිපි හා සම්මුඛ සාකච්ඡා ද්විතීයික මූලාශ්‍රය ලෙස භාවිතයට ගැනේ. පර්යේෂණයේ මූලික කොට ගන්නා පරිසරවාදි විචාර ප්‍රවේශයට අදාළ ග්‍රන්ථ ද මූලාශ්‍රය කර ගැනීම අපේක්ෂිත ය. පර්යේෂණ සීමාව වශයෙන් Avatar: The Way of Water චිත්‍රපටයේ රූපාත්මක භාෂා විලාසය භාවිත වන අවස්ථා පිළිබඳ ව පමණක් අවධානය යොමු කිරීම දැක්විය හැකි ය. මිනිසා තාක්ෂණික වශයෙන් විවිධ අත්හදා බැලීම් සිදුකරමින් කාලය හා අන්තර් පුද්ගල දූරස්ථභාවය ජය ගැනීමේ තරගයක නිරත වී සිටී. එහි දී බොහෝ විට සොබාදහමේ සනාතන නියතීන් ඉක්මවා යාමට නව තාක්ෂණය යොදා ගැනීමට උනන්දු වන බවක් පෙනේ. එහෙත් සොබාදහමේ නියතීන් ඉක්මවා යාමට වෙර දරන්නා එයින් ම විනාශයට පත් වන බව Avatar: The Way of Water චිත්‍රපටයෙන් ප්‍රකට කිරීමට ජේම්ස් කැමරන් රූපාත්මකව උත්සාහ ගෙන ඇත. ත්‍රිමානකරණය ඔස්සේ පාරිසරික සුන්දරත්වය ප්‍රේක්ෂකයා වෙතට සමීප කිරීමත් සොබාදහමෙන් වියුක්ත ව මිනිසාට ජීවත් විය නොහැකි බව හැඟවීමටත් අධ්‍යක්ෂකවරයා සමත් ව ඇති බව පැහැදිලි ය. එබැවින් සිනමාත්මක රූප භාෂා මාධ්‍යයේ කැමරන් වඩාත් හෘදයග්‍රාහී ව ස්වකීය ආධ්‍යාශය ප්‍රේක්ෂකයාට සමීප කරන බව කිව හැකි ය.

**ප්‍රමුඛ පද:** ජේම්ස් කැමරන්, පරිසරවාදී විචාරය, රූපාත්මක කථනය, සිනමාව, සොබාදහම් නියතීන්, Avatar The Way of Water

# A Cinematographic Study on the Graphical Portrayal of the Influence of Natural Law on Human Being in the Film "Avatar: The Way of Water"

U.W.N. Subashani
Department of Sinhala, University of kelaniya
nadeeshasuba1996@gmail.com

**Abstract**

The movie Avatar: The Way of Water, which was screened in the year 2022, is a cinematic discourse about the relationship between man and nature. James Cameron solidly portrays the correlation between the Navi civilians and the natural environment in this film. From the beginning to the end of the film, James Cameron succeeds in graphically explaining that man cannot overcome the laws of nature. The research aims to discover how the movie Avatar: The Way of Water reveals the mutual relationship between man and nature and the influence of nature's law on man. Accordingly, the research problem indicates how Avatar: The Way of Water portrays through film grammar that nature destroys the man who opposes nature. The research methodology follows the theories of literary criticism based on environmentalism. In the present research, the film is the primary source, and the written review articles and interviews are the secondary source materials. As the limitations of the research, it only focuses on the cases where graphical language is used in the movie Avatar: The Way of Water. Man is engaged in a competition to conquer time and distance by performing technical experiments. But James Cameron has figuratively tried to show in the movie Avatar: The Way of Water that the one who strived to exceed the laws of nature will be destroyed by it. It is clear that the director has succeeded in bringing the environmental beauty closer to the audience through 3D renderings while making it clear that man cannot live in isolation from nature. Hence, it is clear that Cameron brings his characters closer to the audience in a heart touching manner through the medium of cinematic imagery.

**Keywords:** Avatar: The Way of Water, Cinematic Technology, Environmentalism, James Cameron, Nature, Navi Civilians,

# ඡායාරූප තැපැල්පත් (Picture Postcards) භාවිතය පිළිබඳ අධ්‍යයනයක්

ඒ. එම්. ටී. ඩී අබේසිංහ
deepthikaabeysinghe@gmail.com

**සාරසංක්ෂේපය**

මාධ්‍ය බහුලීකරණය නොවූ අවධියේ පටන් මිනිසා නෑ සිය මිතුරන් සමග කාඩ්පත් හුවමාරු කර ගනිමින් සබඳතා පවත්වා ඇති ආකාරය පිළිබඳ සාධක බහුල ව හඳුනාගත හැකි ය. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේ ආරම්භ වී සියවස් එකහමාරක පමණ කාල පරාසයක් ප්‍රචලිත ව පැවති ඡායාරූප තැපැල්පත් (Picture Postcards) වර්තමානයේ අවම වශයෙන් භාවිත කරන අයුරු හඳුනාගත හැකි ය. ලංකාවේ පුරාවිද්‍යාත්මක වටිනාකම, සමකාලීන සංස්කෘතිය, ජන ජීවිතය සහ පරිසරය විදේශයන් වෙත රැගෙන ගිය මෙම දෘශ්‍ය මාධ්‍යය වර්තමාන සමාජය තුළ ගිලිහී ගොස් ඇත්තේ ඇයි ද යන්න අධ්‍යයනය මෙහි අරමුණ වේ. නූතන මිනිසා කාඩ්පත් හුවමාරුව සඳහා ඇබ්බැහි වීමක් ඇතත්, ඡායාරූප තැපැල්පත් භාවිතය ගිලිහී යාමේ ගැටලුවත්, නවීන තාක්ෂණය සමග මෙකී දෘශ්‍ය මාධ්‍ය නව මානයකින් සමාජගත කළ හැකි ද යන්නත් මෙහි දී විමර්ශනය කරන ලදි. ඡායාරූප තැපැල්පත් පරිහරණය උදෙසා වන අද්‍යතන සමාජ නැම්යාව විමසා බැලීමත්, ඒ සඳහා වන පරිශීලකයන්ගේ රුචිකත්වය හඳුනාගැනීමත් පිණිස වන මෙම අධ්‍යයනයේ දී ප්‍රතිචාරකයන් 200ක් ප්‍රශ්නාවලියක් මගින් සමීක්ෂණයට භාජනය කරන ලදි. තෝරාගත් නියැදියක් වෙත ඉදිරිපත් කරන ලද එකී ප්‍රශ්නාවලිය මගින් ඒකරාශීකරණය කරන ලද දත්ත ජීවත් වන ප්‍රදේශය, වයස, ස්ත්‍රී පුරුෂ ගතිකත්වය යන විචල්‍යය සමග වෙන් වෙන් ව විශ්ලේෂණය කොට ඡායාරූප ඇසුර පෘථුල වූත්, සක්‍රීය මානව සබඳතා බහුල වූත් වර්තමානයේ ඡායාරූප තැපැල්පත් භාවිතය සඳහා පවතින ඉඩකඩ හඳුනාගැනීමට හැකි විය. එහි ප්‍රතිචාර අනුව මෙරට ප්‍රජාව තුළ හස්ත කෘත මෝස්තර (Handcraft) සඳහා වැඩි ඉල්ලුමක් පවතින බවත්, ඡායාරූප අන්තර්ගත කරන කල්හි සමකාලීන පරිසරය හා සංස්කෘතික අනන්‍යතා වැඩි වශයෙන් ඊට නිමිති කොටගත යුතු බවත්, සාමාන්‍ය පුද්ගලයන් හා කුඩා දරුවන්ගේ ඡායාරූප වඩා තාත්වික නිරූපණයකින් යුක්ත වන බවත්, ගෙවීම් රහිත ව මෘදු පිටපත් (Soft Copy) ලෙස ඡායාරූප තැපැල්පත් පරිහරණයට කැමැත්තක් පවතින බවත් අනාවරණය විය.

**ප්‍රමුඛ පදඃ** ඡායාරූප තැපැල්පත්, තාත්වික නිරූපණය, දෘශ්‍ය මාධ්‍ය, මාධ්‍ය බහුලීකරණය, හස්ත කෘත මෝස්තර

# A Study of the Use of Picture Postcards

A.M.T.D Abeysinghe
deepthikaabeysinghe@gmail.com

**Abstract**

Being a social being, man is constantly in relationships with others. From the time when the media did not proliferate, maintaining relationships by exchanging cards with friends can be widely identified. Picture postcards, which were popular for a period of one and a half centuries from the beginning of British colonial rule, are far from being used today. The purpose of this study is to find out why this visual medium, which carried Sri Lanka's archaeological value, contemporary culture, people's lives and environment abroad, has been lost in today's society. Although there is a trend in exchanging cards in modern man, the problem of losing the use of picture postcards and whether this visual media can be socialised in a new dimension with modern technology are examined here. In this study, 200 respondents were surveyed through a questionnaire in order to investigate the current social trend towards the use of picture postcards and to identify the interest of the users for the same. The collected data from the questionnaire given to a selected sample was analysed separately with the variable of living area, age, and gender dynamics, and it was possible to identify the opportunities for the use of picture postcards nowadays where the use of photos is widespread and active human relationships are abundant. According to the responses, it was found that there is a greater demand for handmade designs in the Sri Lankan community. Contemporary environment and cultural identities should be taken into account more when uploading photos, while photos of ordinary people and small children are found to appear more realistic. It was also revealed that there is a willingness to use soft copies of picture postcards, which are available free of charge.

**Keywords:** Handmade design, Media proliferation, Picture postcards, Realistic representation, Visual media

# උඩරට නර්තන සම්ප්‍රදායේ හිස වෙස් තැබීමේ මංගල්‍යයේ චාරිත්‍ර විධි පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එස්. එම්. ඒ. පී. රත්නසිරි
ඉතිහාසය හා පුරාවිද්‍යාව අධ්‍යනාංශය - රුහුණ විශ්වවිද්‍යාලය
amila.17704@uhss.ruh.ac.lk

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලාංකේය සංස්කෘතියේ විචිත්‍රත්වයට නර්තන කලාවෙන් ලැබෙන්නේ සාධාරණ දායකත්වයකි. උඩරට, පහතරට, සබරගමු ලෙස ත්‍රිත්වාකාරයකට බෙදී යන මෙම නර්තන කලාව මහනුවර, සත්කෝරළය, සතරකෝරලය, කුරුණෑගල, අනුරාධපුරය ආදී ප්‍රදේශවල ව්‍යාප්ත ව පවතී. මෙම උඩරට නර්තන සම්ප්‍රදායේ යක්දෙස්සෙකු ප්‍රවීණ නර්තන ශිල්පියකු බවට පත් වන්නේ හිස වෙස් තැබීමේ මහා කලඑළි මංගල්‍යය මගිනි. යක්දෙස්සෙකු ව සිටින කාලයේ සිදු කරන චාරිත්‍ර, ගුරුවරයා විසින් සිදු කරනු ලබන චාරිත්‍ර, දෙපිරිස ම එකතුව සිදු කරන චාරිත්‍ර විධිවල ස්වභාවය ආදිය පිළිබඳ ව ගවේෂණය මෙහි අධ්‍යයන අරමුණ විය. මෙකී උඩරට නර්තන සම්ප්‍රදායේ හිස වෙස් තැබීමේ මංගල්‍යය ඇති චාරිත්‍ර විධිවල ස්වභාවය කෙසේද? යන අධ්‍යයන ගැටලුවට දත්ත ඒකරාශී කිරීමට මෙමගින් උත්සාහ ගෙන ඇත. ඒ සඳහා පුස්තකාල ගවේෂණ ක්‍රමවේදය හා ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය භාවිත කරන ලදි. අනුරාධපුර - ගලෙන්බිඳුනුවැව ප්‍රදේශය, සතරකෝරලය, කුරුණෑගල - අලව්ව ආදී අධ්‍යයන ප්‍රදේශවල සහභාගිත්ව හා සහභාගී නොවන නිරීක්ෂණ ක්‍රම මගින් තෝරාගත් ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් පනස් දෙනෙකු සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වා තේමාත්මක (Thematic) විශ්ලේෂණ ක්‍රමය මගින් අවසන් නිගමනවලට පැමිණ ඇත. මෙ මගින් යක්දෙස්සා කලඑළි මංගල්‍යයට ප්‍රථම තෙමසකට අධික කාලයක් මස්, මාංශ ආදී පිළි සහ කිළියෙන් වැළකී පංචශීලය ආරක්ෂා කරමින් කොහොඹා දෙවියන්ගේ දේවාභරණ කට්ටලය හිස පැළඳීමට සූදානම් විය යුතුය. පසුව ගුරුවරයා විසින් මඩු පේ කිරීම, තොට පේ කිරීම, යක්දෙස්සන් ස්නානය කරවීම, අඩ වෙස් ඇඳුමින් සැරසවීම, හගල් පේ කිරීම, වෙස් තැබීම, දොරට වැඩීම, දෝෂ දුරුකිරීම, ශිල්ප දැක්වීම, බලියක් සිදු කිරීම හා පිරිත් සජ්ඣායනය සිදු කරනු ලබන බව ද දැනගන්නට ලැබුණි. යක්දෙස්සා වෙස් නර්තන ශිල්පියකු වීමේ දී කරනු ලබන වත් පිළිවෙත්, ගුරුවරයා කරනු ලබන වත් පිළිවෙත්, දෙමව්පියන්ගෙන් ඉටුවන කාර්යභාරය හා බෞද්ධාගම හා සම්බන්ධ ව අවියෝජනීය සම්බන්ධතාවක් දක්වන බව ප්‍රතිඵල ලෙස අධ්‍යයනය මගින් හඳුනා ගැනීමට හැකි විය.

**ප්‍රමුඛ පද :-** උඩරට නර්තන සම්ප්‍රදාය, චාරිත්‍ර, යක්දෙස්සා, වෙස් නර්තන ශිල්පියා, වෙස් මංගල්‍යය

# Investigative Study of the Rituals of the Head Masking Ceremony in the Upcountry Dance Tradition

S.M.A.P. Rathnasiri
Department of History and Archaeology - University of Ruhuna
amila.17704@uhss.ruh.ac.lk

**Abstract**

The art of dance makes a fair contribution to the richness of Sri Lankan culture. This dance art, divided into three parts: Upcountry, Lowland, and Sabaragamu, is widespread in Kandy, Satkoralaya, Satarakoralaya, Kurunegala, and Anuradhapura. In this Upcountry dance tradition, a Yakdessa evolves into an expert dancer through the grand masking ceremony. The study examines the practices performed by a Yakdessa, by the teacher, or by both groups. The study attempts to collect data on the rituals of the head masking ceremony in this up-country dance tradition. Library study method and field study method were used for that. Under the library study method, secondary data of literature, such as research papers and research works, were studied. In the field study method, areas such as Anuradhapura - Galenbidunuwewa area, Satarakoralaya, and Kurunegala – Alavwa have been studied. Participatory and non-participatory observation methods are used, and interviews with 50 experts in the field have been done. The thematic analysis method was used, and the conclusions were reached using a comparison framework. Therefore, before the ceremony of Yakdessa's debut, one should avoid eating meat and fish for more than three months to protect the path of purity and prepare to wear the set of ornaments of God Kohombaa on his head. Later, it was also learned that the teacher performs madu pe, tota pe, bathing the yakdessas, halfly dressing them up in mask clothes, hagal pe, putting on the mask, debuting them, removing doshas, performing a Bali, and chanting Pirith. As a result of the study, it was possible to identify that in the process of a Yakdessa becoming a mask dancer, the teacher's role, the role played by parents and Buddhism are inseparable.

**Keywords:** Mask dancer, Masking ceremony, Rituals, Upcountry dance tradition,Yakdessa

# වාර්තා චිත්‍රපටකරණය වෘත්තාන්ත සිනමාවට ප්‍රවේශයක් ද යන්න ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ සිනමා සම්ප්‍රාප්තිය ඇසුරෙන් විමසා බැලීමක්

ඒ. එම්. ටී. ඩී අබේසිංහ
deepthikaabeysinghe@gmail.com

**සාරසංක්ෂේපය**

දේශීය සිනමාවේ ගමන් මග තීන්දු කිරීමේ ප්‍රමුඛ සාධකයක් ලෙස සැලකෙන ලෙස්ටර්, මෙරට මුල් කාලීන වාර්තා චිත්‍රපටකරණයෙහි ලාංකේය මුද්‍රාව ගවේෂණය කළ අයෙකි. ඒ බව සනාථ වන්නේ රජයේ චිත්‍රපට ඒකකය තුළ රැල්ෆ් කීන් යටතේ සහය අධ්‍යක්ෂවරයෙකු ලෙස ප්‍රමුඛ නිර්මාණ දායකත්වයක් එක් කළ ලංකා උරුමය (Heritage of Lanka - 1951) සහ නෙළුම්ගම (1934) යන චිත්‍රපට මගිනි. ලෙස්ටර් විසින් නිර්මාණය කරන ලද වියළි කලාපය ජය ගැනීම (Conquest in the dry zone -1954) සහ ප්‍රවේසම් වෙනු නැතිනම් තැවෙනු (Be safe or be sorry -1955) යන චිත්‍රපටවල දී කැමරාව එළිමහනට රැගෙන ගොස් සූර්යාවලෝකය යටතේ රූපගතකරණය මැනවින් අභ්‍යාස කොට ඇත. ලෙස්ටර්ගේ වාර්තා චිත්‍රපටකරණය වෘත්තාන්ත සිනමාවට ප්‍රවේශයක් ද යන්න මෙහි දී අධ්‍යයනයට ලක්කොට ඇත. චිත්‍රපටකරණය සඳහා පූර්වගාමී ප්‍රවේශ මාර්ගයක් ලෙස වාර්තා චිත්‍රපටය වැදගත් වන්නේ ද යන්න ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ සිනමා සම්ප්‍රාප්තිය ඇසුරෙන් හඳුනාගැනීම මෙහි පර්යේෂණ ගැටලුව වේ. වෘත්තාන්ත චිත්‍රපටකරණයට එළඹීමට පෙරාතුව ලෙස්ටර් විසින් රජයේ චිත්‍රපට අංශය සඳහා නිපදවන ලද වාර්තා චිත්‍රපටවල ගැමි දිවිය හා පරිසරය අරුත් ගැන්වූ ආකාරය සංසන්දනාත්මක අධ්‍යයනයකට පාත්‍ර කිරීම මෙහි පර්යේෂණ ක්‍රමවේදය වේ. රැල්ෆ් කීන්ගේ මග පෙන්වීම යටතේ ලත් තාක්ෂණික නිපුණත්වයත්, ලාංකික ජන සමාජයේ සැබෑ ස්වරූපය පිළිබඳ තමාගේම නිරීක්ෂණ හා අවබෝධයත්, දේශීයත්වය මුල් කොටගත් වෘත්තාන්ත චිත්‍රපටයකට මග පෙන්වූ බව ලෙස්ටර්ගේ ප්‍රකාශ මෙන් ම පළමු වෘත්තාන්ත චිත්‍රපටය (රේඛාව - 1956) හා ඉන් පෙර නිර්මාණය කළ වාර්තා චිත්‍රපට අතර වන අනුරූපණය තුලනාත්මකව සලකා බලන කල සනාථ වේ. අගනුවර උසස් යැයි සම්මත ජන සමාජයේ උපත ලබා බටහිර පන්නයට හැදී වැඩුණු ඔහු දේශීය ජන ජීවිතය, සාම්ප්‍රදායික කලා මාධ්‍ය, ලාංකේය පරිසරය ඇසුරෙහි අත්දැකීම් හා ජීවිතාවබෝධය නොලත් අයෙකු බව ලෙස්ටර් චරිතය ඇසුරු කොටගත් ග්‍රන්ථගත මූලාශ්‍රය මගින් හෙළිදරව් වේ. එකී සාධකවලට අනුව මෙරට පරිසරය හා ජන ජීවිතය පදනම් කොටගත් වෘත්තාන්ත සිනමාවකට ඔහු අවකාශ උදා කර ගත්තේ වාර්තා චිත්‍රපටකරණයෙන් ලද තාක්ෂණික පරිචය සහ ඊට අන්තර්ගත විෂය විශ්ලේෂණය මගින් ගොඩනංවා ගත් දැනුම් සම්භාරය මත බව මෙම අධ්‍යයනයේ දී අනාවරණය කොටගත හැකි විය.

**ප්‍රමුඛ පදඃ** තාක්ෂණික පරිචය, දේශීයත්වය, ලෙස්ටර්, වාර්තා චිත්‍රපට, වෘත්තාන්ත සිනමාව

# An Inquiry into Whether Documentary Filmmaking Can Be Considered an Approach to Feature Cinema Within the Context of the Cinematic Tradition of Lester James Peries

A.M.T.D Abeysinghe
deepthikaabeysinghe@gmail.com

**Abstract**

Lester, who is considered a leading influence in shaping the course of local cinema, is one of the individuals who explored Sri Lankan themes in early documentary filmmaking within the country. This is evident through his contributions as an assistant director under Ralph Keane in the Government Film Unit, particularly in films like "Heritage of Lanka" (1951) and "Nelumgama" (1934). Lester's films, "Conquest in the Dry Zone" (1954) and "Be Safe or Be Sorry" (1955), ventured outdoors and embraced shooting in natural sunlight. This study aims to investigate whether Lester's documentary filmmaking approach served as a precursor to his feature films as part of the cinematic tradition of Lester James Peries. The research methodology involves a comparative analysis of how rural life and the environment were portrayed in Lester's documentaries produced for the government film unit before he embarked on making feature films. The parallels between his first feature film, "Rekhava" (1956), and the documentaries created prior to it align with Lester's assertion that his technical skills acquired under Ralph Keane's guidance, coupled with his own observations and understanding of the authentic Sri Lankan society, paved the way for locally-rooted feature filmmaking. Ultimately, this study reveals that despite Lester's upbringing in a more standard, Westernised society in the capital, he was able to create feature films that authentically represented the environment and people's lives in Sri Lanka, thanks to his technical expertise in documentary filmmaking and his in-depth knowledge gained from analysing the subjects within his documentaries.

**Keywords:** Documentary film, Feature film, Indigenization, Lester, Technical practice

# සෝමලතා සුබසිංහ ළමා නාට්‍ය නිර්මාණයේ දී වස්තු විෂය තෝරා ගැනීම සහ එය නිර්මාණශීලීව ඉදිරිපත් කිරීම සම්බන්ධව දක්වා තිබෙන ශක්‍යතා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (පුංචි අපට දැන් තේරෙයි ළමා නාට්‍යය ඇසුරෙන්)

පී. ඒ. එස්. එස්. කෞෂල්‍යා
කැලණිය විශ්වවිද්‍යාලය
passkaushalya@gmail.com

**සාරසංක්ෂේපය**

ළමා නාට්‍ය නිර්මාණයේ ප්‍රමුඛස්ථානය ගන්නා සෝමලතා සුබසිංහ, සීමිත වුවත් හරවත් ළමා නාට්‍ය සමූහයක් බිහි කරන්නට සමත් වූ තැනැත්තියකි. වස්තු විෂය තෝරා ගැනීම සහ නිර්මාණශීලීව ඉදිරිපත් කිරීම සම්බන්ධව සුබසිංහ දැක්වූ කුසලතාව ළමා නාට්‍ය පිටපත් සාර්ථක ව ඉදිරිපත් කරන්නට බලපා ඇතැයි අධ්‍යයනය කළ හැකි වේ. ළමා මනස වෙත සමීප වීමේ දී අන්‍ය රටකට ආවේණික වස්තු විෂයක් වුවත් ලාංකේය සමාජයේ දරුවාට යෝග්‍ය ආකාරයෙන් සම්පාදනය කරමින් නිර්මාණශීලීව ඉදිරිපත් කර ඇත්තේ කෙසේ ද යන්න සොයා බැලීම පර්යේෂණ ගැටලුවයි. මනෝවිද්‍යාත්මකව ළමා මනස හඳුනා ගනිමින් ඊට උචිත පරිදි නිර්මාණශීලී ව නාට්‍යය නිර්මාණය කර තිබේ ද යන්න ගවේෂණය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. එහිදී මුඛ්‍ය මූලාශ්‍රය වශයෙන් සුබසිංහගේ *පුංචි අපට දැන් තේරෙයි* නාට්‍ය පිටපත සහ එයට පදනම් වන ජනකතාව අධ්‍යයනය කෙරිණි. මෙහිදී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ පුස්තකාල නිරීක්ෂණය සහ ශාස්ත්‍රීය ලිපි, පර්යේෂණ නිබන්ධන ආශ්‍රය කෙරිණි. ක්ෂේත්‍රයේ ප්‍රාමාණික උගතුන් හමු වී සම්මුඛ සාකච්ඡා ආශ්‍රයෙන් ද තොරතුරු එක් රැස් කෙරිණි. නිර්මාණයක නිර්මාණශීලී බව තීරණය වීම සම්බන්ධ ව වස්තු විෂය ප්‍රබලව බලපෑම් කරන්නෙකි. නාට්‍ය පිටපත සම්බන්ධව ද එසේම ය. තමා නාට්‍යය ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වන පිරිසේ ස්වභාවය අනුව වස්තු විෂය තෝරා ගැනීම දක්ෂ නිර්මාණකරුවෙකුගේ ලක්ෂණයකි. සුබසිංහ එය ජය ගන්නට සමත් වී ඇති බව මෙම නාට්‍ය පිටපතෙන් පෙනී යන්නෙකි. ළමයා යනු කවරෙක් ද? ළමා මනසට යම් අදහසක් ඉදිරිපත් කිරීමේ දී ආමන්ත්‍රණය කරන්නට වඩාත් උචිත ක්‍රමවේදය කුමක් ද? යන්නට සුබසිංහ දැන සිටි බව නාට්‍ය පිටපත අධ්‍යයනයෙන් මෙන් ම දර්ශන අධ්‍යයනයෙන් ද නිගමනය කළ හැකි වේ. *පුංචි අපට දැන් තේරෙයි* ළමා නාට්‍යය නිර්මාණයට යොදාගත් වස්තු විෂයීය ජනකතාව දරුවාට විවිධාකාරයෙන් අසන්නට දකින්නට ලැබුණ ද, සුබසිංහ තම නාට්‍යය නිර්මාණයේ දී වස්තු විෂය වඩාත් නිර්මාණශීලී, කලාත්මක, උපදේශනාත්මක සහ අධ්‍යාපනික දැනුමකින් පෝෂණය කරමින් ජනකතාවට සාපේක්ෂව නව්‍යයත්වයකින් යුතුව ඉදිරිපත් කරන්නට සමත් වී ඇති බව නිගමනය කළ හැකි වේ. වස්තු විෂය නාට්‍යකරණයට නිර්මාණශීලී ව ඒකාබද්ධ කරගැනීමෙන් ළමා මනසට රසවින්දනය මෙන් ම ප්‍රඥාව ද නිර්මාණශීලී ව සමීප කළ හැකි බව මෙම නාට්‍යයෙන් නිරීක්ෂණය වේ.

**ප්‍රමුඛ පදඃ** අධ්‍යාපනය, නාට්‍ය, පුංචි අපට දැන් තේරෙයි නාට්‍යය, වස්තු විෂය, ළමා රසවින්දනය

# An Investigative Study of Somalatha Subasinghe's Ability to Choose the Subject Matter and Present it Creatively in Creating Children's Dramas (Based on the Children's Play "Punchi Apata Den Therei")

P. A. S. S. Kaushalya
University of Kelaniya
passkaushalya@gmail.com

**Abstract**

Somalatha Subasinghe, who takes the lead in creating children's drama, is a person who has managed to create a group of valuable children's drama scripts even though she is limited. It can be studied that Subasinghe's skill in choosing the subject matter and presenting it creatively has influenced the successful presentation of children's drama scripts. The research problem is to find out how the subject matter belonging to another country has been creatively presented in a suitable way for the child in Sri Lankan society. The aim of this research is to explore whether the play has been created appropriately by recognising the child's mind on a psychological aspect. There, as the main sources, Subasinghe's play script "*Punchi Apata den Therei*" and the folktale based on it were studied. Library observation, academic articles and research theses were consulted under qualitative research methodology. Information was also collected through interviews with authentic experts in the field. The subject matter is a strong influencer in determining the creativity of a creation. The same is true for the script. It is a characteristic of a skilled creator to choose the subject according to the nature of the people he hopes to present the play to. It is clear from this drama script that Subasinghe has managed to overcome it. It can be concluded from the study of the play script as well as from the study of the scenes that Subasinghe knew who the child was and the most appropriate method to address the child's mind in presenting a certain idea. Although the child gets to hear and see the folktale used in the creation of the children's drama "*Punchi Apata den Therei*", it is concluded that Subasinghe has managed to present the subject matter with more creative, artistic, instructional and educational knowledge in the compilation of her creation of the drama with an innovation compared to the folktale. It is observed from this drama that by creatively integrating the subject matter into dramatisation, the child's mind can be creatively approached with enjoyment as well as wisdom.

**Keywords:** Children's enjoyment, Drama, Education, Subject matter, The drama "Punchi Apata Den Therei"

# මැඩියා වන්නම ඇසුරින් රජරට වන්නම් සම්ප්‍රදායේ අප්‍රකට ගායන ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයක්

එස්. එම්. පී. එස් මුතුකුඩආරච්චි
සංගීතය හා නිර්මාණාත්මක තාක්ෂණ අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
pradeepmuthuku@gmail.com

**සාරසංක්ෂේපය**

දේශීය වන්නම් සම්ප්‍රදායක් වන රජරට වන්නම් සම්ප්‍රදායට අයත් ගායනා ශ්‍රී ලංකාවේ රජරට ප්‍රදේශය ආශ්‍රිත ව අසන්නට ලැබෙන අප්‍රකට, වැදගත් ගායන විලාසයකි. එසේ ම තවමත් ලේඛනගත ව නැති ජනප්‍රවාදයේ පවතින වන්නම් ගායන පෙළකි. වන්නම් සංඛ්‍යාව 21ක් ලෙස වන්නම් පටුනෙහි කියැවේ. මහනුවර යුගයේ කවිකාර මඩුවෙන් පැවතෙන්නෙකු වූ වාගොල්ලෑකඩ කිරිහාමි මොහොට්ටාල නැමැත්තා මෙම වන්නම් පෙළෙහි පැරණි උරුමක්කාරයා ලෙස හඳුන්වයි. ලයනල් රන්වල විසින් සිදුකරන ලද ක්ෂේත්‍ර අධ්‍යයනයක දී කහටගස්දිගිලියේ පහළ දිවුල්වැව මුදලිහාමි නැමැත්තෙකු විසින් ගයන ලද සාම්ප්‍රදායික ගායනා කිහිපයක් අතර මැඩියා වන්නම හමුවේ. රජරට වන්නම් සම්ප්‍රදායේ අප්‍රකට ගායන ලක්ෂණ මැඩියා වන්නම ඔස්සේ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. පර්යේෂණ ගැටලුව වූයේ ප්‍රකට ව පවතින උඩරට, පහතරට හා සබරගමු වන්නම් ගායන සම්ප්‍රදායන් ගෙන් රජරට වන්නම් ගායන සම්ප්‍රදාය වෙනස් වන්නේ ද යන්නයි. මෙය ගුණාත්මක පර්යේෂණ වර්ගයට අයත් සංගීත විද්‍යාත්මක අධ්‍යයනයකි. දත්ත එක්රැස් කිරීමේ දී ප්‍රාථමික මූලාශ්‍රය වූයේ මැඩියා වන්නම පටිගත කළ සාම්ප්‍රදායික ගායනයයි. ද්විතියික මූලාශ්‍රය ලෙස වන්නම් පිළිබඳ රචනා වී ඇති ලිපි ලේඛන අධ්‍යයනයට බඳුන් විය. දත්ත විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන්නේ මෙම ගායන විලාසය දැනට ලංකාවේ ප්‍රචලිත වන්නම් ගායන විලාසයන් ට වඩා බෙහෙවින් වෙනස් බවයි. කිසියම් තාල හෝ තිත් ක්‍රමයක් ඇසුරු කිරීම ප්‍රචලිත වන්නම් ශෛලීන්හි ප්‍රධාන ලක්ෂණය වුව ද, මෙම වන්නම් විලාසය අනාඝාතාත්මක ය. සමස්ත වන්නම මැඩියාගේ ජීවන චක්‍රය නිරූපණය වන පරිදි සරල, නිදහස් ශෛලියකින් ඉදිරිපත් කර තිබීම ද සුවිශේෂ වෙයි. ස්වර ස්ථාන 05කට ප්‍රධාන නාදමාලාව සීමා වුව ද, අර්ථ අවධාරණය කිරීමේ දී ඉහළ ස්වරස්ථාන දක්වා නාදමාලාව විහිදේ. ඒ අනුව මැඩියා වන්නම ඔස්සේ රජරට වන්නම් සම්ප්‍රදායේ ගායන ලක්ෂණ අධ්‍යයනය කිරීමේ දී එළඹිය හැකි අවසාන නිගමනය වූයේ එය ශ්‍රී ලාංකේය ජන ගායන ශෛලියක් වන ගද්‍ය ගායන ශෛලියේ ලක්ෂණ ප්‍රකට කරන බව යි.

**ප්‍රමුඛ පදඃ** අනාඝාතාත්මක, කවිකාර මඩුව, ගද්‍ය ගායන ශෛලිය, මැඩියා වන්නම, රජරට වන්නම්

# A Study on the Unique Oral Characteristics of the Rajarata Vannam Tradition Based on Madiya Vannama

S.M.P.S. Muthukudaarachchi
University of Sri Jayawardhanapura
pradeepmuthuku@gmail.com

**Abstract**

The Rajarata Vannam tradition, which is a local Vannam tradition, is an unknown and important singing style heard in the Rajarata area of Sri Lanka. Some of them are unrecorded legendary singing patterns that have been orally transferred from generation to generation for centuries. According to the literary sources, it is said that there are 21 Vannams. Vagollaakada Kirihami Mohottala, who was a descendant of the *Kawikara Maduwa* of the Kandyan period, is known as the ancient heir of this Vannams. During the field studies carried out in the 1970s, a few vannams were found in the possession of Katagasdigliye Pahaladivulweva Mudalihami. The aim of this research is to study the unfamous singing features of the Rajarata Vannam tradition through Madiya Vannama. The primary sources used for this research were the recordings of the vannam singing, while the books and articles were used as the secondary sources. While analysing the data, it appears that this singing style is very different from the present vannam singing styles in Sri Lanka. Although a certain rhythm or thith pattern is a distinguishing feature of popular Vannam genres, this Vannam has an unrhythmic singing style. The life cycle of the frog is presented in a simple way, which is another unique feature of this vannama. Although the association of a particular beat or dot pattern is the main characteristic of Vannam styles, this Vannam style of singing is atypical. Accordingly, while studying the oral characteristics of the Rajarata Vannam tradition through Madiya Vannama, the final conclusion that can be reached is that it reveals the features of the prose singing style.

**Keywords**: Kawikaara maduwa, Mediya vannama, Non-rhythmic, Prose singing style, Rajarata vannam

# ලාංකේය අංගම්පොර සටන් කලාවේ වර්තමාන මුහුණුවර පිළිබඳ අධ්‍යයනයක් (අතුරුගිරියේ පිහිටි ශ්‍රී ලංකා පාරම්පරික දේශීය සටන් කලා සංගමය ඇසුරෙනි)

එස්. රණවීර
නාට්‍ය සිනමා හා රූපවාහිනී අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
ranaweera.ssk@gmail.com

**සාරසංක්ෂේපය**

වසර එක්ලක්ෂ විසිපන්දහසක පමණ අතීතයක සිට පැවත එන අංගම්පොර සටන් කලාව ශ්‍රී ලංකාවට ආවේණික සටන් කලාවකි. වර්තමානය වන තෙක් ම විවිධ වෙනස්කම්වලට ලක් වෙමින් මෙම සටන් කලාව පැවත එන බව අධ්‍යයනය කළ හැකි ය. ලාංකේය අංගම්පොර සටන් කලාව වර්තමානයේ දී පවත්වාගෙන යාමට කටයුතු කරන ආයතනයක් වශයෙන් අතුරුගිරියේ පිහිටි ශ්‍රී ලංකා පාරම්පරික දේශීය සටන් කලා සංගමය හඳුනාගත හැකි ය. අංගම්පොර සටන් කලාව පවත්වාගෙන යාමට මෙම ආයතනය දරන ප්‍රයත්නය කෙතරම් දුරට සාර්ථක වී තිබේදැයි ගවේෂණය කිරීම මෙහි පර්යේෂණ ගැටලුව වේ. ලාංකේය අංගම්පොර සටන් කලාවේ වර්තමාන ප්‍රවණතා මොනවා ද?, නවීන ලෝකයට උචිත ආකාරයෙන් සකස් කරගෙන ඇත්තේ කෙසේ ද? මුහුණ දී ඇති අභියෝග කවරේ ද? සාම්ප්‍රදායික හරයන් කෙතෙක් දුරට ආරක්ෂා කරගෙන තිබේ ද? යනාදී කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පාරම්පරික දේශීය සටන් කලා සංගමය කෙතරම් දුරට සාර්ථක වී තිබේදැයි අධ්‍යයනය කිරීම පර්යේෂණ අරමුණ වේ. මෙහිදී ප්‍රාථමික දත්ත වශයෙන් ආයතනයේ ගුරුවරුන්ගේ සහ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන්ගේ සම්මුඛ සාකච්ඡා සහ ද්විතීයික දත්ත වශයෙන් පොත්පත් සහ අන්තර්ජාලය යොදා ගන්නා ලදී. අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමවේදය ඔස්සේ මේ සඳහා දත්ත විශ්ලේෂණය සිදු කරනු ලැබීය. මෙම ආයතනයෙන් අංගම්පොර සටන් කලාව ලාංකිකයන්ට මෙන් ම විදේශිකයන්ට ද පුරුදු පුහුණු කිරීම සිදු කෙරෙයි. පුහුණු කිරීම් ක්‍රමවේද වර්තමානයට උචිත අයුරින් හැඩගස්වා ඇති බව ද නිරීක්ෂණය විය. අංගම්පොර සටන් කලාව ක්‍රීඩාවක් වශයෙන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු ද මෙම ආයතනය මගින් සිදු කරමින් පවතින බව අධ්‍යයනය කළ හැකි විය. රජය හෝ ක්‍රීඩා කටයුතු සම්බන්ධ ආයතන ඇසුරෙන් අංගම්පොර සටන් කලාව නිසි නියාමනයකින් හා ක්‍රියා පටිපාටියකින් සංරක්ෂණය කළ යුතු බව මෙහි දී නිගමනය කළ හැකි වේ. ලොව පිළිගත් අනෙකුත් සටන් ක්‍රම මෙන් ම ලාංකේය අංගම්පොර සටන් කලාව ද ලෝකය හමුවේ විවර කිරීමට කටයුතු සිදු කළ යුතු ය.

**ප්‍රමුඛ පද:** අංගම්පොර, සංරක්ෂණ, සටන් කලා, සම්ප්‍රදාය, ශ්‍රී ලංකාව

# A Study of the Current Face of the Sri Lankan Angampora Martial Art (In Association with the Sri Lanka Traditional Indigenous Martial Arts Association in Athurugiriya)

S. Ranaweera
Department of Drama, Cinema and Television Studies
University of Kelaniya
ranaweera.ssk@gmail.com

**Abstract**

The Angampora martial art is a distinctive indigenous martial art with a heritage tracing back to 125,000 years in Sri Lanka. The evolution of this martial art reveals a continuous process of adaptation and transformation, which persists to the present day. The Sri Lanka Traditional Indigenous Martial Arts Association, situated in Athurugiriya, is an institution dedicated to preserving the traditional Sri Lankan martial art, Angampora. The research objective is to investigate the organisation's effectiveness in safeguarding and upholding the practice of Angampora. The research examines contemporary trends in Sri Lankan Angampora martial arts and its adaptation to the modern era. It also seeks to identify the challenges encountered in this process and assess the extent to which the traditional foundations of Angampora have been retained. Furthermore, the research objective is to evaluate the success of the Sri Lanka Traditional Indigenous Martial Arts Association in addressing these aspects and their impact on martial arts' preservation and development in the modern world. Primary data for the study were obtained through interviews conducted with instructors and senior students associated with the Sri Lanka Traditional Indigenous Martial Arts Association Institute, while secondary data consisted of relevant books and research articles. Data analysis was carried out utilising the content analysis method. This institution offers training in the Angampora martial arts to both Sri Lankan nationals and individuals from other countries. Moreover, the institute has adapted its training methodologies to align with contemporary practices and is actively conducting the necessary activities for promoting Angampora martial arts as a sport. In conclusion, the preservation of Angampora martial arts necessitates proper regulation and procedures, ideally overseen by governmental or sports-related institutions. Furthermore, it underscores the importance of promoting Angampora martial arts on the global stage, akin to other internationally recognised martial arts, thus fostering cultural exchange and appreciation.

**Keywords:** Angampora martial arts, Sri Lanka, Traditional martial arts, reservation, sports recognition

# ජයලත් මනෝරත්නගේ නාට්‍යයන්හි නිරූපිත පරිපීඩිත සමාජ පරිස්ථිතිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්
## (මහගිරිදඹ, කණේරු මල්, බූරුවා මහත්තයා, සෙල්ලම් නිරිඳු නාට්‍ය ඇසුරින්)

එරංග කෞශල්‍ය ගොඩකන්ද ආරච්චි,
erangakaushalya92@gmail.com

**සාරසංක්ෂේපය**

අසූව දශකයේ දී නාට්‍ය නිෂ්පාදනයට පිවිසි මනෝරත්න, මෙරට නාට්‍ය කලාවේ උන්නතියට දායකත්වය ලබා දුන් නාට්‍යකරුවෙකි. ඔහු රචනා කළ ස්වතන්ත්‍ර නාට්‍ය සංඛ්‍යාව දොළොසකි. ඒ අතුරින් *මහගිරිදඹ* (1980*), කණේරු මල්* (2000), *බූරුවා මහත්තයා* (2011), *සෙල්ලම් නිරිඳු* (2013) සාර්ථක ලක්‍ෂණ ප්‍රකට කරන නාට්‍ය නිර්මාණ කිහිපයකි. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ඉහත සඳහන් නාට්‍යයන්හි නිරූපිත පරිපීඩිත සමාජ පරිස්ථිතිය අධ්‍යයනය කිරීමයි. විවිධ සමාජ ස්තරවල ජනතාව පරිපීඩනයට ලක් වන ආකාරය මනෝරත්න නිරූපණය කර ඇති බව හඳුනා ගැනීමට හැකි වීම මෙම පර්යේෂණයේ වැදගත්කම යි. නාට්‍යකරුවා පරිපීඩිත සංකල්පය අර්ථ කථනය කරන ආකාරය හා උක්ත නාට්‍යවල කෙතෙක් දුරට පරිපීඩිත සමාජය නිරූපණය වන්නේ ද යන්න හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ මූලික ගැටලුව යි. පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය භාවිතයට ගැනුණි. ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ජයලත් මනෝරත්න රචනා කළ *මහගිරිදඹ, කණේරු මල්, බූරුවා මහත්තයා, සෙල්ලම් නිරිඳු* යන නාට්‍යයන්හි පිටපත් භාවිත කෙරුණි. ද්විතීයික මූලාශ්‍රය වශයෙන් පරිපීඩිත සමාජය සම්බන්ධයෙන් රචනා වූ විවිධ ග්‍රන්ථ හා ජයලත් මනෝරත්නගේ නාට්‍ය සම්බන්ධයෙන් රචනා වූ විවිධ විචාර ලිපි භාවිතයට ගැනුණි. *මහගිරිදඹ* නාට්‍ය සඳහා විෂය වන්නේ තරුණ නාට්‍යකරුවෙකුට මුහුණ පෑමට සිදුවන සමාජ -. ආර්ථික පීඩනයයි. *කණේරු මල්* නාට්‍යයෙහි මෙරට ගොවි ජනතාව කායික ව හා මානසික ව පරිපීඩනයට ලක් වන ආකාරය නිරූපණය වේ. *බූරුවා මහත්තයා* නාට්‍යයේ දී කම්කරු ජනතාවත්, ඔවුන් වෙනුවෙන් පෙනී සිටින බලවේගයන්ට අත්වන ඛේදනීය ඉරණමත් නිරූපණය කෙරෙයි. *සෙල්ලම් නිරිඳු* නාට්‍යය සඳහා පසුබිම් වන්නේ ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රාජ්‍ය සමයයි. රජු විවාහ කර ගන්නා 'සුමිත්‍රා' නම් විජාතික කුමාරිකාව නුපුරුදු සංස්කෘතික වපසරියක පරිපීඩනයට ලක්වන ආකාරය නිරූපණය වේ. උක්ත නාට්‍ය නිර්මාණයන්හි චරිත සමාජ, සංස්කෘතික, ආර්ථික හා දේශපාලනික හේතු පදනම් කරගෙන පීඩනයට පාත්‍ර වූවෝය. පරිපීඩිතභාවයෙන් මිදීම සඳහා ඔවුහු මරණය තෝරා ගැනීම හෝ අරගල කිරීමට හෝ පෙලඹෙති. කායික හා මානසික පරිපීඩිතභාවය පන්ති පරතරයක් නොමැතිව පවතින ආකාරය මෙහි දී නිරූපණය කෙරෙයි. පරිපීඩිතභාවයෙන් වියුක්ත සාධාරණ සමාජයක වටිනාකම ඉදිරිපත් කිරීමට මනෝරත්න උත්සාහ කර ඇති ආකාරය මෙම පර්යේෂණය මගින් තහවුරු වෙයි.

**ප්‍රමුඛ පදඃ** නාට්‍ය, පරිපීඩනය, මනෝරත්න, සංස්කෘතිය, සමාජය

# Analytical Study of the Oppressed Social Circumstances Depicted by Plays of Jayalath Manoratne
## (Through plays: *Mahagiridamba, Kaneru Mal, Buruwa Mahattaya, Sellam Nirindu*)

Eranga Kaushalya Godakanda Arachchi
erangakaushalya92@gmail.com

**Abstract**

Mr Jayalath Manoratne, a playwright who had commenced his productions in the 80th decade, made his contribution to upholding the drama industry. There are 12 plays which were solely composed by him, and out of those, *Mahagiridamba* (1980)*, Kaneru Mal* (2000)*, Buruwa Mahattaya* (2011) and *Sellam Nirindu* (2013) are a few plays which showed greater success traits. The objective of this research is to investigate the oppressed social circumstances depicted by the aforementioned plays. The research is significant as it distinguishes the approaches used by Manoratne to characterise the circumstances where different levels of society are oppressed. The main problem of this research focuses on identifying the playwright's definition of oppressed ideology and the extent to which the oppressed society is represented in aforesaid plays. Primary and secondary sources were used as the research methodology. The play scripts of *Mahagiridamba, Kaneru Mal, Buruwa Mahattaya* and *Sellam Nirindu* written by Jayalath Manoratne were used as primary sources while using few written sources related to the oppressed society and reviews related to Jayalath Manoratna's plays as secondary sources. Socio-economic difficulties faced by a young playwright is the subject matter of the play "*Mahagiridamba"* and the play "*Kaneru Mal"* signifies how the peasants of the country are oppressed mentally and physically. The tragic fate of labourers as well as their representative parties, are symbolised in "*Buruwa Mahattaya"* and the play "*Sellam Nirindu"* is based on the era of king *Sri Veera Parakrama Narendrasinghe*. This portrays how the foreign princess *Sumithra*, a queen of the king, is being oppressed because of her unfamiliar cultural background. The characters of the aforementioned plays had been oppressed for many reasons, such as social, cultural, economic and political. They tend to choose either death or struggle to get rid of the stress. This represents how physical and mental oppression rises despite the class gap. The attempt made by Jayalath Manoratne to illustrate the value of an unoppressed, fair society has been clearly identified by this research.

**Keywords:** Culture, Manoratne, Oppression, Society, Sri Veera Parakrama Narendrasinghe

# ප්‍රසන්න ජයකොඩිගේ '28' සිනමා කෘතියෙහි ස්ත්‍රීත්වය හා ලිංගිකත්වය නිරූපණයෙහි ලා උපයුක්ත සිනමාරූප භාවිතය පිළිබඳ අධ්‍යයනයක්

එච්. එම්. එස්. එස්. හේරත්
සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය
sarasiherath7@gmail.com

**සාරසංක්ෂේපය**

සිනමාව යනු කලාවන් අතර ලාබාලතම කලාවයි. නමුත් මිනිසාගේ ආරම්භයේ සිට බිහි වූ සකලවිධ කලාවන් එහි ගැබ් ව ඇත. නවකතා කෙටිකතා ආදි කලාවන්ගේ විශිෂ්ටත්වයට ඒවායේ භාවිත බස උපකාරී වන්නේ කෙසේ ද? ඒ අයුරින් ම සිනමා කෘතියක විශිෂ්ටත්වය උදෙසා එහි භාවිත සිනමාරූප වැදගත් කාර්යයක් ඉටු කරයි. සිනමාව යනු රූපය භාෂා මාධ්‍යය වශයෙන් යොදාගත් ප්‍රබල කලාවකි. සිනමා නිර්මාණයක දී රූප භාවිතය හෙවත් රූප ගොඩනගන ආකාරය මත සිනමා කෘතියේ විෂය මූලික අර්ථය විශද කරයි. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ප්‍රසන්න ජයකොඩිගේ '28' නමැති සිනමා කෘතියෙහි ස්ත්‍රීත්වය හා ලිංගිකත්වය නිරූපණය කිරීම උදෙසා යොදාගත් සිනමාරූප භාවිතය පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීමයි. පර්යේෂණ ගැටලුව වූයේ ස්ත්‍රියගේ සංවේදනා සජීවී ව රූපණය කරන්නට සිනමාවේදියා යොදාගත් රූපමය භාවිතයන්හි උචිත අනුචිත බව කෙබඳු ද යන්න සොයා බැලීමයි. මෙහි ප්‍රධාන භූමිකාව හොබවන සුද්දීගේ චරිතය තරුණියක්, බිරිඳක් හා සේවයේ නිරත ස්ත්‍රියක් වශයෙන් සිනමා තිරය මත දිගහැරේ. ඒ ඔස්සේ ස්ත්‍රීත්වය හා ලිංගිකත්වය හා බැඳුණු කරුණු මෙන් ම සංස්කෘතික රාමුව තුළ සිර ව සිටින ස්ත්‍රියගේ නොහැකියාවන් විදාරණය කරන්නට සිනමාවේදියා භාවිත කළ රූපමය සංසිද්ධි සුවිශිෂ්ට ය. මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ කරුණු එක් රැස් කරගත් අතර එහි දී ප්‍රසන්න ජයකොඩිගේ '28' සිනමා කෘතිය ප්‍රධාන මූලාශ්‍රය ලෙස යොදා ගනිමින් පූර්වෝක්ත විෂය හා සම්බන්ධ විචාර කෘති, අන්තර්ජාලය, සඟරා ලිපි ලේඛන ආදිය  ද්විතීයික මූලාශ්‍රය ලෙස යොදා ගනු ලැබුණි. සාර්ථක රූප භාවිතයක් මගින් සමාජය තුළ දුර්වල තැනක ස්ථානගත කර ඇති ස්ත්‍රී භූමිකාව හා ලිංගිකත්වය නිසා ස්ත්‍රිය පීඩාවට පත් වන අවස්ථා මනාව නිරූපණය කරන්නට සිනමාවේදියා සමත් ව ඇති බව පර්යේෂණය අවසානයේ එළඹිය හැකි නිගමනයයි.

**ප්‍රමුඛ පද :** ලිංගිකත්වය, ස්ත්‍රීත්වය, සිනමා කෘතිය, සිනමා රූප

# A Study on the Use of Cinematography in the Portrayal of Femininity and Sexuality in Prasanna Jayakodi's Movie' 28'

H.M.S.S. Herath
Department of Sinhala, University of Kelaniya
Sarasiherath7@gmail.com

**Abstract**

Cinema is the youngest of the arts. But all kinds of arts born from the beginning of man are embedded in it. How does the use of language contribute to the excellence of the arts, such as novels and short stories? In the same way, for the excellence of a work of thought, its use of cinematography plays an important role. Cinema is a powerful art that uses images as a medium of language. The basic meaning of the subject of the film is based on the use of images or the way images are constructed in a film. The purpose of this research is to conduct a study on the use of cinematography used to portray femininity and sexuality in Prasanna Jayakodi's movie '28'. The research problem was to find out the appropriateness of the imagery used by the cinematographer to vividly depict women's feelings. The character of Suddi, who plays the main role here, unfolds on the screen as a young woman, a wife and a working woman. In this way, the pictorial phenomena used by the filmmaker to reveal the issues related to femininity and sexuality as well as the inabilities of women trapped in the cultural framework, are excellent. For this study, a qualitative research method was used to collect data in which Prasanna Jayakodi's movie '28' was used as the main source and critical works related to the previous subject, internet, and magazine papers were used as secondary sources. The conclusion that can be reached at the end of the research is that the cinematographer has been able to portray well the situations where women are oppressed due to sex and the role of women in a weak position in the society through the use of successful images.

**Keywords:** Cinematic images, Cinematography, Femininity, Sexuality

# විදෙස් භාෂිත චිත්‍රපට හා මාලා නාටක (TV series ) සඳහා උපසිරැසි භාවිත කිරීම හා හඬකැවීම මුල් නිර්මාණය සඳහා කෙබඳු ආකාරයේ බලපෑමක් සිදු කරන්නේ ද යන්න පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

ඔෂාන් එන්. පියුමන්ත
නාට්‍ය, සිනමා හා රූපවාහිනී අධ්‍යයනාංශය
piumanthaoshan@gmail.com

**සාරසංක්ෂේපය**

සිනමාවට ඇත්තේ ඊට ම ආවේණික භාෂාවකි. එය රූපය හා ශබ්දය යන මූලික සංඝටක ද්වයේ එක්වීමෙන් නිර්මාණය වන අතර සංඥාර්ථවේදී ප්‍රවේශයන් ඔස්සේ අධ්‍යයනයට ලක්කළ හැකිවේ. සිනමා නිර්මාණවල නිෂ්පාදිත රට අනුව එහි අන්තර්ගත භාෂාව ද වෙනස් වේ. සිනමා භාෂාව සංඥාර්ථවේදී ප්‍රවේශයන් ඔස්සේ අවබෝධ කරගැනීමට හැකි වුව ද එහි අන්තර්ගත ව්‍යවහාරික භාෂාව අවබෝධ කරගැනීම එකී භාෂාව පිළිබඳ දැනුමක් නැත්තෙකුට පහසු නොවේ. දේශීය ප්‍රේක්ෂකයෝ විදෙස් භාෂිත නිර්මාණ රසවින්දනය කිරීමේ දී සිනමා ශාලා, රූපවාහිනී හෝ අන්තර්ජාල නැරඹුම් ප්‍රවේශ ආදී ක්‍රමෝපායන් භාවිත කරති. අන්තර්ජාලයෙන් බාගතකර භාවිතයට ගන්නා උපසිරැසි නිසා ප්‍රධාන ගැටලු කීපයක් උත්පාදනය වේ. කෙසේ ද යත් බොහෝ විදේශීය නිර්මාණයන් සඳහා සපයනු ලබන උපසිරැසි මුල් නිර්මාණයෙහි භාෂාත්මක අර්ථයට වඩා වෙනස් වීම හෝ අර්ථයට නොගැළපෙන ලෙසින් සකසා තිබීම නිසා හෝ මුල් නිර්මාණයේ මූලිකාර්ථය ප්‍රකාශනයේ දී ගැටලු ඇති වේ. එසේ ම උපසිරැසි නැරඹීමට අවධානය යොමුකිරීම නිසා සිනමා නිර්මාණය වෙත පූර්ණ අවධානය යොමු කිරීමට ඇති අවකාශය සීමා වීම ද ගැටලු සහගත ය. එසේ ම විදෙස් භාෂිත නිර්මාණ ප්‍රදර්ශනයේ දී හඬකැවීම් සිදු කිරීම අනුමත ක්‍රමවේදයකි. මේ ඔස්සේ සිනමා නිර්මාණයේ මූලික කතා ආඛ්‍යානය ප්‍රේක්ෂකයාට අවබෝධ වුව ද එහි සියුම් සිනමාත්මක සංඝටකයන් අවශෝෂණය කරගැනීමට ඇති හැකියාව අහිමි වේ. නිර්මාණ සඳහා හඬකැවීම සිදු කිරීමට ප්‍රථමයෙන් එය අදාළ භාෂාවට පරිවර්තනය කිරීමේ කාර්යයේ දී ද පරිපූර්ණ වශයෙන් ම මුල් නිර්මාණයෙහි අර්ථයට සර්වසම ව පරිවර්තනය වේ ද යන්න මෙන් ම බොහෝ විට පාත්‍ර වර්ගයාගේ තොල් චලනයන්ට අනුචිත ලෙසින් දෙබස් ඛණ්ඩයන් සකස් කිරීමට සිදුවීම නිසා මුල් නිර්මාණයෙහි මූලික ප්‍රකාශනයට යම්කිසි අන්දමකින් හානි සිදුවීම ද ගැටලුවක් බව මෙම පර්යේෂණ පත්‍රිකාව ඔස්සේ ඉදිරිපත් කෙරෙයි. මෙකී හේතුසාධක නිසා විදේශීය නිර්මාණයන් නැරඹීමේ දී එම භාෂාවන්ට සමීප නොවන ප්‍රේක්ෂකයන්ට නියමානුකූල ලෙස සිනමා පඨිතය රසවින්දනයට බාධාකාරී තත්ත්වයක් උද්ගත වේ. විදෙස් භාෂිත නිර්මාණයන් උදෙසා උපසිරැසි යෙදීම හා හඬකැවීම නිර්මාණයේ මූලිකාර්ථයට හානියක් ඇතිකරනු ලබන බව විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කිරීම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණයි. ඉහත මාතෘකාව පර්යේෂණාත්මක වශයෙන් අධ්‍යයනය කිරීම සඳහා ප්‍රශ්නාවලියක් ඔස්සේ දත්ත සම්පාදනය කරගන්නා අතර, විෂය මූලික ව සම්පාදිත කෘති හා විෂය සම්බන්ධ ප්‍රාමාණික විද්වතුන්ගේ අදහස් ඔස්සේ එය විශ්ලේෂණය කිරීමට අපේක්ෂිත ය.

**ප්‍රමුඛ පද**: උපසිරැසි, ප්‍රේක්ෂකයා, සිනමා රසවින්දනය, භාෂාව, හඬකැවීම

# An Analytical Study on the Effect of Subtitling and Dubbing on Foreign Language Films and TV Series

Oshan N. Piumantha
Department of Drama, Cinema and Television
Piumanthaoshan@gmail.com

**Abstract**

Cinema has its own unique language. It is created by combining the two basic components of image and sound and can be studied through semiotic approaches. According to the country of the original production of a movie or a TV series, the language contained in it also changes. Although it is possible to understand the language of movie through semiology approaches, in order to understand the original spoken language contained in it, there must be an understanding of that language. Local audiences use methods such as cinemas, television or internet access (OTT) to enjoy foreign language productions. Subtitles downloaded and used from the internet cause several major problems. However, because the subtitles provided for many foreign productions are different from the linguistic meaning of the original production or are arranged in a way that does not match the meaning, problems arise in watching the original production's original meaning. It is also problematic to limit the time to pay full attention to the movie or the TV series by focusing on watching subtitles. Also, dubbing is an accepted method of screening and distribution of foreign language productions on television and OTT platforms. In this way, even if the audience understands the basic narrative of the creation, the ability to absorb its subtle cinematic components is lost. Before dubbing works, there is a problem of translating it into the relevant language and whether it is perfectly translated to the meaning of the original work. It is presented through this research paper that the basic expression of the original work is damaged in some way due to having to adjust the dialogue segments to suit the character's lip movements. Due to these reasons, when watching foreign productions, the audiences who are not close to those languages have an obstacle to enjoying the creations properly. The main purpose of the study is to analytically present that the application of subtitles and dubbing for foreign language productions is harmful to the main purpose of the production. Data is collected through a questionnaire to study the topic experimentally, and it is based on the works compiled on the subject, and the opinions of authentic scholars related to the subject are analysed.

**Keywords**: Cinema audience, Cinema enjoyment, Dubbing, language, subtitles

# දේශීය නර්තන රංගවස්ත්‍රාභරණ නිර්මාණය වීමෙහිලා බලපෑ ඉන්දීය ආභාසය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එස්. ඒ. ජී. කාවින්ද්‍යා
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය.
sakavindya@gmail.com

**සාරසංක්ෂේපය**

ලාංකේය සංස්කෘතියේ නර්තන කලාවට සුවිශේෂ ස්ථානයක් හිමි ව තිබේ. උඩරට, පහතරට සහ සබරගමු වශයෙන් මෙරට ප්‍රධාන නර්තන සම්ප්‍රදායයන් ත්‍රිකයකි. අතීතයේ දී නර්තනය තොවිල්, දේවාල නැටුම් සහ රාජ රාජ මහාමාත්‍යාදීන්ගේ ගමන් බිමන් සඳහා ද විවිධ උත්සව සඳහා මෙන් ම අභිචාර විධි උදෙසා ද යොදා ගැනිණ. මෙම නර්තනමය අවස්ථාවන්හි දී නර්තන ශිල්පීහු විවිධ රංගවස්ත්‍රාභරණයන් උපයෝගී කරගනිති. මුල් කාලීනව සාම්ප්‍රදායික නර්තනය පුරුෂ පාර්ශ්වයට පමණක් ආවේණික ව පැවතුණ ද පසුකාලීන ව කාන්තාවෝ ද නර්තන කලාවට ප්‍රවිෂ්ට වූහ. දේශීය නර්තන ඇඳුම් පැළඳුම් නිර්මාණය වීමෙහි ලා ඉන්දීය ආභාසයේ බලපෑම කෙබඳු ද යන්න අප පර්යේෂණ ප්‍රස්තුතයෙන් විමසා බැලෙයි. දේශීය සාම්ප්‍රදායික නර්තන ඇඳුම් පැළඳුම් උදෙසා විවිධ හේතූන් ඔස්සේ ඉන්දියානු ආභාසය ලැබී ඇති නමුත් නූතනය දක්වාම දේශීයත්වය ද ආරක්ෂා කර ගැනීමට හැකි වී ඇති බව උපන්‍යාස කොටගති. දේශීය නර්තන කලාවට බලපෑ ඉන්දීය ආභාසයෙහි කාලානුක්‍රමික විවිධතා මත රංගවස්ත්‍රාභරණ වෙනස්වීම පිළිබඳ අධ්‍යයනය අප පර්යේෂණ ප්‍රස්තුතයේ මුඛ්‍ය පරමාර්ථය වන අතර දේශීය නර්තන රංග වස්ත්‍රාභරණ පිළිබඳ පුරාවිද්‍යාත්මක සාධක අධ්‍යයනය කිරීම පර්යේෂණ උප අරමුණ වේ. ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදයට අනුගතව අප පර්යේෂණය සිදුකෙරිණ. සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනය සහ සම්මුඛ සාකච්ඡා ඔස්සේ දත්ත එක්රැස් කෙරුණු අතර තාර්කික විශ්ලේෂණයට අනුගතව නිගමන කරා එළැඹිණ. ඒ අනුව ලාංකේය විවිධ රාජධානි සමයන්හි දෙරට අතර සිදු වූ රාජකීය විවාහයන් සහ නායක්කර් වංශික රාජකීය බලපෑම් මෙන් ම ලාංකේය සිනමාවේ ආරම්භක යුගයේ දී ඉන්දීය ලක්ෂණ අන්තර්ගත වීමත් ලාංකේය නර්තන රංග වස්ත්‍රාභරණයන්ට ඉන්දීය ආභාසය ලැබීමට හේතු වූ බව විද්‍යමාන විය. තවද ලාංකේය දේවාල නර්තනයන්හි මූලාරම්භයේ සිට ම ඉන්දීය ලක්ෂණ අන්තර්ගත ව පැවතීමත්, පසුකාලීන ව මෙරට නර්තන ශිල්පීන් අධ්‍යාපනය ලැබීම සඳහා ඉන්දියාවට යාමේ ප්‍රවණතාවයත් හේතුවෙන් ඉන්දීය ආභාසය දේශීය නර්තන රංගයට මෙන් ම වස්ත්‍රාභරණයන්ට ද සුසංයෝග වූ බව විශද විය.

**ප්‍රමුඛ පද:** ඉන්දීය ආභාසය, දේවාල නර්තනය, නර්තන රංගවස්ත්‍රාභරණ, නර්තන රූකම්, සාම්ප්‍රදායික නර්තනය

# An Investigative Study of Indian Influences in the Creation of Native Dance Costumes

S.A.G. Kavindya

University of the Visual & Performing Arts

sakavindya@gmail.com

## Abstract

Dancing has a significant importance in the Sri Lankan culture. There are three main dance traditions in our country. They are known as Up Country Dance, Low Country Dance and Sabaragamuwa Dance. In the past, dance was used for different purposes. Since ancient times, dance has been used for various royal functions, festivals and rituals. The costume is the best way of expressing the idea of the dance. In the past, traditional dance was restricted only to men, but nowadays, women are also involved in the dance. Accordingly, the problem of this research is how Indian influence aspires to the creation of local dance costumes. Traditional dance costumes have been inspired by India for various reasons. However, our traditional traits were also assumed to be preserved. The primary objective of our research is to study the changes in the Indian influence that influenced the local dance art and native dance costumes at different times. The other research objective is to study the archaeological influence of local dance costumes on local dance traditions. Data was collected through the study of primary and secondary sources and interviews. This research follows historical research methodology. Conclusions were drawn following the logical analysis method. Consistently, the royal marriages between the two countries during different kingdoms and the influence of the Nayakkar dynasty led to the Indian influence on Sri Lankan dancing clothing. Also, it was concluded that the presence of Indian characteristics in temple dances and the dancers going to India for education also influenced it.

**Keywords -** Dance costumes, Dancing statues, Devala dance, Indian inspiration, Traditional dance

# සිංහල සංස්කෘතික අභිචාරයන්හි සමාජ ඥානනය ; සොකරි ගැමි නාටකය පදනම් කරගත් විමර්ශනාත්මක අධ්‍යයනයක්

බී. එම්. ටී. එල්. බාලසූරිය[1]
සමාජ විද්‍යා අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා භාෂා පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
bmtlakruwan@gmail.com
බී.එම්.සී. මධුසංඛ බණ්ඩාර[2]
මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, සමාජවිද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
madusankabandaranayaka42@gmail.com

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ පැරණි ම ජන නාටක විශේෂය වන සොකරි වනාහි සමාජයේ විවිධ චරිත අනුකරණයෙන් හාස්‍යෝත්පාදකව කතාව නිරූපණය වන්නකි. ගැමි ජනයා අතර ප්‍රචලිත වූ ස්වාධීන දේශීය කලා අංගයක් මෙන් ම යාතු කර්මයක් වශයෙන් ද සොකරි ජන නාටකය හැඳින්වේ. ඒ අතරින් අභිචාරාර්ථ සංකල්ප සමාජය විසින් නිවැරදි ව ඥානනය නොකිරීම සහෘද රසවින්දනයට බලපෑමක් ව පවතී. සොකරි ගැමි නාටකයෙන් නිරූපිත අභිචාරාර්ථ සංකල්පය වර්තමාන සමාජය විසින් ඥානනය කෙරෙන ආකාරය පිළිබඳ විමර්ශනය කිරීම අධ්‍යයනයේ මුඛ්‍ය අරමුණ වේ. සංස්කෘතියේ ඇදහිලි සහ විශ්වාස සොකරි ගැමි නාටකය මගින් නිරූපණය කෙරෙන ආකාරය අධ්‍යයනය කිරීම සහ සංකීර්ණ සමාජ සංදර්භය වෙත ගැමි සමාජ ලක්ෂණ ඉදිරිපත් කිරීම සඳහා ගැමි නාටකය යොදා ගැනීම පිළිබඳ ව විමර්ශනය කිරීම අධ්‍යයනයේ අනු අරමුණු වේ. විමර්ශනාත්මක පර්යේෂණ ක්‍රමවේදය අධ්‍යයනය සඳහා යොදාගෙන ඇත. අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත ප්‍රදේශය සහ පුත්තලම දිස්ත්‍රික්කයේ ආණමඩුව ප්‍රදේශය තෝරාගෙන ඇත්තේ එම ගැමි ශෛලිය බහුල ව ම ප්‍රචලිත වී ඇති බැවිනි. පංගු නියැදීම යටතේ ප්‍රදේශ ද්විත්වයෙන් ම පනස්දෙනෙකු බැගින් සියදෙනෙකු පර්යේෂණයට සම්බන්ධ කරගෙන ඇත. ප්‍රාථමික දත්ත මූලාශ්‍රය යටතේ ව්‍යුහගත ප්‍රශ්නාවලිය සහ සම්මුඛ සාකච්ඡා හයක් යොදා ගැනුණි. ද්විතීයික දත්ත මූලාශ්‍රය යටතේ පොත්පත්, පුවත්පත්, සඟරා සහ පර්යේෂණාත්මක අධ්‍යයනයන් යොදා ගැනුණි. විනෝදාස්වාදය ලබා දීම, කෘෂිකර්මාන්තයේ දී වගාවට අවශ්‍ය සශ්‍රීකත්වය හා සෞභාග්‍ය උදා කිරීම ප්‍රධාන පරමාර්ථ කරගනිමින්, කමත ප්‍රධාන රංග භූමිය කරගත් සොකරි ගැමි නාටකය සිංහල ජන සමාජයේ අභිචාර සම්බන්ධ ජන සම්මතයන් මුල් කරගනිමින් රඟ දැක්වෙන්නකි. එහි ගැමි වහරේ එන අධිවිශ්වාස, දේවවාදී සංකල්පය ඉස්මතු කරන්නකි. පත්තිනි දේවිය, කාලි මෑණියන් පිළිබඳ කථාංගය ඉස්මතු කරන අතර, සොකරි, ගුරුහාමි, පරයා, වෙදරාළ, සොත්තානා යන චරිත තුළින් සමාජාකල්ප ප්‍රතිනිර්මාණය කෙරෙයි. ගැමි ජීවන ස්වභාවය ඉස්මතු කිරීම, ගම්මානයේ ඉදිරි පැවැත්ම, කිරි සිහිනය සහ පොදුවේ දේව ආශිර්වාදය ලබා ගැනීම සඳහා සොකරි ගැමි නාටකය රඟ දැක්වීම අධ්‍යයන ප්‍රතිඵල අතර වැදගත් වේ. සිංහල ගැමි සංස්කෘතිය ඔප්නැංවීම සඳහා වර්තමානය වන විටත් සොකරි ගැමි නාටකය රඟ දැක්වෙන අතර, එහි රඟ දැක්වීම්, කවි ගායනා, දෙබස් ඛණ්ඩ ප්‍රාදේශීය වශයෙන් සුළු වෙනස්කම් සහිත ව ඉදිරිපත් කරන අතර, ස්ත්‍රී සහ පුරුෂ චරිතාංග ලක්ෂණ, දුර්වලතා, ගැමි සමාජ ලක්ෂණ හාස්‍යෝත්පාදනය සමඟ රංගනයේ යෙදුන ද වර්තමානයේ එහි රසිකත්වය අනුව ධනාත්මක හා ඍණාත්මක සමාජාකල්ප පවතින බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද:** අභිචාරාර්ථ සංකල්පය, ගැමි ලක්ෂණ, සමාජ ඥානනය, සිංහල සංස්කෘතිය, සොකරි ගැමි නාටකය

# Social Awareness of Sinhala Cultural Practices; An Investigative Study Based on Sokari Folk Drama

B.M.T.L. Balasuriya[1]
Department of Sociology, Faculty of Social Sciences and Languages, Sabaragamuwa University of Sri Lanka
bmtlakruwan@gmail.com
B.M.C. Madhusankha Bandara[2]
Department of Humanities, Faculty of Sociology and Humanities, Rajarata University of Sri Lanka
madusankabandaranayaka42@gmail.com

**Abstract**

Sokari is the oldest folk drama in Sri Lanka, which portrays a story in a humorous way by imitating various characters in the society. Sokari folk drama is known as an independent local art form as well as a ritual popular among the villagers. The society's lack of proper understanding of these ritual concepts has an effect on the enjoyment of this folk drama. The main aim of the study is to investigate how the concept of rituals depicted in Sokari folk drama is understood by today's society. The sub-objectives of the study are to study the manner in which the rituals and beliefs of the culture are portrayed in Sokari folk drama and to investigate the use of folk drama to present the characteristics of the village society to a complex social context. The research question of the present study focuses on how the rural social belief concepts depicted in Sokari play are reflected in today's society. Exploratory research methodology has been used for the study. Haguranketha area of Kandy district and Anamaduwa area of Puttalam district have been chosen as the study area because folk art is widely popular in those areas. One hundred fifty people from each of the two areas have been involved in the research under stratified sampling. Structured questionnaire and 6 interviews were used as primary data sources. Books, newspapers, magazines and experimental studies were used as secondary data sources. With the main objectives of providing entertainment, and bringing about the fertility and prosperity needed for cultivation in agriculture, the Sokari village drama, which is staged on the threshing floor, is based on the folk norms of the Sinhala society. It is a highlight of the superstitious, theistic concept that comes from the villagers. Goddess Pattini and Kali are highlighted in this story while the social attitudes are recreated through the characters of *Sokari, Guruhami, Paraya, Vedarala*, and *Sottana*. Among the study results, it was found that the performance of Sokari drama is used to highlight the nature of village life, to ensure good fortune to the village and fertility of women and, in general, to seek God's blessings. *Sokari* drama is still performed to enhance the Sinhala village culture, and its performances, poems, and dialogues are presented with minor regional variations, and although the female and male character traits, weaknesses, and village social characteristics are played with humor, nowadays, tt can be concluded that there are positive and negative social attitudes depending on fandom.

**Keywords:** Abhicharartha, Sinhala Culture, Social Knowledge, Sokari folk Drama, Village Characteristics

# යුරිපිඩීස්ගේ බැකී නාට්‍යයෙහි විද්‍යමාන මනෝවිද්‍යාත්මක ප්‍රවේශය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එස්. පී. සසින්ද ගිම්හාන් ප්‍රේමකුමාර
sasindagimhan@gmail.com

**සාරසංක්ෂේපය**

සම්භාව්‍යත්වයෙහි ලා සැලකෙන ග්‍රීක නාට්‍ය කලාව ලොව පැරණි ලිඛිත සාධක සහිත කලා සම්ප්‍රදායක් වශයෙන් ඇගයුමට ලක් කෙරේ. වත්මනෙහි ශේෂ ව පවත්නා සෑම ග්‍රීක නාට්‍යයක් ම පාහේ පුරාණ ග්‍රීක රාජ්‍යයෙහි ඇතැන්ස් නගරය ආශ්‍රිත ව නිපන් බවට විචාරකයෝ මත පළ කරත්. මෙහි ලා වෙසෙසින් ම ග්‍රීක ශෝකෝත්පාදක නාට්‍ය කලාව බහුතර විචාරක අවධානයට පාත්‍ර වූවකි. එය මානව සමාජයත්, ලෝක ස්වභාවයත් කලාත්මක රීතියකින් ප්‍රත්‍යුත්පාදිත කලාවකි. සම්භාව්‍ය ග්‍රීක සමාජ සංස්ථාව මගින් විශ්වයට දායාද කළ ශෝකෝත්පාදක නාට්‍යමය සෞන්දර්ය ධාරාවෙහි විද්වත් සම්භාවනාවට පාත්‍ර වූ අවසන් පුරෝගාමියා යුරිපිඩීස් (ක්‍රි.පූ. 480 - 406) වන්නේය. පූර්වජ නාට්‍ය රචකයින්ගේ විඥානධාරාවට අනුගත නොවූ කලාත්මක ප්‍රත්‍යුත්පාදනයෙහි ව්‍යාවෘත වීමේ දී ස්වාධීන රීතියක් අනුගමනය කළ රචකයෙකු වශයෙන් ද යුරිපිඩීස් නම් ශ්‍රේෂ්ඨ නාට්‍ය රචකයා හැඳින්විය හැකිය. ග්‍රීක නාට්‍ය කලාව ආශ්‍රිත ව සම්භාවනාවට පාත්‍ර වූ නාට්‍යයක් වශයෙන් යුරිපිඩීස්ගේ *බැකී* නාට්‍යය හැඳින්විය හැකිය. *බැකී* නාට්‍යය සඳහා අනුභූතිය සපයන ලද්දේ දියෝනීසස් පුරාවෘත්තයයි. ග්‍රීක චින්තනයට අනුව දියෝනීසස් යනු ග්‍රීක දේව මණ්ඩයෙහි සශ්‍රීකත්වය, රහමෙරවලට හා ආධ්‍යාත්මික මානව සංවේදනාවලට සංකේතයක් බැව් විද්වත්හු පෙන්වා දෙති. කතා පුවතට අනුව දියෝනීසස් තමා හා යාතු කර්ම පිළිබඳ හඳුන්වා දීම සඳහා ග්‍රීසියට එළඹීමත් සමඟ ආචිර්ණකල්පික මත හා දියෝනීසස් දේවවන්දනය පිළිබඳ ව උභතෝකෝටිකයක් පැන නැගේ. එකී උභතෝකෝටිකය අබිමුව *බැකී* නාට්‍යයෙහි මනෝවිද්‍යාත්මක ප්‍රවේශයක් විද්‍යමාන වේ. ඒ අනුව යථෝක්ත නාට්‍යයෙහි මනෝවිද්‍යාත්මක පසුබිම නිරූපණය වන්නේ කෙසේ ද යන්න මෙහි පර්යේෂණ ගැටලුවයි. එහි ලා යුරිපිඩීස්ගේ *බැකී* නාට්‍යයයේ ප්‍රමාණික සිංහල පරිවර්තනය ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් හා මනෝ විද්‍යාත්මක මූලධර්ම පිළිබඳ ව රචිත විචාර ග්‍රන්ථ ද්විතීයික මූලාශ්‍රය වශයෙන් ගෙන සිදු කළා වූ සාහිත්‍යමය දත්ත විශ්ලේෂණයක් මෙහි පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් භාවිත කෙරිණි. මෙම පර්යේෂණයෙන් අනාවරණය වූ පරිදි සිග්මන්ඩ් ෆ්‍රොයිඩ්ගේ මනෝ විශ්ලේෂණවාදය ප්‍රධාන පශ්චාත් ෆ්‍රොයිඩියානු සහ නව ෆ්‍රොයිඩියානු මනෝවිද්‍යා ප්‍රවේශයන්ට අදාළ මනෝ විද්‍යාත්මක ප්‍රවේශයක් යථෝක්ත දෘශ්‍ය කාව්‍යයෙහි ප්‍රතීයමාන වන බව හඳුනා ගත හැකිය.

**ප්‍රමුඛ පද :** ග්‍රීක නාට්‍ය සම්ප්‍රදාය, පශ්චාත් ෆ්‍රොයිඩියානු මනෝවිද්‍යා ප්‍රවේශය, බැකී නාට්‍යය, මනෝවිශ්ලේෂණවාදය, නව ෆ්‍රොයිඩියානු මනෝවිද්‍යා ප්‍රවේශය

# An Investigative Study of the Psychological Approach Evident in Euripides' Play Bacchi

S.P. Sasinda Gimhan Premakumara
sasindagimhan@gmail.com

**Abstract**

Classical Greek theatre is considered one of the oldest documented art traditions in the world. Critics claim that almost every Greek drama that exists today was born in the city of Athens in the ancient Greek kingdom. Among them, Greek tragic drama has received the attention of most critics. It is an art that reproduces human society and the nature of the world by an artistic rule. Euripides (480 - 406 BC) was the last scholarly pioneer of the tragic dramatic aesthetic bequeathed to the universe by classical Greek society. The great playwright Euripides can be called as a writer who followed an independent rule in the development of artistic reproduction that did not adhere to the ideology of the predecessor playwrights. Euripides' Bacchi can be called as a famous play in Greek drama. The legend of Dionysus provided the inspiration for Bacchi. Scholars point out that according to Greek thought, Dionysus is a symbol of fertility, alcohol and spiritual human feelings in the Greek pantheon. According to the story, when Dionysus arrived in Greece to introduce himself and the rituals, a dilemma arose between the philosophical views and the worship of gods by Dionysus. Against that dilemma, a psychological approach is evident in the play. Accordingly, the research problem here is how the psychological background of the fictional drama is depicted. A literary data analysis was used as the research methodology, which was done by taking the original Sinhala translation of Euripides' play Bacchi as the primary source and the critical books written on psychological principles as the secondary source. As revealed in this research, Sigmund Freud's psychoanalyticism can be identified as a psychological approach related to the main post-Freudian and neo-Freudian psychological approaches reflected in actual visual poetry.

**Keywords**: Bacchi drama, Greek drama tradition, Neo-Freudian approach to psychology, post-Freudian approach to psychology, psychoanalysis

# ජනප්‍රිය සංස්කෘතිය ප්‍රවර්ධනය සඳහා රූපවාහිනී මාධ්‍යයේ බලපෑම

නිසල් ශානක අබේසිංහ[1]
කැලණිය විශ්වවිද්‍යාලය
nisalabesinghe@gmail.com

**සාරසංක්ෂේපය**

මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් අධ්‍යයනය කරනු ලබන්නේ රූපවාහිනී මාධ්‍යය සහ ජනප්‍රිය සංස්කෘතිය ප්‍රවර්ධනය අතර ඇති සංකීර්ණ සම්බන්ධතාව පිළිබඳ ව යි. රූපවාහිනී නාලිකා සහ වැඩසටහන් ජනප්‍රිය සංස්කෘතියට සක්‍රිය ව ප්‍රවර්ධනය කරන සහ බලපෑම් කරන යාන්ත්‍රණයන් ගවේෂණය කිරීම සඳහා මාධ්‍ය අධ්‍යයනය, සමාජ විද්‍යාව සහ සංස්කෘතික විශ්ලේෂණවලින් උපුටා ගනිමින් මෙම අධ්‍යයනය බහුවිධ ප්‍රවේශයක් ඔස්සේ සිදු කර ඇත. මෙම පර්යේෂණයෙහි ප්‍රධාන අරමුණ වන්නේ ජනප්‍රිය සංස්කෘතිය ප්‍රවර්ධනය සඳහා රූපවාහිනී මාධ්‍යයේ බලපෑම හඳුනා ගැනීමයි. රූපවාහිනියේ ජනප්‍රිය සංස්කෘතිය ප්‍රවර්ධනය පිළිබඳ පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා, ගුණාත්මක හා ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රම දෙක ම ඒකාබද්ධ කරමින් මිශ්‍ර ක්‍රමවේදයක් භාවිත කර ඇත. අන්තර්ගත විශ්ලේෂණය, සමීක්ෂණ, ප්‍රශ්නාවලි හා ගැඹුරු සම්මුඛ සාකච්ඡා ක්‍රම ඔස්සේ දත්ත රැස් කරන ලදී. රූපවාහිනියේ ජනප්‍රිය සංස්කෘතිය ප්‍රවර්ධනය පිළිබඳ අධ්‍යයනයෙන් කැපී පෙනෙන ප්‍රතිඵලයන් කිහිපයක් ලෙස, ජනප්‍රිය සංස්කෘතිය හැඩගැස්වීමේ දී සහ බෙදා හැරීමේ දී රූපවාහිනිය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන බව නිරීක්ෂණය විය. විවිධ රූපවාහිනී වැඩසටහන්වල අන්තර්ගත විශ්ලේෂණයන්ගෙන් විලාසිතා ප්‍රවණතා, ප්‍රබන්ධ වාක්‍ය ඛණ්ඩ සහ සංස්කෘතික යොමු කිරීම් වැනි ජනප්‍රිය සංස්කෘතික අංග නිතර ආඛ්‍යානයට අනුකලනය වී ඒවා ප්‍රේක්ෂකයින් අතර ඵලදායී ලෙස සාමාන්‍යකරණය කර ජනප්‍රිය කරන බවට පැහැදිලි විය. ප්‍රේක්ෂක පිළිගැනීමෙන් හෙළි වූයේ නරඹන්නන් බොහෝ විට රූපවාහිනිය ඔවුන්ගේ ම සංස්කෘතියේ සහ සමාජයේ පිළිබිඹුවක් ලෙස දකින බවයි. ඔවුන් අන්තර්ගතය සමඟ ක්‍රියාකාරී ව සම්බන්ධ වන අතර, ඔවුන්ගේ ම අත්දැකීම් සමඟ අනුනාද වන චරිත සහ කථාංග සමඟ චිත්තවේගීය සම්බන්ධතා ගොඩනඟා ගනී. මෙයින් ඇඟවෙන්නේ රූපවාහිනිය කැඩපතක් සහ සංස්කෘතියේ හැඩගැන්වීමක් ලෙස ක්‍රියා කරන බවත්, පුද්ගලයන් තමන් සහ ඔවුන්ගේ ප්‍රජාවන් දකින ආකාරය කෙරෙහි බලපෑම් කරන බවත් ය. තව ද, අධ්‍යයනයෙන් පෙනී ගියේ රූපවාහිනියේ බලපෑම හුදෙක් විනෝදාස්වාදයෙන් ඔබ්බට විහිදෙන බවයි. රූපවාහිනියෙන් ජනප්‍රිය සංස්කෘතික ප්‍රවර්ධනය හා පාරිභෝගික හැසිරීම් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. එය "නිෂ්පාදන ස්ථානගත කිරීමේ" වෙළඳ ප්‍රචාරණ උපාය මාර්ගවල වර්ධනයෙන් පැහැදිලි වේ. නරඹන්නෝ බොහෝ විට ඔවුන්ගේ ප්‍රියතම රූපවාහිනී චරිතවල ජීවන රටාවන් සහ මනාපයන් අනුකරණය කරති. එය පාරිභෝගිකවාදය සහ සන්නාම පක්ෂපාතිත්වය වැඩි කිරීමට හේතු වේ. අවසාන වශයෙන්, මෙම පර්යේෂණය ජනප්‍රිය සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම සහ හැඩගැස්වීම සඳහා රූපවාහිනිය විසින් ඉටුකෙරෙන වැදගත් කාර්යභාරය ඉස්මතු කරයි.

**ප්‍රමුඛ පද:** ජනප්‍රිය සංස්කෘතිය, ජනමාධ්‍යය, මාධ්‍යය, රූපවාහිනිය, සංස්කෘතිය

# The Influence of Television Media on the Promotion of Popular Culture

Nisal Shanaka Abeysinghe[1]
University of Kelaniya
nisalabesinghe@gmail.com

**Abstract**

This research investigates the intricate relationship between television media and the dissemination of popular culture. Adopting a multidisciplinary approach, this study draws upon insights from the fields of media studies, sociology, and cultural analysis to dissect the intricate mechanisms through which television channels and programs actively promote and wield influence over popular culture. The main objective of this research is to discern the profound impact of television media on the promotion of popular culture. To facilitate a comprehensive inquiry into the promotion of popular culture on television, a mixed methods research approach was employed, encompassing both qualitative and quantitative research methodologies. Data collection involved rigorous content analysis, surveys, questionnaires, and in-depth interviews. Key findings emerging from the investigation of the promotion of popular culture on television underscore television's pivotal role in shaping and disseminating popular culture. Analysis of various television programs reveals the recurrent integration of popular culture elements, including fashion trends, catchphrases, and cultural references, seamlessly interwoven into narrative contexts, effectively engendering their widespread popularisation among diverse audiences. Audience responses illuminate that viewers frequently perceive television as a reflective prism of their own culture and society. They actively engage with the content, forging emotional connections with characters and episodes that resonate with their own experiences. This implies that television functions both as a mirror and a shaper of culture, significantly impacting the manner in which individuals perceive themselves and their communities. Moreover, the research reveals that television's influence transcends the realm of mere entertainment. The promotion of popular culture on television undeniably leaves an indelible imprint on consumer behaviour, exemplified by the proliferation of "product placement" advertising strategies. Viewers often emulate the lifestyles and preferences of their cherished TV characters, resulting in heightened consumerism and unwavering brand loyalty. In conclusion, this research underscores the pivotal role that television plays in the promotion and moulding of popular culture. It highlights the intricate interdependence between television and society, emphasising the medium's capacity to shape cultural norms, values, and consumer choices. These findings underscore the imperative need for ongoing research and critical reflection on the implications arising from television's promotional endeavours concerning popular culture in our contemporary milieu.

**Keywords:** Culture, Mass Media, Media, Popular Culture, Television

''... ලක්දිව සිටින විද්‍යාඥයන්ගේ ගණන අල්ප වේ. ඔවුන් අතර පවා කෘතහස්ත වෛඥානිකයෝ දුර්ලභයහ. සිද්ධාන්තයන් දන්නා බව මුත් එය ක්‍රියාවේ යෙදවීමේ අභ්‍යාසය ඔවුනට නැත. විඥානයන්ගේ පරමාර්ථය ඉගෙනීමෙන් ම කෙළවර වන්නට ඉඩ හැරීම අයෝග්‍ය ය. එය ජනෝපයෝගී වස්තුවකි. ඒ මඟින් සමාජයට යහපතක් සැලසෙන්නේ රටවාසීන් ඒ පිළිබඳ සාමාන්‍ය දැනීමක් වත් ලබාගත් විට ය. මෞලිකවිඥානයන් සියබසින් ඉගෙනීමට මහාජනයාට ඉඩ ලබා දිය යුත්තේත් භෞතික මානසික දෙඅංශයට ම අයත් විද්‍යාවන් අනුව පොත් ලීමට සිංහල උගතුන් යොමුවිය යුත්තේත් මේ නිසා ය.

මෙකල අප කන බොන, අඳින පලඳින, හිඳින හිටින, යන එන, කරන කියන, සිතන පතන හැම දෙයක් ම විඥානයෙහි බලයට හසු ව තිබේ. එබඳු යුගයෙක එකී විද්‍යා නො ඉගෙන එයින් දියුණුව නො ලබා සිටීම මහත් අලාභයකි. ලෝකයෙහි ඒ කොනේ සිට මේ කොන තෙක් සිදුවන දේ එදිනෙදින ම දැනගත හැක්කේ විද්‍යාවේ මහිමයෙනි...''

කොටහේනේ ප්‍රඥාකීර්ති,
සාහිත්‍යය හා සමාජය

# ශාස්ත්‍රීය ප්‍රභාෂණයේදී ප්‍රස්තුතීකරණය නොකළ සාරසංක්ෂේප

# ‘ෆ’ රූපය සිංහල අක්ෂර මාලාවේ ස්ථාන ගත කර ඇති ස්ථානය සහ ‘Z’ වෙනුවට අකුරක් සිංහල අක්ෂර මාලාවට ගන්නේ නම් එය ස්ථානගත කළ යුතු ස්ථානය පිළිබඳ විමර්ශනයක්

ගිනිකටුවැවේ විපුල හිමි
භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
gvipula260@gmail.com

**සාරසංක්ෂේපය**

සංස්කෘත අක්ෂර ශික්ෂා වර්ණමාලාව විධිමත් ශාස්ත්‍රීය පදනමක් සහිත ය. සංස්කෘත ක්‍රමය ම අනුගමනය කරමින් නිර්මාණය කර ඇති සිංහල අක්ෂර මාලාවේ ද එම ශාස්ත්‍රීය පදනම බොහෝ සෙයින් දැකිය හැකි ය. එය උල්ලංඝනය වී ඇත්තේ සංස්කෘතයේ නැති ඇතැම් අක්ෂර ස්ථානගත කිරීමේ දී ය. එසේ ක්‍රමවිරෝධ ස්ථානගත කිරීමක් ලෙස ‘ෆ’ අක්ෂරයේ ස්ථානගත කිරීම හඳුනා ගත හැකි ය. එමෙන් ම ඇතැම් විද්වත්තු දන්තජ ඝෝෂ ඌෂ්ම ශබ්දය (Z) සඳහා අක්ෂරයක් අවැසි බව ද යෝජනා කරති. ඒ හෙයින් මෙහි පර්යේෂණ ගැටලුව වූයේ දන්තෝෂ්ඨජ අඝෝෂ ඝර්ෂයක් වූ ‘ෆ’ අක්ෂරය සහ දන්තජ ඝෝෂ ඌෂ්ම අක්ෂරය, අක්ෂර ශික්ෂා වර්ණමාලා පටිපාටිගත ක්‍රමය අනුව ස්ථානගත කළ යුතු ස්ථානය කවරේ ද? යන්නයි. ඒ අනුව මෙහි පර්යේෂණ අරමුණ වූයේ ‘ෆ’ අක්ෂරය ස්ථානගත කළ යුතු නිරවද්‍ය ස්ථානය හඳුනා ගැනීම සහ ඒ යථා ස්ථානයේ ස්ථානගත නොකිරීමට හේතු හඳුනා ගනිමින් යථා ස්ථානයේ ස්ථානගත කළ හැකි ද යන්න විමසීමත් දන්තජ ඝෝෂ ඌෂ්මය සඳහා අක්ෂරයක් ගන්නේ නම් එය ස්ථානගත කළ යුතු ස්ථානය විමසීමත් ය. මේ සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයේ පුස්තකාලය පරිශීලනය අනුගමනය කෙරිණි. එහි දී වෛදික කෘති ආශ්‍රයයෙන් අක්ෂර ශික්ෂා වර්ණමාලා පටිපාටිය අධ්‍යයනය කෙරුණු අතර විග්‍රහාත්මක වාග්විද්‍යාවේ ශබ්දවිද්‍යා පර්යේෂණ අනුව ‘ෆ’ අක්ෂරයේ සහ දන්තජ ඝෝෂ ඌෂ්මයේ ශබ්ද විචාරාත්මක ලක්ෂණ අධ්‍යයනය කොට ‘ෆ’ අක්ෂරය සහ දන්තජ ඝෝෂ ඌෂ්මය ස්ථානගත කළ යුතු නිවැරදි ස්ථානය හඳුනා ගැනිණි. ඉන් අනතුරුව ක්‍රමවිරෝධී ස්ථානයක ‘ෆ’ අක්ෂරය ස්ථානගත කිරීමට බලපෑ කරුණු අධ්‍යයනය කොට දන්තජ ඝෝෂ ඌෂ්මය ද ක්‍රමවිරෝධී ස්ථානයක ස්ථානගත කළ යුතු ද යන්න විමසිණි. ප්‍රතිඵල විශ්ලේෂණයේ දී පෙනී ගියේ අක්ෂර ශික්ෂා වර්ණමාලා පටිපාටිගත ක්‍රමය අනුව ‘ෆ’ අක්ෂරය සිංහල හෝඩියේ අවසානයේ ස්ථානගත කිරීම වැරදි බවත් එය ‘ශ ෂ ස ෆ හ’ යනුවෙන් ස්ථානගත කළ යුතු බවත් දන්තජ ඝෝෂ ඌෂ්මය **හ**කාරයෙන් පසු ව ස්ථානගත කළ යුතු බවත් ය. එසේ වෙතත් අලුතින් එකතු කර ගන්නා අක්ෂර ක්‍රමවිරෝධී ව හෝඩියේ අන්තයේ ස්ථානගත කොට ඇත්තේ ශබ්දකෝශවලට වචන එකතු කිරීමේ දී ගැටලුවක් ඇති නොවීම පිණිස ය. එහෙත් මුල් ම අවස්ථාවේ යථා ස්ථානයේ මේ අක්ෂර ස්ථානගත කරන්නේ නම් ශබ්දකෝශවලට ගැටලුවක් ඇති නොවන බවත් එය අක්ෂරමාලාවේ ශාස්ත්‍රීයත්වය රැකීමට හේතු වන බවත් මෙහි නිගමනය වේ.

**ප්‍රමුඛ පදඃ** වර්ණමාලා පටිපාටිය, අක්ෂර මාලාව, අක්ෂර ස්ථානගත කිරීම, දන්තජ ඝෝෂ ඌෂ්මය, දන්තෝෂ්ඨජ අඝෝෂ ඝර්ෂය

# An Investigative Study on the Placement of the Letter ‘ෆ’ (/f/) in the Sinhala Alphabet and the Possible Placement of ‘Z’, if Such a Letter is Necessary

Ginikatuwewe Vipula

Department of Languages, Rajarata University of Sri Lanka

gvipula260@gmail.com

**Abstract**

The Sanskrit alphabet is organized based on a formal scholarly foundation, and the same basis can be identified about the Sinhala alphabet which follows the same form as Sanskrit. It is violated in the placement of certain letters which are not in Sanskrit. The placement of the letter (/f/) can be given as an example of this deviation. Moreover, some scholars suggest that a separate Sinhala letter is necessary to represent the dental sonant fricative sound /z/. Hence the present study focuses on the potential location of letters representing the labiodental voiceless fricative (/f/) sound and the voiced fricative /z/ sound in the Sinhala alphabet respectively, as per the acceptable organisation of the alphabet. The main objective of this research is to identify the correct location of the letter (/f/) while examining if this letter can be placed in the proper place in the alphabet seeking reasons why it has not been placed in a proper location. The study further attempts to examine the correct placement of the letter /z/ in case such a letter is to be introduced into the Sinhala alphabet. Library-based analysis under the qualitative research method was employed and the organisation of the alphabet according to the Vedic texts was closely examined. Also, the phonological characteristics of the letters (/f/) and /z/ as described in Descriptive Linguistics were observed, and the correct placement of those letters in the Sinhala alphabet was identified. Reasons, why the letter (/f/) has currently been placed in an incorrect location, were also examined while inquiring into whether the letter /z/ should also be placed in an irregular location. Findings revealed that it is incorrect to place the letter (/f/) at the end of the Sinhala alphabet as per the accepted organisation and that it has to be placed in the letter sequence ‘ශ ස ෂ ෆ හ'. It is also argued that the letter /z/ has to be placed after ‘හ’ (/h/). However, it seems to be the case that the newly introduced letters have been placed at the end of the alphabet to prevent difficulties in adding new words to dictionaries. However, this study argued that placing these sounds initially at the proper location in the alphabet does not cause difficulties in adding words to dictionaries and thus it preserves the scholarly nature of the alphabet.

**Keywords:** Alphabet, Dental Voiced Fricative, Labiodental Voiceless Fricative, Order Of Letters, Placement Of Letters

# සිංහල ව්‍යවහාරික භාෂාව සමඟ බැඳුණු ලාංකේය ස්ත්‍රී පුරුෂ සමාජභාවය ("කැල්ල" සහ "බඩුව" යන වාග්පදයන්ගේ අර්ථයන් සහ සමාජ සංස්කෘතික සංදර්භය තුළ එහි භාවිතය පිළිබඳ සිදුකරන ලද අධ්‍යයනයක්)

ඒ. ආර්. එම්. ඩී. කේ අබේසිංහ
සමාජවිද්‍යා අධ්‍යනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය
darshani@soc.cmb.ac.lk

**සාරසංක්ෂේපය**

ජන සමාජයක් තුළ ස්ත්‍රියක හෝ පුරුෂයෙකු හැඳින්වීම සඳහා යොදන වචන, සමාජීය නිර්මිතයන් බව ද එම සමාජීය නිර්මිතය අදාළ සමාජ ව්‍යුහයෙහි පවතින සංකීර්ණ සමාජ සම්බන්ධතා සහ සංස්කෘතිය නිරූපණය කරන බව ද පෙන්වා දිය හැකි ය. ලාංකේය සමාජයෙහි ස්ත්‍රිය සහ පුරුෂයා විෂයයෙහි එකිනෙකට වෙනස් ස්ත්‍රී පුරුෂ භූමිකා විභේදන, භූමිකා කාර්යය කොටස් මෙන් ම අන්‍යොන්‍යතා ද පවතින බව හඳුනාගත හැකි ය. ලාංකේය ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංස්කෘතික නිර්මිතයන් වටහා ගැනීමේ දී භාෂාවේ ඇති දායකත්වය කෙසේ ද? යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් ව එදිනෙදා අන්තර්ක්‍රියාව තුළ යෙදෙන සුලභ වචන දෙකක් ලෙස "කැල්ල" සහ "බඩුව" යන පද දෙක ආශ්‍රිත සාමාජ භාවිතය පිළිබඳ වාග් විද්‍යාත්මක ගවේෂණයක් කිරීම මෙම ශාස්ත්‍රීය අධ්‍යනයෙහි මූලික අරමුණ වෙයි. ඒ අනුව සාහිත්‍යය පදනම් කරගත් ද්විතියික දත්ත විශ්ලේෂණයක් සිදු කරන ලදී. පර්යේෂකයා විසින් සමාජ මාධ්‍ය වේදිකාවක් තුළ ''කැල්ල" සහ ''බඩුව" යන යෙදුම් පිළිබඳ මිනිසුන්ගේ අදහස් විමර්ශනය කරන ලද අතර, ප්‍රතිචාර දැක්වූවන්ගේ අදහස් මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික දත්ත ලෙස භාවිතා කරන ලදී. දත්ත විශ්ලේෂණය, ''කැල්ල'' සහ ''බඩුව'' යන පද නිර්මාණයෙහි සමාජ ව්‍යුහාත්මක මූලය සහ ''කැල්ල'' සහ ''බඩුව'' යන පදවලින් ප්‍රකට වන සංස්කෘතිකමය අර්ථගැන්වීම් පිළිබඳ තේමා අන්තර්ගත ගුණාත්මක දත්ත විශ්ලේෂණයක් සිදු කෙරුණි. අධ්‍යයනයේ ප්‍රතිඵල සමාලෝචනය කළහොත්, ලාංකේය සමාජ සංස්කෘතිකය තුළ ස්ත්‍රිය හැඳින්වීම සඳහා යෙදෙන "කැල්ල" සහ "බඩුව" යන වාග්පද මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සංස්කෘතික නිර්මිතයන් ඇති කරන බව තහවුරු වේ. "කැල්ල" යන්නෙහි මතුපිට අර්ථය ස්ත්‍රියගේ සුන්දරත්වය සහ අසම්පූර්ණත්වයත් "බඩුව" යන්නෙහි මතුපිට අර්ථය එතරම් ධනාත්මක අර්ථයක් නොවන බවත් දත්ත විශ්ලේෂණය තුළින් හෙළි විය. "කැල්ල" සහ "බඩුව" යනු පුරුෂාධිපත්‍ය සමාජයක් තුළ කාන්තාවට හිමි ස්ථානය සහ සමාජ තත්ත්වය මනාව පිළිබිඹු කරන වචන යුග්මයකි. එමෙන් ම දර්ශන මාත්‍රයකින් පමණක් හඳුනාගත නොහැකි පුරුෂාධිපත්‍ය සමාජයක ක්‍රියාත්මක වන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් සංස්කෘතිකමය නිර්මිතයන් මනාව නිරූපණය වන වචන යුග්මයක් ලෙස ද ''කැල්ල" සහ "බඩුව" යන වාග්පදද්වය හඳුනාගත හැකි ය.

**ප්‍රමුඛ පදඃ** කැල්ල, බඩුව, සංස්කෘතිය, සමාජ ව්‍යුහ, ස්ත්‍රී පුරුෂ සමාජභාවය

# Sri Lankan Gender Relations Associated with Sinhala Pragmatic Language (A Study of the Meanings and Usage of the Terms '*Kalla*' And '*Baduwa*' in Socio-Cultural Context)

A.R.M.D.K Abesinghe

Department of Sociology - University of Colombo

darshani@soc.cmb.ac.lk

**Abstract**

It can be pointed out that the words used to refer to a woman or a man in a society are social constructs and that social constructs represent the complex social relations and culture in the relevant social structure. It can be recognised that there are different gender role distinctions, matters of roles, and identities in the subject of women and men in Sri Lankan society. The research problem revolved around the role of language in contributing to the understanding of cultural constructions of gender in Sri Lanka. The main objective of this academic study is to linguistically explore the social usage of the terms "*Kalla*" and "*Baduwa*" as two common words used in everyday interaction based on gender. Accordingly, literature-based secondary data analysis was conducted. The researcher investigated people's opinions about the terms "*Kalla* " and "*Baduwa*" on a social media platform, and the respondents' opinions were used as primary data for this research. A qualitative data analysis was conducted that included a thematic analysis of the socio-structural roots of the coining of the terms "*Kalla*" and "*Baduwa*" and the cultural meanings conveyed by them. Findings confirm that there are gendered cultural constructs in the Sri Lankan social culture through the terms "*Kalla*" and "*Baduwa*" used to refer to women. The data analysis also revealed that the superficial meaning of "*Kalla*" is the beauty and imperfection of the woman while the superficial meaning of "*Baduwa*" gives a negative interpretation. "*Kalla*" and "*Budawa*" can be identified as a pair of words that perfectly indicate the position and social status of women in a patriarchal society. Linguistic terms such as "*Kalla*", and "*Baduwa*" perfectly describe the invisible but gender-based cultural constructs that operate in a patriarchal society.

**Keywords:** Baduwa, Culture, Gender constructs, Kalla, Social structure

# පුරාතන අවධියේ ශ්‍රී ලංකා සමාජයේ පැවති අවමංගල්‍ය චාරිත්‍ර පිළිබඳ විමසුමක් (සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ඇසුරින්)

විජේරත්න, එස්. ඩබ්. එස්. ජී.[1]සමරනායක, පී. ඩබ්. පී. එච්.[2]
මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
gayand02i83@gmail.com[1] ,piyumisamaranayaka17@gmail.com[2]

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳ අධ්‍යයනය කරන විට පුරාතන අවදියේ පටන් මෙරට සමාජයෙහි මුල් බැසගෙන පැවති සිරිත්විරිත් අතර අවමංගල්‍ය චාරිත්‍රවාරිත්‍රවලට විශේෂත්වයක් හිමි වේ. මෙම පර්යේෂණයේ ගැටලුව ලෙස පුරාතන අවධියේ ශ්‍රී ලංකා සමාජයේ පැවති අවමංගල්‍ය චාරිත්‍ර මොනවා ද? යන්න හඳුන්වාදිය හැකි ය. මෙම පර්යේෂණයේ දී ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට මෙරට සමාජයේ අවමංගල්‍ය කටයුතු හා සම්බන්ධ චාරිත්‍ර විකාශනය වූ ආකාරය විමසා බැලීම ද, ඓතිහාසික අවධියේ ශ්‍රී ලාංකික සමාජයෙහි අවමංගල්‍ය සිරිත් විරිත් මුල්බැසගෙන තිබූ ආකාරය හා ඒවා ප්‍රායෝගිකව කෙබඳු ස්වරූපයක් ගත්තේ ද යන්න විමසා බැලීම ද, අවමංගල්‍ය චාරිත්‍රවලට සමාජය තුළ හිමි වූ වැදගත්කම හා ඒවා මගින් සමාජයට සිදු වූ බලපෑම කෙබඳු වී ද යන්න විමසා බැලීම ද අරමුණු වෙයි. උක්ත පර්යේෂණ ගැටලුව සාධනය කර ගැනීමේදී ක්ෂේත්‍ර නොවන අධ්‍යයන ක්‍රමවේදය භාවිත කරන ලද අතර ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුගතව පුස්තකාල පර්යේෂණ ක්‍රමවේදය මගින් ප්‍රාථමික හා ද්විතියීක මූලාශ්‍රය පරිශීලනය කරමින් දත්ත රැස්කිරීම හා එම දත්ත විශ්ලේෂණය සිදුකර නිගමනවලට එළඹීමේ ප්‍රවේශය භාවිත කරන ලදී. ප්‍රාග් ඓතිහාසික අවධිය විමසන විට ප්‍රාථමික හා සරල අවමංගල්‍ය චාරිත්‍ර පිළිබඳ තොරතුරු පුරාවිද්‍යාත්මක සාධක ඇසුරින් හමුවේ. පුරාවිද්‍යාත්මක මෙන්ම සාහිත්‍ය මූලාශ්‍ර මගින් තොරතුරු අනාවරණය වන ඓතිහාසික අවධිය විමසන විට මහින්දාගමනය සිදුවීමට පෙර අවධියේ පැවති ඇදහිලි හා විශ්වාස මෙන් ම බ්‍රාහ්මණ, ජෛන වැනි ආගමික විශ්වාස ද පදනම් කොට ගෙන පැවති බව ද මෙරටට බුදුදහම ලැබීමෙන් අනතුරුව ඒ හා සම්බන්ධ චාරිත්‍ර වාරිත්‍ර ව්‍යාප්ත වීම නිසා අවමංගල්‍ය චාරිත්‍රයන් ද ඒ අනුව සකස් වූබව ද පෙරට වඩා සංවිධිත හා සංකීර්ණ වෙමින් නවාංග රාශියක් එකතු වී ඇති බව ද හඳුනාගත හැකි වේ. එමෙන් ම මෙකී චාරිත්‍රයන් මෙරට සංස්කෘතියේ ප්‍රගතිගාමී අයුරින් ක්‍රියාත්මක වෙමින් පසුකාලීන අවධිය කෙරෙහි ද බලපෑම් සහගත තත්ත්වයක් ඇති කළ බව පැහැදිලි ව හඳුනාගත හැකි වේ.

**ප්‍රමුඛ පදඃ** අවමංගල්‍ය චාරිත්‍ර, පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය, සමාජය, සංස්කෘතිය, සාහිත්‍යමූලාශ්‍ර

ශාස්ත්‍රීය ප්‍රභාෂණයේදී ප්‍රස්තුතීකරණය නොකළ සාරසංක්ෂේප

# An Investigation into the Funeral Rituals of Ancient Sri Lankan Society (Based on Literary and Archaeological Sources)

Wijerathna, S. W. S. G.[1]Samaranayaka, P. W. P. H.[2]
Postgraduate Institute of Humanities and Social Sciences, University of Peradeniya, Sri Lanka
gayand02i83@gmail.com [1],piyumisamaranayaka17@gmail.com [2]

**Abstract**

In the study of the history of Sri Lanka, it is possible to recognize several customs that were rooted in the society during the ancient period and how the funeral customs were implemented. What were the funeral rituals in ancient Sri Lankan society? is the problem of this research. The aims are to in this research, the investigate how funeral customs have existed in Sri Lankan society since the pre-historic period, how funeral customs were rooted in the society of Sri Lanka during the historical period, what form they took in practice, and the importance of funeral customs in the society. Also to examine whether their importance and effects on society have been determined. The non-field method was used in this research and according to the qualitative research method, the library research method was used to collect data by using primary and secondary sources, analyze the data and draw conclusions. Archaeological evidence provides information about primitive and simple funeral rituals during the pre-historic period. When we ask about the historical period where information is revealed through archaeological and literary sources, it is found that it was based on the beliefs of the period before the Mahindagamana as well as existing religious beliefs such as Brahminism and Jainism. After receiving Buddhism, due to the spread of the practices related to Buddhism, it can be recognized that funeral rituals and arrangements have become more organized and complicated than before. Also, it can be recognised that funeral rituals were implemented progressively in the culture of this country and influenced later societies as well.

**Keywords:** Archaeological Sources, Culture, Funeral rituals, Literary sources, Society

# හෙන්රි පාකර්ගේ "ලංකාවේ ගැමිජනකතා"(Village Folk-Tales of Ceylon) නම් කෘතියෙන් හෙළිවන යටත් විජිතවාදී ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයක් (තෝරාගත් ජනකතා කිහිපයක් ඇසුරෙන්)

එච්. එම්. එස්. අයි. කුමාරි
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
sachinthiisuri2@gmail.com

**සාරසංක්ෂේපය**

සමාජය ශිෂ්ටාචාරවත් වීමට ආරම්භ වූ කාලවකවානුවේ සිට ම ජනකතාවල ද ආරම්භය සිදුවූයේ නිරායාසයෙනි. මේවා පැවත ආයේ මුඛ පරම්පරාගත ව ය. ජනකතා ඒ ඒ දේශයන්ට ආවේණික වන පරිදි කාලානුරූපී ව ගොඩනැගුණු කතා විශේෂයක් වන අතර නිශ්චිත කතෘවරයෙක්/කතෘමණ්ඩලයක් සහ නිර්මාණය කළ නිශ්චිත කාලවකවානුවක් සොයා ගැනීමට ද නො හැකි ය. නමුත් පසුකාලීන ව විවිධ නිර්මාණකරුවෝ සිය නිර්මාණ සඳහා ජනකතා වස්තුබීජ කරගත් අතර ජනශ්‍රැතිය වෙත ඇල්මක් දැක්වූ විවිධ වෘත්තිකයෝ ද ජනකතා ලේඛනගත කිරීමෙහි නියැළුණහ. ඒ ඔස්සේ ජනකතා ලේඛනගත කිරීම ආරම්භ විය. මෙය අනෙකුත් දේශයන්ට මෙන් ම ශ්‍රී ලංකාවට ද පොදු වූ කාරණයකි. ලාංකේය ජනකතා ලේඛනගත කිරීමෙහි ලා එංගලන්ත ජාතික ඉංජිනේරුවෙකු වූ හෙන්රි පාකර් නම් විදේශිකයා දැරූ ප්‍රයත්නය ප්‍රශංසනීය වූවකි. ඔහුගේ වෙළුම් තුනකින් යුත් "Village Folk-Tales of Ceylon"නම් කෘතිය 1910 දී පළකෙරුණේ ලංකාවේ ගැමි ජනකතා 266 කින් සමන්විත ව ය. ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යය රාජ්‍යයෙහි යටත් විජිතයක් ව පැවති කාලවකවානුවක දී මෙම කෘතිය පළකර තිබීම විශේෂත්වයකි. මෙහි දී පාකර්ගේ "Village Folk-Tales of Ceylon" නම් කෘතියෙහි ඇති ජනකතාවලින් හෙළිවන යටත් විජිතවාදී ලක්ෂණ අධ්‍යයනය කිරීම ප්‍රමුඛ අරමුණ වේ. එම අරමුණ පූරණය කරගැනීමට පාකර්ගේ "Village Folk-Tales of Ceylon" නම් කෘතියෙහි සිංහල පරිවර්තනය වන චන්ද්‍ර ශ්‍රී රණසිංහගේ **ලංකාවේ ගැමිජනකතා** නම් වෙළුම් ත්‍රිත්වය ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් යොදාගන්නා අතර තවත් කෘති ද්විතීයික මූලාශ්‍රය ලෙස යොදා ගැනේ. එමෙන් ම මේ සඳහා මානවවංශ පර්යේෂණ විධි ක්‍රමයට අයත් වන ගුණාත්මක අධ්‍යයන ක්‍රමවේදය භාවිත කෙරේ. පාකර් පළකර ඇති ජනකතා ඔස්සේ යටත් විජිතවාදී ලක්ෂණ ඉස්මතු වන්නේ ද, ඒ කුමනාකාරයෙන් ද යන්න මෙහි පර්යේෂණ ගැටලු වේ. ජනකතා සමාජය මූලික කරගනිමින් ගෙතුණු කතාන්දර වේ. ඉහත කෘතියෙහි ලංකාවේ පැරණි ජනකතා සහ පාකර්ගේ අත්දැකීම් ද පදනම් කර ගනිමින් ගෙතුණු ජනකතා ද වේ. එම ජනකතාවල අනෙකුත් ජනකතාවලට සාපේක්ෂ ව වෙනස් ලක්ෂණ පෙන්නුම් කරන අවස්ථා වේ. ඒ අතර එක් ලක්ෂණයක් ලෙස ජනකතාවල යටත් විජිතවාදී ලක්ෂණ හඳුනාගත හැකි ය. එබැවින් කාලානුරූපී ව ජනකතා ද එකල පැවති යටත් විජිත සමාජයේ බලපෑමට ලක් වී ඇති බව නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද** : ගැමිජනකතා, යටත් විජිතවාදී ලක්ෂණ, ශ්‍රී ලංකාව, සමාජය, හෙන්රි පාකර්

ශාස්ත්‍රීය ප්‍රභාෂණයේදී ප්‍රස්තුතීකරණය නොකළ සාරසංක්ෂේප

# A Study of the Colonial Features Revealed in Henry Parker's "*Lankawegamijanakatha*" (Village Folk-Tales of Ceylon); Based on a Few Selected Folktales

H.M.S.I. Kumari

Department of Sinhala, University of Kelaniya, Sri Lanka

sachinthiisuri2@gmail.com

**Abstract**

From the time when society started to become civilized, the beginning of folk tales happened naturally. Folktales were passed down through oral generations. Folktales are a type of stories that have been developed over time to be specific to each country. These cannot be traced to a specific author or authorship and a specific time of creation. But later on, various authors used folktales for their literary creations and various professionals who showed love for folklore also engaged in documenting folktales. The documentation of folktales started with that. This is common to other countries as well as to Sri Lanka. The efforts made by a foreigner named Henry Parker, who was an English engineer, in documenting Sri Lankan folklore were commendable. His three-volume work titled "Village Folk-Tales of Ceylon" consisting of 266 village folk tales of Sri Lanka was published in 1910. Significantly, this work was published at a time when Sri Lanka was a colony of the British Empire. Here, the main purpose is to study the colonial characteristics revealed in the folktales of Parker's book "Village Folk-Tales of Ceylon". For this purpose, the Sinhala translation of Parker's book "Village Folk-Tales of Ceylon" is used as the primary source and other works are used as the secondary source. This study uses the qualitative study method which belongs to the anthropological research method, and the research problems are whether and how the colonial characteristics are highlighted through the folktales published by Parker. Folktales are created stories based on society. In the above work, there are folktales woven based on the old folktales of Sri Lanka and Parker's experiences. These folktales show different characteristics compared to other folktales. Among them, colonialist features of folktales can be recognized as one of them. Therefore, this study concludes that folktales have been influenced by the colonial society of that time.

**Keywords**: Colonial Features, Henry Parker, Society, Sri Lanka, Village Folklore

# නුවරකලාවියේ සත් මඟුල පිළිබඳ සමාජ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

## (කලාගම් පළාත සහ නුවරගම් පළාත ඇසුරෙන්)

ඩබ්ලිව්. එම්. නයෝමි නිසංසලා

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

nnayomi500@gmail.com

**සාරසංක්ෂේපය**

මිනිසාට ජීවිතයේ දී මුහුණදීමට සිදුවන නොයෙකුත් සංසිද්ධි ඔස්සේ ජන සංස්කෘතිකාංග නිර්මාණය වී ඇති බවක් හඳුනාගත හැකි ය. ඒ අතර ජනමංගල්‍යය ප්‍රධාන තැනක් ගනියි. නුවර කලාවියේ පාරම්පරික ව අඛණ්ඩ ව ක්‍රියාත්මක වන වරිග සම්ප්‍රදාය බොහොමයක් පවතියි. ඒ අතරින් දැරිවියකගේ ජීවිතයේ සුවිශේෂ අවස්ථා අගයමින් නුවර කලාවියේ ගැමියෝ සමරන මංගල්‍යය සතක් වෙති. එය සත් මඟුල වෙයි. ඉඳුල්කට ගෑමේ මංගල්‍යය, කන් විදීමේ මංගල්‍යය, කොටහළු මංගල්‍යය, හීන් මංගල්‍යය, මහමංගල්‍යය, හේල බැලුම් මංගල්‍යය සහ කද්බැදි මංගල්‍යය යනාදීය මෙම සත් මංගල්‍යයයි. සෑම රටකට ම, සෑම සමාජයකට ම උරුම වූවක් වූ ජනශ්‍රැතිය සංස්කෘතික අංගයක් මෙන් ම සංස්කෘතික වාහකයක් ද වෙයි. එවන් ජනශ්‍රැතික අංගයක් ලෙසත් මංගල්‍යය හඳුන්වා දිය හැකි වෙයි. මෙම පර්යේෂණය ඔස්සේ සමස්ත නුවර කලාවියේ ම සත්මංගල්‍යය පිළිබඳ අනාවරණය නොකරන අතර නුවරගම් පළාත සහ කලාගම් පළාතෙහි සත්මංගල්‍යය පිළිබඳ පමණක් අධ්‍යයනය කිරීම සිදුකෙරෙයි. නුවරකලාවියේ නුවරගම් පළාත සහ කලාගම් පළාතෙහි සත්මංගල්‍යයේ දැකිය හැකි නූතන විචල්‍යතා කවරාකාර ද යන ගැටලුව මුල්කර ගනිමින් සිදුකරනු ලැබූ මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූයේ දැරිවියකගේ ජීවිතය හා බැඳී පවතින සත්මංගල්‍යයන්හි ස්වරූපය අධ්‍යයනය හා එහි සමාජීය හා මානව ලක්ෂණ පිළිබඳ සොයා බැලීමයි. සත්මංගල්‍යයෙහි ඉතිහාසය ගවේෂණය කිරීම හා නූතන විචල්‍යතා අධ්‍යයනය ද මෙහි අනුඅරමුණක් විය. ජනශ්‍රැති අංග පිළිබඳ අධ්‍යයනය කරන්නන් උදෙසා නව පර්යේෂණ අවස්ථා විවර කර දීම ද අනුඅරමුණක් විය. මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදා ගැනුණි. පර්යේෂණ විධික්‍රම වශයෙන් මූලික ව ම සම්මුඛ සාකච්ඡා සහ ශාස්ත්‍රීය ග්‍රන්ථ පරිශීලනය සිදුකෙරුණි. අනෙකුත් පර්යේෂණ විධික්‍රම වශයෙන් පර්යේෂණ නිබන්ධ, සඟරා සහ පුස්තකාල පරිශීලනය සිදුකර ඇත. දැරිවියකගේ උපතේ සිට නැවැත්ම දක්වා ක්‍රියාත්මක වන මංගල අවස්ථා සතක් මින් අර්ථවත් කෙරුණි. දැරිවියක් ඉඳුල්කට ගෑමේ අවස්ථාවේ සිට ඇය විවාහ කොට සැමියාගේ පාර්ශ්වයට භාරදීම දක්වා සිදුකෙරෙන මංගල චාරිත්‍ර මින් නිරූපණය කෙරෙයි. එහි දී පුරාතනයෙහි පැවති බොහොමයක් චාරිත්‍ර විධි නූතනයේ දී වෙනස් ව ඇති ආකාරයක් සහ ඒවා නවීකරණයට ලක් ව ඇති ආකාරයක් මෙම අධ්‍යයනයේ දී අනාවරණය විය. පුරාතනයේ දී රන් මුදුවකට කිරි ස්වල්පයක් තවරා දියණියගේ තොලෙහි තැවරූ රන්කිරිකටගෑම නූතනයේ දී වෙනස්වෙයි. තව ද නක්ෂත්‍රකරුවෙකුගේ අනුදැනුම මත වලව් පැළැන්තියේ අයවලුන් අතින් කුල හීනදරුවන් උදෙසා සිදුකරනු ලැබූ ඉඳුල් කැවීම නූතනයේ දී දක්නට ලැබීම විරල වෙයි. මහමංගල්‍යයෙහි ප්‍රධාන අංගය වූ මංගල පෝරුව ගොක්කොළ රටා පසෙකලා විසිතුරු ආයිත්තම්වලින් සරසන අයුරු නූතනයේ දී දැකිය හැකි වෙයි. මෙලෙස මෙම මංගල්‍යය සතෙහි ම විවිධාකාර වෙනස්වීම් නූතනයේ දී දැකගත හැකිවෙයි. නමුත් තවමත් මෙම වැසියෝ අතීත අනන්‍යතාව ද රැක ගනිමින් නූතනත්වය ද එයට ආරෝපණය කොට මෙම මංගල්‍යය සමරන ආකාරයක් මෙම පර්යේෂණයෙන් අනාවරණය විය.

**ප්‍රමුඛපද :** නුවරකලාවියේ නුවරගම් පළාත සහ කලාගම් පළාත, සත්මංගල්‍යය, සමාජ හා මානව ලක්ෂණ, විචල්‍යතා, නූතනත්වය

# A Socio-Anthropological Study of *Sat Magula* in Nuwarakalawiya
## ( Based on Kalagam Area and Nuwaragam Area)

W.M.Nayomi Nisansala

Univrsity of Peradeniya

Nnayomi500@gmail.com

**Abstract**

It can be recognized that folk culture elements have been created through various phenomena that man has to face in life, among which the folk festival takes a major place. Many traditions in Nuwarakalawiya continue to be passed down from generation to generation. Among them, there are seven festivals celebrated by the villagers of Nuwarakalawiya to celebrate the special moments in a girl's life. These seven festivals include Indul Kata Game Mangalya, Ear Piercing Festival, KotahaluMangalya, HeenMangalya, Mahamangalya, HelaBalumMangalya and KathBandhiMangalya etc. Ethnicity, which is inherited by every country and every society, is a cultural element as well as a cultural carrier. Sat Mangalya can be introduced as such a folkloric element. Through this research, the Sat Mangalya of NuwaraKalawiya itself will not be disclosed and only the Sat Mangalya of Nuwaragampalatha and Kalagampalatha will be studied. The problem of this research was what kind of modern variations can be seen in Sat Mangalaya in Nuwaragampalatha and Kalagampalatha in Nuwarakalawiya. The main purpose of this research was to study the form of seven festivals associated with the life of a girl and to find out about its social and human characteristics. Exploring the history of Sat Mangalya and studying its modern variations was also a sub-objective of this. To achieve these objectives, qualitative research methodology was used as the research methodology. The research methods were primarily interviews and references to academic books. Other research methods include research papers, journals and library references. This meant seven ceremonial events that take place from the birth of a girl to the end of her life. This depicts the wedding rituals that are performed from the ceremony of Indhulkatagema a girl until she is married and handed over to her husband. In this study, it was revealed that many of the rituals that existed in antiquity have changed in modern times and that they have been modernized. In the past, the ceremony of putting a little milk on a gold ring and smearing it on the daughter's lips has changed in modern times. Also, it is rare to see in modern times, the ceremony of IndhulkewimeMangalya for the underprivileged children by the members of the Valav family with the knowledge of an astrologer. In modern times, it can be seen how the wedding raft, which was the main part of the great festival, is decorated with decorative items aside from Gokkolapatterns. Thus, various changes can be seen in these seven festival in modern times. Still, this research revealed how these people celebrate this festival while preserving the past identity and attributing modernity to it.

**Keywords:** Kalagam Area of Nuwarakalawiya, Modernity, Nuwaragam Area, *Sat Mangalya*, Social and Human Characteristics Variability

# සිංහල ජනකවියෙන් හෙළිවන ශ්‍රී ලංකාවේ වී ගොවිතැන ආශ්‍රිත සංස්කෘතිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඒ. ඒ. ඒ. ශ්‍රීමාලි අධිකාරි
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
anuradhashrimali96@gmail.com

**සාරසංක්ෂේපය**

ජනශ්‍රැතියක් ලෙස හඳුන්වනු ලබන්නේ පරම්පරාවෙන් පරම්පරාවට ජනතාව අතර හුවමාරු වන ඥාන සම්භාරයකි. මේ ඥාන සම්භාරය ජනකවි, ජනකතා, ජනවිශ්වාස හා ඇදහිලි, අභිචාරවිධි, විශ්වාස, චාරිත්‍ර වාරිත්‍ර හා යාතු කර්ම ආදී විවිධ ස්වරූපයන්ගෙන් පවතී. ජනශ්‍රැතියේ මේ අංගෝපාංග අතර ජනකවිය ප්‍රධාන වේ. සිංහල ජනකවියෙන් අතීත ශ්‍රී ලාංකේය ජනයාගේ ජීවන රටා හා සංස්කෘතිය හැදෑරිය හැකි ය. පරම්පරාවෙන් පරම්පරාවට අතින් අතට ආ ජනකවි කලින් කලට වෙනස්වීම්වලට ලක්වුව ද ඒවායින් සිදුකෙරෙන සමාජ සංස්කෘතික නිරූපණය එලෙසින් ම සිදු වේ. අතීත ලංකා සමාජයේ පැවති වෘත්තීන්ට සමගාමී ව බිහිවූ ජනකවි එම වෘත්තීන් ආශ්‍රිත සංස්කෘතිය හෙළි කරයි. ජනශ්‍රැතිය ඇතිවන්නේ සාමූහික උපතකිනි. ජනකවිය ද එලෙස සාමූහික ව උත්පාදනය වූ අව්‍යාජ සාහිත්‍ය නිර්මිතයක් වන අතර අතීත සමාජ තතු හෙළි කරන කැඩපතකි. වී ගොවිතැන සඳහා බිම් සැකසීමේ සිට අස්වනු නෙළීම දක්වා වූ ක්‍රියාදාමයත් ඒ හා බැඳුණු ඇදහිලි විශ්වාස අභිචාර ආදී සංස්කෘතියත් කෙරෙහි අවධානය යොමු කරන මෙම පර්යේෂණයෙහි පර්යේෂණ ගැටලුව වන්නේ සිංහල ජනකවිවලින් හෙළි කෙරෙන වී ගොවිතැන හා බැඳුණු සංස්කෘතිය කෙබඳු ද? යන්නයි. මෙම පර්යේෂණයෙහි අරමුණ වන්නේ සිංහල ජනකවිවලින් හෙළි කෙරෙන කෘෂි අර්ථ ක්‍රමය හා බැඳුණු සංස්කෘතිය පිළිබඳ ව විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීමයි. මෙහි දී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ලේඛන ගත ජනකවි සංග්‍රහ පරිශීලනය කෙරෙන අතර ජනකවි හා වී ගොවිතැන සම්බන්ධ ව සිදුකෙරෙන විචාර හා විමර්ශන ද්විතීයික මූලාශ්‍රය වශයෙන් භාවිත කෙරේ. ජන සමාජයෙන් ම පැන නැගී ජන සමාජයේ ම පිළිබිඹුවක් බවට පත් වී එකල ලාංකේය ජන සමාජයේ තතු හෙළි කරන ජනකවි නිතැතින් ම ගැමි ජන ජීවිතයේ සංස්කෘතික හර පද්ධතින් ගැබ් කරගෙන තිබේ. ඒ අනුව ජනකවි අතීත ලංකාවේ වී ගොවිතැන හා බැඳුණු සංස්කෘතියේ තතු මනාව ගෙන හැර දක්වන බව නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද :** කෘෂි අර්ථ ක්‍රමය, ජනකවි, ජනශ්‍රැති, වී ගොවිතැන, සමාජය

ශාස්ත්‍රීය ප්‍රභාෂණයේදී ප්‍රස්තුතීකරණය නොකළ සාරසංක්ෂේප

# An Investigative Study of Rice Farming Culture in Sri Lanka as Revealed in Sinhala Folk Poetry

A.A.A.Shrimali Adhikari
Department of Sinhala University of Kelaniya
anuradhashrimali96@gmail.com

**Abstract**

Folklore is a collection of knowledge that is passed down from generation to generation. This wealth of knowledge exists in various forms such as folk poems, folk tales, folk beliefs and faiths, manners, beliefs, customs, rituals and yatu karma. Folk poetry is the main among these components of folklore. Sinhala folk poetry can be used to study the lifestyles and culture of past Sri Lankan people. Although the folk poems passed down from generation to generation change from time to time, the socio-cultural representation of them remains the same. The folk poems that emerged along with the occupations of the past Sri Lankan society reveal the culture associated with those occupations. Ethnicity is born out of collective birth. Folk poetry is also an authentic literary creation that is collectively generated and a mirror that reveals past social conditions. The research problem of this research which focuses on the process from land preparation to harvesting for paddy farming and the culture associated with it is, what is the culture related to paddy farming as revealed in Sinhala folk poems? The purpose of this research is to investigate the culture associated with agriculture interpretation revealed in Sinhala folk poems. Documented folk poetry anthologies are used as the primary source and reviews and investigations related to folk poetry and rice farming are used as the secondary source. The folk poems that emerged from the folk society and became a reflection of the folk society and revealed the facts of the Sri Lankan folk society at that time naturally contained the cultural core systems of the rural folk life. According to that, it can be concluded that the folk poems clearly describe the aspects of the culture associated with rice farming in Sri Lanka in the past.

**Keywords**: Folk poetry, Folklore, Paddy farming,  Rice farming, Society

# 2022න් පසු ස්වාධීන රූපවාහිනී නාලිකාවේ විකාශනය වන ටෙලිනාට්‍ය මඟින් සංස්කෘතික හරපද්ධතීන්වලට කෙරෙන බලපෑම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඩබ්. ඒ. සඳමාලි විජේසිංහ
එල්.ජී.එස්.යු සඳරුවන්
කුමුදු සෙනෙවිරත්න

නාට්‍ය, සිනමා හා රූපවාහිනී අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

aswij211@kln.ac.lk, igsus231@kln.ac.lk, amgkn231@kln.ac.lk

**සාරසංක්ෂේපය**

ස්වාධීන රූපවාහිනී නාලිකාව ආරම්භ වූයේ 1979 වර්ෂයේ දී ය. රූපවාහිනිය ආරම්භ කිරීමේ මූලික අරමුණ තොරතුරු හා විනෝදාස්වාදය ලබාදීම වේ. මුල් අවධියේ දී එම නාලිකාවෙන් විකාශනය වූ ටෙලිනාට්‍ය මඟින් සමාජ වටිනාකම් ආරක්ෂා වීමක් සිදු වූ බව පැහැදිලි ය. යහපත් සමාජයක් ගොඩනැගීම උදෙසා හේතු වන ආචාරධර්ම රැකගැනීම, සදාචාරාත්මක වීම සහ සමාජය ඥාණනය කිරීම වැනි කරුණු ඉතාම වැදගත්වන අතර වර්තමානයේ ස්වාධීන රූපවාහිනී නාලිකාවෙන් විකාශනය වන ටෙලිනාට්‍ය මඟින් එම අරමුණු ඉටුවේ ද යන්න පිළිබඳ සමාජයේ කතිකාවක් ගොඩනැගී තිබේ. 2022න් පසු ස්වාධීන රූපවාහිනී නාලිකාවේ විකාශනය වන ටෙලිනාට්‍ය මඟින් සමාජ සංස්කෘතික හරපද්ධතීන් ආරක්ෂා වේ ද? යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කෙරිණ. නියැදිය ලෙස **කොඩිගහයට** සහ **එයා දැන් බැඳලා** ටෙලිනාට්‍ය ද්විත්වය තෝරාගත් අතර ප්‍රාථමික මූලාශ්‍රය භාවිත කරමින් දත්ත රැස් කෙරිණ. පර්යේෂණ විධික්‍රමය ලෙස අන්තර්ගත විශ්ලේෂණය යොදා ගැණින. මෙම නාලිකාවේ විකාශනය වුනු ඇතැම් ටෙලිනාට්‍ය හා සැසඳීමේ දී විශ්ලේෂණයට ලක් කෙරුණු ටෙලිනාට්‍ය ද්විත්වයෙහි පවුලේ සැමට එක්ව නැරඹිය නොහැකි ඇතැම් රූප රාමු පවතින බව නිරීක්ෂණය විය. ලිංගික උත්තේජනයක් ඇති කරන සහ ජුගුප්සාජනක සිතිවිලි උපදවන ඇතැම් දර්ශන මෙම ටෙලිනාට්‍යය දිවිත්වයේ අන්තර්ගත බව එමඟින් පැහැදිලි විය. සංස්කෘතික හර පද්ධතීන් බොහෝ දුරට ආරක්ෂා කරමින් රාජ්‍ය නාලිකාවක් ලෙස වගකිවයුතු භූමිකාවක් නිරූපණය කරමින් සමාජයේ කැපීපෙනීමට සමත් වූ ස්වාධීන රූපවාහිනී නාලිකාවේ වර්තමානය වන විට විකාශනය වෙමින් පවතින ඇතැම් ටෙලිනාට්‍ය මඟින් සංස්කෘතික හරපද්ධතීන් බොහෝ දුරට බිඳ වැටීමකට ලක්වන බව මෙම පර්යේෂණයෙන් නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද :** ටෙලිනාට්‍යය, විකාශනය, ස්වාධීන රූපවාහිනිය, සංස්කෘතික හරපද්ධතීන්, සමාජය

# An Exploratory Study of the Impact of Teledramas Broadcast on ITN on Cultural Networks After 2022

W.A.S Wijesinghe
L.G.S.U Sandaruwan
A.M.G.K.N Senevirathne

Department of Drama, Cinema & Television Studies, University of Kelaniya, Sri Lanka

aswij211@kln.ac.lk, igsus231@kln.ac.lk, amgkn231@kln.ac.lk

## Abstract

The independent television channel started in the year 1979. The primary purpose of television is to provide information and entertainment. In the early stage, it is clear that social values were protected by teledramas broadcasted by ITN. In order to build a good society, things like maintaining ethics, being moral and enlightening the society are very important, and nowadays, a discourse has been built in the society about whether these objectives will be fulfilled by the teledramas broadcasted on the independent television channel. The research problem focuses on whether, after 2022, ITN teledramas will preserve socio-cultural norms. Qualitative research methodology was used for this research. As the sample, "Kodigahayata" and "Eya dan Badala" teledramas were selected, and data was collected by using primary sources. Content analysis is used as the research method. It was observed that there are certain contents that cannot be watched together by the whole family in the two teledramas that were analysed in comparison with some teledramas aired on this channel. It was evident that the teledrama contained some sexually stimulating and suggestive scenes. It can be concluded from this research that the cultural values are almost being destroyed by some of the teledramas currently being aired on ITN, a channel which had previously managed to stand out in society by portraying a responsible role as a state channel that protects the cultural values to a large extent.

**Keywords :** Teledrama, Cultural Values, Society, ITN, Broadcast

# ලාංකේය චිත්‍රපට වාරණයට ලක් වීමට දේශපාලනය, ලිංගිකත්වය හා භාෂාව යන සමාජ කරුණු බලපා ඇති ආකාරය පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් (තෝරාගත් චිත්‍රපට ත්‍රිත්වයක් ඇසුරින්)

කේ.ජී.ටී.එස්.එම්.කුමාරසිරි
නාට්‍ය, සිනමා හා රූපවාහිනී අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
thilinismkumarasiri@gmail.com

**සාරසංක්ෂේපය**

සමාජයේ සාමාජිකයෙකු ලෙස මිනිසා තමා ජීවත් වන පරිසරයෙන් හා පළපුරුද්දෙන් ලබා ගත්තා වූ සමස්තය සංස්කෘතිය ලෙස සැලකිය හැකි ය. චිත්‍රපටය වූ කලී පොදු සමාජ අවකාශයක් තුළ වින්දනයක් ලබා දීමට උත්සාහ කරන කලා මාධ්‍යයකි. ඉන් සමාජ සංස්කෘතික ලෝකයේ ක්‍රියාකාරීත්වය හා එහි යථාර්ථය ප්‍රතිනිර්මාණය කිරීමට පෙළඹෙන අතර එහි දී මෙම චිත්‍රපට කලාව ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් ලෙස තාක්ෂණික හා දෘෂ්ටිමය වශයෙන් පුළුල් වීමත් සමග යථාර්ථ නිරූපණය හා සංස්කෘතික කාරණා අතර ඝට්ටනයක් ඇති වේ. මෙම සංස්කෘතික කාරණා ලෙස සාරධර්ම, සිරිත් විරිත්, ආගම, භාෂාව, ලිංගිකත්වය, වාර්ගිකත්වය හා දේශපාලනය වැනි කරුණු පෙන්වා දිය හැකිය. මෙම කරුණු මත පදනම් ව බොහෝවිට චිත්‍රපට වාරණයට ලක් වේ. වාරණය යනු පොදු යහපතට අහිතකර යන පදනම මත කතා කිරීම හෝ ලිවීම තහනම් කිරීම හෝ යටපත් කිරීම වේ. මානව සමාජයෙන් හා එම ලැදියාවන්ගෙන් පෝෂණය වන චිත්‍රපට කලාව ඇතැම් සමාජ සංස්කෘතික කරුණු මත වාරණයට ලක්වීම කෙසේ සිදු වනවා ද, ඉන් චිත්‍රපට කලාවට වන බලපෑම කෙසේ වේ ද යන්න පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි. එසේ චිත්‍රපට වාරණයට බලපානු ලබන දේශපාලනය, ලිංගිකත්වය හා භාෂාව යන සමාජ සංස්කෘතික කාරණා මෙම චිත්‍රපට කලාවට කරනු ලබන බලපෑම කෙබඳු ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. මේ සඳහා තෝරා ගත් චිත්‍රපට ත්‍රිත්වයක් යොදා ගන්නා අතර **අක්ෂරය, පුරහඳ කළුවර, බොරදිය පොකුණ** එම චිත්‍රපට ත්‍රිත්වය වේ. මෙහි දී මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදයක් යොදා ගන්නා අතර ප්‍රාථමික මූලාශ්‍රය ලෙස අහඹු ලෙස තෝරාගත් (50) දෙනෙකුගෙන් යුත් පුද්ගල නියැදියකට ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කිරීම හා චිත්‍රපට අධ්‍යයනය කිරීමත්, ද්විතීයික මූලාශ්‍රය ලෙස ග්‍රන්ථ හා තොරතුරු ගොනු පරිශීලනය කිරීමටත් අපේක්ෂා කෙරේ. මෙරට සිංහල සංස්කෘතික පද්ධතියට අනුකූලව, නිර්මාණකරුගේ නිදහස් චින්තනයට අනුගත ව නිර්මාණකරණයේ නියැලීමට හා අධ්‍යයනයට නවක නිර්මාණකරුවන්ට හා පරිශීලකයන්ට මෙම විශ්ලේශනාත්මක අධ්‍යයනය ප්‍රයෝජනවත් වනු ඇත.

**ප්‍රමුඛ පද:** චිත්‍රපට කලාව, බලපෑම්, යථාර්ථ නිරූපණය, වාරණය, සමාජ සංස්කෘතික කාරණා

ශාස්ත්‍රීය ප්‍රභාෂණයේදී ප්‍රස්තුතීකරණය නොකළ සාරසංක්ෂේප

# An Analytical Study of How Politics, Sexuality, and Language Have Influenced Film Censorship in Sri Lanka (From a Selected Film Trilogy)

K.G.T.S.M.Kumarasiri
Department of Drama, Cinema and Television, University of Kelaniya
thilinismkumarasiri@gmail.com

**Abstract**

Culture can be considered as the whole acquired from the environment and experiences in which man lives as a member of society. Cinema is an art form that tries to provide enjoyment in a public social space. It tries to recreate the functioning of the socio-cultural world and its reality. There, this film art expands technically and ideologically as an audio-visual medium. Therefore, there is a clash between reality and cultural matters. These cultural matters include values, customs, religion, language, sexuality, ethnicity, and politics. Films are often censored based on these facts. Censorship is the prohibition or suppression of speech or writing because it is detrimental to the public good. The primary purpose of this research is to study how film art, which is nourished by human society and those interests, is censored on certain socio-cultural issues and how it affects film art. The research problem here is how socio-cultural issues such as politics, sexuality, and language that affect film censorship affect this film art. Three selected films are used for this purpose: Akshara, Purahanda Kaluvara, and Boradiya Pokuna. A diverse research method is used, and it is expected to present a questionnaire to randomly selected 50 people as the primary source for studying films. As the secondary source, books and information files are considered. This analytical study will be useful for new designers and users to engage in and study design following the Sinhala cultural system of this country, according to the designer's free thinking.

**Keywords:** film art, effects, realism, censorship, socio-cultural issues

# ටෙලි නාට්‍ය මගින් හෙළි කෙරෙන තත්කාලීන ලාංකේය සමාජ දේශපාලන මුහුණුවර පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක් (නාමල් ජයසිංහගේ සහෝදරයා ටෙලි නාට්‍යය ඇසුරින්)

ඒ. ඒ. ඒ. ශ්‍රීමාලි අධිකාරි
සිංහල අධ්‍යයන අංශය , කැලණිය විශ්වවිද්‍යාලය
anuradhashrimali96@gmail.com

**සාරසංක්ෂේපය**

ටෙලි නාට්‍යය, රූපය මාධ්‍ය කොටගෙන ප්‍රේක්ෂකයා වෙත පැමිණෙන කලා අංගයකි. 1982 පෙබරවාරි 15 දින ජාතික රූපවාහිනිය ස්ථාපිත කළ අතර එහි විකාශය වූ පළමු ටෙලි නාට්‍යය දිමුතුමුතු නම් විය. එතැන් සිට ආරම්භයේ සිට අවසානය තෙක් ප්‍රේක්ෂකයා ඇද බැඳ තබා ගත් නිර්මාණ රාශියක් බිහි විය. පශ්චාත් කාලීනව තවත් රූපවාහිනී නාලිකා ආරම්භ වීමත් සමග යථාර්ථය ඉක්මවූ සිහින ලෝක මවාපාන ඉන්ද්‍රීය ටෙලි නාට්‍ය හඬකවා පෙන්වීම හා කලාව පිළිබඳ නිසි අවබෝධයක් නොමැතිව වාණිජ පරමාර්ථයෙන් හරසුන් නිර්මාණ බිහි කිරීම නිසා ටෙලිනාට්‍ය කර්මාන්තයේ කලාත්මක බව ගිලිහිණ. චිත්‍රපට කලාවේ මූලික මාධ්‍යය වූ දෘශ්‍ය රූපයත් ගුවන් විදුලි නාටකයේ ප්‍රකාශන මාධ්‍යය වූ ශ්‍රව්‍ය රීතියත් වේදිකා නාට්‍යවලින් රංග රටාවනුත් උකහා ගත් ටෙලි නාට්‍ය යනු නිසි පරිදි හැසිරවීමෙන් අද්විතීය නිර්මාණ බිහි කළ හැකි කලා මාධ්‍යයකි. මෙවන් පසුබිමක නව ප්‍රවණතාවක් ලෙස පවත්නා සමාජ ක්‍රමය යථාර්ථවත් ලෙස ප්‍රතිනිර්මාණය කෙරෙන නිර්මාණ කීපයක් සාර්ථක ලෙස ප්‍රේක්ෂකයා හමුවට පැමිණවීමට ස්වාධීන රූපවාහිනී නාලිකාව සමත් විය. කුඹියෝ, සහෝදරයා, තණමල්විල කොල්ලෙක්, සත්‍යා ආදී නිර්මාණ ඒ සඳහා නිදසුන් වේ. හරසුන් නිර්මාණ නිසා ටෙලි තිරයෙන් ඈත්ව සිටි පිරිසක් තමා වෙත ඇද ගැනීමට මෙම නිර්මාණ සමත් විය. රූපවාහිනි නැරඹීම ප්‍රතික්ෂේප කරන පිරිස් පවා සමාජ මාධ්‍ය නැරඹුම් ඔස්සේ මේ නිර්මාණවලට සමීප විය. සිංහල ටෙලි නාට්‍ය මගින් හෙළි කෙරෙන තත්කාලීන ලාංකේය සමාජ දේශපාලන මුහුණුවර කෙබඳු ද? යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වේ. නාමල් ජයසිංහ අධ්‍යක්ෂණය කළ සහෝදරයා ටෙලි නිර්මාණය ඇසුරින් ටෙලිනාට්‍ය මගින් හෙළි කෙරෙන තත්කාලීන සමාජ දේශපාලන මුහුණුවර පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයක් කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. මෙහිදී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ස්වාධීන රූපවාහිනී නාලිකාවේ විකාශය වූ සහෝදරයා ටෙලි නිර්මාණය භාවිත කෙරෙන අතර ද්විතීයික මූලාශ්‍රය වශයෙන් ඒ සම්බන්ධ විචාර විමර්ශන හා පුවත්පත් ලිපි අධ්‍යයනය කෙරේ. සමාජ ජීවිතයට මෙන් ම ජන විඥානයට ද බලපෑම් කළ හැකි කලා මාධ්‍යයක් ලෙස ටෙලිනාට්‍ය ජනතාවගේ දේශපාලන සවිඥානික භාවය ඉහළ නැංවීමට ද යොදාගත හැකි බව සනාථ කරන මේ නිර්මාණ තත්කාලීන ලාංකේය සමාජ දේශපාලන මුහුණුවර මනාව විවරණය කිරීමට සමත් ව ඇති බව මේ අනුව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද:** ටෙලි නාට්‍යය, දේශපාලනය, මුහුණුවර, සමාජය, සහෝදරයා

ශාස්ත්‍රීය ප්‍රභාෂණයේදී ප්‍රස්තුතීකරණය නොකළ සාරසංක්ෂේප

# An Investigative Study on the Current Sri Lankan Socio-Political Face Revealed by Teledrama (Based on Namal Jayasinghe's Sahodaraya)

A.A.A.Shrimali Adhikari
University of Kelaniya
anuradhashrimali96@gmail.com

**Abstract**

Teledrama is an art form that comes to the audience through the medium of image. On February 15, 1982, National Television was established, and the first teledrama aired which was called Dimuthu Muthu. Since then, there have been many creations that have captivated the audience from the beginning to the end. Later, with the opening of more television channels, the artistry of the teledrama industry was lost due to the dubbing of Indian teledramas that pretended to be dream worlds that surpassed reality, which were commercial creations without a proper understanding of the art. Teledramas combined with the visual image, which was the basic medium of the film art, the audio channel which was the medium of expression of the radio drama, and the theatrical patterns from the stage dramas, is an art form that can create unique creations if properly handled. In such a background, the ITN television channel managed to successfully present several productions that realistically recreate the existing social system as a new trend: Kumbio, Sahodaraya, Thanamalwila kollek, Satya. These creations managed to attract a previously distracted crowd to the telescreen. Even people who refuse to watch television came close to these creations through social media viewing. The research investigates the current Sri Lankan socio-political face revealed by Sinhala teledramas. The purpose of this research is to conduct an investigative study on the contemporary socio-political face revealed by teledrama based on the television production of Sahodaraya directed by Namal Jayasinghe. Here, as the primary source, the teledrama of Sahodaraya telecasted on the ITN television channel is used, and as the secondary source, related critical investigations and newspaper articles are studied. Thus, it can be concluded that these productions have been able to explain the current Sri Lankan socio-political face well, which proves that teledrama can be used to raise the political consciousness of the people as an art medium that can influence social life as well as public consciousness.

**Key Words:** Drama, Face revealed, Politics, Sahodaraya, Society